75 වන කාණ්ඩය
8 වන කලාපය

සෙනසුරාදා
1967 නොවැම්බර් 4

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1717] :**

**පෞද්ගලික මන්ත්‍රීගෙ පනත් කෙටුම්පත් පනත [තී. 1745] :**

**Wildlife Protection Society of Ceylon (Incorporation) Bill—**
[වර්නන් ජොන්ක්ලාස් මයා.]
පළමුවන වර කියවන ලදී.

**විශ්ව විද්‍යාලවල තත්ත්වය පිළිබඳව ගරු අධ්‍යාපන හා සංස්කෘතික ඇමතිතුමාගේ ප්‍රකාශය [තී. 1746] :**

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා [තී. 1765] :**

කුඹුරු පනත සංශෝධනය—යෝජනාව, අවසර දෙන ලදුව, ඉල්ලා අස් කරගන්නා ලදී.
කෘෂිකාර්මික කටයුතු සඳහා පාවිච්චි කරන පාරවල් තැනීම, අලුත්වැඩියා කිරීම හා නැවත සකස් කිරීම—යෝජනාව අහෝසි විය.

**කල් තැබීමේ යෝජනාව [තී. 1790] :**

නොබෝදා ඇති වූ ජල ගැල්මෙන් සිදු වූ හානි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 75
இல. 8

சனிக்கிழமை
4 நவம்பர் 1967

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 1717]

தனி அங்கத்தவர் மசோதா [ப. 1745] :
Wildlife Protection Society of Ceylon (Incorporation) Bill—
[திரு. வேணன் ஜொங்ளாஸ்]
முதன்முறை மதிப்பிடப்பட்டது

பல்கலைக் கழக அந்தஸ்துப் பற்றி கல்வி, கலாசார விவகார அமைச்சரது அறிக்கை [ப. 1746]

தனி அங்கத்தவர் பிரேரணைகள் [ப. 1765] :
நெற்காணிச் சட்டம் : திருத்தம்—பிரேரணை அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.
கமத்தொழில் தேவைகளுக்குப் பயன்படுத்தப்படும் வீதிகளை அமைத்தலும் திருத்தலும் சீராக்கலும்—பிரேரணை காலாவதியாயிற்று.

ஒத்திவைப்புப் பிரேரணை [ப. 1790] :
சமீபகால வெள்ளத்தாலேற்பட்ட சேதம்

---

Volume 75
No 8

Saturday
4th November 1967

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Col. 1717]

PRIVATE MEMBER'S BILL [Col. 1745] :
Wildlife Protection Society of Ceylon (Incorporation) Bill—[Mr. Vernon Jonklaas]
Read the First time

STATEMENT BY MINISTER OF EDUCATION AND CULTURAL AFFAIRS RE. STATUS OF UNIVERSITIES [Col. 1746]

PRIVATE MEMBERS' MOTIONS [Col. 1765] :
Paddy Lands Act : Amendment—Motion, by leave, withdrawn.
Construction, Repairing and Reconditioning of Roads used for Agricultural Purposes—Motion lapsed.

ADJOURNMENT MOTION [Col. 1790] :
Damage caused by recent floods

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## House of Representatives

**1967 නොවැම්බර් 4 වන සෙනසුරාදා**

சனிக்கிழமை, 4 நவம்பர் 1967

*Saturday, 4th November 1967*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස්විය. කථානායක තුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at* 2 P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

## வினாக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

### රුප්පේ ඩී. ජී. පියදාස මයා. සහ තවත් අයගේ හාල් පොත් නැතිවීම

ரூப்பேயைச் சேர்ந்த திரு. ஜி. பியதாசவும் ஏனையோரும் : அரிசிப்புத்தகங்கள் காணமற் போதல்

### MR. G. PIYADASA AND OTHERS, RUPPE : LOSS OF RICE RATION BOOKS

1. **ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)
*(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை)*
**(Mr. T. B. M. Herath—Walapane)**

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) නිල්දන්ඩාහින්න, රුප්පේ, පදිංචි ඩී. ජී. පියදාස, පොඩි හාමිනේ, බේබිනෝනා හා අබේරත්න යන අයගේ හාල් සීට්ටු පොත් නොබෝදා නැතිවූ වග එතුමා දන්නවාද? (හාල් පොත් අංක ඩබ්ලිව්. 363517, පී. 237517, සී. 588061 හා අයි. 324667) (ආ) මේ නිසා ඔවුන් හාල් හා වෙනත් ආහාර ද්‍රව්‍ය ලබාගත නොහැකිව සිටින බව එතුමා දන්නවාද? (ඉ) ඔවුන් මේ තත්ත්වයෙන් මුදවා ගැනීමට එතුමා කවර ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන්නේද?

விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) நில்தந்தாகின்ன, ரூப்பே என்னும் இடத்தில் வசிக்கும் ஜி. பியதாச, பொடிஹாமினே, பேபிநோனா, அபேரத்தின ஆகியவர்களுக்குச் சொந்தமான அரிசிப் புத்தகங்கள் (இல. டபிள்யு. 363517, பி. 237517, ஸி. 588061, ஜே. 324667) சமீபத்திற் காணமற்போனதை அவர் அறிவாரா? (ஆ) இதனால் அரிசியையும் மற்றைய உணவுப் பொருள்களையும் அவர்கள் பெற முடியாதிருப்பதை அவர் அறிவாரா? (இ) இக்கஷ்ட நிலையிலிருந்து அவர்களை நீக்குவதற்கு அவர் எடுக்கவிருக்கும் நடவடிக்கை என்ன?

asked the Minister of Agriculture and Food: (*a*) Is he aware that the Rice Ration Books (Rice Ration Book Nos. W 363517, P 237517, C 588061 and I 324667) belonging to G. Piyadasa, Podihamine, Baby Nona, and Abeyratne, residents of Ruppe, Nildandahinna were lost recently? (*b*) Is he aware that as a result they cannot obtain rice and other foodstuffs? (*c*) What course of action will he take to help them out of this position?

**ගරු පී. සී. ඉඹුලාන (වැඩබලන කෘෂිකර්ම හා ආහාර ඇමති)**

*(கௌரவ பீ. சீ. இம்புலான—பதில் விவசாய, உணவு அமைச்சர்)*

(The Hon. P. C. Imbulana—Acting Minister of Agriculture and Food)

(අ) ඔව්. (ආ) අතිරේක ආහාර ද්‍රව්‍ය සලාක, සහල් සලාක පොත්වලට නිකුත් කරනු නොලැබේ. තමතමන්ගේ අතිරේක ආහාර ද්‍රව්‍ය සලාක ලබා ගැනීම සඳහා සෑම පවුලකටම වෙනම සලාක පත්‍රයක් බැගින් නිකුත් කරනු ලැබ ඇත. එම නිසා සහල් සලාක පොත් නැතිවීමෙන් පාරිභෝගිකයාට තමාගේ අතිරේක ආහාර ද්‍රව්‍ය සලාකය නොලැබී නොයනු ඇත. (ඉ) මෙකී රුප්පෙ වැසියන්ගේ සහල් සලාක පොත් නැති වී තිබෙන්නේ නැදැයකු විසින් කරන ලද සොරකමක ප්‍රතිඵලයක් වශයෙන් බව වාර්තා කරන ලදී. නැති වූ සහල් සලාක පොත් වෙනුවට නැවතත් පොත් නිකුත් නොකරනු ලබන බවට දන්වමින්ද තම තමන්ගේ සහල් සලාක පොත් පරිස්සම් කොට තබාගන්නා ලෙස මහජනයාගෙන් ඉල්වා සිටිමින්ද දැනට වලංගුව පවතින සහල් සලාක පොත් මාලාව නිකුත් කිරීමට පෙර, ප්‍රමාණවත් ප්‍රචාරයක් කරන ලදී. කරුණු මෙසේ

2——එච 8049—793 (67/11)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඉඹුලාන]

හෙයින්, මේ නැති වූ සහල් සලාක පොත් නැවත ලබා දීමට බලාපොරොත්තු නොවේ. එහෙත් මේ අයට තමන්ගේ අතිරේක ආහාර ද්‍රව්‍ය සලාක ලබා දීමට නුවරඑළියේ නියෝජ්‍ය ආහාර පාලක සහතික වශයෙන් වග බලා ගනු ඇත.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

මේ උදවියට දැනට ලැබෙන්නේ එක හාල් සේරුවක් පමණයි. නැති වූ මේ හාල් පොත් වෙනුවට අලුත් පොත් නිකුත් නොකිරීම නිසා, ඒ හාල් සේරුවත් ඔවුන්ට නොලැබී යනවා. ඊළඟ වාරයේ හාල් පොත් නිකුත් කරන තුරුම ඔවුන්ට ඒ හාල් සේරුවවත් ලැබෙන්නේ නැහැ. එම නිසා ඒ නැති වූ හාල් පොත් අවලංගු කර ඒවා වෙනුවට අලුත් හාල් පොත් නිකුත් කරන්නට බැරිද යන වග මා දැන ගන්නට කැමතියි.

ගරු ඉඹුලාන
(கௌரவ இம்புலான)
(The Hon. Imbulana)

මීළඟ වාරයේ හාල් පොත් දෙන විට මිස ඉන් මෙහා මේ උදවියට අලුත් හාල් පොත් දෙන්නට පුළුවන්කමක් නැහැ.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

අලුත් හාල් පොත් නිකුත් කිරීමට තව අවුරුද්දක් පමණ කල් තිබෙන නිසා, එතෙක් එක හාල් සේරුවවත් නොලැබෙන මේ පවුලේ උදවිය ජීවත් වන්නේ කොහොමද යන ප්‍රශ්නය මා ගරු ඇමතිතුමාගෙන් අහන්නට කැමතියි. මනුෂ්‍ය ධර්මයේ නාමයෙන්වත් මේ උදවියට අලුත් හාල් පොත් ලබා දීමට යම් කිසි ක්‍රමයක් සලස්වන්නට බැරිද? අවුරුද්දක් තිස්සේ මේ මිනිසුන්ට බඩගින්නේ ඉන්නට පුළුවන්ද?

ගරු ඉඹුලාන
(கௌரவ இம்புலான)
(The Hon. Imbulana)

බඩගින්නේ ඉන්නට බැරි බව අප පිළිගන්නවා. එහෙත්, දැන් තිබෙන තත්ත්වය අනුව, සමහර උදවිය ඔවුන්ගේ හාල් පොත් නැති වුණාය කියා අලුත් හාල් පොත් ලබා ගෙන විශාල දූෂණ කටයුතු කරනවා. අමාත්‍යාංශය මේ තීරණය ගෙන තිබෙන්නේ ඒ නිසයි. කලින් තිබුණු තත්ත්වයත් ඒකයි.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

තුන්වැනි අතුරු ප්‍රශ්නය. මෙම හාල් පොත් යම් කිසිවකු විසින් හොරකම් කර තිබෙන බව ගරු ඇමතිතුමාගේ පිළිතුරෙහි සඳහන් වුණා. එසේ නම්, මේ උදවියට අලුත් හාල් පොත් නිකුත් කිරීමට එය සෑහෙන හේතුවක් වෙනවා. එම නිසා, විශේෂ අවසර පත්‍රයක් මගින් හෝ මේ අයට හාල් පොත් අලුතෙන් ලබා දීම ආණ්ඩුවේ යුතුකමක්. ඒ අනුව, මේ පිරිස බඩගින්නේ නොතබා, දැනට දෙන එක හාල් සේරුවවත් ලබා ගැනීම සඳහා මේ උදවියට අලුතනේ හාල් පොත් නිකුත් කිරීමට ගරු ඇමතිතුමා කල්පනා කරන වාද?

ගරු ඉඹුලාන
(கௌரவ இம்புலான)
(The Hon. Imbulana)

යම් කෙනකුගේ හාල් පොත් ගංවතුරෙන් හෝ ගින්නෙන් හෝ කුණාටුවකින් හෝ විනාශ වුණොත් ඒ වෙනුවට අලුත් හාල් පොත් නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය දැනටත් තිබෙනවා. අප පමණක් නොව කලින් තිබුණු ආණ්ඩුව ගෙන ගියෙත් මේ ප්‍රතිපත්තියමයි. මේ කියන හාල් පොත් යම් කෙනකු හොරකම් කර තිබෙන බව ඔප්පු කරන්නට ගරු මන්ත්‍රීතුමාට පුළුවන් නම් ඒ ගැන විශේෂ විභාගයක් පවත්වන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පෞද්ගලික පේෂකර්ම මධ්‍යස්ථානයන්ට දුන් විදේශ විනිමය**

*தனியார் துறை நெசவு நிலையங்களுக்கு வெளிநாட்டுச் செலாவணி ஒதுக்கீடு*

**FOREIGN EXCHANGE ALLOCATIONS TO PRIVATE TEXTILE CENTRES**

2. **ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)*

(Mr. Lakshman Jayakody—Divulapitiya)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) 1966 සහ 1967 වර්ෂවලදී පෞද්ගලික අත්යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථාන හිමියන් හා බලවේග පේෂකර්ම මධ්‍යස්ථාන හිමියන් කී දෙනෙකුට කපු, රේයන් සහ සේද නූල් ආනයනය, කිරීමට කොපමණ විදේශීය විනිමයක් වෙන් කර තිබේද ? (ආ) ආනයන කොටස් ලැබූවන් ගේ නම් සහ ලිපිනයන් හා ඔවුන්ට වෙන් කළ මුදල සඳහන් කරනවා ද ? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද ?

*உள்நாட்டு விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1966, 1967 ஆகிய ஆண்டுகளில் எத்தனை தனியார் துறை கைத்தறி நெசவு நிலையங்களுக்கும் தனியார் துறை மின்தறி நெசவு நிலையங்களுக்கும் பருத்தி, றேயன், பட்டுநூல் ஆகியவற்றை இறக்குமதி செய்வதற்கு வெளிநாட்டுச் செலாவணி ஒதுக்கப்பட்டது? எவ்வளவு வெளிநாட்டுச் செலாவணி ஒதுக்கப்பட்டுள்ளது? (ஆ) இறக்குமதிக் கோட்டா அனுமதியளிக்கப்பட்டவர்களின் பெயர், விலாசம், அவர்களுக்கு ஒதுக்கப்பட்ட பணத்தினளவு ஆகியவைகளைக் குறிப்பிடுவாரா? (இ) இன்றேல், ஏன்?*

asked the Minister of Home Affairs : (*a*) During the years 1966 and 1967 how many persons owning private hand-loom textile centres and private power-loom textile centres have been allocated foreign exchange to import cotton, rayon and silk yarn ? What is the amount of foreign exchange involved ? (*b*) Will he state the name, the address and the exchange allocated, in respect of each person who was granted an import quota ? (*c*) If not, why ?

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)*

(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

(අ) ලියා පදිංචි වී ඇති ආයතන 304 කට රේයෝන් නූල් සහ අනිකුත් කෘත්‍රිම නූල් ආනයනය කිරීම සඳහා පහත සඳහන් විදේශ විනිමයන් 1966 සහ 1967 (අද දක්වා) වර්ෂයන් වෙනුවෙන් වෙන් කර ඇත. කපු නූල් සහ සේද නූල් සඳහා විදේශ විනිමයන් වෙන් කර නැත. 1966—රු. 6,86,735. 1967—රු. 5,62,000. (ආ) ඔව්—අමුණා ඇති ලැයිස්තුවේ සඳහන් වේ. (ඉ) පැන නොනගියි.

ගරු කථානායකතුමනි, අමුණා තිබෙන ලැයිස්තුව හුඟක් දිග එකක් නිසා එය හැන්සාඩ් එකේ පළ කරන ලෙස මා ඉල්ලනවා.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

ලැයිස්තුව තිබෙන පිළිවෙළ අනුව එය හැන්සාඩ් එකේ පළ කරන්නට බැහැ. එහි පිටපතක් ගරු මන්ත්‍රීතුමාට දී තව පිටපතක් පුස්තකාලයේ තබන්නට පුළුවනි.

**ගරු ආචාර්ය දහනායක**

*(கௌரவ கலாநிதி தகநாயக்க)*

(The Hon. Dr. Dahanayake)

ඒක හැන්සාඩ් වාර්තාවේ පළ කිරීම නියමයක් නේද ?

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

ඒ විධියේ දේවල් හැන්සාඩ් වාර්තාවේ පළ කිරීමට ගියහොත් හැන්සාඩ් වාර්තාව මාසයක් දෙකක් ප්‍රමාද වෙනවා. කරුණාකර පිළිතුරේ පිටපතක් ප්‍රශ්නය ඇසූ මන්ත්‍රීතුමාට යවන්න. තවත් පිටපතක් පුස්තකාලයේ තබනවා ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ලංකා නාවුක හමුදාවට බඳවා ගත්තවුන් අස් කිරීම

## இலங்கை கடற்படை : சேர்க்கப்பட்டோரைச் சேவையிலிருந்து விலக்கல்

## CEYLON NAVY : DISMISSAL OF RECRUITS

3. පී. බී. විජයසුන්දර මයා. (කිරිඇල්ල)
(திரு. பீ. பி. விஜயசுந்தர—கிரியல்ல)
(Mr. P. B. Wijesundara—Kiriella)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍යාරක්‍ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වර්තමාන ආණ්ඩුව බලයට පත් වීමෙන් පසු නාවික හමුදාවට බඳවා ගන්නා ලද 272 දෙනෙකුගෙන් 44 දෙනෙකු කිසිම චෝදනා පත්‍රයක් ඉදිරිපත් නොකොට පසුගිය දෙසැම්බර් තුන් වනදා හිටි අඩියේම සේවයෙන් නෙරපූ බව එතුමා දන්නවාද? (ආ) පසුව එකී අය නාවුක හමුදාපතිගෙන් මේ ගැන විමසූ විට අවශ්‍ය සුදුසුකම් නොමැති නිසා මේ අය අස්කරණලද බව පැවසූ බව එතුමා දන්නවාද? (ඉ) මේ අය නුසුදුසු නම් ඒ අය බඳවාගත් සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයට විරුද්ධව ක්‍රියා නොකලේ මන්දැයි එතුමා සඳහන් කරනවාද? (ඊ) ඒ අස් කරණ ලද 44 දෙනා අතුරින් කී දෙනෙක් බෞද්ධද, කී දෙනෙක් කතෝලිකද, කී දෙනෙක් හින්දුවරුන් ද යන්න එතුමා සඳහන් කරනවාද? (උ) එම 44 දෙනා කුමන ඡන්දදායක කොට්ඨාශවල පදිංචි කරුවන්දැයි එතුමා සඳහන් කරනවාද?

பிரதம அமைச்சரையும், பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரையும், திட்ட அமைப்பு பொருளாதார அமைச்சரையும், தகவல், ஒலிபரப்பு அமைச்சரையும் கேட்ட வினா: (அ) இன்றைய அரசாங்கம் அதிகாரத்திற்கு வந்த பின் கடற்படையில் சேர்க்கப்பட்ட 272 பேரில் 44 பேர் அவர்கள்மீது எவ்வித குற்றச்சாட்டும் சமர்ப்பிக்கப்படாது கடந்த டிசம்பர் 3 ஆம் தேதி திடீரெனச் சேவையிலிருந்து விலக்கப்பட்டனரென்பதை அவர் அறிவாரா? (ஆ) மேலே குறிப்பிடப்பட்டவர்கள் கடற்படைத் தளபதியிடம் இதுபற்றிப் பின்னர் விசாரித்தபோது தேவையான தகுதியின்மையால் விலக்கப்பட்டனரெனக் கூறினரென்பதை அவர் அறிவாரா? (இ) இவர்கள் தகுதியற்றவர்களாயின் அவர்களைத் தேர்ந்தெடுத்த நேர்முகத் தேர்வுச் சபைக்கு எதிராக நடவடிக்கையெடுக்காததேன் என்பதை அவர் குறிப்பிடுவாரா? (ஈ) நீக்கப்பட்ட 44 பேரில் எத்தனை பேர் பௌத்தர் என்பதையும், எத்தனை பேர் கத்தோலிக்கர் என்பதையும், எத்தனை பேர் இந்துக்கள் என்பதையும் அவர் குறிப்பிடுவாரா? (உ) அவர்கள் 44 பேரும் எத்தேர்தல் தொகுதிகளில் குடியிருக்கிறார்கள் என்பதை அவர் குறிப்பிடுவாரா?

asked the Prime Minister, Minister of Defence & External Affairs & Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting: (*a*) Is he aware that 44 of the 272 persons recruited to the Ceylon Navy after the present Government came into power were summarily dismissed on the 3rd of last December without any charges being framed against them? (*b*) Is he aware that subsequently on inquiring from the Navy Commander regarding this matter, they were informed by him that they were dismissed because they did not possess the necessary qualifications? (*c*) Will he state why no action was taken against the Interview Board who recruited them, if the recruits were found unsuitable? (*d*) How many of the 44 persons dismissed were Buddhists, Catholics and Hindus respectively? (*e*) Will he state the electorates in which these 44 persons reside?

ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)
(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

(අ) නැත. 1966 දෙසැම්බර් 2 වැනි දින රාජකීය ලංකා නාවික හමුදාවෙන් පහ කරන ලද්දේ ඔවුන් නුසුදුසු වූ බැවිනි. (ආ) නැත. (ඉ) සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයට විරුද්ධව කිසිම ක්‍රියා මාර්ගයක් අවශ්‍ය යයි මා සලකන්නේ නැත. (ඊ) බෞඩයින් 42; කතෝලිකයින් 2; හින්දු භක්තික යින් නැත. (ඒ) මැද කොළඹ 5; උතුරු කොළඹ 1; දකුණු කොළඹ 1; කෝට්ටේ 1;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පානදුරය 6; බුලත්සිංහල 1; කළුතර 2; වැල්ලවත්ත-ගල්කිස්ස 1; බොරැල්ල 2; කිරිඇල්ල 1; ගම්පහ 5; මොරටුව 4; කොට්ටාව 1; කැස්බෑව 2; අගලවත්ත 3; ජාඇල 1; මතුගම 2; හොරණ 1; අම්බලන්ගොඩ 1; බද්දේගම 1; මහර 1; දොම්පෙ 1.

**විජයසුන්දර මයා.**
*(திரு. விஜயசுந்தர)*
(Mr. Wijesundara)

මේ අය නුසුදුසු නම් ඔවුන් රාජකීය ලංකා නාවුක හමුදාවට බඳවා ගත්තේ කුමක් නිසාද ?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

පිළිතුරේ නම් ඒ ගැන සඳහන් කර නැහැ. දෙවනුව කියන්නට පුළුවනි.

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)
*(திரு. பேர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு)*
(Mr. Bernard Soysa—Colombo South)

වැල්ලවත්ත-ගල්කිස්ස නමින් කොට්ඨාශයක් නැහැ. වැල්ලවත්ත අයත් වන්නේ මා නියෝජනය කරන දකුණු කොළඹ කොට්ඨාශයටයි. ඒක වෙනත් කොට්ඨාශයකට පරිත්‍යාග කරනවාට මා කැමති නැහැ.

### විශේෂ ඉඩම් බදු
### விசேட காணிக் குத்தகைகள்
### SPECIAL LEASES OF LAND

4. **කේ. බී. රත්නායක මයා.** (අනුරාධපුර)
*(திரு. கே. பி. ரத்னுயக்க—அனுராதபுரம்)*
(Mr. K. B. Ratnayake—Anuradhapura)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) විශේෂ බදු ක්‍රමය යටතේ අද වන තෙක් ඉඩම් දෙනු ලැබූ අයගේ නම් හා ලිපිනයන් එතුමා සඳහන් කරනවාද ? (ආ) එම ඉඩම් පිහිටි තැන් හා ඒවායේ ප්‍රමාණයන් සඳහන් කරනවාද ? (ඉ) මෙම ඉඩම්වල වර්තමාන සංවර්ධන තත්ත්වය කුමක් ද ?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினு: (அ) விசேட குத்தகைகளின் கீழ் இன்றுவரை காணிகள் கொடுக்கப்பட்டவர்களின் பெயர்களையும் விலாசங்களையுங் கூறுவாரா? (ஆ) அக்காணிகளின் பரப்பையும் அவை அமைந்துள்ள இடத்தின் குறிப்பையுங் கொடுப்பாரா? (இ) அக்காணிகளின் அபிவிருத்தி இப்போது எந்நிலையிலுள்ளது?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Will he state the names and addresses of persons to whom land has been alienated up to date under the Special Leases ? (*b*) Will he give the location of such land and the extent ? (*c*) What is the present stage of development of this land ?

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා.** (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
*(திரு. சீ. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளு மன்றக் காரியதரிசி)*
(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

The reply is a very long list. I am tabling it.

**රත්නායක මයා.**
*(திரு. ரத்னுயக்க)*
(Mr. Ratnayake)

ඉන් පිටපතක් මට එවනවාද ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Yes, and a copy will be available in the Library.

### ලොරි චැසි ආනයනය
### லொறி அடிச்சட்டங்களின் இறக்குமதி
### IMPORT OF LORRY CHASSIS

11. **රත්නායක මයා.**
*(திரு. ரத்னுயக்க)*
(Mr. Ratnayake)

ප්‍රවාහණ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1967 ජනවාරි මාසයේ සිට මේ දක්වා විවිධ වර්ගවල ලොරි චැසි කොපමණ ආන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

යනය කර තිබේද ? (ආ) මෙම රථ දෙනු ලැබූ අයගේ නම් සහ ලිපිනයන් එතුමා ප්‍රකාශ කරනවාද ?

*போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா : (அ) 1967 ஆம் ஆண்டு ஜனவரி மாதம் முதல் இன்றுவரை இறக்குமதி செய்யப்பட்ட பல் வேறு விதமான லொறி அடிச்சட்டங்களின் எண்ணிக்கை என்ன ? (ஆ) இவை கொடுக்கப் பட்டவர்களின் பெயர்களேயும், முகவரிகளேயும் அவர் தெரிவிப்பாரா ?*

asked the Minister of Communications : (*a*) How many lorry chassis of various makes have been imported since January 1967 up to date ? (*b*) Will he state the names and addresses of those to whom these were issued ?

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)**

*(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்கு வரத்து அமைச்சர்)*

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

(අ) ආනයනය කරන ලද ලොරි චැසි සංඛ්‍යාව 515 යි. (ආ) ඔව් ; එම රථ වෙන් කර දෙනු ලැබූ අයගේ නම් සහ ලිපිනයන් ඇතුළත් ලැයිස්තුවක් මේසය මත තබමි.

This also is a fairly long list. I am tabling it.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

The same procedure as in the case of the Answer to Question No. 4 will be adopted ; that is, a copy will be given to the hon. Member and a copy will be available in the Library.

**ටී. බී. ඉලංගරත්න මයා. (කොළොන්නාව)**

*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னுவ)*

(Mr. T. B. Ilangaratne—Kolonnawa)

අතුරු ප්‍රශ්නයක් අහන්නට තිබෙනවා. මෙම ලොරි දෙන්නේ මොන ප්‍රතිපත්ති යක් උඩද ?



**ගරු හුරුල්ලේ**

*(கௌரவ ஹுருல்ல)*

(The Hon. Hurulle)

ගැසට් නිවේදනයක් මඟින් සුදුසුකම් නියම කරනු ලැබ තිබෙනවා. ඒ සුදුසුකම් අනුවයි, දෙන්නේ.

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

සුදුසුකම් මොනවාද ?

**ගරු හුරුල්ලේ**

*(கௌரவ ஹுருல்ல)*

(The Hon. Hurulle)

ගැසට් නිවේදන දෙකක් තිබෙනවා. පළමු වැනි ගැසට් නිවේදනය අනුව අවුරුදු 10 කට වඩා පැරණි වාහන ඇති අයට වාහන දෙනවා. දෙවැනි ගැසට් නිවේදනය අනුව වෘත්තියක් වශයෙන් ඒ ව්‍යාපාරයේ යෙදී සිටින අයටත් දෙනවා.

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

ඒ ප්‍රතිපත්තියට වෙනස්ව විශේෂ කාරණා උඩ දුන් අවස්ථා තිබෙනවාද ?

**ගරු හුරුල්ලේ**

*(கௌரவ ஹுருல்ல)*

(The Hon. Hurulle)

නැහැ.

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

හොඳයි, එහෙම තිබෙන බව ඔප්පු කළ හොත් ?

**ගරු හුරුල්ලේ**

*(கௌரவ ஹுருல்ல)*

(The Hon. Hurulle)

ගැසට් නිවේදන දෙකක් තිබෙනවා. එකක් අනුව අවුරුදු දහයකට වඩා පරණ වාහන තිබෙන්නට ඕනෑ. අනෙක අනුව ඒ වෘත්තියට සුදුසු වන්නට ඕනෑ. සම හරුන්ට වාහන නැතත් වාහන කුලියට ලබාගෙන තම ව්‍යාපාර ගෙන යනවා. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අයට සහනයක් වශයෙනුයි, ඒ දෙවැනි ගැසට් නිවේදනය නිකුත් කෙළේ.

ඉලංගරත්න මයා.
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඒ ප්‍රතිපත්තිය උඩ නොව විශේෂ කරුණු උඩ සමහර මන්ත්‍රීවරුන්ගේ, ඇමතිවරුන්ගේ, රජයේ ලොක්කන්ගේ බලපෑම් උඩ වාහන ලබා ගැනීමේ අවසර පත්‍ර නිකුත් කරන බව ඔබතුමා දන්න වාද ?

ගරු හුරුල්ලේ
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)

එහෙම දෙයක් තිබෙනවා නම් මන්ත්‍රීතුමා මට දැන්නුවොත් ඒ වාහන ලබා දී තිබෙන්නේ මොන හේතු උඩදැයි මම සොයා බලන්නම්.

## පීටර් ප්‍රේමසිරි මහතාට කිරිඇල්ල පොලිසියෙන් පහරදීම

திரு. பீட்டர் பிரேமசிறி : கிரியெல்லைப் பொலிசு தாக்குதல்

## MR. PETER PREMASIRI : ASSAULT BY KIRIELLA POLICE

5. **එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ—පී. ජී. බී. කෙනමන් මයා.—මැද කොළඹ තුන්වන මන්ත්‍රී—වෙනුවට)

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்ரும் அங்கத்தவர் சார்பாக)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. P. G. B. Keuneman—Third Colombo Central)

ගරු අග්‍රාමාත්‍ය සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) 1967.6.18 වැනි දින එපිටවල ශ්‍රී සුධර්මාරාමයේ අළුත් ගොඩනැගිල්ලක් සඳහා ආධාර එකතුකරමින් සිටියදී තමාට කිරිඇල්ල පොලීසියේ පොලිස් පරීක්ෂක, තිරිනාවකරසු මහතා පහරදුන් බවට, කිරිඇල්ලේ එපිටවල පීටර් ප්‍රේමසිරි මහතා 1967.6.19 වැනි දින පොලිස්පතිවරයාටත් රත්නපුරේ පොලිස් අධිකාරී තැනටත් පැමිණිලි කර ඇති බැව් එතුමා දන්නවාද ? (ආ) මෙම පැමිණිල්ල ගැන කුමන ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද ? නැති නම් කුමන ක්‍රියා මාර්ගයක් ගනු ලබන්නේද ?

*பிரதம அமைச்சரையும், பாதுகாப்பு, வெளி விவகார அமைச்சரையும், திட்ட அமைப்பு பொருளாதார விவகார அமைச்சரையும், தகவல், ஒலிபரப்பு அமைச்சரையும் கேட்ட வினு : (அ) கிரியெல்லை, எபிடாவலையில் உள்ள திரு. பீட்டர் பிரேமசிறி என்பவர் தாம் எபிடாவலை, சிறீ சுதர்மாருமய கோயிலில் புதுக் கட்டடம் அமைப்பதற்காக 18.6.67 அன்று நிதி திரட்டுவதில் ஈடுபட்டிருந்தபோது கிரியெல்லை, பொலிசு நிலையத்தில் வேலை செய்யும் திருநாவுக்கரசு என்னும் பொலிசு பரிசோதகர் தம்மைத் தாக்கினுர் என்று 19.6.67 அன்று பொலிசு பரிசோதகர் நாயகத்திற்கும், இரத்தினபுரி பொலிசு அத்தியட்சருக்கும் முறைப்பாடு செய்தாரென்பதை அவர் அறிவாரா? (ஆ) இம் முறைப்பாட்டுக்கு எந்நடவடிக்கை எடுக்கப்பட்டது ? அல்லது எந்நடவடிக்கை எடுக்கப்படும் ?*

asked the Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting : (*a*) Is he aware that Mr. Peter Premasiri of Epitiwala, Kiriella, has complained on 19.6.67 to the I. G. P. and the S. P. (Ratnapura) that he had been assaulted by I. P. Thirinavakarasu of the Kiriella Police on 18.6.67 while collecting donations for a new buiding at the Sri Suddharma-ramaya Temple, Epitiwala ? (*b*) What action has been or will be taken on this complaint ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු වන්නිනායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති වෙනුවට)**

*(கௌரவ வன்னிநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும் சார்பாக)*

(The Hon. Wanninayake—on behalf of the Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

(*a*) Yes. (*b*) A preliminary inquiry has been held by the Assistant Superintendent of Police, Ratnapura, in connection with this complaint and disciplinary action is being taken against the police officer concerned.

## 1966 ජනවාරි වැඩ වර්ජනයට සහභාගි වූවන් පිළිබඳ පරීක්ෂණ පමාවීම

### 1966 ஜனவரி வேலை நிறுத்தத்தில் ஈடுபட்டோருக் கெதிரான விசாரணை: தாமதம்

### INQUIRIES AGAINST JANUARY 1966 STRIKES : DELAY

6. **එස්. ඩී. බණ්ඩාරනායක මයා.** (ගම්පහ)

*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹா)*

**(Mr. S. D. Bandaranayake—Gampaha)**

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1966.1.8 වැනි දින ඇතිවූ සංකේත වැඩ වර්ජනයට සහභාගි වීමෙන් වැඩ තහනම් කල රජයේ සේවකයින්ගේ නම්, තනතුරු හා දෙපාර්තමේන්තු එතුමා සඳහන් කරනවාද? (ආ) වැඩ තහනමට ලක්වූ සියලු දෙනාගේම විනයානුකූල පරීක්ෂණ අවසානද? (ඉ) නොමැති නම් ඒ මන්ද? (ඊ) සේවයෙන් පහකළ මහතුන්ගේ ගණන කොපමණද? (උ) එයට විරුද්ධව එම මහතුන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා ඉදිරිපත් කර ඇති වග එතුමා දන්නවාද? (ඌ) එසේ නම් අභියාචනා ප්‍රමාද වීමට හේතුව එතුමා සඳහන් කරනවාද?

*நிதியமைச்சரைக் கேட்ட வினா: (அ) 8.1.1966 அன்று நடைபெற்ற அடையாள வேலைநிறுத்தத்தில் கலந்து கொண்டதால் வேலையினின்று இடைநிறுத்தம் செய்யப்பட்ட அரசாங்க ஊழியர்களின் பெயர்கள், பதவிகள், திணைக்களங்கள் ஆகியவற்றை அவர் தெரியத்தருவாரா? (ஆ) இவ்வாறு இடைநிறுத்தம் செய்யப்பட்டவர்கள் மீதான ஒழுக்காற்று விசாரணைகள் முடிவடைந்து விட்டனவா? (இ) இல்லையெனில், ஏன்? (ஈ) சேவையிலிருந்து விலக்கப்பட்டவர்கள் எத்தனை பேர்? (உ) சேவையிலிருந்து விலக்கப்பட்டதற்கு எதிராக அரசாங்க சேவை ஆணைக் குழுவிற்கு அவர்கள் மேன்முறையீடு செய்துள்ளனர் என்பதை அவர் அறிவாரா? (ஊ) அங்ஙனமாயின், இம் மேன்முறையீடுகள் பற்றிய தீர்ப்பை வழங்குவதில் காலதாமதம் ஏற்படுவதற்கான காரணங்களை அவர் தெரிவிப்பாரா?*

asked the Minister of Finance: (*a*) Will he give the names, posts and the departments of the government servants who were interdicted for participating in the token strike of 8.1.1966? (*b*) Have the disciplinary inquiries against all those interdicted been completed? (*c*) If not, why? (*d*) How many were discontinued from service? (*e*) Is he aware that they have appealed to the Public Service Commission against discontinuance? (*f*) If so, will he state the reasons for the delay in the disposal of these appeals?

**එන්. විමලසේන මයා. (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance)

(*a*) Yes. I table a list giving the particulars. The majority of these officers have since been reinstated in service. (*b*) Yes, except for a few which are still in progress. (*c*) Most of the outstanding inquiries will be completed shortly. The inquiries have been delayed in a few cases because the officers have failed to answer the charges and have appealed to higher authorities instead. (*d*) Four permanent employees and two casual employees. (*e*) I am aware that the four permanent employees have appealed to the Public Service Commission. (*f*) The appeals have been

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

forwarded promptly by the departments concerned to the Public Service Commission. I am not aware of the reasons for any delay in the disposal of these appeals by the Public Service Commission.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

As the list tabled is too lengthy for inclusion in HANSARD, it will be kept in the Library for reference by hon. Members.

## මහ කොළඹ ප්‍රදේශයේ විදුලි සංදේශ සංවර්ධන යෝජනා ක්‍රමය : උපකරණ

*கொழும்பு பெரும் பிரிவின் தந்தி அபிவிருத்தித் திட்ட உபகரணங்கள்*

**GREATER COLOMBO TELECOMMUNICATION DEVELOPMENT SCHEME : EQUIPMENT**

7. **ලෙස්ලි ගුණවර්ධන මයා.**,—(පානදුර චම්ලි ගුණවර්ධන මයා.—කළුතර—වෙනුවට)

*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை—திரு. சம்ளி குணவர்தன—களுத்துறை—சார்பாக)*

(Mr. Leslie Goonewardene—Panadura—on behalf of Mr. Cholmondeley Goonewardene—Kalutara)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මහ කොළඹ ප්‍රදේශයේ විදුලි සංදේශ කටයුතු සංවර්ධන යෝජනා ක්‍රමයට එක්සත් රාජධානිය විසින් මුලින් දෙන ලද ණය මුදල කොපමණද? (ආ) මෙම ණය මුදල 1965-1966 දී වැඩි කරන ලද්දේද? එසේ නම් කොපමණ මුදලකින්ද? (ඉ) උපකරණ සහ කම්බි නිෂ්පාදකයින්ගේ නම් මොනවාද? එක් එක් නිෂ්පාදකයා වෙත කරන ලද ඇණවුම් වල මුළු වටිනාකම කොපමණද? (ඊ) මෙම බ්‍රිතාන්‍ය නිෂ්පාදකයින්ගේ මෙරට නියෝජිතවරු කවරහුද? (උ) බ්‍රිතාන්‍ය නිෂ්පාදකයින්ගේ මෙරට නියෝජිතයින්ගේ නම් සහ ලිපිනයන් ගැන බ්‍රිතාන්‍ය නිෂ්පාදකයින්ගෙන් ලිඛිත සහතික කිරීමක් විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැන ලබා ගත්තේද?

වාචික පිළිතුරු

*அரசாங்க கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) கொழும்பு பெரும் பிரிவின் தந்தி அபிவிருத்தித் திட்டத்திற்கு ஐக்கிய இராச்சியத்தால் தொடக்கத்தில் கொடுக்கப்பட்ட கடன் தொகை எவ்வளவு? (ஆ) இக்கடன் தொகை 1965-1966 இல் அதிகரிக்கப்பட்டதா? அவ்வாறாயின் தொகை எவ்வளவு? (இ) உபகரணங்களை விநியோகித்த பிரித்தானிய தொலைபேசி உபகரணங்களும் கம்பியும் உற்பத்தி செய்பவர்களின் பெயர்கள் யாவை? ஒவ்வொரு உற்பத்தியாளருக்கும் ஒதுக்கப்பட்ட கட்டளை (ஓடர்) களின் முழுப்பெறுமதி என்ன? (ஈ) இந்த பிரித்தானிய உற்பத்தியாளர்களின் இந்நாட்டு முகவர்கள் யாவர்? (உ) பிரித்தானிய உற்பத்தியாளர்களின் இந்நாட்டு முகவர்களின் பெயர்களையும் முகவரிகளையும் பற்றிப் பிரித்தானிய உற்பத்தியாளரிடம் எழுத்துருவ உறுதிப்பாட்டைத் தந்தித் திணைக்களப் பிரதம பொறியியலாளர் பெற்றுக் கொண்டாரா?*

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) What was the amount of the original loan granted by the United Kingdom for the greater Colombo area telecommunication development scheme? (*b*) Was the loan increased in 1965-1966 and if so, by how much? (c) What are the names of the British telephone equipment and cable manufacturers, who supplied the equipment and what was the total value of the orders placed on each manufacturer? (*e*) Did the Chief Engineer of the Telecommunication Department obtain written confimation from the British manufacturers regarding the names and addresses of their local agents?

**ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)**

*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)*

(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

(*a*) £2,500,000. (*b*) Yes, by £ 235, 000. (*c*) The names of the manufacturers who supplied the equipment and the total value of the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මොන්ටේගු ජයවික්‍රම]

orders placed so far on each manufacturer are as follows: (i) Messrs. Associated Electrical Industries Ltd., £475,592; (ii) Messrs. Automatic Telephones & Electric Co., Ltd., £41,048; (iii) Messrs. Ericsons Telephone Ltd., £93,945; (iv) Messrs. The General Electric Co., Ltd., £414,532; (v) Messrs. Standard Telephone Ltd., £93,945; (vi) Messrs. British Insulated Callender Cables Ltd., £ 207,603; (vii) Messrs. Pirelli General Cable Works Ltd., £102,297. (*d*) As far as is known there are no local agents of these British manufacturers in respect of the C. A. D. S. (*e*) No; the question does not arise in view of (*d*) above.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 8.

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)

I ask for one month's time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**බරවා රෝග මර්දන ව්‍යාපාරය : සේවකයින්ට විශ්‍රාම වැටුප්**

யானைக்கால் நோய்த்தடுப்பு இயக்கம் : ஊழியர்க்கு இளைப்பாற்றுச் சம்பள உரிமை

ANTI-FILARIASIS CAMPAIGN : PENSION RIGHTS FOR EMPLOYEES

9. පර්සි වික්‍රමසිංහ (කඹුරුපිටිය—බී. වයි. තුඩාවේ මයා.—මාතර—වෙනුවට)
*(திரு. பேர்சி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய—திரு. பி. வை. துடாவ—மாத்தறை—சார்பாக)*
(Mr. Percy Wickremasinghe—Kamburupitiya—on behalf of Mr. B. Y. Tudawe—Matara)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) බරවා රෝග මර්දන ව්‍යාපාරය යටතේ දස අවුරුදු අඛණ්ඩ සේවා කාලයක් ඇති සේවකයන් පවා විශ්‍රාම වැටුපට අහිමි තත්ත්වයෙක සිටින බව එතුමා දන්නවාද? (ආ) මෙම සේවක සංඛ්‍යාව කොපමණද? (ඉ) ඔවුනට විශ්‍රාම වැටුප් අතිසිවාසිකම් ලබා දීමට එතුමා ක්‍රියා කරනවාද? (ඊ) නො එසේ නම්, ඒ මන්ද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா : (அ) யானைக்கால் நோய்த் தடுப்பு இயக்கத்தில் தொடர்ந்து பத்து ஆண்டுகள் சேவைசெய்துள்ள ஊழியர்கள் இளைப்பாற்றுச் சம்பள உரிமையற்றவர்களாக இருப்பதை அவர் அறிவாரா? (ஆ) இவ்வூழியர்களின் எண்ணிக்கை யாது? (இ) அவர்களுக்கு இளைப்பாற்றுச் சம்பள உரிமையைப் பெற்றுக் கொடுக்க அவர் நடவடிக்கை எடுப்பாரா? (ஈ) அன்றேல் ஏன்?*

asked the Minister of Health: (*a*) Is he aware that even employees with a continuous service of ten years in the Anti-Filariasis Campaign are not entitled to pension? (*b*) What is the number of such employees? (*c*) Will he take action to grant them pension rights? (*d*) If not, why?

**විමලා කන්නන්ගර මිය. (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திருமதி விமலா கன்னங்கர—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Minister of Health)

(අ) එසේය. (ආ) 34යි. (ඉ) නැත. (ඊ) ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්තේ විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුරු 146 කට පමණි. ඉතුරු තනතුරු තාවකාලික ගණයේ වෙයි. මෙහි කියන කම්කරුවන් 34 දෙනා තාවකාලික සේවක සංඛ්‍යාවේ අඩංගු වෙති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## බෝගොඩ, තල්දෙන හා සොරණාතොට සමගි මණ්ඩල

போகொட, தல்தென, சொரணத்தோட்டை இணக்கச் சபைகள்

**CONCILIATION BOARDS, BOGODA, TALDENA AND SORANATOTA**

5. **එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.—** (කේ. වයි. විජේරත්න බණ්ඩා මයා.—සොරනාතොට—වෙනුවට)

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணத்தோட்டை—சார்பாக)*

(Mr. M. P. de Zoysa Siriwardena—on behalf of Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)

අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පහත සඳහන් ගම්සභා සීමාවන් සඳහා සමගිදාය කයන් පත්කරන ලද්දේ කාගේ නිර්දේශයන් උඩද? (i) උතුරු බෝගොඩ. (ii) දකුණු බෝගොඩ. (iii) තල්දෙන. (iv) සොරණාතොට. (ආ) ඉහත කී ගම්සභා වලින් සමගිදායකයින් නම් කර එවා ඇති බව එතුමා දන්නවාද? (ඉ) එම යෝජනා වන් නොපිළිගැනෙන වෙනත් නම් ඉදිරි පත් කිරීම අයුක්ති සහගත බව එතුමා දන්නවාද? (ඊ) නැවත වරක් ගම්සභා වලින් කරනලද යෝජනා පිළිගෙන සමගි දායකයින් පත්කිරීමට එතුමා කටයුතු කර නවාද? (උ) නො එසේ නම්, ඒ මන්ද?

*நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) பின்வரும் கிராமச் சங்க எல்லைகளுக்காக இணக்கச்சபை உறுப்பினர்கள் எவரது சிபார்சின்படி நியமிக்கப்பட்டார்கள்? (i) போகொட வடக்கு; (ii) போகொட தெற்கு; (iii) தல்தென; (iv) சொரணத்தோட்டை. (ஆ) மேற்கூறிய கிராமச் சங்கங்கள் இணக்கச்சபை உறுப்பினர்களாக நியமனம் பெறத் தகுந்தவர்களின் பெயர்களை அனுப்பியிருப்பதை அவர் அறிவாரா? (இ) அப்பெயர்களை ஏற்றுக்கொள்ளாமல் வேறு உறுப்பினர்களை நியமிப்பது அநீதியென்பதையும் அவர் அறிவாரா? (ஈ) மீண்டும் ஒரு தடவை கிராமச் சங்கங்களின் சிபார்சை யேற்று இணக்கச்சபை உறுப்பினர்களை நியமிக்க அவர் நடவடிக்கை எடுப்பாரா? (உ) அன்றேல் ஏன்?*

asked the Parliamentary Secretary to the Minister of Justice: (*a*) On whose recommendations were members appointed to the conciliation boards of the following village areas: (1) Bogoda North; (2) Bogoda South; (3) Taldena; (4) Soranatota? (*b*) Is he aware that the Village Councils of these areas have recommended names of persons for appointment to the Conciliation Boards? (*c*) Is he aware that it is unjust to reject the names that have been recommended and appoint others instead? (*d*) Will he take action to appoint members of conciliation boards anew on the recommendations of the village councils? (*e*) If not, why?

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්—අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி — நீதிஅமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி சார்பாக)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs—on behalf of the Parliamentary Secretary to the Minister of Justice)

(අ) (i) උතුරු බෝගොඩ, (ii) දකුණු බෝගොඩ, (iii) තල්දෙන හා (iv) සොරණාතොට ගම්සභා සීමාවන් සඳහා සමගිදායකයින්ගේ සභාවන් පත්කොට නැත. (ආ) ඔව්. (ඉ) සඳහන් කරන ලද ප්‍රදේශවල සමගිදායකයින්ගේ සභා තවම පත්කොට නොමැත. (ඊ) සමගිදායකයින්ගේ සභාවන් පත් කිරීමේදී ඒ ඒ ප්‍රදේශ වල ගම්සභාවලින් කරනු ලබන නිර්දේශයන් උචිත පරිදි සලකා බලනු ඇත. (උ) පැන නොනගී.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

සමගි මණ්ඩල පත් කිරීමේදී මොන පක්ෂයේ වුණත් ප්‍රදේශයේ මන්ත්‍රී වරුන්ගේ අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශය කටයුතු කරනවාදැයි මා දැන ගන්ට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

මම ඒ අදහස ඇමතිතුමාට දැනුම් දෙන් නම්.

ටී. බී. තෙන්නකෝන් මයා. (දඹුල්ල)
(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)
(Mr. T. B. Tennekoon—Dambulla)

සමගි මණ්ඩලවලට ගරු ඇමතිතුමා විසින් සමහර ගම්සභාවල නියෝජිත මහතුන් පත් කොට තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ නොවන කිසිම ගම්සභා නියෝජිතයෙකු මේ තනතුරුවලට පත් කර නොමැති බව තමුන්නාන්සේ දන්නවාද?

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

මම දන්නෙ නැහැ.

ඩී. පී. ආර්. වීරසේකර මයා. (දෙහිඕවිට)
(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெஹியோவிற்ற)
(Mr. D. P. R. Weerasekera—Dehiowita)

දෙහිඕවිට ප්‍රදේශයේ සමගි මණ්ඩලවලට පත් කර සිටින 16 දෙනකු එක්සත් ජාතික පක්ෂයේ අය බව, කෙළින්ම පාර්ලිමේන්තු ලේකම්තුමා අත්සන් කර, මන්ත්‍රීවරයා වන මට එවූ ලියුමේ සඳහන් කර තිබෙන බව ඇමතිතුමා දන්නවාදැයි පාර්ලිමේන්තු ලේකම්තුමා මාර්ගයෙන් මා දැන ගන්ට සතුටුයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

That matter came up before and an answer was given.

වීරසේකර මයා.
(திரு. வீரசேக்கர)
(Mr. Weerasekera)

Sir, I am asking the question as I was not present.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The hon. Member cannot ask the same question over and over again.

වීරසේකර මයා.
(திரு. வீரசேக்கர)
(Mr. Weerasekera)

I was not here when it was answered.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Whether the hon. Member was here or not, it is in HANSARD, and he can read it there.

වීරසේකර මයා.
(திரு. வீரசேக்கர)
(Mr. Weerasekera)

Now that you have informed me of it, I accept it.

## බරවා රෝග මර්දන ව්‍යාපාරය : බෙහෙත් ඉසින සේවකයින්

## யானைக்கால் நோய்த்தடுப்பு இயக்கம் : மருந்து தெளிக்கும் ஊழியர்

## ANTI-FILARIASIS CAMPAIGN : EMPLOYEES ENGAGED IN SPRAYING

12. පර්සි වික්‍රමසිංහ මයා. (තුඩාවේ මයා. වෙනුවට)
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—திரு. துடாவ சார்பாக)
(Mr. Percy Wickremasinghe—on behalf of Mr. Tudawe)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) බරවා රෝග මර්දන ව්‍යාපාරය යටතේ බෙහෙත් ඉසීමේ යෙදී සිටින සේවකයන් ගෙන් බොහෝ දෙනෙකුගේ ශරීර සෞඛ්‍යය දුර්වල බව එතුමා දන්නවාද? (ආ) මෙම සේවකයන් වාර්ෂික වෛද්‍ය පරීක්ෂණයකට භාජන කිරීමට හා අවශ්‍ය ප්‍රතිකාර ලබාදීමට එතුමා පියවර ගන්නවාද? (ඉ) එසේ නම්, ඒ කවරදා සිටද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா : (அ) யானைக்கால் நோய்தடுப்பு இயக்கத்தின் கீழ் மருந்து தெளிக்கும் ஊழியர்களாகக் கடமை

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

யாற்றும் ஊழியர்களில் பெரும்பாலானோர் உடனலம் குன்றியவர்களாயிருப்பதை அவர் அறிவாரா? (ஆ) இவ்வூழியர்களை ஆண்டு தோறும் வைத்தியப்பரிசோதனை செய்யவும் தேவையான பிற மருத்துவ சிகிச்சைகளை அளிக்கவும் அவர் நடவடிக்கை எடுப்பாரா? (இ) அங்ஙனமாயின், எப்பொழுதிருந்து?

asked the Minister of Health: (*a*) Is he aware that many of the employees engaged in spraying insecticide under the Anti-Filariasis Campaign are of poor health? (*b*) Will he take action to subject these employees to an annual medical examination and to provide them with the necessary medical treatment? (c) If so, from when?

**විමලා කන්නන්ගර මිය.**

*(திருமதி விமலா கன்னங்கர)*

(Mrs. Wimala Kannangara)

(*a*) No. (*b*) No. It is not considered necessary. However, medical examinations and medical treatment are available free to those who desire them. (*c*) Does not arise.

## බරවා රෝග මර්දන ව්‍යාපාරය : ඕවර්සියර් වරුන්ට නිල ඇඳුම්

யானைக்கால் நோய்த்தடுப்பு இயக்கம் : மேற்பார்வையாளருக்கு உத்தியோக உடை

**ANTI-FILARIASIS CAMPAIGN : UNIFORMS FOR OVERSEERS**

13. **පර්සි වික්‍රමසිංහ මයා.** (තුඩාවේ මයා. වෙනුවට)

*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—திரு. துடாவ சார்பாக)*

(Mr. Percy Wickremasinghe—on behalf of Mr. Tudawe)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බරවා රෝග මර්දන ව්‍යාපාරයේ ඕවර්සියර් වරුන්ට නිල ඇඳුම් නොලැබෙන බව එතුමා දන්නවාද? (ආ) නිල ඇඳුම් කමිටුවේ නිර්දේශයන් අප්‍රමාදව ක්‍රියාත්මක කර මෙම සේවකයන්ට අංග සම්පූර්ණ නිල ඇඳුම් ලබාදීමට එතුමා ක්‍රියා කරනවාද? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) யானைக்கால் நோய் தடுப்புத்திட்டத்தில் சேவைசெய்யும் மேற்பார்வையாளர்களுக்கு உத்தியோக உடை வழங்கப்படாமலிருப்பதை அவர் அறிவாரா? (ஆ) உத்தியோக உடைக் குழுவின் சிபார்சுகளை உடனடியாக நடைமுறைப்படுத்தி இவ்வூழியர்களுக்கு முழுமையான உத்தியோக உடைகளை வழங்க அவர் நடவடிக்கை எடுப்பாரா? (இ) அன்றேல், ஏன்?

asked the Minister of Health: (*a*) Is he aware, that overseers employed under the Anti-Filariasis Campaign are not provided with uniforms? (*b*) Will he take action to implement without delay the recommendations of the Uniforms Committee and provide these employees with complete unoforms? (c) If not why?

**විමලා කන්නන්ගර මිය.**

*(திருமதி விமலா கன்னங்கர)*

(Mrs. Wimala Kannangara)

(අ) නැත. බරවා මර්දන ව්‍යාපාරයේ ඕවර්සියර්ගොල්ලන්ට මතු සඳහන් නිල ඇඳුම් සපයනු ලැබේ:—වර්ෂයක් පාසා (1) කොට කලිසන් දෙකකට කාකි ඩ්‍රිල් යාර 4ක්ද, (2) කමිස දෙකකට කාකි ට්විල් යාර 7 1/2ක්ද සමග උරහිස් පේරුස් යුවලක්. (ආ) හා (ඉ) නිල ඇඳුම් කමිටුවේ වාර්තාව පිළිගෙන ක්‍රියාත්මක කිරීමට මුදල් අමාත්‍යාංශය මෙතෙක් තීරණය කර නොමැතිය.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Question No. 14.

**ගරු වන්නිනායක**

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Waninayake)

I require two weeks' time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ශ්‍රී ලංකා සිනි සංයුක්ත මණ්ඩලයේ යාන්ත්‍රික ඉංජිනේරු

ஸ்ரீ லங்கா சீனிக் கூட்டுத்தாபனம் : இயந்திரப் பொறிஞர்

SRI LANKA SUGAR CORPORATION : MECHANICAL ENGINEER

15. ලෙස්ලි ගුණවර්ධන මයා. (ආචාර්ය එන්. එම්. පෙරේරා—යටියන්තොට—වෙනුවට)
(திரு. லெஸ்லி குணவர்தன—கலாநிதி என். எம். பெரோரா—யட்டியாந்தோட்டை—சார்பாக)
(Mr. Leslie Goonewardene—on behalf of Dr. N. M. Perera—Yatiyantota)

ඉඩම් වාරිමාර්ග සහ විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ශ්‍රී ලංකා සිනි සංයුක්ත මණ්ඩලයේ යාන්ත්‍රික ඉංජිනේරු තැන කවිද? (ආ) ඔහු පත් කරන ලද්දේ කවදාද? (ඉ) ඔහුගේ සුදුසුකම් මොනවාද? (ඊ) ඔහු සිටින්නේ කොළඹද? කන්තලේද? (උ) සුදුසුකම් ලබාගැනීම සඳහා සිනි සංයුක්ත මණ්ඩලයේ වියදමින් ඔහු එංගලන්තයට යැවීමට කිසියම් යෝජනාවක් තිබේද?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) ஸ்ரீ லங்கா சீனிக் கூட்டுத்தாபனத்தின் இயந்திரப் பொறிஞர் யார்? (ஆ) அவர் எப்பொழுது நியமிக்கப்பட்டார்? (இ) அவரது தகைமைகள் யாவை? (ஈ) அவர் கொழும்பிலா, கந்தளாயிலா தங்கியுள்ளார்? (உ) அவர் தகைமை பெறுவதற்கு அவரைச் சீனிக் கூட்டுத்தாபனக் கணக்கில் இங்கிலாந்திற்கு அனுப்பும் எண்ணம் ஏதாவது உண்டா?

asked the Minister of Land, Irrigation and Power: (*a*) Who is the Mechanical Engineer of the Sri Lanka Sugar Corporation? When was he appointed? (*c*) What are his qualifications? (*d*) Is he stationed at Colombo or Kantalai? (*e*) Is there any proposal to send him to England to qualifv on the Sugar Corporation account?

සෙනෙවිරත්න මයා.
(திரு. செனெவிரத்ன)
(Mr. Seneviratne)

(*a*) Mr. G. E. Proctor. (*b*) 1st January 1967. (*c*) B.E., A.M.I.C.E. (Lond.); A.M.I.E. (India); M.I.E. (Ceylon). Functioned as Chief Mechanical Engineer and Equipment Manager, G. O. D. B., and Chief Engineer Operations, Irrigation Mechanical Branch, prior to his appointment to the Sri Lanka Sugar Corporation. (*d*) In Colombo, as he has to look after both the factories at Kantalai and Hingurana. (*e*) No.

## නොපැමිණීමේ අවසරය: ඩී. එෆ්. හෙට්ටිආරච්චි මයා.

வராதிருக்க அனுமதி: திரு. டி. எப். ஹெற்றியாரச்சி

LEAVE OF ABSENCE : MR. D. F. HETTIARACHCHI

එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. எம். பீ. டி சொய்ஸா சிரிவர்தன)
(Mr. M. P. de Zoysa Siriwardena)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරමි:

"1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජ සභා ආඥාවේ 24(1) (ඊ) ඡේදය යටතේ නිවිතිගල මන්ත්‍රීවර ඩී. එෆ්. හෙට්ටිආරච්චි මහතාට 1967 නොවැම්බර් මස 4 වන දින සිට මාස 3 ක් තුළ මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතුය."

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

විසින් ස්ථිර කරන ලදී.

அனுவதித்தார்.

*seconded.*

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පණත්

*தனி அங்கத்தவர் மசோதா*

## Private Members' Bill

### WILDLIFE PROTECTION SOCIETY OF CEYLON (INCORPORATION) BILL

**වර්නන් ජොන්ක්ලස් මයා.** (පත්කරන ලද මන්ත්‍රී)

*(திரு. வி. ஜொங்கிளஸ்—நியமன அங்கத்தவர்)*

(Mr. V. Jonklaas—Appointed Member)

I move,

"That leave be granted to introduce a Bill to incorporate the Wildlife Protection Society of Ceylon."

The objects for the incorporation are, first to prevent the progressive destruction of species of wild animals and plants, and, wherever possible, to preserve wildlife intact in natural conditions in Ceylon, and secondly to promote an interest in the life histories of all forms of animal life and to co-operate with other societies and institutions which have similar aims and objects.

**ආර්. සිංගල්ටන්-සැමන් මයා.** (පත්කරන ලද මන්ත්‍රී)

*(திரு. ஆர். சிங்கல்டன்-சமன்—நியமன அங்கத்தவர்)*

(Mr. R. Singleton-Salmon—Appointed Member)

විසින් ස්ථිර කරන ලදී.

*அனுவதித்தார்.*

*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**කෙටුම්පත් පනත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.**

**වාර්තා කිරීම සඳහා 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ කෙටුම්පත් පනත රාජ්‍ය ඇමති වෙත පවරන ලදී.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*இதன்படி மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு அச்சிடப்படப் பணிக்கப்பட்டது.*

*மசோதா, நிலையற்கட்டளை இல. 51 (4) இன்படி இராஜாங்க அமைச்சருக்கு, அறிக்கை செய்யப் படுதற்காகச் சாட்டப்பட்டது.*



*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 51 (4), to the Minister of State for report.*

## විශ්ව විද්‍යාලවල තත්ත්වය පිළිබඳව ගරු අධ්‍යාපන හා සංස්කෘතික ඇමතිතුමාගේ ප්‍රකාශය

*பல்கலைக்கழக அந்தஸ்துபற்றி கல்வி, கலாசார விவகார அமைச்சரது அறிக்கை*

## Statement by the Minister of Education and Cultural Affairs re Status of Universities

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

The Minister of Education wishes to make a statement as he had given an undertaking to the Member for Colombo South (Mr. Bernard Soysa) yesterday.

අ. භා. 2.18

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල** (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)

*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

කථානායකතුමනි, ඊයේ සන්ධ්‍යා සමයේදී දකුණු කොළඹ ගරු සම මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) හා හබරාදූවේ ගරු මන්ත්‍රීතුමාත් (ප්‍රින්ස් ගුණසේකර මයා.) විසින්, විශ්ව විද්‍යාලයේ දැනට පවත්නා අරගලය පිළිබඳ තත්ත්වය සම්බන්ධයෙන් නගන ලද ප්‍රශ්න කීපයකට පිළිතුරු වශයෙනුත්, ඒ පිළිබඳව පෞද්ගලිකව මා ක්‍රියා කළ ආකාරය සම්බන්ධයෙනුත් මේ ගරු සභාවේ දැන ගැනීම සඳහා ඊයේ ප්‍රකාශයක් කරන්නට මට බැරි වුණත්, අද ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන බවට මා පොරොන්දු වුණා. ඒ පොරොන්දුව ඉෂ්ට කිරීමටයි, මා දැන් සූදානම් වන්නේ. එය දීර්ඝ කථාවක්. එහෙත් කථාව හැකි තරම් කෙටියෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

පළමුවෙන්ම මේ ගරු සභාවේ අවධානය 1965 ඔක්තෝබර් මාසය කෙරෙහි යොමු කරවන්නට කැමැතියි. මා අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් පත් වී මාස කීපයකට පසුව විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්නට සිදු වුණා. එසේ වුයේ, කළ යුතු පරිද්දෙන් නියම විධියට සංඛ්‍යා ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා, බලාපොරොත්තු නොවුණු තත්ත්වයක් උද්ගත වූ නිසායි. විශ්ව විද්‍යාලයීය අධ්‍යාපනය ලැබීම සඳහා 6,000 ක් පමණ සුදුසුකම් ලබා තිබුණත්, ඇති ඉඩකඩ අනුව ඇතුළත් කරගත හැක්කේ 3,000 ක් පමණක් බවට උප කුලපතිතුමා විසින් කරන ලද ප්‍රකාශය නිසා මට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්නට සිදු වුණා. ඇත්ත වශයෙන්ම තත්ත්වය එසේ නොවුණත්, 6,000 ක් ඇතුළත් කරගැනීමේ තත්ත්වයක් නොතිබුණත්, ඒ ප්‍රකාශය ප්‍රසිද්ධ වූවායින් පසුව ඊට ප්‍රතිකර්ම යෙදීම යුතු යැයි මා හිතුවා. වට පිට බැලූ නමුත් කොහේවත් ඉඩක් නැහැ. පේරාදෙණියේ විශ්ව විද්‍යාලයෙත් ඉඩක් නැහැ ; කොළඹ ශාඛාවෙත් ඉඩක් නැහැ. කළ යුතු ප්‍රතිකර්ම දෙකයි තිබුණේ. එකක් මොවුන්ට අධ්‍යාපනය ලබාගැනීමේ මාර්ග නැතිව යන පරිදි කටයුතු සැලැස්වීම ; එනම් ඉඩ නැති නිසා ඉඩක් නැහැ කියා ඉඩ තිබෙන ප්‍රමාණයට පමණක් ඇතුළත් කර ගැනීමයි. එහෙත් එවැනි පියවරක් ගැනීම හැදී වැඩී එන තරුණ ජනතාවගේ විපතට හේතුවක් බව මා කල්පනා කළා. ඔවුන් මා හමුවන්නට පැමිණ මගෙන් ඉල්ලීමක් කළා, කෙසේ හෝ ශබ්දවිකාශන යන්ත්‍ර මගින් හෝ අපට දේශනවලට ඇහුම්කන් දීමට පිළිවෙළක් සලසා දෙන්නය, එසේ සලසා දුනහොත් ඉඩ පාඩු පිළිබඳ ප්‍රශ්න කොහොම වුණත් කමක් නැත කියා. ඒ කෙසේ වෙතත් ඒ ආකාරයට අධ්‍යාපනික කටයුතු කරගන්න බැරි නිසා, එක්සත් ජාතික පක්ෂයේ බලවත් ආධාරකරුවන් වන තුරඟ තරඟ සමිතියේ පිට්ටනියවත් අරගෙන මේ අයට ඉඩ සලසා දිය යුතුය කියා මා අගමැතිතුමාට යෝජනා කළා. තුරඟ තරඟ සමාජයේ පිරිස එක්සත් ජාතික පක්ෂයට ඉතාමත් හිතවත් අය වුණේ වී නමුත්, අනාගත පරම්පරාවේ යහපත ගැන ඊට වඩා බැලිය යුතුය කී අගමැතිතුමා පැය 24ක් ඇතුළත ඒ පිට්ටනිය බලයෙන් අරගෙන තාවකාලිකව ඉඩ පාඩු සහ ඉඳුම් හිටුම් සලසා ශබ්ද විකාශන යන්ත්‍ර යොදවා මෙම 3,000 ටම අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථාව සැලසුවා. මෙතැනට පැමිණි 3,000, මා කලින් සඳහන් කළ පරිදි, ඇතුළත් වීමට නොහැකි වූ 3,000 ම නොවෙයි වෙන්න පුළුවන්. සමහර විට පේරාදෙණිය හා කොළඹ ඉඩ පාඩු තිබුණ තැන්වලට යා යුතු අයත් මේ අතරේ සිටින්නට ඇති. කෙසේ හෝ වැඩිපුර 3,000කට අධ්‍යාපන කටයුතු සැලසුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් මටත් චෝදනාවක් එල්ල වුණා අපේ ළමයින් අශ්ව විද්‍යාලයකට දමා අව් වැසි පිණි ආදියට භාජන කළාය කියා. එහෙත් මා කළ දේ කුමක්ද කියා මා දන්නවා.

යහපතක් කරන්නට ගොස් චෝදනාවක් ලැබුණත් කමක් නැත කියා ළමයින් වෙනුවෙන් මා ඉවසුවා. පසුව පුළුවන් තරම් දුරට අව් වැසි පිණි ආදියෙන් ඔවුන් ආරක්ෂා වන පරිදි කටයුතු සලස්වාගෙන ආවා. දැන් බලන විට ලංකා විශ්ව විද්‍යාලයේ පේරාදෙණිය අංශයෙත්, ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ අංශයෙත් ශිෂ්‍ය සංඛ්‍යාව සමාන තත්ත්වයකට පැමිණි අවස්ථාවක් වී තිබෙනවා.

මේ අතර විශ්ව විද්‍යාල පරිපාලනයේ දෙස් දුටු ජාතික ආණ්ඩුවට එය ප්‍රතිසංවිධානය කිරීම සඳහා උසස් අධ්‍යාපන පනතක් ඉදිරිපත් කරන්නට සිදු වුණ බව නමුන්නාන්සේත් මේ ගරු සභාවත් දන්නවා. එහි අඩුපාඩු තිබෙන්නට පුළුවන්. එහෙත් කොතෙක් අඩුපාඩු තිබුණත් කලින් තිබුණ පාලනයට වඩා ක්‍රමානුකූල පාලනයක් එයින් සකස් වන බව කල්පනා කර ඒ කාර්යය අප ඉෂ්ට කළා. විශ්ව විද්‍යාල තුනම—එවකට තිබුණේ විශ්ව විද්‍යාල තුනයි, එනම් ලංකා විශ්ව විද්‍යාලය, විද්‍යෝදය විශ්ව විද්‍යාලය සහ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය යන තුනම—එකම පාලන මණ්ඩලයකින් පාලනය වන පරිද්දෙන් සම තත්ත්වයකට ගෙනැවිත් එකම ඇතුළත් කර ගැනීමේ විභාගයකින් ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමට කටයුතු යෙදුවා. එහෙත් කොළඹ ශාඛාවේ ශිෂ්‍ය සංඛ්‍යාව විශාල බැවිනුත් සමහර මහාචාර්යවරුන් පේරාදෙනියේ සිට ඉහළ පහළ යා යුතු හෙයිනුත්, පරිපාලනය වෙනස් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ස්වාධීනව සකස් කරන්නට පුළුවන් වුණොත් හොඳය යන හැඟීම මට පමණක් නොව ජාතික උසස් අධ්‍යාපන මණ්ඩලයටත් ඇති වුණ හෙයිනුත් ජාතික උසස් අධ්‍යාපන මණ්ඩලයේ අනුශාසනය පරිදි එසේ කළ යුතුය කියා මා ජාතික ආණ්ඩුවට දන්වා සිටියා. ජාතික ආණ්ඩුවේ කැබිනට් මණ්ඩල යත් එය පිළිගත්තා. මේ පිළිබඳව නම් කිරීමේදී නොයෙක් නොයෙක් ආයතන මගින් කරන ලද යෝජනා කල්පනාවට ගෙන ජාතික උසස් අධ්‍යාපන මණ්ඩලය නම් දෙකක් ඉදිරිපත් කිරීමට මා වෙත එවා තිබුණා. මේ නම් දෙක ඒ වූ පරිද්දෙන්ම නොවුණත් හුඟක් දුරට සමාන වන පරිද් දෙන් මා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. කැබිනට් මණ්ඩලයේ තීරණය අනුව කිසියම් වෙනසක්ද කර ගරු සභාවට ඉදිරි පත් කරනු ලැබුවා.

මෙහිදී එක් කාරණයක් ගැන සඳහන් කළ යුතුයි. ලංකා විශ්ව විද්‍යාලය කියන නම ඒ වූ පරිද්දෙන්ම තිබිය යුතු බවත්, එම ආයතනය ආරම්භ කිරීමට ඉතා උනන් දුවෙන් ක්‍රියා කළ ඒ ජන නායකයින්— දැනට ඇතැමෙක් ජීවතුන් අතර නැහැ— තැබූ නම කිසිම විධියකින් වෙනස් කිරීම නුසුදුසුය යන හැඟීම අපේ ආණ්ඩුව තුළ තිබුණ නිසාත්, එය වෙනස් නොකිරීමේ තීරණය මා සම්පූර්ණයෙන්ම පිළිගත්තා. ඒ අනුව එකක් ලංකා විශ්ව විද්‍යාලය වශ යෙනුත්, අනික කොළඹ විශ්ව විද්‍යාලය යනුවෙනුත් විශ්ව විද්‍යාල දෙකක් වශ යෙන් සකස් කළා. මේ අනුව නම් දෙක කින් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා කැබිනට් මණ්ඩලයේ තීරණයෙන් පසු රෙගුලාසි ඉදිරිපත් කළා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව මගේ හිතේ හැටියට දකුණු කොළඹ මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) පමණක් ඒ පිළිබඳව යම් යම් විවේචන වගයක් ඒ අවස්ථාවේදී කළා. එසේ වුණත් ඡන්ද විමසන්නේ නැතුව එම නම් දෙක මෙම ගරු සභාව පිළිගත්තා. ඒ වූ පරිද්දෙන් රෙගුලාසි සකස් කර නීතියේ පරිද්දෙන් ගැසට් නිවේදනයක් නිකුත් කළා.

ඒ අවස්ථාවේදී ඒ ගැන කිසිවකුගේ බල වත් විරෝධතාවක් තිබුණේ නැහැ. අපේ රජයේ අදහස වූයේ ස්වාධීන විශ්ව විද්‍යාල දෙකක් බිහි කිරීමයි. එය ප්‍රසිද්ධ වීම හා කීර්තියට පත්වීම, එහි ඉගෙනීම අනුව හා අභ්‍යන්තර පරිපාලන ආදී කටයුතු අනුව අවුරුදු එකකින් හෝ දෙකකින් හෝ තුන කින් සිදුවිය යුත්තක්. මෙම විශ්ව විද්‍යාල අතර තරඟයක් ඇති කිරීමෙන් දියුණුව සැලසේය යන හැඟීම අප තුළ අවංකවම තිබුණා. ගරු කථානායකතුමනි, ඔක්තෝ බර් මස 4 වනදා කොළඹ විශ්ව විද්‍යාලය විවෘත වුණා. උප කුලපතිවරයකු වෙනම පත් කළා. අධිකාරි මණ්ඩලයක් පත් කළා. වෛද්‍ය ශිෂ්‍යයින් ඔක්තෝබර් 4 වනදා පටන් ඇතුළත් වී ඔවුන්ගේ අධ්‍යයන කට යුතු කර ගෙන ගියා. විරුද්ධතාවයේ රාව යක් තිබුණේම නැහැ. නමුත් යම්කිසි හේතුවක් නිසා, සමහර විට යම් යම් අය ගේ අදහස්වලට ඇහුම්කන් දීමෙන් හෝ කලක් ගතවීමෙන් පසුව තමන්ටම පෙනී යාමෙන් හෝ කොළඹ විශ්ව විද්‍යාලයට ලංකා විශ්ව විද්‍යාලයට වඩා පහත් තත්ත් වයක් ඇත යන හැඟීමක් ඔවුන් තුළ අවං කවම ඇති වුණා.

උසස් අධ්‍යාපන පනතට අනුව මෙම කිසිම විශ්ව විද්‍යාලයක් අනික් විශ්ව විද්‍යාලයකට වඩා එකිනෙකට උසස් නො වෙතත්, ලංකා විශ්ව විද්‍යාලය ලෝකයේ ප්‍රකටව පැවති විශ්ව විද්‍යාලයක් නිසා, කොළඹ විශ්ව විද්‍යාලයට ඇතුළත් වන ශිෂ්‍යයින් ලබාගන්නා උපාධි එක්තරා පහත් තත්ත්වයක ලා පිළිගැනීමක් ඇති වේය යන බව එම ශිෂ්‍යයින් මට ප්‍රකාශ කළා.

ඒකෙ ඇත්තක් තිබෙනවා වාගේ මටත් පෙනුනා.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
මාස කීයකට පසුවද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
පසුව වුවත් ඇත්ත පිළිගන්නවා නම් ඒ හොඳ ගුණයක් නොවැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

ජීවිතාන්තය දක්වා මා ඇත්ත පිළිගන්නට ලෑස්තියි. ඒ අවස්ථාවේදී මා ඒ ළමයින්ට කිව්වා "හොඳයි, මේක මගේම තීන්දුවක් නොවෙයි, මේක කැබිනට් මණ්ඩලය සමග සාකච්ඡා කර ගත් තීන්දුවක්, එම නිසා නැවතත් කැබිනට් මණ්ඩලය සමග සාකච්ඡා කර මේ ගැන තීන්දුවක් දෙන්නම්" කියා. "වැඩි කල් යන්නට ප්‍රථමයෙන්ම සතුටුදායක තීරණයක් ගන්නට මම උත්සාහ කරන්නම්" කියාත් මා කිව්වා. හැම අංශවලම ශිෂ්‍යයන් එක වරක් ආවා. වෛද්‍ය අංශයේ ශිෂ්‍යයන් වෙනමම වරක් ආවා. හරියටම කුමන අවස්ථාවලදී මා මේ වචන කීවාද කියා මට මතක නැහැ. ඊළඟට මුණ ගැසුණු අවස්ථාවේදී මා ඒ ශිෂ්‍යයනට මෙහෙම කිව්වා: "මට නවම තීරණයකට එළඹෙන්නට බැරි වුණා; අගමැතිතුමා මුණ ගැසෙන්නට බැරි වුණා; එහෙත් එක පොරොන්දුවක් මට දෙන්නට පුළුවනි; ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට ඇතුළු වූ අය—කොළඹ විශ්ව විද්‍යාලයට ඇතුළු වන අය නොවෙයි—ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ උපාධි නැතිව කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධි ලැබීම පාඩුවක්ය, හානියක්ය කියා කල්පනා කරනවා නම්, විශ්ව විද්‍යාල දෙක අතර සම්බන්ධතාව ඇති කර ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට ඇතුළු වූ කොළඹ ශාඛාවේ ශිෂ්‍යයන් ලබන උපාධි ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේම උපාධි බවට පත් කරන්නම්." උප කුලපතිවරුන් දෙදෙනාත් ස්ථිර ලේකම්වරයාත් උසස් අධ්‍යාපන මණ්ඩලයේ ලේකම්වරයාත් ගෙන්වා සාකච්ඡා කර මා එහෙම කිව්වා. පනත අනුවත් ඒක කරන්නට පුළුවනි. [බාධා කිරීමක්] බැරි වුණත් මිනිසා විසින් සකස් කළ නීතිය මිනිසාට වෙනස් කළ හැකියි. ඉතින් ඒ අවස්ථාවේදී ශිෂ්‍යයින් එයින් සතුටු වුණා. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය කොළඹ විශ්ව විද්‍යාලයට වඩා උසස්ය කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධි ලැබීමෙන් තමන්ට පාඩුවක් වෙනවාය කියා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට බැඳුණු අය කල්පනා කරනවා නම් ඔවුනට ඒ මුල් අයිතිවාසිකම ලැබිය යුතු බව මට පෙනී ගියා. ඒ අනුව මා ප්‍රකාශ කළ දේ ඒ විධියට ඉෂ්ට කරනවාය කියා කිව්වා.

ඔය අතර තුර, කලා අංශයේ ළමයින්ට මා වූ පොරොන්දුව, එනම් අගමැතිතුමා සමග සාකච්ඡා කර තීරණයක් ගැනීමේ පොරොන්දුව, මා සිතූ තරම් ඉක්මණට ඉෂ්ට කරන්නට පුළුවන් වුණේ නැහැ. ඉන්දිරා ගාන්ධි මැතිණිය ආවා. අගමැතිතුමා මැලේෂියාවට ගියා. බණ්ඩාරගම අතුරු මැතිවරණයත් තිබුණා. ඔය ආදී නොයෙක් කරුණු හේතුකොටගෙන මට බලාපොරොත්තු වූ තරම් ඉක්මණින් තීරණයක් ගන්නට නුපුළුවන් වුණා. මේ ශිෂ්‍යයනට පිටස්තර බලපෑම් තිබුණා ද කියා මා දන්නේ නැහැ. නමුත් පිටස්තර බලපෑම් තිබුණු බව රැස්වීමේදී පෙනුනා. ඊට පසුව පන්ති වර්ජනයක් කළා. පන්ති වර්ජනය කර විශ්ව විද්‍යාලයීය භූමියෙන් පෙරහැරක් ගෙන යන්නට පිළියෙළ කළා. ඒ අවස්ථාවේදී මා සිතන හැටියට විශ්ව විද්‍යාලයේ පරිපාලකයින් ඒ පෙරහැර නවතා දමුවා. පසුව පෙරහැරක් ගෙන යන්නට පොලීසියෙන් අවසර ලැබුණා. ඊට පසු පෙරහැරින් ගිහින් රැස්වීමක් පැවැත්වූවා. ඒ කාලය ඇතුළතදී මගේත් අනුදැනුම ඇතිව උප කුලපති හෝ වේවා අධිකාරී මණ්ඩලය හෝ වේවා—අත්දැකීම් තිබෙන නිසා—ශිෂ්‍යයනට විශ්ව විද්‍යාල භූමියට පැමිණීම තහනම් කළා.

රැස්වීම පැවැත්වූද රාත්‍රියේ මිදිගම උපරතන කියන ස්වාමීන්වහන්සේ මට දුරකථනයෙන් කථා කළා. විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය සංගමයක සභාපතිවරයකු වශයෙන් කලකට පෙර මා ඒ ස්වාමීන් වහන්සේ ගැන දැන සිටියා. එහෙත් ඒ ස්වාමීන් වහන්සේ බාහිර ශිෂ්‍යයකුද අභ්‍යන්තර ශිෂ්‍යයකුද යනාදී විස්තර කියන්නට මා දන්නේ නැහැ. මා එම ස්වාමීන් වහන්සේ හඳුනනවා. හෙට උදේ මුණගැසෙන්නට පුළුවන්දැයි මගෙන් ප්‍රශ්න කළා. ඕනෑම වෙලාවක මුණගැසෙන්නට පුළුවන් බව මා කීවා. ඊළඟට ඒ ස්වාමීන් වහන්සේත් වර්ජනය කර සිටින ශිෂ්‍යයන් කීප දෙනකුත් මා හමුවීමට පැමිණ විශ්ව විද්‍යාලීය ශිෂ්‍යයනට මා මුණගැසී සාකච්ඡා කරන්නට ඉඩ ලබා දිය හැකිදැයි ඇසුවා. මා නිතරම ලෑස්තියි, සාකච්ඡා කරන්නට. ඒ බව මා ප්‍රකාශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළා. ඔය අතරතුරේ විශ්ව විද්‍යාලයීය ගුරුවරුනුත් හමු වුණා. ඔවුන් සමගත් මා ඔය විධියටයි කරුණු කීවේ. ඔවුන්ද නොයෙකුත් යෝජනා ඉදිරිපත් කළා. මා ඒ උදවිය සමගත් ඔය අන්දමටයි කතා කළේ.

ගුරුවරුන්ගේ මැදිහත්වීමෙන් සහ යම් කිසි පරිබාහිර බලවේගයක් හදිසියේ ඇති වීමෙන් සිදු වූයේ කුමක්ද? ශිෂ්‍යයන්ට මා එදා කීවා, මා ඒ අය පිළිගන්නේ හැම අංශයකින්ම නිලධාරීන් පෙනී සිටිය හොත් පමණය කියා. එක් කොටසකින් හෝ කොටස් දෙකකින් පමණක් සහභාගි විය යුතු නැති බවයි මගේ අදහස වූයේ. ඒ උදවිය ඊට පොරොන්දු වුණා. ඊළඟට කවුදෝ හමු වී කරන ලද සාකච්ඡාවකින් පසු ගුරුවරුන්ගේ අනුදැනුම ඇතුව අද එන්නේ නැතැයි කියා විශ්ව විද්‍යාලයේ ලේකම්ට දන්වා තිබුණා. මා එය විශ්වාස කළේ නැහැ. ඒ වාගේ ම එය මිථ්‍යා කතාවක් වුණා. සේරම ළමයි ආවා. කලා අංශයේ සභාපති තමයි, මුළු සංගමයේම සභාපති, එම ශිෂ්‍යයාද ඇතුළත්ව හැම අංශයෙන්ම වගකිවයුතු නිලධාරීන් පැමිණ සිටියා. ඔවුන් සමග සාකච්ඡා කරද්දී මා පමණක් නොව මගේ ස්ථිර ලේකම්වරයාද සිටියා. ඒ ළමුන් සමග සාකච්ඡා කිරීමේදී මට පෙනී ගිය එක්තරා දෙයක් තිබෙනවා. එනම්, ඔවුන්ගේ කාරණය කොතෙක් දුරට සැබෑ හෝ නොසැබෑ වුවත් ඔවුන්ගේ අදහස් අවංක බවයි. ඔවුන් විසින් පළ කරන ලද අඩුපාඩු ඇත්ත බව හුඟක් දුරට පෙනී ගියා. එහෙත් නම පිළිබඳ තත්ත්වය ගැන මා කරුණු කීවා. "ලංකා විශ්ව විද්‍යාලය" යන නමින් දෙකක් තියන්නට බැරි බවට රජය තීරණය කළ නිසා මට ඒ නම ස්ථාන දෙකකට දෙන්නට බැරි බව කීවා. එහෙත් පාඩුව සිදු වුණේ පැරණි තත්ත්වයෙන් වෙනස් කිරීම නිසා නම් නැවත ඒ පැරණි තත්ත්වයට සර්වප්‍රකාරයෙන්ම විශ්ව විද්‍යාල පමුණුවන්නම්; හැබැයි, එය නීති ව්‍යවස්ථා වෙනස් කිරීමෙන් කළ යුතු දෙයක්, යනුවෙන් මා ප්‍රකාශ කළා.

තව දුරටත් සාකච්ඡා කළායින් පසු ඒ උදවියට මුහුණ පාන්නට සිදු වී තිබෙන වෙනත් හුඟක් අඩුපාඩුකම් ගැනත් කීවා. මා ඒ කරුණුවලටත් ඇහුම්කන් දුන්නා. එම අඩුපාඩුකම් පුළුවන් තරම් හොඳින් සකස් කර දෙන්නට බලන බව මා ප්‍රකාශ කළා. මුදල් ලබාගැනීමේ ක්‍රමත් පහසු විධියට පිළියෙල කරන්නට මා බලාපොරොත්තු වන බව කීවා. ඒ ළමයි මගේ කතාව අවංකවම පිළිගත්තා. මා හමුවීමට පැමිණි නියෝජිතයන් වශයෙන් ඔවුන් එම අදහස් පිළිගත්තත් සිය සාමාජිකයනට එම කරුණු ප්‍රකාශ කර ඔවුන්ගේ ඡන්දයෙන් අන්තිම තීරණයට බසින තුරු මුළු සංගමය වෙනුවෙන් පිළිගැනීමක් නොවෙයි, එතැනදී සිදු වුණේ. එම නිසා ඒ ගැන ඔවුන් සංගමයට ප්‍රකාශ කළ යුතු බව කීවා. හොඳයි, සංගමය කැඳවා අනතුරුව ඒ ගැන දන්වන්නැයි මා ප්‍රකාශ කළා.

මා මේ කියන සියලුම කරුණු ඇත්ත කරුණුයි. ඒ අතරතුර ගුරුවරුන් බලවත් සේ නැඟී සිට ශිෂ්‍යයන්ට නොයෙකුත් දේ කීමෙන් ශිෂ්‍යයන් ටිකක් කලබල වී නැවත වරක් මා හමු වන්නට ආවා. මායි පණිවුඩය යැව්වේ. ඒ අනුව සියලු දෙනාම රාත්‍රියේ ඇවිත් මා සමු වුණේ, මෙම ශිෂ්‍ය සංගමයේ රැස්වීම් තුන පටන් ගන්නට පෙරයි. මා ඔවුනට කරුණු පැහැදිලි කර දුන්නා.

එතැනදී සිදුවූ තවත් දෙයක් කියන්නට ඕනෑ. "දැන් තිබෙන අන්දමට පේරාදෙණියේ සිටින මහාචාර්යවරුන් මෙහාට එන්නයි මෙහේ සිටින මහාචාර්යවරුන් එහාට යන්නයි ගියාම කරදරයි; මහාචාර්යවරුන්, සම තත්ත්වයේ මහාචාර්යවරුන් අඩුපාඩු වූ මෙහි පිහිටි පීඨවලටත් පත් නොකළොත් තමන්ගේ ඉගෙනීම් කටයුතුවලට විශාල කරදරයක් සිදු වන්නට පුළුවනි" යනුවෙන් ඉදිරිපත් කරන ලද කාරණය ඇත්ත බව මට පෙනී ගියා. මා කීවා, සංඛ්‍යා ලේඛන අනුව සම මහාචාර්යවරුන් පත් කළ යුතු හැම අංශයකටම ඔවුන් පත් කිරීමට කටයුතු සලස්වන බව. ඉගෙනීමේ කටයුතුවලට කිසිම බාධාවක් ඇති නොවන අන්දමට පුළුවන් තරම් ඉක්මනින් මා කටයුතු කරනවාය කියා මා ඔවුනට කිව්වා. පාඩම් ඉගෙනීමට අවශ්‍ය ශාලා ආදිය මැජික්වලින් මෙන් කරන්නට බැරි වුණත් තිබෙන මුදල් ප්‍රමාණය අනුව ජාතික උසස් අධ්‍යාපන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

මණ්ඩලය මගින් හැකි තරම් ඉක්මනින් ඒවා සම්පූර්ණ කර දීමේ අවශ්‍යතාව මගේ කල්පනාවට භාජන වී ඇති බවත් මා ඔවුන්ට කිව්වා. අප කතා කළෙත් සුහදතාවයෙන්. ළමයින්ගේ අදහසුත් අවංක බව ඒ සාකච්ඡාවේදී මට පෙනී ගියා. ඒ නිසා ඔවුන් ඒ අවංක තීරණයේ පිහිටයි කියා මට සියයට සියයක්ම ඒත්තු ගියා. පසුවදා පැවැත්වූ රැස්වීමට විශේෂයෙන්ම වෛද්‍ය ශිෂ්‍යයනට ඇතුළත් වන්නට අවශ්‍ය බව වෛද්‍ය ශිෂ්‍යයන් කීප දෙනකු වෙන වෙනම පැමිණ මට කිව්වා. ඒ නිසා ඒ අන්දමට කටයුතු සිදු වේ යයි මා හිතුවා. එහෙත් පසුවදා රැස්වීම් දෙකක් තැබුවා. වෛද්‍ය ශිෂ්‍යයන්ගේ රැස්වීමට ගුරුවරුනුත් තුන් දෙනකු ගියා. මහාචාර්යවරයකු හා ඉහළ පෙළේ කථිකාචාර්යවරුන් දෙදෙනකු එම රැස්වීමට ගියා. සාමාන්‍යයෙන් එය නො කෙරෙන දෙයක්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
ඒ ආරාධනාවක් අනුව.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගියාට පසුව, එහෙම නොකියා වෙන මොනවා කියන්නද? ඇත්ත හදවතේ තිබෙන්නට ඕනෑ. එසේ නැතිව දේශපාලන වාසියකට හෝ උසාවියකදී නඩුව කීන් දිනීමට හෝ කරන තර්කයක් නො විය යුතුයි. මා දන්නවා, ශිෂ්‍යයන් රාත්‍රියේ මා හමු වී ආපසු ගියේ ඉගෙනීමේ කටයුතු කලින් තිබුණු තත්ත්වයට පත් වෙනවා යයි සතුටට පත් වෙලයි. මා එම ළමයිනට දොස් කියන්නේ නැහැ. ඔවුන් තම දෙමව්පියන්ගේ බලාපොරොත්තු අනුව ඉගෙනීමට පැමිණි අයයි. එහෙත් ගුරුවරුනට විරුද්ධව යන්නවත් ඔවුනට අමාරුයි. විභාගවල උත්තර පත්‍ර බලන්නේ ගුරුවරුන් නිසා එතැනදී තව්වු වුණොත් ඔක්කොම ඉවරයි. එහෙත් එඩිතර ශිෂ්‍යයිනුත් නැත්තේ නැහැ. කලා අංශයේ සභාපති එවැනි ළමයකු බව මා කියනවා. කිසිම ගුරුවරයකුට ආරාධනා කළේ නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා. (හබරාදූව)**
*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ)*
(Mr. Prins Gunesekera—Habaraduwa)
නිකම් දෙකොටසකට බෙදන්න එපා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තමුසේ කට වහගෙන ඉන්නවා මා කථා කරන තුරු.

ඊට පසුව කලා ශිෂ්‍ය සංගමයේ රැස්වීම තිබුණා. එතැනදී සභාපතිවරයා සාමාජිකයන් අමතන්නට ඇති. මා හමු වී බැසගත් තීරණය ඒ ළමයා විසින් අනික් ශිෂ්‍යයනටත් කියන්නට ඇති. කලින් පැවැති සාකච්ඡාවේදී මගේ සහකාර ලේකම්වරයාත් කලා පීඨයේ සභාපති හා ලේකම්වරයාත් අත්සන් කළ නිවේදනයකුත් නිකුත් කළා. එක පුවත් පතක හැර අනික් සෑම පුවත්පත්වලම එම නිවේදනය ඒ වූ පරිද්දෙන්ම පළ වුණේ නැහැ. මෙය ලංකා විශ්ව විද්‍යාලයේ ශාඛාවක් කරනවාට විරුද්ධයි කියා වෛද්‍ය ශිෂ්‍යයන්ගේ සංගමයේදී ගුරුවරුන් තුන් දෙනාගෙන් දෙදෙනකු කථා කළාය කියා මට පසුව ආරංචි වුණා. ඒ සමගම කලා පීඨය හා මහා ශිෂ්‍ය බල මණ්ඩලයේ සභාපතිගෙන් හා ලේකම්ගෙන් මට පසුවදා ලිපියක් ලැබුණා. මේ ගරු සභාවේ දැනගැනීම සඳහා මම ඒ ලිපියත් කියවන්නම්:

"එම්. ඩී. ජස්ටින්,
සභාපති, කලා පීඨය සහ මහා ශිෂ්‍ය බල මණ්ඩලය,
ලංකා විශ්ව විද්‍යාලය,
කොළඹ 3,
2.11.1967.

ගරු අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය,
කොළඹ.

30.10.67 වැනි දින ඔබතුමා සමග පැවැති සාකච්ඡාව සම්බන්ධවයි

මැතිතුමනි,

ඔබගේ ඉල්ලීම පරිදි එදා අප කළ සාකච්ඡාවේ තොරතුරු අපගේ සාමාජිකයින්ට 2.11.67 වැනි දින පැවැති මහා සභා රැස්වීමේදී ඉදිරිපත් කළෙමි. එමෙන්ම ඔබතුමා නිකුත් කළ පුවත්පත් නිවේදන යද කියවීමි. ඒ සම්බන්ධයෙන් පහත දැක්වෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෝජනා අප සංගමයේ සාමාජිකයන් විසින් ඒක මතිකව සම්මත කොට ඔබතුමා වෙත ඉදිරිපත් කරන ලෙස අප වෙත දන්වන ලදී.

1. ඔබතුමා අප විශ්ව විද්‍යාලය පෙර පරිදි සර්ව ප්‍රකාරයෙන්ම ශාඛාවක් බවට පත් කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නැති බැවින් එය හැකිතාක් ඉක්මනින් නීත්‍යානුකූල තත්ත්වයෙන් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු.

2. දැනට අප විශ්ව විද්‍යාලයේ කිසිම කරදරයක් හෝ කලබලයක් නැති බැවින් අපට විශ්ව විද්‍යාලයට ඇතුළු වීමට පනවා ඇති තහනම් නීතිය ඉවත් කර ගන්නා ලෙස ඉල්ලා සිටිමු.

3. දැනට නම් කර ඇති කොළඹ විශ්ව විද්‍යාලය පෙර තිබූ පරිද්දෙන් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ශාඛාවක් කරන්නේ නම් කොළඹ අංශය වසා තිබෙන තාක් පේරාදෙණි විශ්ව විද්‍යාලයද වසා තබන ලෙස ඉල්ලමු.

4. මේවා සම්බන්ධයෙන් අප සංගමය ඔබතුමාගෙන් පැහැදිලි පිළිතුරු බලාපොරොත්තු වන අතර වැඩි දුරටත් කරුණු ඉදිරිපත් කිරීම සඳහා ඔබතුමා හමු වීමට අවස්ථාව ඇතොත් අපි ඒ සඳහා ඕනෑ වේලාවක සූදානම්ව සිටිමු.

මෙයට,

පාලිත ගුරුසිංහ,
කලා පීඨයේ ගරු ලේකම්.

එම්. ඒ. ජස්වින්,
ගරු සභාපති. "

මේ ළමයින් දෙදෙනා මා හමු වී මේ සම්බන්ධව කථා කළාම මා කීවා, විශ්ව විද්‍යාලය කලින් තිබුණු තත්ත්වයට ගෙන ඒමෙන් හෝ වෙන යම්කිසි පිළිවෙළකින් හෝ සතුටුදායක තීරණයකට බසින්නට පසුගිය වාරයේදී කැබිනට් මණ්ඩලය මට සම්පූර්ණ බලතල පැවරුවාය, මා සාකච්ඡා කෙළේ ඒ උඩය, ළමයින් දැන් මේ තත්ත්වයට කැමති වුණු නිසා කැබිනට් මණ්ඩලයට දන්වා පිළිතුරක් දෙනවාය කියා.

ගරු සභාපතිතුමනි, විශ්ව විද්‍යාලයේ ළමයින්ගෙන් සියයට අනූවක් කලා පීඨයේ ළමයින්. නීති විද්‍යාලයේ ළමයින් සියළු දෙනාමත් ඇවිත් කීවා, තහනම ඉවත් කර, විශ්ව විද්‍යාලයට යන්නට ආරක්ෂක සංවිධාන සලස්වා දෙන්නය කියා. කලා අංශයේ ළමයිනුත් ඊයේ මා හමු වී ඔය විධියට කීවා. මා කැබිනට් මණ්ඩලයට තත්ත්වය දන්වූවා. මේ තීරණය ගැන කැබිනට් මණ්ඩලයේ විරුද්ධත්වයක් නැති බව මට දැන ගන්නට ලැබුණා. ඒ නිසා හෙට තහනම ඉවත් කරන බවත්, හෙට සිට විශ්ව විද්‍යාලයට එන්නට ළමයින්ට ඉඩ සලස්වා දෙන බවත් මා මේ ගරු සභාවේදී කියනවා. ඒ අතරතුර කුමක් කුමක් වේදැයි මට කියන්නට බැහැ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ගරු කථානායකතුමනි, මේ ප්‍රකාශය කරන්නට ප්‍රථම මා පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) සමග තමුන්නාන්සේ හමු වී මේ කරන ප්‍රකාශය සම්බන්ධව විවාදයක් කිරීමට විරුද්ධ පාර්ශ්වයට අවශ්‍ය බව දන්වා සිටියා. ඒ නිසා පුළුවන් තරම් ඉක්මනින් මේ ප්‍රකාශය ගැන විවාදයක් ඇති කිරීමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති හා සභානායක)**
*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*
(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

ඒ ඉල්ලීම ගැන සලකා බලනවා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

එහෙම කරන්නට බැහැ. ඇමතිතුමා කළ ප්‍රකාශය පිළිබඳව විවාද කරන්නට අපට ඉක්මනින්ම දිනයක් දෙන ලෙස අප ඉල්ලා සිටිනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

Let us have it as early as possible.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

What has the Government got to say about it ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I would suggest that we give the Opposition half an hour.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னட் சொய்஁லா)
(Mr. Bernard Soysa)

Half an hour is not enough.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

There is no provision in the Standing Orders of the House which enables a statement of this nature to be made. There is provision in the Standing Orders for the making of a personal explanation only. This is more than a personal explanation. I think the Opposition should be given an opportunity of debating this statement. I would suggest that it be done on the 6th instant from 2 P.M. to 4.30 P.M.

ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

There is a regulation before this House on which the debate has been adjourned. We can debate that.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

That is to be taken up tomorrow.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I do not know whether that would be taken up tomorrow. This matter must come before the Cabinet, be taken up at Cabinet level, and a date given for debate before a decision is made.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The Hon. Minister saw me in my Chambers just before 2 o'clock and told me that he wished to make a statement. I allowed him that indulgence. Once I have given him that indulgence I think it is nothing but fair for the Government to give the Opposition an opportunity of debating the statement.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

The Hon. Minister has made a statement. He said he will place the matter before the Cabinet. What the House wants to debate is not the Minister's statement but the Cabinet policy. As soon as a decision is made we will give Parliament time for debate.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னட் சொய்஁லா)
(Mr. Bernard Soysa)

No. A policy statement has been made by the Hon. Minister. We should have the opportunity of debating his statement.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

No, no ! The Hon. Minister said that he was replying to some statement made here and that the matter was coming up before the Cabinet. As soon as the Cabinet comes to a decision, we will certainly give an opportunity for debate.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

We cannot agree to that. If it is a Cabinet decision we will move a Vote of No Confidence. That is another

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

matter. We are not concerned with that. We are concerned only with the statement made by the Hon. Minister. As was quite correctly pointed out, this is not a personal explanation. It is a matter of Cabinet policy. Therefore we should have the opportunity to debate this statement.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I am sure the Hon. Minister of State will not mind giving them that opportunity tomorrow.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewadene)

We cannot do that tomorrow. What about this debate ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

If that were the position I would not have allowed the statement to be made. I told the Hon. Minister that when he came and saw me.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I only heard about it when that statement was made here.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

There was a statement made here yesterday and I had no time to reply to it ; I said that I would make a statement today.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Many things are said in the course of a debate and all those things are not carried out. But it was the duty of the Hon. Minister to have seen me in time so that I may make arrangements. Then I would have discussed the matter with the Government and other party leaders. Unfortunately, he came and saw me exactly at two minutes to two o'clock. So, I would request the Government to allow this debate ; otherwise, under Standing Order 133 I shall make my Order. Standing Order 133 reads :

> " Mr. Speaker shall have power to regulate the conduct of business in the House in all matters not provided for in Standing Orders. "

This is not a matter to quarrel over. After all, to allow 2½ hours on the 6th instant would not be too much after the Hon. Minister has taken over one hour of the time of this House in making his statement.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

Yesterday when they raised this matter you were not here, so I had no opportunity of speaking to you. I told the other side that I would make a statement today on the Floor of the House, and I have made that statement more or less in reply to theirs.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

නෑ ගරු කථානායකතුමනි, සිදුවුණේ ඒක නොවෙයි, ඊයේ ඒ අවස්ථාවේදී ඔබතුමා මෙහි සිටියේ නැහැ. මේ ගැන සාකච්ඡා කරන්නට අප අවස්ථාවක් ඉල්ලූ විට, ගරු අධ්‍යාපන ඇමතිතුමා අපට කියා සිටියේ එතුමා මෙය කැබිනට් මණ්ඩලය සමග සාකච්ඡා කොට අද ප්‍රකාශයක් කරන බවයි. අප ඉදිරිපත් කරන කරුණුත් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස අප ඒ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටියා. එවිට ගරු අධ්‍යාපන ඇමතිතුමා කිව්වේ, " නෑ, වුවමනා නැහැ ; හෙට මා ප්‍රකාශයක් කළායින් පසු මෙය විවාද කරන්නට පුළුවන් " කියායි. ගරු ඇමතිතුමා මෙය එක් වරක් දෙවරක් තුන් වරක් නොව දහ වරක් පමණ කිව්වා..

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

We cannot have a debate now.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னூட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Yesterday, the Hon. Minister said that he was going to make a statement irrespective of the question being raised at Adjournment. He said it was his intention to make a statement after the Cabinet meeting.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

What is there to debate ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

It is not a question of asking, what is there to debate. The point is that I would not have allowed this statement to be made if this was what was going to happen.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

It was more or less in reply to the statement made yesterday. You were not here.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Any statement or promise the Hon. Minister makes here is subject to what I have to say. As a matter of courtesy he should have seen me in time and enabled me to make the necessary arrangements. Since he has not done so, I am asking the co-operation of the Government. He could not have made that statement as of right. I allowed him that indulgence. I ask the Government to co-operate with me and allow the Opposition to have 2½ hours on the 6th instant.

ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. டீ. ஷெல்ற்றன் ஜயசிங்ஹ—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

Talk about what ?

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා. (දොම්පෙ)
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—தொம்பே)
(Mr. F. R. Dias Bandaranaike—Dompe)

About Punchihewa.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Does the Leader of the House agree ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I have to consult the Hon. Prime Minister.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

What is the use of a Leader of the House if he has to consult the Hon. Prime Minister on everything that takes place on the Floor of this House ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

May I ask the Leader of the House to consult the Hon. Prime Minister and inform this House at 4.30 P.M. ?

The Minister could not have made that statement as a matter of right. As a matter of indulgence I gave the Minister an opportunity to make a statement. It is nothing but fair that I should, therefore, give the Opposition an opportunity to discuss that statement.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, හතරහමාරෙන් පසු සමහරවිට රැස්වීමක් නැති වන්නට පුළුවනි. එම නිසා තමුන්නාන්සේ මේ ගැන දැන් නියෝගයක් දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I shall give the Government time till tomorrow morning, and if the Government does not come to any decision, I shall make my Order.

We shall now proceed with the business on the Order Paper.

## කුඹුරු පනත සංශෝධනය කිරීම
*நெற்காணிச் சட்டத்திற்குத் திருத்தம்*
PADDY LANDS ACT: AMENDMENT

**එස්. එම්. රාසමානික්කම් මයා.** (පද්දිරිප්පු)
*(திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு)*
(Mr. S. M. Rasamanickam—Paddiruppu)
**නැගී සිටියේ ය.**
*எழுந்தார்.*
*rose.*

**වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන** (අම්බලංගොඩ)
*(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன—அம்பலாங்கொடை)*
(Dr. M. H. Saddhasena—Ambalangoda)

I rise to a point of Order. These Motions are not in the order in which they have been submitted.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I am sorry. I have got to follow the Order Paper.

**අ. භා. 3**

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

*சபாநாயகர் அவர்களே, நான் பிரேரிக்க இருக்கும் இந்தப் பிரேரணை, இன்றுள்ள சூழ் நிலையில் மிகவும் முக்கியமான ஒரு பிரேரணை யாகக் கருதப்பட வேண்டும். இந்த நாட்டிலே உணவு உற்பத்தியை அதிகரிக்க வேண்டு மென்று அரசாங்கம் நடவடிக்கைகள் எடுத் துக் கொண்டிருக்கும் இந்தச் சந்தர்ப்பத்தில் இந்தப் பிரேரணை மிகவும் முக்கியமான இடத் தைப் பெறுகின்றது.*

"நெற்காணிச் சட்டத்தின் கீழ் உள்ள பயிர்ச் செய்கைக் குழுக்களில் பல செயலாற்றுமனும் செயற் றிறமையற்றும் ஊழல் மலிந்துள்ளனவாயும் அவற் றின் கீழுள்ள பயிர்ச்செய்கை வேலைகளைக் கட்டுப் படுத்தும் ஆற்றலற்று மிருப்பதனால் நிர்வாகச் சீர் கேட்டை ஏற்படுத்த வகை செய்கின்றனவாகையல்,

(i) அத்தகைய குழுக்களை இல்லாமற் செய்வதற்கும்,

(ii) அவ்விதமான திறமைக் குறைவுக்குக் காரண மாகவுள்ள உறுப்பினர்களை வெளியேற்று வதற்கும்

கமத்தொழில் சேவைகள் ஆணையாளருக்கு அதிகார மளிப்பதற்கு ஏதுவாயும், பயிர்ச்செய்கைக் குழுவின் அதிகாரங்களைப் பயிர்ச்செய்கை அத்தியட்சரிடமோ, ஆணையாளரினால் அங்கீகரிக்கப்படும் உத்தியோகத்தர் ஒருவரிடமோ, அவரால் நியமிக்கப்படும் சபையொன் றிடமோ கையளிப்பதற்கு ஏதுவாயும் நெற்காணிச் சட்டம் திருத்தப்பட வேண்டுமென இச்சபை கருது கிறது."

*இந்தப் பிரேரணையைப் பிரேரிக்கும் பொழுது நெற்காணிச் சட்டத்தை எந்த நோக்கத்திற்காக அரசாங்கம் இயற்றியதோ அந்த நோக்கத்திற்குப் பாதகமில்லாத முறை யில் நான் என்னுடைய ஆட்சேபனைகளைக் கூற விரும்புகிறேன்.*

*இலங்கையிலே குத்தகையாளர்களுக்கு, நெற்காணிகளைக் குத்தகைக்கு எடுத்துப் பயிர் செய்பவர்களுக்குப் போதிய பாதுகாவல் இல் லாததன் காரணமாக அவர்களுக்கு நிரந்தர மான பாதுகாவல் அளிப்பதற்காகவே நெற் காணிச் சட்டம் ஆக்கப்பட்டது. இச்சட்டத் தின் நோக்கங்கள் யாவும் புனிதமானவை எனக் கருதப்பட்டபோதிலும் இந்தச் சட்டத் தில் பல குறைகள் காணப்படுகின்றன. 1958 ஆம் ஆண்டிலே ஆக்கப்பட்ட இந்த நெற் காணிச் சட்டத்தில், இன்று காலத்திற்கும் இடத்திற்கும் சந்தர்ப்பத்திற்கும் ஏற்றவாறு*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කුඹුරු පනත සංශෝධනය කිරීම

[රාජමාණික්කම් මයා.]

பல மாற்றங்கள் செய்யப்பட வேண்டுமெனத் தோன்றுகின்றது. இம் மாற்றங்களைச் செய்யாவிடில் இந்த நாட்டிலே விவசாய உற்பத்தியும் முன்னேற்றமும் ஓரளவு சீர்கெடும் என்பதில் எந்தவிதமான ஐயமுமில்லை.

நெற்காணிச் சட்டத்திருத்தங்களையிட்டுக் குறிப்பிடும் அதே நேரத்தில் இந்த நெற்காணிச் சட்டத்தின் சிறந்த நோக்கங்களையோ அல்லது இதில் அடங்கியிருக்கும் கொள்கைகளையோ நான் எதிர்ப்பதாகக் கருதக்கூடாது. அடுத்ததாக, சொந்தக்காரரிடமிருந்து நெற்காணிகளைக் குத்தகையாகப் பெற்று வேளாண்மை செய்யும் குத்தகையாளர்க்குப் பாதகம் அளிக்கும் நோக்கத்துடன் எதையும் கூற நான் முன்வரவில்லை. இந்தச் சட்டத்தின் வெற்றி விவசாயக் குழுக்களின் திறமையிலே தான் தங்கியிருக்கின்றது. நாட்டிலே மக்களின் நிர்வாகத்துக்காக எவ்வாறு பாராளுமன்றம் இருக்கின்றதோ, ஸ்தல ஸ்தாபனங்களை நிர்வகிப்பதற்கு எவ்வாறு நகர சபைகள், பட்டண சபைகள், கிராம சபைகள் இருக்கின்றனவோ, அவ்வாறே இந்த நாட்டின் கிருஷிக நிலங்களுக்கு ஏற்ற நிர்வாகச் சட்டங்களை அமுல் நடத்துவதற்குக் கிராமங்கள் தோறும் சிறு சிறு பாராளுமன்றங்கள் போன்ற விவசாயக் குழுக்கள் இந்தச் சட்டத்தின் மூலம் அமைக்கப்பட்டிருக்கின்றன. விவசாயக் குழுக்கள் இயங்கும் தன்மையில்தான் விவசாய நிருவாகம் சீராக நடக்கும்; விவசாயிகளின் நாளாந்த தேவைகளுக்கு அது வசதியும் மதிப்பும் அளிக்குமென்பதை நான் சொல்லத் தேவையில்லை.

இச்சட்டத்தை ஆக்கும் பொழுது விவசாயக் குழுக்களுக்கு இச்சட்டத்திலே பல கடமைகள் கொடுக்கப்பட்டிருக்கின்றன. விவசாயக் குழுக்கள், அவ்வப்பகுதியிலேயுள்ள விவசாய நிலங்களை, சிறப்பாக நெற்காணிகளை நிருவாகம் செய்வதோடு சிறந்த முறையில் விவசாயம் செய்வதற்கு விவசாயிகள் கடன்களைப் பெறுவதற்கு, விவசாயத்திற்குரிய இயந்திர உபகரணங்களையும் அதற்கான பசளை முதலியவற்றையும் பெற்று இலகுவாக வேளாண்மையைச் செய்வதற்கும் உதவியாக இருப்பதற்காகவே நியமிக்கப்பட்டன. ஆனல், இன்று ஏறக்குறைய ஒன்பது ஆண்டுகளுக்குப் பின்பு விவசாயக் குழுக்களின் கடமைகளையும் அவற்றின் தன்மையையும் அவைகள் எவ்வாறு இயங்குகின்றன என்பதையும் பார்க்கும் பொழுது விவசாயக்குழுக்கள் அநேகமாகச் செயலற்று இருக்கும் நிலையையும், அவைகள் நேர்மையற்று, நிருவாக ஊழல் உள்ளவைகளாக நாட்டின் விவசாயிகளுக்குத் தகுந்த பாதுகாப்பு அளிக்காமல், கடமைகளைத் துரிதமாகச் செய்யாமல் இருக்கின்ற ஒரு நிலையையுமே நாம் காணக்கூடியதாக இருக்கிறது.

கிழக்கு மாகாணத்தை எடுத்துக்கொண்டால், அங்குள்ள விவசாயக்குழுக்கள் பல செயலற்றவைகளாக இருப்பது மாத்திரமன்றி அங்கத்தவர்கள் நியாயமான வகையில் தங்களுடைய கடமைகளைச் செய்யாத காரணத்தால் விவசாயக் குழுக்கள் எதிர்பார்த்தவாறு மக்களுக்குச் சேவை செய்யாமல் தவறியிருப்பதையும் காண்கிறோம். இந்த நெற்காணிச் சட்டத்தின்கீழ் விவசாயக் குழுக்களை ஏன் நாம் நியமித்தோமென்றல், விவசாயிகளின் ஜனநாயக ஸ்தாபனமாக அவை இருக்க வேண்டுமென்பதற்காகத்தான். சொந்த நிலம் உள்ளவர்களும், குத்தகை நிலமுள்ளவர்களுமான கமக்காரர்களின் பிரதிநிதித்துவம் இருக்கக்கூடிய வகையிலே இவ்விவசாயக் குழுக்கள் ஆக்கப் பட்டிருக்கின்றன. இவ் விவசாயக்குழுக்களிலே உள்ள அங்கத்தவர்கள் தெரிவுசெய்யப்பட்ட அங்கத்தவர்களாக இருக்கின்றார்கள். சில கடமைகள் மாத்திரமன்றி ஓரளவுக்குப் பல உத்தரவாதங்களும் இதில் இருக்கின்றன. இவை சரியான வகையில் இயங்காமல் விட்டால், விவசாய நிருவாகம் முன்னிருந்ததிலும் பார்க்கச் சீர்கேடான நிலைக்குப் போகுமென்பதைக் கூறிக்கொள்ள விரும்புகிறேன்.

கமச் செய்கை உத்தியோகத்தர்களின் பொறுப்பிலோ அல்லது கிருஷிக ஆணையாளரின் பொறுப்பிலோ அல்லது மாகாண அதிபரின் பொறுப்பிலோ விவசாயம் நடக்க வேண்டுமென்று நான் இங்கு கேட்கவில்லை. ஆனல், நல்ல முறையில் இயங்காத குழுக்களை கிருஷிக ஆணையாளர் நிறுத்தவோ அல்லது அக்குழுக்களில் இருக்கின்ற அங்கத்தவர்களை விலக்கவோ சட்டத்தில் வழிவகுக்க வேண்டுமென்றுதான் நான் கேட்கின்றேன். இப்பொழுது இருக்கின்ற நெற்காணிச் சட்டத்தில், செயலற்றிருக்கும் அல்லது நிருவாக ஒழுங்கற்றிருக்கும் அல்லது கடமைகளைப் பல வகைகளில் துரிதமாகச் செய்யாதிருக்கும் குழுக்களைக் கலைப்பதற்கு கிருஷிக ஆணையாள

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ருக்கு அதிகாரம் இருக்கின்றது. ஆனால், இந்த அதிகாரம் சரியான வகையில், துரிதமான வகையில் உபயோகிக்கப்படவில்லையென்பதைத்தான் நான் சுட்டிக்காட்ட விரும்புகிறேன். திறம்பட இயங்காத அல்லது செயலற்று, நேர்மையற்று இருக்கும் குழுக்களைக் கலைக்க இச்சட்டத்திலே ஆணையாளருக்கு அதிகாரம் இருந்த போதிலும், அந்த அதிகாரத்தை ஆணையாளர் தேவையான இடங்களில் தேவையான நேரங்களில் தகுந்த வகையில் பயன்படுத்தாமல் இருக்கின்ற காரணத்தால், விவசாயிகளின் நலன்கள் பாதிக்கப்படும் நிலை இன்று இந்த நாட்டில் ஏற்பட்டிருக்கிறது. எங்களுடைய பகுதியிலே உள்ள விவசாயக் குழுக்களில் பலவற்றைப் பார்த்தால் அவைகளில் அனேகமாக ஆசிரியர்களும், தங்களுடைய முழுநேரத்தையும் விவசாயத்திற்காக ஈடுபடுத்த முடியாதவர்களும், விவசாயத்தில் அக்கறை இல்லாதவர்களும் தான் இருக்கிறார்கள். இக் குழுக்களுக்குத் தெரிவு செய்யப்பட்டிருப்பவர்கள் கூட்டாக இயங்காத காரணத்தினால் தலைவரையோ அல்லது காரியதரிசியையோ சந்தித்துத் தங்களுடைய கடமைகளைச் செய்வதற்கு முடியாத நிலையில் விவசாயிகள் தத்தளிக்கிறார்கள். எத்தனையோ இடங்களில் வயல்கள் விதைப்புச் செய்யப்படாமலும், வரம்பு கட்டப்படாமலும், உரிய காலத்தில் பசளை இடப்படாமலும் இருக்கின்றன. நெற்காணிச் சட்டத்திலுள்ள வசதிகளைப் பெறுவதற்கு எத்தனையோ இடங்களில் இக்குழுக்களின் தலைவரையோ அல்லது காரியதரிசியையோ சந்திக்க முடியாமல் விவசாயிகள் தத்தளிக்கிறார்கள்.

விவசாயிகளிடமிருந்து கட்டணமாக அறவிடப்படும் பணம் இந்த விவசாயக் குழுக்களிடம்தான் இருந்து வருகின்றது. இந்தப் பணம் நல்லமுறையில் கணக்கு வைக்கப்பட வேண்டும். சரியான முறையில் இப்பணத்தைச் செலவிடாவிட்டால் விவசாயிகள் எதுவித பயனையும் பெறமுடியாது. அநேக இடங்களில் இப்பணம் துஷ்பிரயோகஞ் செய்யப்பட்டும் ஆணையாளரால் அது தண்டிக்கப்படாத நிலையில் இருந்து கொண்டிருக்கின்றது. நெற்காணிச் சட்டத்தின் 38 ஆவது "பி" பிரிவின்படி தகுதி இல்லாத விவசாயக் குழுக்களை நிறுத்தவோ அவைகளை இல்லாது ஒழிக்கவோ அதிகாரம் இருக்கின்றது.

I shall read Section 38B (1) of the Paddy Lands Act, No. 1, of 1958:

"If at any time the Commissioner is satisfied that there is sufficient proof of—

(*a*) wilful neglect, or misconduct in the performance, of the duties imposed by this Act, or

(*b*) persistent disobedience to or disregard of the directions, instructions or recommendations of the Commissioner, or

(*c*) incompetence or mismanagement, or

(*d*) abuse of the powers conferred by this Act, on the part of a Cultivation Committee he may, by order published in the *Gazette* dissolve such Committee.

இந்தச் சட்டத்திலே விவசாயக் குழுக்களை நிறுத்துவதற்கு ஆணையாளருக்கு அதிகாரம் இருந்தபோதிலும் தேவையான இடங்களில் அந்த அதிகாரம் ஆணையாளரால் உபயோகிக்கப்படாமல் இருப்பது விசனிக்கத்தக்கது. ஆகவே, கௌரவ அமைச்சர் அவர்களுக்கு நான் சுட்டிக்காட்டுவது என்னவென்றால், எங்கு விவசாயக் குழுக்கள் நிர்வாகச் சீர்கேட்டால், நேர்மையற்ற காரணங்களால் சரியான முறையில் இயங்கவில்லையோ அத்தகை இடங்களில் அவைகளை ஒரு விசேட அதிகாரி மூலம் நிர்வகிக்க வழிவகுத்தால் இந்த நாட்டில் சாதாரண விவசாயிகளின் நலனுக்குப் பாதுகாப்பு ஏற்படுமென்பதையே. எனவே, இந்த விடயத்தை நான் மிகவும் வலியுறுத்தி அமைச்சர் அவர்கள் இது விடயத்தில் நடவடிக்கைகள் எடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன்.

அடுத்ததாக, விவசாயக் குழுக்களில் திறமையான அங்கத்தவர்கள் இருந்தபோதிலும் கூட பல இடங்களில் நேர்மையற்ற அல்லது தகுதியற்றவர்கள் காணப்படுகிறார்கள். தங்களுடைய சுயநலத்திற்காக நிர்வாகக் குழுவை வழிநடத்தும் தலைவர், காரியதரிசி போன்றவர்களை விலக்கி அந்தக்குழுவை வழி நடத்தத்தக்க அதிகாரமும் ஆணையாளருக்கு இருக்க வேண்டும். இதற்கு நேரடியான சட்டம் இந்த நெற்காணிச் சட்டத்தில் காணப்படவில்லை. ஒரு தலைவரை, காரியதரிசியை அல்லது பொக்கிஷதாரரை அந்தச் சபையிலிருந்து வெளிப்படுத்த வேண்டுமானால் ஒரு நம்பிக்கையில்லாத் தீர்மானத்தின் மூலம் அவர்களை வெளியேற்ற முடியாத நிலை இன்று

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කුඹුරු පනත සංශෝධනය කිරීම

[රාසමානික්කම් මයා.]

இருக்கிறது. அவர்களை வெளியேற்றுவதானால் விவசாயிகள்—வாக்காளர்களாகிய விவசாயிகள்—ஆணையாளருக்கு மனுச்செய்ய, அவர் தமக்குள்ள விசேட அதிகாரத்தைக் கொண்டு அவர்களை விலக்க வேண்டிய நிலை இன்று இருக்கிறது. இத்தகைய சட்டங்கள் இல்லாதபடியால் விவசாயக் குழுக்கள் நன்றாக இயங்காத இடங்களில் அவர்களை வெளியேற்ற பல ஆண்டுகள் செல்கின்றன. துரிதமாக அவர்களை வெளியேற்ற முடியாமல் இருக்கிறது. இதனால் விவசாய நிர்வாகம் சீர்கெட்டிருப்பதைக் காண்கிறோம். இந்த நிலையை மாற்றி, உணவு உற்பத்தியைப் பெருக்க வேண்டுமென்று கங்கணம் கட்டிக் கொண்டிருக்கும் இந்த நேரத்தில், விவசாயிகளுக்குத் தேவையான விவசாய நிர்வாகத்தைச் சீர்ப்படுத்திக் கொடுக்க வேண்டும். விவசாயக்குழுவினால் விவசாயிகள் இடைஞ்சலை அனுபவிக்கக் கூடிய நிலை இருந்தால், அல்லது குழு அங்கத்தவர்கள் தங்களுடைய சேவையைத் திறம்படச் செய்யாமல் இருந்தால், எமது முக்கிய நோக்கமாகிய விவசாய அபிவிருத்தி, உணவுப் பெருக்கம் ஆகியவற்றை அடைய முடியாது. ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் இவ்விஷயத்தில் துரிதமான நடவடிக்கைகளை எடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன்.

இந்தச் சட்டத்தின் அச்சாணியாக இருப்பது விவசாயக் குழுவே. விவசாயக் குழு திறம்படச் செயற்படாமல் இருந்தால் இந்தச் சட்டம் செயற்படக் கூடிய நிலை இல்லை. ஆகையால், இந்தச் சட்டத்தில் இருக்கும் பல குறைபாடுகளையும் விரைவில் திருத்தவேண்டியது கௌரவ அமைச்சரவர்களுடைய கடமையாகும் என்பதை இந்தச் சந்தர்ப்பத்திலே சுட்டிக்காட்ட விரும்புகிறேன்.

சபாநாயகரவர்களே, இன்னும் ஒரு பிரதான விஷயத்தைக் கூறி என்னுடைய பேச்சை முடித்துக்கொள்ளுகிறேன். இந்தச் சட்டத்தை, நெற்காணிச் சொந்தக் காரர்களிடமிருந்து நெற்காணிகளை குத்தகைக்கு பெற்று வேளாண்மை செய்பவர்களுக்கு நிரந்தர பாதுகாப்பு அளிக்கும் சட்டமாக நாம் கருதுகிறோம். உண்மையில் இந்தச் சட்டம் இந்த நாட்டின் விவசாயிகளுக்கு முதுகெலும்பாக இருக்க வேண்டும் என்பதே என்னுடைய கருத்து. குத்தகைக்காரர்களுக்கு நிரந்தர பாதுகாப்பு அளிக்கும் பொழுது நிலச் சொந்தக்காரர்களுடைய நிலைமையை இந்தச் சட்டம் மறக்கக் கூடாது. நான் நிலச் சொந்தக்காரர்களுக்காகப் பேசவில்லை. ஆனால், குத்தகைக்காரர்களுக்கு இந்தச் சட்டம் பாதுகாப்பு அளிக்கும் பொழுது நிலச் சொந்தக்காரர்களது உரிமைகளையும் இந்தச் சட்டம் ஓரளவு பாதுகாக்க வேண்டும் என்று வற்புறுத்திக் கூற விரும்புகிறேன். குத்தகைக்காரர்கள் இன்று இந்தச் சட்டத்தின் பாதுகாப்பில் விவசாய நிலங்களைக் கைப்பற்றியிருக்கிறார்கள். ஆனால் அதே நேரத்தில் கைப்பற்றிய நிலத்தின் சொந்தக்காரர்களுக்கு தங்களுடைய கடமைகளைச் செய்ததாகத் தெரியவில்லை. இதற்கான பாதுகாப்பைச் சட்டம் அளிக்காமல் இருப்பது பெரும் குறையை ஏற்படுத்தியிருக்கிறது என்று கூற விரும்புகிறேன். விவசாயிகளுக்கு, குத்தகைக்காரர்களுக்கு பாதுகாப்பு அளிக்கும் அதே நேரத்தில் நிலச் சொந்தக்காரர்களுக்கும் ஓரளவு பாதுகாப்பு அளிக்க வேண்டும். இந்தச் சட்டத்தின் 25 ஆவது விதியின் முதலாவது ஷரத்து, குத்தகைகள் கொடுப்பதைப் பற்றியது :

"25 (1) The rent in respect of any extent of paddy land shall be paid by the tenant cultivator of such extent to the landlord of such extent or to his authorised agent either directly or through the Cultivation Committee within whose local jurisdiction such extent wholly or mainly lies."

அதே நேரத்தில் 28 ஆவது ஷரத்து பின்வரும் நிபந்தனையை விதிக்கின்றது :

"28. Where any sum is due from the tenant cultivator of an extent of paddy land to his landlord as rent in arrear or interest on such rent or both, the landlord may, with the prior written sanction of the Commissioner, apply——

(a) if such sum does not exceed one hundred rupees, to the Rural Court having jurisdiction over the place where such tenant cultivator resides or such extent is situate or, where there is no Rural Court having jurisdiction over such place, to the Court of Requests having jurisdiction over such place, or

(b) if such sum exceeds one hundred rupees but does not exceed seven hundred and fifty rupees, to the Court of Requests having jurisdiction over such place, or

(c) if such sum exceeds seven hundred and fifty rupees, to the District Court having jurisdiction over such place,"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කුඹුරු පනත සංශෝධනය කිරීම

சபாநாயகர் அவர்களே, ஒரு குத்தகைக் காரன் நெற்காணிச் சொந்தக்காரன் ஒருவனிடமிருந்து பெற்ற பூமியை விளைப்பதற்கு ஓர் ஏக்கருக்கு பதினைந்து புசலோ, அல்லது விளைச்சலில் இருபத்தைந்து சதவீதமோ, எது குறைவாக இருக்கிறதோ அதனைக் குத்தகையாகக் கொடுக்கவேண்டுமென்பது நெற்காணிச் சட்டத்தில் விதிக்கப்பட்டிருக்கின்றது. அதே நேரத்தில் குத்தகைக் காரன் குத்தகையைக் கொடுக்காதிருந்தால் அதனை அறவிடுவதற்கு ஆணையாளரின் உத்தரவோடு கிராமக் கோட்டிலோ, Court of Requests, அல்லது District Court இலோ வழக்குத் தொடர்ந்து, குத்தகையை அறவிட்டுக்கொள்ளலாம் என்று இருக்கின்றது. சில வேளைகளில் இந்த வழக்குகள் இரண்டு, மூன்று வருடங்களுக்கு நடக்கக்கூடியனவாக இருக்கும். ஆகவே, நிலத்தைக் குத்தகைக் காரனுக்குக் கொடுத்த நிலச்சொந்தக்காரன் வருடாந்தக் குத்தகையைப் பெற்றுக்கொள்ள முடியாத நிலையில் தத்தளிக்கிறுன். அந்தக் குத்தகையை நிலச்சொந்தக் காரனுக்குக் கொடுக்காமலிருந்தால் அதனை அறவிட வழியில்லாது அவன் தத்தளிக்கிறுன். வழக்குத் தொடர்ந்து குத்தகையை அறவிடலாமேயொழிய, குத்தகையைக் கொடுக்காத காரணத்துக்காக நிலத்தைப் பறிமுதல் செய்ய முடியாது. எத்தனை யாண்டுகளாகக் குத்தகையைக் கொடுக்காதிருந்தாலும் வழக்குத் தொடரவேண்டுமேயொழிய, வேறு வழிகளில் குத்தகையை அறவிட்டுக்கொள்ளும் வழியை இந்தச் சட்டம் சிறந்த முறையில் வகுக்கவில்லை. ஆகவே, நிலச் சொந்தக்காரன் குத்தகைக் காரனுக்கு நிரந்தரமாக நிலத்தைக் குத்தகைக்குக் கொடுத்திருந்தால் அந்தக் குத்தகையை மீட்க முடியாது. அவனுடைய பிள்ளை குட்டிக் காரர்களும் தொடர்ந்து அதனை அனுபவித்துக்கொண்டிருக்கலாம். எனவே, வருடந்தோறும் குத்தகையைப் பெற ஒரு நியாயமான கோட்பாடு இந்தச் சட்டத்தில் விதிக்கப்படல் வேண்டுமென நான் கேட்டுக்கொள்ள விரும்புகிறேன். அவ்விதம் விதிக்கப்படாது போனுல், குத்தகைக் காரனுக்கு அது சாதகமாக அமையுமேயொழிய நிலச் சொந்தக் காரனுக்கு எந்தவித அனுசரனையையும் கொடுக்காது.

ஒரு குத்தகைக் காரனுடைய நிலம் குத்தகையிலிருந்து சொந்தக்காரனுக்கு மீட்கப்படுதற்கு இந்தச்சட்டத்தில் இருக்கும் நியதிகளுள் ஒன்ருக, நிலச் சொந்தக்காரனுக்குக் குத்தகையைக் கொடுக்காமலிருக்கும் குத்தகைக்காரர்களின் நிலக்குத்தகை நிராகரிக்கப் படுவதற்கான விதியும் இந்தச் சட்டத்தில் இருந்தால், நிச்சயமாக வருடந்தோறும் குத்தகையைக் குத்தகைக்காரன் கொடுத்து வருவான். அப்படியான ஒரு திட்டவட்டமான ஷரத்து—ஒரு penal clause— நெற்காணிச் சட்டத்திலே அமைக்கப்படாதிருந்தால் காணிச் சொந்தக்காரர் தங்களுடைய காணிகளைக் குத்தகைக்காரருக்குக் கொடுத்தும் அதனுல் எந்த விதமான வருமானத்தையோ, நன்மையையோ பெற முடியாத நிலையில் தான் இருப்பார்கள். ஆகவே, இந்த நிலையை உடனடியாக மாற்றியமைத்தாலே யொழிய, இந்த நெற்காணிச் சட்டம் பிரயோசனம் அளிக்கக் கூடியதாக இருக்க முடியாது.

நான் இப்பொழுது குறிப்பிட்டவற்றை இந்தச் சபையிலே யாராவது பிற்போக்கான அபிப்பிராயம் எனக் கருதக்கூடாது. இந்த நெற்காணிச் சட்டம் மிகவும் முற்போக்கானது. முற்போக்கான இந்த நெற்காணிச் சட்டத்தில் சில விதிகளைத் திருத்தவேண்டுமென்றுதான் நான் கூறுகிறேன். நெற்காணிச் சட்டத்தின் கீழ், பயிர்ச் செய்கைக் குழுக்கள் அல்லது விவசாயக் குழுக்கள் தகுதியற்றனவாகவும் செயல் திறனற்றனவாகவும் இருந்தால், அவைகளை உடனடியாக நிறுத்த வேண்டும். அவைகளிலேயுள்ள அங்கத்தவர்கள் திறம்படச் செயலாற்ருவிட்டால், அல்லது அதன் தலைவரோ, பொக்கிஷதாரரோ காரியதரிசியோ இக் குழுக்களைத் தங்கள் சொந்த நலனுக்காக உபயோகித்தார்கள் என்று நிரூபிக்கப்பட்டால், அக்குழுக்களை விலக்கி மீண்டும் அமைக்கவோ, அல்லது அங்கத்தவர்களை விலக்கவோ ஆணையாளர்களுக்கு அல்லது அப்பகுதியிலுள்ள விவசாயிகளுக்கு உரிமை அளிக்கப்பட வேண்டும்.

நெற்காணிச் சட்டம் குத்தகைக்காரர்களுக்கு எவ்வாறு பாதுகாப்பளிக்கின்றதோ அதே போன்று நிலச் சொந்தக்காரர்களுக்கும் நியாயமான அளவு பாதுகாப்பளிக்கக் கூடியதாக இருக்கவேண்டும். நெற்காணிச் சட்டத்தில், குறிப்பிட்ட காணிக் குத்தகைகளை அவர்கள் வருடந்தோறும் பெறக்கூடியதாக ஒரு நிலையிருக்கவேண்டும். அந்தக் குத்தகை நிலச் சொந்தக்காரர்களுக்குத்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජමාණික්කම් මයා.]

தொடர்ந்து கிடைக்காமல் இருந்தால், அல்லது அதனைப் பெறுவதற்கு வழக்காடுகின்ற ஒரு நிலையிருந்தால், நிலச்சொந்தக்காரர்களுக்கு எந்தவிதமான பாதுகாப்பும் அளிக்கப்படுவதாக இருக்காது. ஆகவேதான், உரிய முறையில், குத்தகையைச் சொந்தக் காரனுக்குக் கொடுக்காத குத்தகைக்காரனை விலக்கவோ தண்டிக்கவோ நியாயமான அளவு அதிகாரம் இருக்கவேண்டுமென்று நான் கூற விரும்புகிறேன்.

**එම්. අබ්දුල් බකීර් මාකර් මයා.** (බේරුවල)

*(ஜனாப் எம். அப்துல் பாக்கிர் மாக்கார்—வேருவலை)*

(Mr. M. Abdul Bakeer Markar—Beruwala)

**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*

*seconded.*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**ෂෙල්ටන් ජයසිංහ මයා.**

*(திரு. ஷெல்றறன் ஜயசிங்ஹ)*

(Mr. Shelton Jayasinghe)

As you know, this is one of the most progressive pieces of legislation of recent times. The original Act, which was passed in 1958, has been subjected to a number of amendments. I believe about four amendments were made, namely, in 1958, 1961, 1962 and 1964. The Proposer of this Motion today—[*Interruption*]. What did you say ?

**විජයසුන්දර මයා.**

*(திரு. விஜயசுந்தர)*

(Mr. Wijesundara)

They are people who opposed the nationalization of the Trincomalee Harbour.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**

*(திரு. ஷெல்றறன் ஜயசிங்ஹ)*

(Mr. Shelton Jayasinghe)

We are talking about paddy and not about the harbour.

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.**

*(திரு. எம். பீ. டி சொய்ஸா சிறிவர்தன)*

(Mr. M. P. de Zoysa Siriwardena)

Your Throne Speech said something else.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**

*(திரு. ஷெல்றறன் ஜயசிங்ஹ)*

(Mr. Shelton Jayasinghe)

We are talking about paddy and not about the harbour or the Throne Speech.—[*Interruption*].

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Do not take notice of interruptions. Please carry on.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**

*(திரு. ஷெல்றறன் ஜயசிங்ஹ)*

(Mr. Shelton Jayasinghe)

The amendments—[*Interruption*]. What did you say ? I will deal with you outside the House if you like. I will deal with you outside and also here. Why do you want to interrupt ? There is no point in interrupting.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, මෙහි තේරුම මොකක්ද ? අපට වාඩිවී ඉන්නට දෙන්නේ නැද්ද ? අඩියක් ගහලා නම් නිකම් ඉන්න බැරිද ? අපි පළිද ?

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Please withdraw that.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

කරුණා කර මට කළ චෝදනාව අස් කර ගත්තැයි පාර්ලිමේන්තු ලේකම්තුමාට කියන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

මොකක්ද චෝදනාව ? පොරොන්දුවක් දුන්නා විතරයි. මේ ගරු සභාවෙන් පිටතදී මම තමුසේ හම්බ වෙන්නම්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

සභා ගර්භයෙන් පිටතදී හම්බ වෙන්නේ මොනවටද ?

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

මම පෙන්වන්නම්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

වුවමනා නම් එහෙම හම්බ වෙන්නට අපත් ලෑස්තියි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා කරුණා කර වාඩි වෙන්න.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Harath)

මම තමුන්නාන්සේට අවනත වෙන්නම්.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

As I said, this is one of the most progressive pieces of legislation of recent times and there have been several amendments made to this Act.

I remember the originator of this Act, when he presented it in Parliament at that stage, said that this was not a full-fledged piece of legislation and that there will have to be amendments as we go along, particularly because in his own mind this Act or the Bill that he was presenting at that stage did not encompass the whole situation as visualized by him as Minister of Agriculture.

The purpose was twofold : one was to redress the grievance of long years, of almost slavery, of the peasant cultivator ; the second was an organized and methodical increase of production. This twofold purpose the Hon. Minister at that time attempted to successfully complete through the Bill he presented to the House. As it went along, as I mentioned to you, there came several amendments—I think about four or five of them. I stand subject to correction on that.

The Proposer of the Motion before us today seeks an amendment to Section 25, under which, he says, the owner is subject to unduly harsh treatment ; the owner has no chance or right of regaining the land and if a penalty is effected the owner has no chance of redeeming that penalty. I am sorry that the Mover of the Motion completely lost sight of the Act itself.

What did the Act provide ? The Act sought to remedy an omission of the owner, an owner who had neglected his land, an owner who had neglected his cultivation, an owner who had neglected his cultivator. It was to remedy this that the Act was brought. If you would read Section 25 carefully, what does it say ? I should like to read Section 25 with your permission :

"(2). Where there are two or more landlords of an extent of paddy land, they shall appoint a person for the purpose of collecting the rent from the tenant cultivator of such extent and shall in writing notify the name and address of the person appointed for such purpose to the Cultivation Committee within whose local jurisdiction such extent wholly or mainly lies, and, if no such appointment is made, such rent shall be paid, directly or through such Committee to the person if any, who customarily collects such rent for such landlords. If there is no person entitled to collect such rent or if there is any dispute as to the proportion in whch such rent should be paid to such landlords or as to the person to whom such rent should be paid,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ෂෙල්ටන් ජයසිංහ මයා.]

such rent computed in money in accordance with the provisions of paragraph (b) of subsection (7) of section 22 shall be paid by such tenant cultivator to such Committee and such Committee shall pay such amount less any expenses incurred by such Committee in handling such rent to the District Court or Court of Requests within whose local jurisdiction such extent wholly or mainly lies, according . . "

This is the important portion of it, which the hon. Mover was contesting—

" . . . .according as such amount exceed or does not exceed seven hundred and fifty rupees to be drawn by the person or persons entitled thereto. Where such amount or any portion thereof is not drawn by the person or person entitled thereto within one year. . . "

May I stress that, Sir ?—

". . . .within one year after the date on which such sum was paid to such Court, such Court shall cause such sum to be paid into the Paddy Lands Fund and no person thereafter shall be entitled to demand or receive such amount or the rent which such amount represents. "

The hon. Mover says, " The landlord has lost his rights. If he has paid Rs. 750, that Rs. 750 cannot be recovered by him or by his children, " and so forth.

I again request the hon. Mover of the Motion to read the section carefully. Twelve months' time is given to an absentee landlord, a man who has no interest in his field or cultivation, to go and collect the money. If a man cannot collect his rent in 12 months, would you honestly expect him to do any cultivation ?

The hon. Mover says that the cultivation committees are not functioning effectively and that they are riddled with corruption. However, not a single case of corruption has been proved by the hon. Mover. I listened very carefully to the speech he made just now. I would have taken a different stand if the hon. Mover adduced evidence of corruption and proved that the committees did not function properly. His is merely a hearsay statement.—[*Interruption*]. I would have been very happy if he placed some sort of evidence before the House. I am only sorry that he took it upon himself to make such a statement.—[*Interruption*].

Any hon. Member who wants to speak will get an opportunity to do so.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Please do not interrupt the hon. Parliamentary Secretary. I think hon. Members agree with what he says, but they still interrupt him.

ෂෙල්ටන් ජයසිංහ මයා.
*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

These are unduly harsh and rash statements that are made in this Motion, if I may put it that way. If you examine the position today you will see that these cultivation committees deserve to be commended and assisted. I say that more powers than they have today should be given to these cultivation committees.

I am sorry to say, however, that in some areas cultivation committees are rich. If there is mismanagement and corruption and if the work that is expected of a cultivation committee is not properly done, it is because that cultivation committee is rich. But where the cultivation committees comprise genuine farmers, you find that much more than what is expected of cultivation committees has been forthcoming.

I do not want to speak at length. I did not anticipate entering into a controversy on this matter, but after listening to the hon. Mover's proposal I had no alternative but to rise in defence of the cultivation committees.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාසමාණික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

I am only speaking about the corrupt cultivation committees.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

I must remind the hon. Mover that we did not have the slightest evidence. I should have been glad if the hon. Mover adduced any evidence of corruption. If there is a case of corruption, there are the cultivation board and the commissioner to whom one can make representations. One must not try to destroy one of the most progressive pieces of legislation.—[*Interruption*].

රාසමාණික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

Sir, I want to make a personal explanation. If the hon. Parliamentary Secretary reads my Motion he will understand my intentions. I agree that this is one of the most progressive pieces of legislation that have been enacted in this country. I said there were certain shortcomings in this legislation which have to be corrected in the light of the experience gained since 1958. I said that the commissioner must be vested with powers to dissolve committees which are corrupt, inefficient and which misuse the funds. So that, my Motion is not a wholesale condemnation of the cultivation committees. In fact, I have described the cultivation committees as miniature parliaments in the cultivation areas. But where these committees do not function properly, the commissioner must have the power to dissolve such committees and reconstitute them.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

The commissioner has the power.

රාසමාණික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

But he does not appear to be using it efficiently, because sometimes he takes one or two years to take action to deal with inefficient committees. That is the situation, and I said that that situation must be corrected.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

Why did the Federal Party vote against the Bill ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Now that the Mover of the Motion has heard the hon. Parliamentary Secretary to the Minister of Industries and Fisheries, will he withdraw his Motion ?

රාසමාණික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

No.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

By the time I finish I may be able to convince the hon. Member.

රාසමාණික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

If the hon. Acting Minister gives an assurance that he will look into this matter, I shall withdraw the Motion.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

The position is that the Mover of the Motion has evidently come across a few committees which are not functioning properly. Even the originator of this Act, I know, has complained about some of these committees in his own area. There is provision in the Act which empowers the commissioner to take action in these cases. There is a Review Board to which representations can be made. There is also the Minister. In the light of the explanation offered, I am sure the hon. Member had no intention whatsoever to propose what amounts to an amendment of the Act to take away the inherent rights of the cultivators that are enshrined in this Act and the amendments so far made that have gone to make it more or less a perfect Act. The intention of the Mover, as he said, was to rectify the position with regard to some of the committees that have not been functioning effectively.

I am sure the Hon. Acting Minister will give an assurance on the Floor of this House that if any instance of a defaulting committee is brought to his notice, he will look into it. On that basis, I hope the Mover will withdraw the Motion.

**ගරු ඉඹුලාන මයා.**
*(கௌரவ இம்புலான)*
(The Hon. Imbulana)

May I give the assurance to the hon. Member that if any representation is made with regard to any cultivation committee not functioning efficiently, and so on, we will take prompt action.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

I withdraw the Motion.

**අවසර දෙන ලදුව, යෝජනාව ඉල්ලා අස් කර ගන්නා ලදී.**

பிரேரணை அனுமதியுடன் வாபஸ் வாங்கப்பட்டது.

*Motion by leave, withdrawn.*



## කෘෂිකාර්මික කටයුතු සඳහා පාවිච්චිකරන පාරවල් තැනීම, අලුත්වැඩියා කිරීම සහ නැවත සකස් කිරීම

### கமத்தொழில் தேவைகளுக்குப் பயன்படுத்தப் படும் வீதிகளை அமைத்தலும் திருத்தலும் சீராக்கலும்

## CONSTRUCTION, REPAIRING AND RECONDITIONING OF ROADS USED FOR AGRICULTURAL PURPOSES

අ. භා. 3.44

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

The second Motion that stands in my name, I believe, will not create a controversy but will arouse a lot of enthusiasm and interest among many hon. Members. In moving this Motion I feel that every hon. Member in this House, particularly those Members representing rural electorates with large acreages of land under cultivation, will agree with me that the sentiments expressed in this Motion are worthwhile implementing.

I move,

"That this House is of opinion that immediate action should be taken by the Minister in conjunction with the Minister of Public Works, Posts and Telecommunications and Local Government, to construct, repair and recondition all roads which are used for agricultural purposes thereby providing the agriculturists the essential transport facilities."

As I said earlier, I believe that every hon. Member will support and appreciate this Motion. In any country roads are an important factor in development. Where the road goes, development follows. In fact, when we look at the trunk roads in this country which have penetrated the agricultural areas, we can appreciate how development has taken place mainly due to the easy movement of agricultural produce from place to place utilizing these roads. Roads are a *sine qua non* for any developing country.

Ours is an agricultural country. Our economy depends not only on our rubber, tea and coconut; it depends to a large extent on rice which supplies the food needs of the people of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

this country. Nevertheless, when one looks at the existing position in the country in regard to its roads, and the condition of those roads, one has to feel sorry for the peasant, the farmer and the agriculturist on whose behalf we are wailing. Just a few minutes ago an hon. Member was almost on the verge of tears when speaking of the farmer. One of the most important ways in which assistance can be provided for the farmer is by opening and maintaining more and more roads.

I have travelled far and wide in this country. There are very few districts into which I have not gone. As a public servant, I have worked in many of the important towns. I feel that the inadequacy of transport facilities provided for the farmer has made cultivation not only irksome but also expensive. The farmer has to spend all his time, money and energy in his important work of cultivation.

There are in the Batticaloa District, Trincomalee District, Kurunegala District, and Hambantota District vast tracts of land where no roads are provided. Under conditions that existed long ago, one could have taken a few bushels of paddy on a couple of buffaloes to those distant places. One could have moved the cattle along fields belonging to others and reached one's destination. But today things are different. The cattle population has been almost eliminated, and one has to depend on tractors and lorries for the transport to the fields of essential agricultural implements and also for the transport back of agricultural produce to one's home or co-operative society or the place where produce can be sold. Then, one is confronted with the problem of inadequate roads; so, one can understand the difficulties the farmer has to undergo.

I do not think I should speak at length to emphasize the reasons why I brought this Motion. As my hon. Friend the Second Member for Mutur (Mr. A. L. Abdul Majeed) said last week, let not Private Members' Motions be treated as a farce. Although Private Members' Motions do not have the guarantee of being implemented immediately, they still serve to spotlight basic problems that face the Government in power so that the Government may take some action to solve them.

**රත්නායක මයා.**
*(திரு. ரத்ნாயக்க)*
(Mr. Ratnayake)

If the Government is deaf what can you do?

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

Deaf or divided?

**රාසමාණික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

It is very strange that every Government that comes into power seems to be deaf and blind. I would say to my hon. Friend the Member for Anuradhapura (Mr. Ratnayake) that the Government of which he was a Member was both deaf and blind. I hope that at least the Government now in power will not be blind.

**රත්නායක මයා.**
*(திரு. ரத்ნாயக்க)*
(Mr. Ratnayake)

They are going blind!

**රාසමාණික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

I feel that this Motion spotlights one of the most important needs of the farmers who live in remote areas. The problem of roads should be examined by the Hon. Minister of Agriculture in conjunction with the Hon. Minister of Public Works and the Hon. Minister of Local Government for the reason that there are only two kinds of roads and——


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

This is a very simple Motion. The time now is 3.55 P.M. and it will not be carried if the hon. Member goes on at length.

රාසමානික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

There are P. W. D. roads and local government roads. If the two Hon. Ministers in charge of these two types of roads can jointly formulate a policy for the development of roads and spend a portion of the funds allocated to them on road development, then within the next few years, or even before 1970, many roads could be provided in agricultural areas. I commend this Motion to the House.

වීරසේකර මයා.
(திரு. வீரசேக்கர)
(Mr. Weerasekera)

විසින් ස්ථිර කරන ලදී.
அனுவதித்தார்.
seconded.

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා. (මූතූර් දෙවන මන්ත්‍රී)
(ஜனுப் ஏ. எல். அப்துல் மஜீது—மூதூர் இரண்டாவது அங்கத்தவர்)
(Mr. A. L. Abdul Majeed—Second Mutur)

சபாநாயகர் அவர்களே, கௌரவ பட்டிருப்புப் பிரதிநிதி (திரு. இராசமாணிக்கம்) சமர்ப்பித்திருக்கும் இந்த நல்லதொரு பிரேரணையை எதிர்க் கட்சியினராகிய நாங்கள் அனைவரும் மனப்பூர்வமாக வரவேற்கிறோம்; ஏற்றுக் கொள்கிறோம். ஆனால், இதற்கு முன் அவர் கொண்டு வந்த பிரேரணை எங்களைத் துக்கத்தில் ஆழ்த்திவிட்டது. காரணம் அதன் பிற்போக்கான தன்மையேயாகும்.

රාසමානික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

அந்தப் பிரேரணைதான் முடிந்து விட்டதே. இப்பொழுது புதிய பிரேரணையைப்பற்றிப் பேசுங்கள்.

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
(ஜனுப் ஏ. எல். அப்துல் மஜீது)
(Mr. A. L. Abdul Majeed)

தேசிய அரசாங்கம் உணவு உற்பத்தியைப் பற்றி இன்று முக்கியமாகப் பிரசாரம் செய்கின்றது. அதிக உணவு உற்பத்தி செய்ய வேண்டுமென்று பிரசாரத்தில் அரசாங்கம் இன்று ஈடுபட்டுள்ளது. கௌரவ பிரதம அமைச்சர் அவர்களும் இவ்விடயத்தில் எவ்வளவோ சுறுசுறுப்புடன் பிரசாரத்தில் ஈடுபட்டுள்ளார்கள், எங்களுடைய உணவில் சுய தேவைப் பூர்த்தியை நாங்களே அடைய வேண்டுமென்பதற்காக. ஆனால், விவசாயிகள் இன்று இந்த நாட்டில் எவ்வளவோ கஷ்டங்களை அனுபவித்துக்கொண்டிருக்கின்றார்கள். தங்களுடைய நெற்காணிகளுக்குச் செல்வதற்கு போதிய போக்குவரத்து வசதிகள் அவர்களுக்கு இல்லை. அரசாங்கம் இந்த நிலையை உணர்ந்து விவசாயிகளின் உபயோகத்துக்கான வீதிகளைச் சீராக்குமாக இருந்தால், நான் நினைக்கிறேன், திட்டவட்டமாக விவசாயத்தின் மூலம் நாம் அடைய எதிர்பார்க்கும் வெற்றியைப் பெற முடியுமென்று.

கிழக்கு மாகாணம் புல்மோட்டையிலிருந்து பொத்துவில்வரை விரிந்து பரந்து கிடக்கின்றது. இந்த மாகாணத்தில் வாழும் பெரும்பான்மை மக்கள் விவசாயிகள். இவர்களின் தொழிலுக்கு உதவும் சாதனங்களில் முக்கியமான ஒன்றாக வீதிகள் இருக்கின்றன. வீதிகளைத் திருத்தி விவசாயிகளுக்கு அதிகமான வசதிகளைக் கொடுக்க அரசாங்கம் முன்வருமாக இருந்தால் உணவில் நாம் சுயதேவைப் பூர்த்தியைக் காண முடியும். இதனைச் செய்வதற்கு அரசாங்கம் முன்வர வேண்டுமென்று நான் இங்கு பணிவாக வேண்டிக் கொள்கிறேன்.

சபாநாயகர் அவர்களே, கல்முனைத் தொகுதியை உங்களுக்கு நன்றாகத் தெரியும். கல்முனைத் தொகுதி பாராளுமன்றப் பிரதிநிதி இல்லாத ஒரு தொகுதியாக இன்று இருந்து கொண்டிருக்கின்றது. இதன் காரணமாக அத்தொகுதியில் வாழ்கின்ற விவசாயிகள் தங்கள் விவசாய நில வீதிகளைத் திருத்திக் கேட்டு தங்கள் குரலை இங்கு எழுப்ப முடியாத நிலையில் இருந்து கொண்டிருக்கிறார்கள். கல்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

முன்னத் தொகுதியே ஒரு நெற்களஞ்சிய மாகும். இத்தொகுதி மக்கள் எல்லோரும் விவசாயிகளே. அவர்கள் இன்று அல்லும் பக லும் கஷ்டத்தை அனுபவித்துக்கொண்டிருக் கிறார்கள். இதுபோன்ற பல தொகுதிகளில் இக்குறைகள் இருந்து கொண்டுதான் இருக் கின்றன. இக் குறைகளைத் தீர்த்து விவசாயிக ளுக்குப் பொருத்தமான பாதைகளை அமைத்து விவசாயத்தைப் பெருக்கி வெளி நாட்டுச் செலாவணியைப் பாதுகாக்கவும் உணவில் சுயதேவைப் பூர்த்தி காணவும் நாம் அனைவரும் ஒன்றுபட்டுழைக்கவேண்டுமென்று வேண்டி விடை பெறுகிறேன்.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

May I know whether we have sufficient time to consider this Motion before the Adjournment ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

It is almost 4 o'clock.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

May I suggest that we take up this Motion on the next day ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

According to the Standing Orders this Motion lapses. Order, please ! The Sitting is suspended till 4.30 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින් අ. භා. 4.30 ට නැවත පවත් වන ලදී.**

அதன்படி அமர்வு பி. ப. 4.30 வரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

# කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

## ගංවතුරින් වූ හානිය

### சமீபகால வெள்ளத்தாலேற்பட்ட சேதம்

### DAMAGE CAUSED BY RECENT FLOODS

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
The Hon. C. P. de Silva)

I move,

"That the House do now adjourn."

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගරු කථානායකතුමනි, නොබෝද ඇති වූ ජල ගැල්මෙන් ලාංකික ජනතාවට විදින්නට සිදු වූ විපත් සම්බන්ධවත්, ඇති වූ හානිය සම්බන්ධවත් මේ ගරු සභාවේදී අපේ අදහස් ප්‍රකාශ කරන්නට අද දින අවස්ථාවක් අපට ලබා දීම ගැන මා තමුන්නාන්සේට ප්‍රථමයෙන්ම කෘතඥ වෙනවා. නොබෝදා ඇති වූ ජලගැල්ම ලංකා ඉතිහාසයේ ඉතාමත් දරුණු ජලගැල්මක් හැටියටයි සැලකෙන්නේ. එහෙත් ඒ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස කථා කරමින් වැඩි කාලයක් ගත කරන්නට මේ අවස්ථාවේ බලාපොරොත්තු වන්නේ නැහැ. මක් නිසාද ? ජලගැල්මෙන් හානි වූ ප්‍රදේශ සම්බන්ධව නොයෙක් ගරු මන්ත්‍රීවරුන්ට අදහස් ප්‍රකාශ කරන්නට තිබෙනවා. ඒ නිසා මාතර දිස්ත්‍රික්කය සම්බන්ධව පමණක් හැකි තාක් ලුහුඬින් වචන සවල්පයක් කථා කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

මාතර දිස්ත්‍රිකකයට ජලගැල්මෙන් යම් ප්‍රමාණයක විශාල හානියක් සිද්ධ වුණා නම් ඒසා විශාල හානියකට මූලික වශයෙන් වගකිව යුත්තේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවය යන්න මුලින්ම සඳහන් කරන්නට ඕනෑ. ඒ නිසා ගරු ඉඩම් ඇමතිතුමා එතුමාගේ අවධානය මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

සම්බන්ධයෙන් යොමු කළ යුතුයි. මේ විධියට කියන්නට හේතුව මොකක්ද? වර්ෂයක් පාසා මේ රටේ ජලගැලීම් ඇති වෙනවා. එයින් විපතට පත් වූවන් වෙනුවෙන් වර්ෂයක් පාසා විශාල මුදලක් වැය කරන්නට සිදු වෙනවා. මේ රටේ රජයේ මුදලින් හෝ වේවා වෙනත් රජයකින් ලබා ගත් මුදලින් හෝ වේවා විශාල ප්‍රමාණයක් වර්ෂයක් පාසා ජලගැල්මෙන් ඇතිවන හානිය නිසා සහනාධාර වශයෙන් ගෙවන්නට සිදු වෙනවා. සහනාධාර වශයෙන් මෙතෙක් වැය කර තිබෙන මුදල් සම්භාරය කෙතෙක්දැයි ගණන් කර බලතොත් මේ රටේ සංවර්ධන කටයුතු කර ගෙන යන්නටත් තත්ත්වයක් තිබිය හැකිදැයි කල්පනා කර බලන්නට ඕනෑ. මාතර දිස්ත්‍රික්කයේ වර්ෂයක් පාසාම ජලගැලීම් ඇති වෙනවා. ඒ වාගේම වර්ෂයක් පාසා සහනාධාරත් දෙනවා. කොයි හැටි වෙතත් පැලැස්තර ඇලවීමක් පමණක් මිස වෙන දෙයක් නියම පියවරක් හැටියට කර තිබෙනවායයි කියන්නට පුළුවන්කමක් නැහැ. මෙතෙක් ඒ සම්බන්ධයෙන් සෑහෙන පියවරක් අර ගෙන නැහැ.

මේ වතාවේ මාතර දිස්ත්‍රික්කයේ කුඹුරු අක්කර දොළොස් දාහක් පමණ විනාශ වී ගියා. එක් වතාවක්, දෙවතාවක් නොව තුන් හතර වතාවක් වැපුරූ කුඹුරු අක්කර 12,000 ක් විනාශ වුණා. දිසාපතිතුමාගේ වාර්තාවලට අනුවයි මේ සංඛ්‍යාලේඛන මා ඉදිරිපත් කළේ. මාතර දිස්ත්‍රික්කයේ කුඹුරු අක්කර හතළිස්දාහක්, පණස් දාහක් පමණ වගා කෙරෙනවා. එයින් දොළොස්දාහක් සම්පූර්ණයෙන්ම නැති වුණා. අද පවතින අපේ ආර්ථික තත්ත්වය ගැන සලකන විටත්, ආහාර වගාව වැඩි දියුණු කිරීම කෙරෙහි ආණ්ඩුව දක්වන සැලකිල්ල ගැන සලකන විටත්, මෙවැනි ඉතාම වැදගත් අවස්ථාවක කුඹුරු අක්කර 12,000ක වී වගාව සම්පූර්ණයෙන් ම නැති වුණාම කොයි තරම් දරුණු හානියකට රට මුහුණ පා ඇද්දැයි හිතන්නට පුළුවනි. මේ කුඹුරුවල වී වගා කළ ගොවීන් අද මොන තත්ත්වයකින්ද ඉන්නේ? ඒ උදවියට මොන අන්දමකටවත් ආධාරයක් ලැබී නැහැ. අද රජය අනුගමනය කරන ප්‍රතිපත්තියේ හැටියට කුඹුරුවලට යම් හානියක් වුණොත් කුඹුරුවල වැඩ කළ ගොවීන්ට කිසිම ආධාරයක් නැහැ. මේ සම්බන්ධව මා කරුණු විමසා බැලුවා. රජය තීරණය කර තිබන්නේ කුමක්ද? සම්පූර්ණයෙන් අලාභ වූ කුඹුරුවල වැඩ කළ ගොවීන්ට නැවත වරක් බිත්තර වී මුදලට ලබා දීමට පමණයි නියම කර තිබෙන්නේ. දෙන ආධාරය එපමණයි. දැන් ඒ සම්බන්ධයෙනුත් ප්‍රශ්නයක් ඇති වී තිබෙනවා. මුදලට හෝ අරන් වපුරන්නට කාලයක් තිබෙනවාද? බිත්තර වී ලැබෙතොත් ඒවා තුන්මස් වී වෙන්නට ඕනෑ. තුන්මාසයකින් අස්වනු ලැබෙන වර්ගයේ බිත්තර වී ලැබෙන්නට ඕනෑ. එහෙත් ඒ විධියේ බිත්තර වී අවශ්‍ය තරම් ප්‍රමාණයක් ලබා දෙන්නට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ශක්තියක් ඇත්තේ නැහැ. ඒ විධියේ බිත්තර වී ලබා ගැනීමට ගොවීන්ට කිසිම සහනාධාරයක් ලැබුණේ නැහැ. කුඹුරු අක්කර 12,000 ක් පමණ මේ ගොවීන් වැඩ කරනවා. මාසයක් තිස්සේ වර්ෂාව පැවති අවසානයේදී මේ මහා ජල ගැලීම ඇති වුණා. සමහර ගොවීන් ඔවුන් ළඟ තිබුණු බිත්තර වී වපුරා තිබුණා. ඒවාට පෝර ආදිය ගැනීම නිසා ඔවුන් ළඟ තිබුණු මුදල් ටිකත් ඉවර වුණා. අන්තිමේදී ඒ කුඹුරු සියල්ලම ජලයෙන් යට වී විනාශ වී ගියා. දැන් ඔවුන්ට බිත්තර වීත් නෑ; මුදලුත් නෑ. ඔවුන් දැන් ඉතාම දුක්ඛිත තත්ත්වයකට පත් වී සිටිනවා. මෙවැනි ගොවීන්ට ලැබුණු සහනාධාරය කුමක්ද? කිසිවක් නැහැ. මේ ගොවීන්ගේ අලාභය තක්සේරු කොට සුළු වශයෙන් හෝ සහනාධාරයක් දෙන ලෙසයි මා ඉල්ලා සිටින්නේ. මෙම කුඹුරු සඳහා රක්ෂණයට යටත් වී තිබෙන සහනාධාර දෙන්නට බැරියයි අමාත්‍යාංශය කියනවා. ගරු කථානායකතුමනි, මැරෙන්නට යන රෝගාතුර මිනිසුන් රක්ෂණය කරන්නට කිසිම රක්ෂණ සංස්ථාවක් කැමැති වන්නේ නැහැ. ඒවාගේම නිතර ජල ගැලීම් ආදියෙන් හානි පැමිණෙන කුඹුරු රක්ෂණය සඳහා බාර ගන්නේ නැහැ. එම නිසා ඒ ගොවීන්ට කිසිම ක්‍රමයක සහනාධාරයක් ලබා ගන්නට බැහැ. ගරු ඉඩම් ඇමතිතුමාත්, කෘෂිකර්ම ඇමතිතුමාත් මේ කාරණය විශෙෂයෙන් සැලකිල්ලට ගන්නට ඕනෑ. තමුන්නාන්සේලාගේ කෘෂිකර්ම ව්‍යාපාරය දියුණු කිරීමට වැඩ කරන ගොවි ජනතාව ජල ගැලීමෙන් විපතට පත් වුණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවස්ථාවේදී ඔවුන්ට මොනම විධියක හෝ සහනාධාරයක් දෙන්නට තමුන්නාන්සේලා වැඩ පිළිවෙළක් යොදන්නේ නැත්නම් ඒ ගොවීන් ඔවුන්ගේ ගොවිතැන් කටයුතු තවදුරටත් කරගෙන යන්නේ කොහොම ද? ජල ගැලීමෙන් විපතට පත් ගොවීන් ගැනයි මා මේ ප්‍රකාශය කරන්නේ.

ඊළඟට වර්ෂයක් පාසාම මේ විධියට ජල ගැලීම් ඇති වන්නේ මොන හේතුවක් නිසාද යන වග අප කල්පනා කරන්නට ඕනෑ. ගංගා, ඇළ දොළවල් පාලනය කිරීමේ නොයෙකුත් ක්‍රම ගැන මේ රජය හැමදාම කථා කරනවා. ඉතා විශාල වපසරියක් තිබෙන මාතර දිස්ත්‍රික්කයේ සිටින ගොවීන්ට වර්ෂයක් පාසා මේ විධියට ජල ගැලීම්වලින් විපතට පත් වන්නට සිදුවී තිබෙන්නේ නිල්වළා ගඟත් කිරම ආරත් පාලනය කිරීමේ වැඩ පිළිවෙළක් නැති නිසා බව පෙන්වා දී එවැනි වැඩ පිළිවෙළක් යොදන ලෙස මා මෙම ගරු සභාවේදී නොයෙක් අවස්ථාවල ඉල්ලා සිටියා. එහෙත් ඒ සියල්ලක්ම කඩදාසියට පමණක් සීමා වී තිබෙනවා. ගංවතුරෙන් විපතට පත් වුණු ගොවීන්ට පසුගිය වතාවේදී නම් රුපියල් 10, 15 බැගින් සහනාධාර ලැබුණා. මේ වාරයේ ඒකත් නැහැ. වර්ෂයක් පාසාම මේ කරදරය උදා වෙනවා. එම නිසා, ගොවීන් මේ විපතින් මුදවා ගැනීමට කිසියම් වැඩ පිළිවෙළක් යොදන්නට ගරු ඉඩම් ඇමතිතුමා ඇත්වත් අදහස් කරන වාදැයි මා දැනගන්නට කැමැතියි.

මාතර දිස්ත්‍රික්කයට මෙවර ගංවතුරෙන් සිදුවුණු හානිය කොයිතරම් බරපතලද යන වග මාතර දිසාපතිතුමාගෙන් අසා බැලුවොත් තමුන්නාන්සේට දැනගන්නට පුළුවන් වෙයි. මාතර නගරය සම්පූර්ණයෙන්ම ජලයෙන් යට වුණා. මාතර මන්ත්‍රීතුමාගේ (බී. වයි. තුඩාවෙ මයා.) නිවස පවා යට වී එය අතහැර යන්නට එතුමාට සිදු වුණා. ගෙවල් විශාල සංඛ්‍යාවක් කඩා වැටුණා. මෙවර ගංවතුර වෙනදා වගේ ඉක්මණින් බැස ගියේත් නැහැ. ගංවතුර අඩු වුණේ ඉතාමත් හෙමින්. ඊට ප්‍රධානම හේතුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඇළ දොළ ආදී ජල මාර්ග සුද්ධ නොකිරීමයි. මා කියන දේ ගරු ඇමතිතුමා නොපිළිගන්නවා නම් මාතර දිසාපතිතුමාගෙන් අසා බලන්න. මිනිසුන්ට විශාල වශයෙන් හානි සිදු වුණේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දුර්වලකම නිසායයි මා මුලින් කීවේ ඒ නිසායි. මගේ ආසනයේ පමණක් ගෙවල් 400 ක් පමණ සම්පූර්ණයෙන්ම කඩා වැටුණා. මාතර හා අකුරැස්ස යන කොට්ඨාශවල බිමින් එක්තරා කොටසක් සම්ර්ණයෙන්ම ජලයෙන් යට වුණා. ගෙවල් කැඩුණා. දවස් ගණනක් යන තුරුම වතුර බැස්සේ නැහැ. වතුර නොබැස්සේ ඇළවල් අවහිර වීම නිසයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් කපන ලද ඇළවල්ද? පිහිටි ඇළවල්ද?

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් කපන ලද ඇළවල්. අද ඒ ඇළවල් අවහිර වෙලා. "බ්ලොක්" වෙලා. ඇළක් කොතරම් පළල් විය යුතු දැයි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පවා දන්නේ නැහැ. ඇළ වේලි පළල නම් මේ විධියට ගංවතුරෙන් හානි සිදු වන්නේ නැහැ. අද ඇළ වේල්ලක් සමහර විට අගල් හයකට වඩා පළල නැහැ. එහි ප්‍රතිඵලයක් වශයෙන් කුඹුරු යායවල් යට වෙනවා. ඇළක පළල කොතරම් විය යුතු දැයි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පවා දන්නේ නැහැ. එක තැනක අඟල් හයක් පළලයි. තව තැනක අඩියක් පළලයි. තවත් තැනක අඩි දෙකක් නැත්නම් තුනක් පළලයි. එසේ නැත්නම් අඩි හතරක්, පහක් පළලයි. ඒ විධියේ ඇළවල් කපා තිබෙන්නේත් ඊරියගොල්ල ඇමතිතුමා බැංකොක් ගිය අන්දමට වංගු ගහලයි. ඒ නිසා තමයි, මේ කරදර ඇති වන්නේ.

ගංවතුරෙන් හානියට පත් ගෙයකට සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් දෙනු ලබන වැඩිම ආධාර මුදල රුපියල් හාර සීයයි. ගෙය කඩා වැටී බඩු මුට්ටු විනාශ වී සිටින අවස්ථාවකදී හැකි තරම් ඉක්මනින් ආධාර මුදල් දෙන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]
හැකි තරම් ඉක්මනින් පරීක්ෂණ පවත්වා අඩු වශයෙන් අත්තිකාරම් මුදලක්වත් දෙන්නට ඕනෑ. මා නියෝජනය කරන කොට්ඨාශයේ මහ පාර අයිනේ පිහිටි ගෙයක් පසුගිය 22 වැනිද ගංවතුර නිසා කැඩුණා. ගම්වාසීන් එකතු වී පැලක් සාද ගෙහිමියා ඇතුළු දරු පවුල ඒ පැලේ නැවැත්තුවා. මේ ගෙහිමියාට මේ මස දෙවැනිදා වන තුරුත් ආධාර මුදල් ලැබුණේ නැහැ. ආධාර මුදල් තබා ඔහුගේ ගේ කඩා වැටීම ගැන පරීක්ෂා කරන්නට වත් තවම නිලධාරියකු ගොස් නැහැ. ඔහුගේ ගෙය පිහිටියේ හක්මන-මාතර මහ පාර අයිනේයි. දවස් හතක් අටක් යන තුරු ඔහුගේ ගෙයවත් පරීක්ෂා කරන්නට නිලධාරීන්ට බැරි වුණා නම් ඈත පිටිසර ගමේ ගොඩේ තිබෙන ගෙවල් පරීක්ෂා කිරීමට කොතරම් නම් කාලයක් ගත වේද? තවද, මා සමහර ප්‍රදේශවල ගෙවල් කැඩුණු මිනිසුන්ගේ ලැයිස්තු ගන්නා තුරු ඒ ප්‍රදේශවල ග්‍රාම සේවක යන් පවා ඒ කැඩුණු ගෙවල් බලන්නට ගොස් නැහැ. ගෙවල් කැඩුණු උදවිය තමන්ට කවදා ආධාර ලැබේද, කවදා නිලධාරීන් පැමිණේදැයි නොඉවසිල්ලෙන් හා දුකින් බලා සිටින බව කල්පනා කරන්නට ඕනෑ නේද? රජය මේ සම්බන්ධයෙන් වහාම වැඩ පිළිවෙළක් යෙදුවේ නැත්නම් මාස ගණනක් ගත වන තුරු විපතට පත් වූවන්ට සහනාධාර ලැබෙන එකක් නැහැ. දවස් අටක් ගත වන තුරු හක්මන-මාතර මහ පාර අයිනේ කැඩුණු ගෙය ගැන පරීක්ෂණයක් පවත්වා ආධාර දෙන්නට ක්‍රියා නොකළ නිසා ඒ පිළිබඳව මා පෙරේදා දිසාපතිතුමාට දන්වා යැව්වා. විපතට පත් වූවන් මා ළඟට අඩාගෙන ආවා. ඇයි මේ අන්ද මට ආධාර මුදල් දීම ප්‍රමාද කරන්නේ?

මාතර ඡන්ද කොට්ඨාශයේත් අකුරැස්ස ඡන්ද කොට්ඨාශයේත් හක්මන ඡන්ද කොට්ඨාශයේ කොටසකුත් ගංවතුරෙන් යට වූ අතර දවස් හතරක් පහක්ම වතුර රැඳී තිබුණා. ඒ නිසා තමයි, ගෙවල් කඩා හැලුනෙ. නිතරම ජලයෙන් යටවන මේ පහත් බිම්වල පදිංචිව සිටින උදවිය උස් බිම් ජනපද යෝජනා ක්‍රමයක් ඇති කර ඉඩම් දී එහි පදිංචි කරවන ලෙස අපි ඉල්ලා සිටිනව. අපි අවුරුදු ගණනාවක් තිස්සේ ඉල්ලා සිටියත් තවම ඒ උදවියට බිම් අඟලක්වත් හම්බ වෙලා නැහැ. මේ වනාවේ කඩා වැටුණු ගෙය නැවතත් හදා තිබෙන්නේ එතැනමයි. නව ජලගැල්මක් ඇති වුණාම නැවතත් කැඩෙනවා. නැවතත් ආධාර දෙනව. ඒ අයට යන්ට තැනක් නැහැ කියන ඇමතිතුමාගේ කීම ගැන මා එකඟ වෙනවා. ඒ උදවියට යන්ට තැනක් නැති නිසා තමයි උඩ වලවේ ව්‍යාපාරයෙන් හෝ වෙනත් ඉඩම් බෙදා දෙන තැනකින් ඒ උදවියට ඉඩම් දිය යුතුව තිබෙන්නෙ. ඒ උදවිය යන්ට කැමතියි. එහෙත් ඉඩම් බෙදා දීමේදී ඒ උදවියට ප්‍රමුඛත්වය දෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
යන්නෙ නැහැ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
යන්ට කැමති අයගෙ ලැයිස්තු මම ඉදිරිපත් කර තිබෙනව. එහෙත් අද වන තුරුත් ඒ උදවියට බිම් අඟලක්වත් ලැබී නැහැ. මම චෝදනා කරනවා නොවෙයි. නිතර ජලයෙන් පීඩාවට පත්වන පහත් බිම්වල පදිංචිව සිටින උදවිය, යම්කිසි උස් බිම් ජනපද යෝජනා ක්‍රමයක් යටතේ බෙදා දෙනු ලබන ඉඩම් ඉල්ලා සිටිනව නම් ඒ උදවියට ප්‍රමුඛත්වය දිය යුතු බවයි මම කියන්නෙ.

ඊළඟ ප්‍රශ්නය මෙයයි. උළු ගඩොල් කර්මාන්තයේ යෙදී සිටින විශාල පිරිසක් අපේ ප්‍රදේශයේ සිටිනව. ඒ කර්මාන්තය අද සම්පූර්ණයෙන් ඇණ හිටින තත්ත්වයට පත්වෙලා තිබෙනවා. උළු හා ගඩොල් පට්ටල් සම්පූර්ණයෙන්ම වගේ හේදිලා ගිහින්. සමහර ස්ථානවල තිබුණු ගඩොල් පහළොස් දාහ—විසි දාහ තරම් ගොඩවල් ගංවතුරට ගසාගෙන ගොස් තිබෙනව. මේ සම්බන්ධයෙන් ආධාර දීමේ දී ප්‍රශ්නයක් මතු වෙනව. තිබුණු ගඩොල් කපල ගහගෙන ගියාට දෙපාර්තමේන්තුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්දි ගෙවන්නෙ නැතිලු. පෝරණුව විතරක් කැඩුණ නම් සහනාධාර මුදලක් ගෙවනවලු. ඒකයි, ප්‍රතිපත්තිය. ගඩොල් ටිකක් නැතිවී පෝරණුවත් දුර්වල තත්ත්වයට පත්වූ උදවියගේ තත්ත්වය ගැන පළල් වශයෙන් කල්පනා කර බලා ආධාර දීමේ වැඩ පිළිවෙළක් තිබිය යුතුයි.

ගරු කථානායකතුමනි, අද මාතර දිස්ත්‍රික්කයේ පාරවල් එකකවත් යන්ට බැරි තත්ත්වයක් තමයි, තිබෙන්නෙ. වතුර නැවති තිබීම නිසා ගම්සභා පාරවල පමණක් නොව මහා මාර්ගවලත් විශාල වළවල් හැරී තිබෙනව. සමහර පාරවල කොහොමවත් ගමනාගමනය කරන්ට පුළුවන්කමක් නැහැ. සමහර ගම්සභා පාරවල් හේදී ගොස් කුඹුරුවලට මට්ටම් වෙලා. ඒවා අලුත්වැඩියා කරන්ට, ඒවා ප්‍රතිසංස්කරණය කරන්ට ඒ ප්‍රදේශවල පළාත් පාලන ආයතනවලට ශක්තියක් නැහැ. මන් ද? ඒවායේ ආදායම මදි. ගංවතුරෙන් හානියට පත්වුණු ගම්බද පාරවල් යථා තත්ත්වයට පත් කරන්ට ඒ ප්‍රදේශවල ගම්කාර්ය සභා වලට හෝ වෙනත් පළාත් පාලන ආයතනවලට යම්කිසි විශේෂ ආධාර මුදලක් දීමට රජය සූදානම්ද කියා මේ අවස්ථාවේදී මා අහනව. අද වන තුරු ඒ විධියේ දැන්වීමක් පළාත් පාලන ආයතනවලට කර නැහැ. ආධාර දීමේ වැඩ පිළිවෙළක් තිබෙන බව නම් ප්‍රකාශ කර තිබෙනව. එහෙත් තමන්ගේ කොට්ඨාශවලට ගංවතුරෙන් මොන තරම් හානි සිදුවී තිබෙනවා දැයි අපේ පළාත් පාලන ආයතනවලින් විමසා එව්වෙ නැහැ. පසුගිය වතාවේ ගංවතුරෙන් හානි සිදුවූ ප්‍රදේශවල ගම්කාර්ය සභාවලට රුපියල් 5,000 හෝ 6,000 හෝ තරම් ආධාර මුදල් දුන්න. එවැනි සුළු ආධාරයකින් ගම්සභා ප්‍රදේශයක හානියට පත්වූ පාරවල් ප්‍රතිසංස්කරණය කරන්ට පුළුවන්කමක් නැහැ. ජල ගැලීම්වලට ගොදුරුවන ප්‍රදේශවල පිහිටා තිබෙන ගම්කාර්ය සභාවලට විශේෂ ආධාර මුදල් දීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යයි මා විශ්වාස කරනව. නිතර ජල ගැලීම්වලට ගොදුරුවන ගම්කාර්ය සභා ප්‍රදේශ ස්වල්පයක් තිබෙනව. ඒ ප්‍රදේශවල පාරවල් ප්‍රතිසංස්කර



ණය කිරීමාදි කටයුතුවලට විශේෂ ආධාර ලබා දීමට අමාත්‍යාංශය කල්පනා කළ යුතුයි. ඒ වගේම සැලකිය යුතු ආධාරයක් ලබා දෙන්ට ඕනෑ. පාරවල් දහයක්—දොළහක්, පාලම් තිහ—හතලිහක් කැඩී ගියාම දැනට ලැබෙන සුළු ආධාරයෙන් එක පාරක් නැත්නම් දෙකක්, එක පාලමක නැත්නම් දෙකක් හදන්නට පුළුවන් වෙයි. එවිට ඒ පාරවල් හා පාලම් සියල්ලම යථා තත්ත්වයට ගෙනෙන්ට අවුරුදු කීයක් ගත වෙයි ද?

අද සමහර ප්‍රදේශවල පාසල් සිසුන්ට පාසල් යන්ට පුළුවන්කමක් නැහැ. මන්ද, පාලම් ගංවතුරට ගසාගෙන ගිහින්. මීට දවස් තුනකට විතර කලින් මා එක්තරා ප්‍රදේශයකට ගියා. ඒ ප්‍රදේශයේ තිබුණු පාළම ගංවතුරට සේදී ගිහින්. ඒ ප්‍රදේශයේ ළමයින්ට පාසල් යන්නටවත් බැරි වී තිබෙන්නේ, ඒ හේතුවෙනුයි. එම නිසා ඒ ප්‍රදේශ වාසීන් මගෙන් ඉල්ලා සිටියා, තාවකාලික පාළමක්වත් සවි කර දෙන හැටියට. [බාධා කිරීම්] ඒ විධියේ තත්ත්වයක් තිබෙන්නේ. අප කථා කරන්නේ විහිළුවකට හෝ සෙල්ලමකට හෝ නොවෙයි. කුණාටුවත් ජල ගැලීමත් නිසා හලාවත ප්‍රදේශයට තරම් විපතක් වෙන කිසිම ප්‍රදේශයකට නොවුණු බව කථානායකතුමා දන්නවා ඇති. අගමැතිතුමා පවා හලාවත ප්‍රදේශයට ගොස් ඒ විපත් ගැන පරීක්ෂා කර බැලුවා.

ඒ තරම් තත්ත්වයක් තිබෙන අවස්ථාවක, කොපමණ ආධාර මුදල් ආණ්ඩුවෙන් දුන්නත් ඒවා ලැබිය යුත්තන්ට—නිස්සන්ට—ලැබෙන්නේ නැත්නම් ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීම අපේ යුතුකමක්. මේ පිළිබඳව සාකච්ඡා කෙරෙන අවස්ථාවේ පළාත් පාලන අමාත්‍යාංශයේ සහ තැපැල්, විදුලි සන්දේශ හා රජයේ වැඩ අමාත්‍යාංශයේත් ඇමතිවරුන් නැත්නම් පාර්ලිමේන්තු ලේකම්වරුන් මේ ගරු සභාවේ සිටින්නට ඕනෑ. ගංවතුරෙන් යට වූ බොහෝ ප්‍රදේශවල පාරවල් කැඩී ගමනාගමන අපහසුකම් ඇති වී තිබෙනවා. නොයෙක් ප්‍රදේශවල පාරවල් අබලන් වීම නිසා ඒ තැන්වල බස් සේවය නවත්වන්නට සිදු වී තිබෙන බවට ලංගමයෙන් පැමිණිලි කර තිබෙනවා. එවැනි අභාග්‍යසම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

පත්න තත්ත්වයකටයි, අද අප මුහුණ පා සිටින්නේ. ගස් ඇද වැටීම නවත්වන්නට පුළුවන් කාටද? කුණාටු, වැසි, ගංවතුර ආදිය නිසා ගස් ඇද වැටෙනවා. ඒ ගස් වැටීමෙන් ගෙවල්-දොරවල් පවා කඩා වැටෙනවා.

මාතර නගරයේ දුප්පත් උදවිය වැඩියක් වාසය කරන්නේ අනුන්ගේ ඉඩම්වල. ජල ගැලීමෙන් තමන්ගේ වාසස්ථානවලට හානි සිදු වුණු නිසා ඒ අය තමන්ගේ වාසස්ථානවලින් ඉවත් වී විද්‍යාලවල හෝ වෙනත් තැන්වල තාවකාලික පදිංචියට ගියා. මෙයින් වාසි වුණේ ඔවුන් වාසය කළ ඉඩම් හිමියන්ටයි. ඒ ඉඩම් හිමියන් හිටියේ, මේ දුප්පත් උදවිය තමන්ගේ ඉඩම්වලින් එළවා ගන්නට බැරිවයි. ජල ගැලීම නිසා දැන් එය ඉබේම සිදු වුණා. ඒ දුප්පත් මනුෂ්‍යයන්ට තමන්ගේ වාසස්ථාන අළුත් වැඩියා කර ගැනීම සඳහා තමන් කලින් පදිංචිව සිටි ඉඩම්වලට එන්නට ඉඩම් හිමියන් ඉඩ දෙන්නේ නැහැ.

සහනාධාර ක්‍රමය යටතේ ආධාර මුදලක් ලබා ගන්නට නම් ඒ ඉඩම් හිමියන්ගෙන් ලිපියක් ලබාගන්නට සිදු වී තිබෙනවා. අනුන්ගේ ඉඩමක පදිංචිව ඉන්නා කෙනකුට ඒ ඉඩම් හිමියාගේ ලිපියක් නැතිව සහනාධාර ලබා ගන්නට බැහැ. දැන් ඔවුන්ට ඒ ඉඩම් හිමියන්ගෙන් ලියුම් ලැබෙන්නෙත් නැහැ ; සහනාධාර ලැබෙන්නෙත් නැහැ. ඒ අතර කලින් පදිංචි ගෙවලට යන්න විධියක් නැති නිසා ඉන්න-හිටින්න තැනකුත් නැහැ.

මෙය ඉතා කණගාටුදායක තත්ත්වයක්. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මැදිහත් වන්නට බැරි යැයි පොලීසිය කියනවා. දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාව කැඳවා අප මේ තත්ත්වය ගැන සාකච්ඡා කළා. තමන් කලින් පදිංචි ඉඩම්වලට යා ගත නොහැකිව ඉන්නා ඒ දුප්පත් මිනිසුන් දැන් තහනම් ඉඩම්වල පැල්පත් ගසාගෙන පදිංචි වී සිටිනවා. කරගොඩ-උයන්ගොඩ ප්‍රදේශයේ වැව් කණ්ඩියේ පවා පැල්පත් ගසාගෙන ඒ මිනිසුන් පදිංචි වී සිටිනවා. තමන් කලින් පදිංචි ඉඩම්වලට යා ගත නොහැකිව ඉන්නා ඒ අයට ඉඩම් කොටස් ලබා දිය යුතුයි. සාමාන්‍ය පුරුදු විධියට ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් දෙන්නට ගියොත් අවුරුදු ගණනාවක් ගත වේවි. ඒ නිසා මේ අයට ප්‍රමුඛස්ථානය දී, මාතර ප්‍රදේශයේ පිහිටි උස් බිම්වලින් ඉඩම් කොටස් බෙදා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

ජල ගැලීම නිසා ගෙවල්වලට හානි සිදු වුණු මාතර ප්‍රදේශයේ වැසියන්ට එක ගෙයකට රුපියල් 400 බැගින් සහනාධාර මුදලක් ලැබුණා. එසේම ගෙවල් කඩා වැටුණු අයට සතියක් ඇතුළත සීනි, පිටි යනාදියත් ලැබුණා. එහෙත් ජල ගැලීමෙන් විශාල හානියක් සිදු වී තිබෙන්නේ ගොවි ජනතාවටයි. මාතර දිස්ත්‍රික්කයේ ගොවීන් ගත් උනන්දුව ගැන කල්පනා කර බලන විට අපට මෙය බලවත් කනගාටුවට කාරණයක්. කවදාවත් නොගත් තරමේ විශාල උනන්දුවක් ඇතිව මාතර දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව තමන්ගේ කුඹුරුවල වැඩ කළා. එහෙත් අවාසනාවට වාගේ ඇති වූ නොවැළැක්විය හැකි ගංවතුරක් නිසා අක්කර 12,000 කට හානි සිදු වුණා. අප දන්නවා එය රජයේ වරදක්වත් ඔවුන්ගේ වරදක්වත් නොවන බව. කෙසේ හෝ අපට පාලනය කර ගත නොහැකි, නොවැළැක්විය හැකි හේතුවක් නිසා එය සිදු වුණා. තමුන්නාන්සේලා කියනවා, පෝර නොමිලේ දෙන්න ලැහැස්තිය කියා. පෝර නොමිලේ දෙන්නේ කන්නයෑ? පෝර දිය යුත්තේ වැපුරූ කුඹුරුවලට දැන්නයි. එහෙත් දැන් වපුරන්න වෙලාවක් නැහැ. වපුරතොත් වැඩිම වුණොත් අක්කර දෙතුන් දාහක් වපුරාගන්න පුළුවන් වේවි. අනික් කුඹුරු බිම් තවමත් වතුරේ. ගංගාව වාගේ වතුර නැවතී තිබෙනවා. ඒ නිසා මේ ගොවීන්ට මේ අවස්ථාවේදී තමුන්නාන්සේලා දෙන්න බලාපොරොත්තු වන්නේ මොන විධියේ ආධාරයක්ද? දැනට නම් කිසිම දෙයක් නැහැ. ආහාර වගාව සඳහා මේ තරම් උනන්දුවෙන් කටයුතු කළ, කටයුතු කරන, ගොවි ජනතාවට ආධාර දීමක් නැහැ. ඔවුන්ට බිත්තර වීවලින් ආධාර කිරීම පිළිබඳව දිසාපතිතුමාගෙන් විමසූ විට කියනවා, බිත්තර වී වුවමනා නම් ණයට හෝ මුදලට හෝ දෙන්න පුළුවන්ය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඉඹුලාන**
*(கௌரவ இம்புலான)*
(The Hon. Imbulana)
තුන් මාසෙ බිත්තර වී දෙනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்சி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

තුන් මාසෙ බිත්තර වී දුන්නත්, අද තවමත් වතුර තිබෙන කුඹුරුවල වපුරන්න පුළුවන්කමක් නැහැ; ඒවා සකස් කරගෙන වපුරාගැනීමට වෙලාවක් නැහැ. මේ කුඹුරු නැවත අමුතුවෙන්ම සකස් කරන්න සිදු වී තිබෙනවා. කුණු වී ඇති ශොයම් ඉවත් කර නැවත කුඹුරු සකස් කර තුන් මාසෙ වී වපුරන්නට වෙලාව මදි. ඇමතිතුමාත් ඒ බව පිළිගන්නවා. වෙලාව තිබුණත් අක්කර කීයද වපුරන්න පුළුවන් වන්නේ ? තුන් මාසෙ බිත්තර වී වුණත් අක්කර 3,000 කට පමණ මිසක් ඊට වඩා දෙන්න තමුන්නාන්සේලාට පුළුවන්ද ? අක්කර 12,000 ක්ම විනාශ වී තිබෙනවා. ඒ ගොවීන් ගොවිතැන් කර තිබෙන්නේ මුදල් ණයට අරගෙනයි. දැන් ඒ ගොවීන් තුළ බියක් තිබෙනවා, ණයට ගත් මුදලින් වැපුරූ කුඹුරුත් පාළු වුණා ය, බිත්තර වී ටිකත් නැත, අන්තිමට හාල් පොතුත් නැති වේවිය කියා. එම නිසා මේ ගොවි ජනතාවට යම්කිසි සහනාධාර වැඩ පිළිවෙළක් සැලැස්විය යුතුයි. තමුන්නාන්සේලා ඒ ප්‍රදේශයට ගොස් බැලුවොත් පෙනී යාවි ඒ ගොවි ජනතාව මොන තරම් හිරිහැරයකට මුහුණ පා තිබෙනවාද කියා. ගෙදර තිබුණු බිත්තර වී ටිකත් නැහැ; හාල් ටිකත් නැහැ; සල්ලිත් නැහැ; අන්තිමට කුඹුරුත් නැහැ. කුඹුරු ගොවිතැන් ගැන තත්ත්වය ඒ විධියයි.

ඊළඟට තමුන්නාන්සේලා ගොඩ ගොවිතැන් දියුණු කිරීම පිණිස ෆේත් එළි පෙහෙළි කර මංඤොක්ක, බතල, එළවළු, ආදිය වගා කළා. රජයේ වැඩ ඇමතිතුමාගේ මන්ත්‍රී කොට්ඨාශය වන වැලිගම කොට්ඨාශයේ දෙනිපිටිය, ජඹුරේගොඩ, තෙලිජ්ජවිල ආදී පළාත්වල සම්පූර්ණයෙන්ම එළවළු කොරටුවලින් ජීවත් වුණ ගොවි ජනතාවගේ එළවළු කොරටු සම්පූර්ණයෙන්ම විනාශ වී ගියා. ඔවුන් අද ඉතාමත් දුඃඛිත තත්ත්වයකට මුහුණ පා සිටිනවා. තමුන්නාන්සේලා ඒ උදවියට දෙන්නේ මොන විධියේ ආධාරයක් ද? ඒ දිස්ත්‍රික්කයේ ගොඩ ගොවිතැනුත් කුඹුරු ගොවිතැනුත් කළ ගොවි ජනතාව ඉතාමත් උනන්දුවෙන් මේ වගා කටයුතු කළේ. ඒවා මෙසේ විනාශ වී යාම කනගාටුදායක සිද්ධියක්. ඔවුන් මොන තරම් උනන්දුවකින් කටයුතු කළාද කියා මා දන්නවා. ඒ නිසා ගොඩ ගොවිතැන්වලත් කුඹුරු ගොවිතැන්වලත් යෙදුණ ඒ ගොවි ජනතාවට යම් කිසි සහනාධාර වැඩ පිළිවෙළක් යොදන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඔවුන්ට සිදු වී ඇති අලාභ හානි ගැන තක්සේරු කර මුදලින් යම් කිසි ආධාරයක් දෙන ලෙස දිසාපතිතුමාගෙන් ඉල්ලූ විට දිසාපතිතුමා කියනවා, එවැනි ආධාරයක් දෙන්න පුළුවන්කමක් නැත කියා. මේ තිබෙන තත්ත්වය දන් අප කාටද කියන්නේ ? කියන්න තිබෙන්නේ තමුන්නාන්සේලාටයි. ඒ නිසා මේ ප්‍රශ්නය ගැන තමුන්නාන්සේලාගේ විශෙෂ අවධානය යොමු කර මෙම ගොවීන්ට මුදලින් ආධාරයක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගෙවල් කැඩුණු අයගේ ගෙවල් සාදා ගැනීම පිණිස තමුන්නාන්සේලා රුපියල් 400 ක ආධාර මුදලක් දෙනවා. නමුත් අවුරුද්දක් පාසා මේ දේ කරන්න බැහැ. එම නිසා ඒ උදවියට ජීවිතාන්තය දක්වා සහනයක් ලැබෙන අන්දමට වැඩ පිළිවෙළක් සකස් කර දෙන්න ඕනෑ. වර්ෂයක් පාසා සහනදායක මුදල් දීමෙන් පමණක් ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මා මුලින් සඳහන් කළා වාගේ වර්ෂයක් පාසා සිදු වන මෙම ජලගැල්මෙන් මාතර ප්‍රදේශයේ ජනතාව බේරා ගැනීම, වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් එසේ නැතිනම් වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කිරීමෙන් කළ හැකි බවයි මා කල්පනා කරන්නේ. නිල්වලා ගඟ, කිරමආර ජලාශයන්ගෙන් වර්ෂයක් පාසා එම ප්‍රදේශයට ජලගැලීම් ඇති වන නිසා මෙම ජලාශයන් පාලනය කිරීමට, එම ජලාශයන්ගෙන් සිදුවන හානිය මැඩ පැවැත්වීමට, ක්‍රමවත් වාරිමාර්ග වැඩ පිළිවෙළක් අනුගමනය කරනවා ඇතැයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

විශ්වාස කරමින්, මේ අවස්ථාව සලසා දීම ගැන තමුන්නාන්සේට ස්තුති කරමින්, තවත් මන්ත්‍රීවරුන් රාශියක්ම මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට බලාපොරොත්තුවෙන් සිටින නිසා මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

අ. භා. 5

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

ගරු කථානායකතුමනි, ජලගැල්මෙන් මෙරටට සිදු වන විශාල අලාභහානිය ගැන වචන ස්වල්පයක් කථා කිරීමට මා අදහස් කරනවා. විශේෂයෙන්ම මේ ආණ්ඩුවේ අගමැතිතුමා, එතුමාගේ දේශපාලන ජීවිත කාලය තුළදී මේ රටේ කෘෂිකර්මය දියුණු කිරීම සඳහා යම්කිසි ප්‍රයත්නයක් දරන බව පෙනී යන නිසාත්, මේ රට ආහාර අතින් හැකිතාක් දුරට ස්වයංපෝෂිත කිරීම උදෙසා මෙම ආණ්ඩුව මෑත කාලයක සිට වගා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කර තිබෙන නිසාත් මේ පිළිබඳව යම්කිසි අදහසක් ප්‍රකාශ කිරීම වැදගත් යයි මා හැම අතින්ම කල්පනා කරනවා.

ජලගැල්ම පිළිබඳ ප්‍රශ්නය ගැන කල්පනා කර බලන විට මේ රටේ ක්‍රම සම්පාදන සැලැස්මේ මූලික ප්‍රශ්නය ඇත්තේත් මෙතැනම බව පෙනී යනවා. වෙනත් වචනවලින් කියතොත් ජාතික සංවර්ධනය පිළිබඳ ක්‍රම සම්පාදන සැලැස්මේ මුල මෙතැනයි. ජලය තමයි සංවර්ධනයේ හෘදය වස්තුව. එදා, සිංහල රජ කාලයේදී, විශේෂයෙන්ම මහා පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේදී බිමට වැටෙන සෑම ජල බිංදුවක්ම අපතේ යා නොදී ආරක්ෂා කර ගැනීම පිණිසත්, එමගින් රට සංවර්ධනය කර, ආහාර අතින් සංවයංපෝෂිත කිරීම පිණිසත් පියවර ගත්තේ කඳුකර ප්‍රදේශවල, ඉතා උස් බිම්වල කැලෑ වැවීමෙනුයි. උල්පත් සහ ඇළ දෙළ රැක ගැනීම පිණිස ක්‍රියා කළේ ඒ ආකාරයටයි. එම නිසා ඒ කාලයේ අද මෙන් නියඟය තිබුනේ නැහැ. ජලගැලීම් ඇති වුණෙත් නැහැ. නමුත් අද සිදු වී තිබෙන්නේ කුමක්ද? උස් බිම්වල ඇති කැලෑ කපා දමා ඒවායේ තේ වගා කර තිබෙනවා. මේ නිසා තදින් වැස්සක් දෙකක් වැස්සොත් ගංගාවන් පිටාර ගලනවා. ඒ එක්කම වෙන පළාත්වල වර්ෂාව නොමැති කමින් නියඟයෙන් ජනතාව පෙළෙනවා. මෙය අවුරුදු පතා සිදුවන දෙයක්. කලින් කලට ආණ්ඩු එනවා, ආණ්ඩු වෙනස් වෙනවා. මේ ප්‍රශ්නයට අවුරුදු පතාම මුහුණ දෙන්න ඒ ආණ්ඩුවලට සිදු වෙනවා. නමුත් අද දක්වා ඇති වූ හැම ආණ්ඩුවක්ම සුද්දන්ගේ වතු වලට අත ගැසීමට භය වූ නිසා මෙම ප්‍රශ්නය විසඳීමට බැරිව තිබෙනවා. මේ ජල ගැලීම් නිසාම, දුප්පත් උදවිය මුළු ජීවිත කාලය තුළදී සම්භ කර ගත් සෑම දෙයක්ම එක පැයකින් නැතිනම් මොහොතකින් අහෝසි වී යනවා. පාරවල් දෙපැත්තේ කුඩාරම්වලට වී සිටින ඒ අහිංසක දුප්පත් ජනතාවට ආණ්ඩුව නොයෙක් නොයෙක් ආකාරයට සහනාධාර දෙනවාය කියනවා. ඉන්පසු සතියක් දෙකක් ගත වන විට සෑම දෙයක්ම අමතක වී යනවා. නමුත් වාසනාවකට මෙන් මේ අවුරුද්දේදී ඒ මුල් ප්‍රශ්නය අමතක වෙන්නට ඉඩක් නැහැ. මක්නිසාද? අගමැතිතුමාත් මේ ආණ්ඩුවත් ආහාර වගා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භකර තිබෙන නිසයි. ඇත්ත වශයෙන්ම මොකක්ද අද තිබෙන තත්ත්වය? අපේ ප්‍රදේශවල එක් කන්නයක සාර් එක ලෙස වැඩ කළ ගොවීන්ට කන්න දෙකම වැඩ කරන්නය කියා නියම කළා. නමුත් අද කන්න දෙකම වැඩ කරනවා තබා සාර් එක වූ කන්නත් විනාශ වී ගොස් තිබෙනවා. අද ඒ ගොවීන් අතරමංවී සිටිනවා. එම නිසා තමුන්නාන්සේලාට පළමුවෙන්ම අර මුල් ප්‍රශ්නය විසඳන්නට සිද්ධ වෙනවා. ඒ මුල් ප්‍රශ්නය විසඳන්නට ගරු අගමැතිතුමා ලෑස්ති වෙනවාද? කඳුකර ප්‍රදේශයේ ඉතා උස් බිම් ප්‍රදේශවල නැවතත් කැලෑ වවන්නට ගරු අගමැතිතුමා ලෑස්ති වෙනවාද? ඒ වාගේම කැලෑ නොවවන, වඩා උස් නොවූ කඳුකර ප්‍රදේශවල ලියදි ක්‍රමයට ඉඩම් සකස් කර ඒවායේ තේ හෝ වෙනත් වගාවල් ඇති කරන්නට කටයුතු කරනවාද? පසුගියදා මා චීනයේ කැන්ටන් නුවරට ගියා. චීනයේ සෑම කඳුකර ප්‍රදේශයකම ඒ විධියට තට්ටු වශයෙන් ලියදි සකස් කර ඒවා වගා කර තිබෙනවා. එම නිසා කිසිම සෝදා පාළුවක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැහැ. "චීනයේ ශෝකය" වශයෙන් මුලින් හඳුන්වනු ලැබූ යැංසි සහ "කහ" ගංගාවල් ආදිය ස්වභාවධර්මය මැඩ පවත්වා ගෙන අද සංවර්ධනය උදෙසා යොදාගෙන තිබෙනවා. මේ ගංගාවල වොන් දහදාහේ නැව් පවා දැන් යාත්‍රා කරනවා ගස්වල කොළ කාපු චීන ජනතාව පසුගිය අවුරුදු 18 ඇතුළත ඒ අන්දමින් කටයුතු කළ නිසා රට ආහාරයෙන් ස්වයංපෝෂිත කර ගැනීමට පමණක් නොවෙයි, ලංකාව ආදී රටවලට ආහාර සැපයීමටත් පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ අන්දමට වැඩ කරන්නට තමුන්නාන්සේලාත් ලෑස්තිද? ඒ වාගේම අපේ ගංගා නිම්න භූමිවල රැඳී තිබෙන වැලි පස, කඳුකර ප්‍රදේශවලින් සෝදාගෙන ඇවිත් රැඳී තිබෙන වැලි පස, ඉවත් කරන්නට තමුන්නාන්සේලා ලෑස්තිද? අවුරුද්දකට වරක් කඳුකර ප්‍රදේශවලින් අඟල් දෙක හමාරක උඩ පස සෝදාගෙන ඇවිත් ගංගා නිම්න භූමිවල තැන්පත් වෙනවා. එමනිසා මුලින්ම අපට මේ ප්‍රශ්නය ගැනයි, කල්පනා කරන්නට සිද්ධ වෙන්නෙ. ගංවතුරෙන් පීඩාවට පත් අහිංසක දුප්පත් උදවියට තමුන්නාන්සේලා සතියකට සෑහෙන පිටි දෙනවා. ඒවාගේම ගෙවල් සාදා ගන්නටය කියා රුපියල් 400 ක පමණ මුදලක් දෙනවා. මේ මුදල වත් දුප්පත් ජනතාවට ලැබේද යන්න සැකසහිතයි. නමුත් අද රුපියල් හාර පන් දහසක් නැතිව ඉතා කුඩා පැල්පතක්වත් සාදා ගන්නට පුළුවන්ද? දැන් පොල් අත්තක මිළ සත පහළොවයි. රුපියල් 400 කින් ගෙයක් සාදා ගන්නට පුළුවන්ය කියා ගරු අගමැතිතුමා කල්පනා කරනවාද? පීඩාවට පත් මේ ජනතාව උපයා ගත් සෑම දෙයක් ම ගංවතුරට සේදී ගොස් තිබෙනවා.

ඊළඟට ආහාර හා කෘෂිකර්ම ඇමතිතුමා ගෙනුත් ඇසිය යුතු ප්‍රශ්නයක් තිබෙනවා. අහිංසක ගොවීන්ගේ සියලුම වගාවන් අද සේදී ගොස් තිබෙනවා. තමුන්නාන්සේලා ඒ ගොවීන්ට කුමන විධියේ වන්දියක් ගෙවන්නට සූදානම්ද? මෙසේ පාළු වී ගිය කුඹුරුවලට ආණ්ඩුව මගින් බිත්තර වී සැපයීමෙන්, වැපිරීමට කලක් නැති නිසා ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. වී ගොවිතැන්, මංඤ්ඤොක්කා, අල, බතල ආදී සියලුම වගාවන් විනාශ වී ගොස් තිබෙනවා. අගමැතිතුමා ප්‍රදේශයක් ප්‍රදේශයක් පාසා ගිහින් අහිංසක ගොවීන්ට ආහාර වගා කරන්නටය කියා කිව්වා. ඒ අනුව කළ වගාවන් සියල්ලක්ම අද විනාශ වී ගොස් තිබෙනවා. ඒවාට තමුන්නාන්සේලා කොයි විධියට වන්දි ගෙවන්නට ලෑස්තිද කියා මා දැනගන්නට සතුටුයි. මේ රට ආහාරයෙන් ස්වයංපෝෂිත කරන්නට තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙනවා නම්, ගොවීන්ගේ සහයෝගය ලබා ගන්නට බලාපොරොත්තු වෙනවා නම්, අර මා මුලින් සඳහන් කළ මූලික ප්‍රශ්නයට හරියාකාරව මුහුණ දී වැඩ කරන්නට ඕනෑ. ගං වතුරෙන් ගෙවල්වලට වන අලාභ හානි, ගොවිතැනට වන අලාභ හානි සඳහාත් ; පාරවල්, බෝක්කු, පාලම් ආදිය ප්‍රතිසංස්කරණය කිරීම සහ ගං වතුර නිසා පැතිරෙන භයානක ලෙඩ රෝග මර්දනය කිරීම සඳහාත් ; ආණ්ඩුව මගින් අවුරුදු පතා ගෙවන හෝ නොගෙවන වන්දි තක්සේරු කරන විට මේ රටේ ගංගා ජල ගැලීම් වලින් ආරක්ෂා කරගෙන රටේ සංවර්ධන ව්‍යාපාර උදෙසා පාවිච්චි කිරීමට වැය කරන මුදල ගැන බැලුවහොත්, ඒ ව්‍යාපාර ගඟට ඉනි කපන ආකාරයට මුහුදට ගලා හරින ක්‍රම සම්පාදන සැලැස්මක්ය අද මේ රටේ පවතින්නේ කියන එක අගමැතිතුමා පිළිගන්නවාද?

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I should like hon. Members to be as brief as possible. Many names have been sent up and I want to give every one of them an opportunity to speak. When Members saw me and requested this Debate they assured me that only a few Members would speak, but now I find that a large number want to speak. Kindly be as short as possible so that all those who want to speak will be able to do so.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**

*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*

(Mr. S. D. Bandaranayake)

මා නව මිනිත්තු පහකට වඩා කතා කරන්නට අදහස් කරන්නේ නැහැ. මේ ප්‍රශ්නවලට නිකම්ම පිළියම් කිරීමෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

වැඩක් නොවන බවයි, ගරු අගමැතිතුමාට මතක් කර දෙන්නට සිදු වී තිබෙන්නේ. ගංගාවලට ඉහළින් ජලාශ කීපයක් සකස් කරන්නට සූදානම් වන බවක් අප පත්‍ර මාර්ගයෙන් දුටුවා. ඔය ආකාරයට ජලාශ ඇති කිරීමෙන් පමණක් ප්‍රශ්නය විස දෙන්නේ නැහැ. සාමාන්‍යයෙන් ගොවි හමුදාවේ හිටපු ගොවි භටයකු වශයෙන් ලැබූ අත්දැකීම් අනුව මෙම ප්‍රශ්නය පිළිබඳව ශාස්ත්‍රානුකූලව කල්පනා කිරීම නිසා මටත් මේ ගැන යම් යම් අත්දැකීම් තිබෙනවා. එහෙත් තමුන්නාන්සේ මේ රටේ කෘෂිකර්ම ඇමතිවරයා හැටියට අවුරුදු ගණනාවක්ම කටයුතු කර තිබෙන නිසා අපට වඩා දනිතැයි අප විශ්වාස කරනවා. එහෙත් අපට සිදු වී තිබෙනවා තමුන්නාන්සේට එක්තරා කාරණයක් පැහැදිලි කර දෙන්නට. මේ රටේ ඉඩම් ප්‍රතිපත්තිය සහ වාරිමාර්ග ප්‍රතිපත්තිය පැහැදිලි වශයෙන් තමුන්නාන්සේලා අවබෝධ කර ගත යුතුව තිබෙනවා; දැන් පවත්නා ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම විද්‍යාත්මක මුහුණුවරකින් පරිවර්තනය කළ යුතුව තිබෙනවා. එසේ නොකර ඔය ආහාර වගා ව්‍යාපාරවලින් සාර්ථක ප්‍රතිඵල ලැබෙන්නේ නැහැ. මා මුලින් කීවාක් මෙන් දින දෙක තුනකට ඉහත අප පත්‍ර මාර්ගයෙන් දුටුවා, ගංගාවලට ඉහළින් ජලාශ වගයක් සාදන්නට යන බව. ජලාශ ඇති කිරීමෙන් පමණක් මේ ප්‍රශ්නය විස දෙන්නේ නැහැ. ගම්පහ ප්‍රදේශයේ තත්ත්වය කොයි ආකාරද? ගම්පහ හඳුන්වා දිය හැක්කේ අත්තනගලු ඔයේ බොක්කක් හැටියටයි. 1931 සිට ක්‍රම ක්‍රමයෙන් ඇනිකට් හදාගෙන ආවා. ඇනිකට් හැදුවාම ජලය රැඳෙනවා. ඊළඟට ගංවතුරක් ඇති වුණ විට එම ජලය මේ බොක්කට ගොස් නතර වෙනවා. එම නිසා ජල ගැල්මක් ආවාම ලොකු බියකට පත් වන්නට සිදු වෙනවා.

පසුගිය ජල ගැල්ම නිසා කුමක්ද සිදු වූයේ? ගම්පහ නගරය අඩි හතරකින් යට වුණා. ප්‍රදේශයේ ගෙවල් 500ක් වාගේ කැඩුණා. මේ පිළිබඳව පවත්නා තත්ත්වය ගැන අවුරුදු දහයක පහළොවක පටන්ම ගොවීන් සමග සාකච්ඡා පවත්වා අප විසින් ඉඩම් සහ වාරිමාර්ග අංශයට සැලසුම් පවා ඉදිරිපත් කර තිබෙනවා. යම් යම් පර්යේෂණ කිරීමෙන් පසුවයි, එම සැලසුම් ඉදිරිපත් කර තිබෙන්නේ. ඔරුතොටයාගොඩ දිය බස්සන ඇළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සකස් කළොත් දෙකන්නය තුළ අක්කර 1,500ක් පමණ වැඩ කරන්නට පුළුවන් වෙනවා පමණක් නොව, කොයි තරම් වැස්සත් මේ වතුර බස්නා ඇළ මාර්ගයෙන් වැඩි වතුර යෑමෙන්, ගම්පහ අත්තනගල්ල ප්‍රදේශය ජල ගැල්මෙන් ආරක්ෂා වෙනවා. ඉඩම් ඇමතිතුමා මේවා සේරම දන්නවා. උන්නැහේ අපේ ආණ්ඩුව කාලයෙත් ඔය ඇමතිධුරයේ සිටි නිසා දැන් අමුතුවෙන් ලියා නොගත්තාට ඔය කරුණු සියල්ලම දන්නවා. අපි ගොවීන් සමග සාකච්ඡා පවත්වා ප්ලෑන් සකස් කොට කරුණු පෙන්නුම් කර දුන්නා. එදා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ගුණසේකර මහත්මයා බලදුසම් නමැති ඉංජිනේරු මහතාත් සමග සාකච්ඡා කර ලක්ෂ හතහමාරක මුදලක් මේ සඳහා වෙන් කර තිබුණා. ඇමතිතුමාගේ ප්‍රාදේශීය ඉංජිනේරු මහත්වරුන් සමග අප මේවා ගැන සාකච්ඡා පවත්වා තිබෙනවා. අන්තිමේදී කුමක්ද සිදු වුණේ? මේ අවුරුද්දේ පෙබරවාරි මාසයේ 20 වන දින මම මේ ගැන ලියා දැනුම් දුන්නා. ඇමතිතුමාටත් කොපියක් එව්වා. ඊළඟට කුමක්ද සිදු වුණේ? මුළු ප්‍රදේශයක්ම ගංවතුරින් යට වූ නිසා ගම්පහ අත්තනගල්ල ආදී ප්‍රදේශවල, ගරු අගමැතිතුමා විසින් ආරම්භ කරන ලද ආහාර වගා කිරීමේ ව්‍යාපාර සියල්ලක්ම අද අහෝසි වී ගොස් තිබෙනවා. බෝගහපිටිය ඇනිකට් එකේ පහළ ප්‍රදේශයට ජලය නැහැ. ඉහළ ප්‍රදේශයට ඕනෑවටත් වඩා ජලය තිබෙනවා. එහි තවමත් වතුර බැහැලා නැහැ.

ආහාර වගා කිරීමේ ව්‍යාපාරයක් ඉදිරියට ගෙනයෑමට නම් මේ රටේ ගොවීන් සමග සාකච්ඡා කර ඔවුනුත් සමග ඉදිරියට යන්නට අප ලෑහැස්ති වන්නට ඕනෑ. ගරු අගමැතිතුමා ආරම්භ කර ඇති ඒ ව්‍යාපාරය වැදගත් එකක්. අප විරුද්ධ පාර්ශ්වයේ සිටගෙනත් අගමැතිතුමා විසින් ආරම්භ කළ එම ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට අත දුන්නේ ඒ නිසයි. එහෙත් අද මතු වී තිබෙන්නේ ඔන්න ඔය ප්‍රශ්නයි. අලුත්ගම, බෙන්මල, පන්විල, කැබෙල්ලවල, ඌරුලෑවල, පොරෝමරුවවිල ආදියෙහි වාරිමාර්ග කටයුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව අවුරුදු 15ක් තිස්සේ පරීක්‍ෂණ පවත්වා රුපියල් 92,000 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළා. ඒ වාගේම මොරැන්ත, කිටවල ආදී ඇනිකට්වල වේලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගොවීන් ඉදිරිපත් වී තිබෙනවා. එහෙත් ඒවායින් වැඩක් නැහැ. ඒ ව්‍යාපාර සියල්ලක්ම නතර වී තිබෙනවා. දක්ෂ, රටට ආදරයක් ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රට ස්වයංපෝෂිත කරන්නට කොතරම් මහන්සි වුණත් මේ ප්‍රශ්න මෙසේ තිබියදී මේ රට ස්වයංපෝෂිත කරන්නේ කොහොමද ? ඒ සෑම ව්‍යාපාරයක්ම ඇනහිට තිබෙනවා. ජල ගැල්ම නිසා මුළු ප්‍රදේශයම පාළු වී තිබෙනවා. ඒ නිසා මේවා ගැන සොයා බලා සුදුසු පියවර ගන්නා ලෙස ගරු අගමැතිතුමාගෙන් අප ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

හලාවත ප්‍රදේශයට විශාල විනාශයක් සිදු වී තිබෙනව ඒ ප්‍රදේශයට හරියාකාර "වින්ඩ් බෙල්ට්" හෙවත් සුළං බඳන ගස් පේළි සකස් කර තැබීම අවශ්‍යයි. ඒ ප්‍රදේශයේ අමුතුවෙන් කැලෑ එළි කරන්න එළි කරන්න තව තවත් සුළි සුළංවලින් විනාශ වේවි. එසේ වන්නේ හරියාකාර පරීක්ෂණයක් හෝ හරියාකාර සැලැස්මක් නොමැති නිසයි. ගරු අගමැතිතුමා යටතේ ඇති ක්‍රම සම්පාදන අංශයේ සැලැස්මවල් මුල් කරගෙනයි, මේ රට ස්වයංපෝෂිත කරන්නට ලැහැස්ති වන්නට ඕනෑ. එසේ නොකළොත් මේ ප්‍රශ්න විසඳන්නට ලැබෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට මට විශේෂ කාලසීමාවක් ලබාදීම ගැන මා නැවත වරක් තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 5.19

**ඩී. ඊ. තිලකරත්න මයා.** (රත්ගම)
*(திரு. டி. ஈ. திலகரத்ன—ரத்கம)*
(Mr. D. E. Tillekeratne—Ratgama)

**ගරු** කථානායකතුමනි, පසුගිය ජල ගැල්ම ගැන වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශවලට අලාභ හානි සිදුවුණාක් මෙන්ම ගාලු දිස්ත්‍රික්කයේ හිනිදුම, බද්දේගම, බෙන්තර-ඇල්පිටිය යන ඡන්ද කොට්ඨාශවලටත් විශාල වශයෙන් අලාභ හානි සිදු වී තිබෙනවා. මගේ රත්ගම ඡන්ද කොට්ඨාශයට නම් ඒ තරම් අලාභ හානි සිදු වී නැහැ. රජයට චෝදනා කරන්නට විරුද්ධ පක්ෂයෙන් මොන විධියේ තර්ක ගෙනාවත් මා මේ අවස්ථාවේදී රජයට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ගාලු දිස්ත්‍රික්කයේ නම් ඒ ජලගැල්මෙන් විපතට පත් වූ අයට රජයෙන් විශේෂ ආධාර දුන්නා පමණක් නොවෙයි වෙනත් නොයෙකුත් ආධාර ක්‍රම සලසා ඇති බව මා විශේෂයෙන්ම මතක් කරනවා. බද්දේගම සහ හිනිදුම ඡන්ද කොට්ඨාශවල අනාථ වූවන් දහස් ගණනකට, ගාල්ලේ දිසාපතිතුමාත්, ගාලු කච්චේරියේ නිලධාරි මහත්වරුනුත්, ඒ ගම්වල සමාජ සේවා අංශවල මහත්වරුනුත් බෝට්ටුවලින්, ඔරුවලින් සහ වෙනත් නොයෙක් විධිවලින් දවස ගණනේ ආහාර ද්‍රව්‍ය ගෙන ගොස් බෙදා දෙනවා මගේ ඇස්වලින් දැක්කා. මගේ ඡන්ද කොට්ඨාශයේත් මාහයගොඩ, වේරගොඩ වැනි ගම් සම්පූර්ණයෙන්ම වතුරෙන් යට වෙලා හරක් සිය ගණන් මැරී ගිය බව, අක්කර සිය ගණන් කුඹුරු පාළු වූ බව මතක් කරන්නේ ඉතා කණගාටුවෙන්. කණගාටුවෙන් එය මතක් කළත් ස්වභාව ධර්මයක් අපට වළක්වන්නට බැහැ. ලංකාවේ පමණක් නොවෙයි, මුළු ලෝකයේම ජල ගැලීම්වලින් නොයෙක් විධියට හානි සිදු වන බව අප කව්රුත් දන්නා කරුණක්. ලංකාවේ සිටින ඉංජිනේරු මහත්වරුන්ට වඩා හොඳ ඉංජිනේරු මහත්වරුන් සිටින වෙනත් රටවලුත් ජල ගැලීම්වලට යට වන බව අප කව්රුත් දන්නා කරුණක්. අප කව්රුත් මහන්සි ගන්නට ඕනෑ ස්වභාව ධර්මයෙන් සිදු වන ජල ගැලීම් නවත්වන්නට නොවෙයි; ඒවා ඇති වූ විට එයින් විපතට පත් වූවන් බේරා ගැනීමට, ඔවුන්ට උදව් කිරීමට කටයුතු කිරීමටයි. අපේ කඹුරුපිටියේ මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) කීවා වගේ කුඹුරු අක්කර දහස් ගණනක් පාලු වුණත් අප රජයෙන් ඉල්ලා සිටිනවා, ඒ ගොවීන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. ඊ. තිලකරත්න මයා.]
සම්පූර්ණ සහනය සලසා දෙන ලෙස. ගිය වතාවේ වගේ නොවෙයි, මේ වතාවේ රජයේ උනන්දුව නිසා තමයි, ගොවීන් කුඹුරු වැපුරුවේ, අල, බතල, මයියොක්කා හිටෙව්වේ. ඒ නිසා ඒ අයට සහනය සලසා දෙන ලෙස මා රජයෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කීවා, දැන් ගෙයක් කැඩුණම දෙන්නේ රුපියල් 400 ක් පමණය කියා. එහෙත් මීට පෙර ගෙයක් කැඩුණු විට හෝ වෙනත් විධියකින් අනාථ වූ අයට දුන් වැඩිම මුදල රුපියල් 300 යි.

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)
*(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர-எல்பிற்றிய)*
(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)
නැහැ, නැහැ, 400 ක් දුන්නා.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)
400 දෙන්නට කලින් දුන්නේ 300 යි. දැන් 100 ක් වැඩි කර තිබෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
අපේ රජය කාලයේදී 400 ක් දුන්නා.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)
තමුන්නාන්සේගේ වාරය ආවාම මට පිළිතුරු දෙන්න. මා කියන දේ වැරදි නම් කරුණාකර හරිගස්සන්න. මා දන්න විධියට මීට කලින් දුන්නේ රුපියල් 300 යි. දැන් රුපියල් 400 ක් දෙනවා. ඒක නොවෙයි කාරණාව. මැටියෙන් ශක්තිමත්ව හදා තිබෙන ගෙයක් කැඩුණොත් පමණයි, දැන් රුපියල් 400 දෙන්නේ. පොල් අතුවලින් හෝ පිදුරුවලින් හෝ හැදූ අත්තිවාරමක් නැති ගෙයක් කැඩුණාම ශත 5 ක්වත් හම්බ වන්නෙ නැහැ. මේ ආණ්ඩුවේ පමණක් නොවෙයි. ගිය ආණ්ඩුවෙත්, ඊට කලින් තිබුණු ආණ්ඩුවෙත් ප්‍රතිපත්තිය ඒකයි. පොල් අතුවලින් හෝ පිදුරුවලින් හෝ ගෙවල් හරිගස්සා ගන්නේ දුප්පත්කම නිසයි. ඒ අයට තමයි, වැඩියෙන් උදව් කරන්නට ඕනෑ. හොඳ අත්තිවාරම් දමා, බැම් දමා ගෙවල් හදාගෙන ඉන්න සමහර අයට සෑහෙන වස්තුවක් තියෙනවා. දුප්පත් අයටයි, අප වැඩියෙන් උදව් කරන්නට ඕනෑ. එම නිසා ඒ නීතිය වෙනස් කර, පොල් අතුවලින් හෝ පිදුරුවලින් හෝ සාදා තිබෙන යම්කිසි ගෙයකටත් අලාභයක් සිදු වී තිබෙනවා නම් ඒ ගෙවල් අයිති කරුවන්ටත් ආධාර මුදල් දෙන ලෙස අප ඉල්ලා සිටිනවා.

අපේ ගරු ඉඩම් ඇමතිතුමා දැනට මාසයකට පමණ පෙර මගේ ඡන්දදායක කොට්ඨාශයේ චාරිකාවක යෙදුණා, ඒ අවස්ථාවේදී අළුතෙන් සාදා තිබෙන ගොවිපොළවල් සහ වාරිමාර්ග පෙන්වන්නට මා එතුමා කැඳවාගෙන ගියා. ඇත්ත වශයෙන් එතුමා ඒ අවස්ථාවේදී, මාදම්පා ව්‍යාපාරය ගැන සන්තෝෂ වුණා. මේ ගම් ප්‍රදේශයේ ඡන්දදායකයන් 15,000 කට වැඩි ගණනක් ඉන්නවා. මේ ගම් ප්‍රදේශය හැම අවුරුද්දෙම ජල ගැල්මට යට වෙනවා. එහෙත් මාදම්පා ව්‍යාපරය පටන් ගෙන දැනට ගත වී තිබෙන්නේ අවුරුද්දයි. මේ අවුරුද්දේදී එක ගෙයක්වත් යට වුණේ නැහැ. ඒ ගැන වාරිමාර්ග කටයුතු භාර ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයේ හික්කඩුව යෝජනා ක්‍රමයත්, ගිංගඟ යෝජනා ක්‍රමයත් පටන් ගෙන තිබෙනවා. මා ඉල්ලා සිටින්නේ මේ යෝජනා ක්‍රම දෙක පුළුවන් තරම් ඉක්මණින් සහ පුළුවන් තරම් වැයමින් සාර්ථක ලෙස අවසන් කර දෙන ලෙසයි. එය ලබන අවුරුද්දේදී ඉවර කර ගන්නට පුළුවන් වෙතැයි මා කල්පනා කරනවා. එය ඒ ආකාරයට ඉටු වුණොත් ලබන වසරේ සිට ඒ පළාතට ජලගැල්මක් ඇති නො වෙතැයි මා සිතනවා. මීට වඩා තමුන්නාන්සේගේ කාලය මිඩංගු කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ.

අන්තිම වශයෙන් එක් කාරණයක් පමනක් කියන්නට අදහස් කරනවා. ගාල්ලේ දිසාපතිතුමාටත් එතුමාගේ සහාය නිල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ධාරීන්ටත් මා ස්තුතිවන්ත වන බව ප්‍රකාශ කරන්නට කැමතියි. විශේෂයෙන්ම ගාල්ලේ දිසාපතිතුමාට ස්තුති කරන්නට ඕනෑ. එතුමා විශාල මහන්සියක් දරා දවස් හත අටක් තිස්සේ නිදි මරාගෙන දැඩි උනන්දුවකින් බෝට්ටු පැදගෙන වැඩ කළා. අනාථ වූ උදවියට නියම අත්දමට, හරියාකාරව, එතුමා විශාල උපකාරයක් කළ බව මේ ආණ්ඩුවට මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 5.26

**කාරියවසම් මයා.**

*(திரு. காரியவசம்)*

(Mr. Kariyawasam)

ගරු කථානායකතුමනි, ජලගැල්මෙන් අනාථ භාවයට පැමිණි විශාල ජනකායක් වාසය කරන ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන් මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ ප්‍රදේශයේ ජනතාව ගැන අවශ්‍ය විධිවිධාන යොදන්නැයි ගංවතුර ගහන අවස්ථාවේ දීත් මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටි බව ඔබතුමාගේ අවසරය ඇතිව සඳහන් කරන්නට කැමතියි. රත්ගම ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළාක් මෙන්ම මාත් ගරු අගමැතිතුමාට ස්තුතිවන්ත වන බව ප්‍රකාශ කරන්නට කැමතියි. අපේ පොරොන්දු දුන් පරිදි, ගංවතුරින් අනාථ වූවන්ට ඒ අවස්ථාවේදී පිහිට වන්නට සම්පූර්ණයෙන් කටයුතු සලසා දීම ගැන මා එතුමාට ස්තුතිවන්ත වෙනවා. දිසාපති තුමාටත්, එතුමාට සහයෝගය දුන් එතුමාගේ සහායක නිලධාරීන්ටත් විශේෂයෙන්ම ග්‍රාමසේවක මහතුන්ටත්, සමාජසේවා අංශයේ මහතුන්ටත් අපගේ ස්තුතිය මේ අවස්ථාවේදී විශේෂයෙන්ම පිරිනැමිය යුතුව තිබෙනවා. ඒ ගැන විශේෂයෙන් මතක් කළ යුතුව තිබෙනවා. තමන්ගේ ජීවිත ගැන පවා නොසලකා, ඉතා අභිංසක මෙන්ම අනාථ තත්ත්වයට වැටී සිටි උදවියට අහාරපාන ආදියා බෙදා දුන් ඒ නිලධාරීන් වටිනා සේවයක් කළ බව කියන්නට ඕනෑ. සමහර අවස්ථාවලදී, සමහර තැන්වලට පිකක් ප්‍රමාද වී වුවත් සහනාධාර ලබා දීම හැම තැනකටමත්, හැම දෙනාටමත් කිරීම ගැන අපේ කෘතඥතාව පළ කරන්නට ඕනෑ. විශේෂයෙන්ම ගාලු දිස්ත්‍රික්කයේ ජනයාට සුමාන දෙකක සලාකය නොමිලයේ බෙදා දෙන්නට විධිවිධාන යොදා තිබුණා. ඒ සඳහා අවශ්‍ය නියෝග කර තිබුණු බව මා දන්නවා. ඒ ගැන ස්තුතිවන්ත වෙනවා.

මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කළ යුතු වැදගත් කාරණයක් කෙරෙහි සැලකිල්ල යොමු කරන්නට කැමතියි. ගෙවල් කැඩුණු අයට රුපියල් හාරසියය බැගින් දෙන්නේ මේ අවුරුද්දේ සිටයයි කිව්වා. එය සාමාන්‍යයෙන් සත්‍යයෙන් ඈත් වූ කියමනක් බව කියන්නට ඕනෑ. 1962 ගංවතුර ගැලූ අවස්ථාවේ රුපියල් තුන්සියය බැගින් දුන්නා. ඒ මුදල් ප්‍රමාණය රුපියල් හාරසියයක් දක්වා වැඩි කරන්නැයි ඉල්ලා සිටියා. ඒ අනුව එය හාරසියය කළා. මේ මුදල් ගෙවන්නේ ගෙයි වටිනාකම අනුව නොවෙයි. සාමාන්‍ය යෙන් තමන්ගේ ගෙය කැඩී යාමෙන් අනාථ වූ මහජනයාට යම්තමින් හෝ ඒ වේලාවට සෑහෙන සහනයක් ලැබෙන අත්දමටයි එය ගෙවන්නේ. තාවකාලික නිවාසයක් තනා ගැනීමටයි ඒ මුදල ගෙවන්නේ. ගාලු දිස්ත්‍රික්කයේ තවමත් මූලික ගෙවීමවත් ගෙවා නැති තැන් තිබෙන බව ගරු අගමැතිතුමාට විශේෂ යෙන් මතක් කරන්නට ඕනෑ. ඒ ගැන වහාම සෝදිසි කර කටයුතු කරවන මෙන් ඉල්ලා සිටිනවා. බෙන්තර ආදායම් නිල ධාරි කොට්ඨාශයේත්, දිවිතුර වැලිවිටිය ගම්කාර්යසභා ප්‍රදේශයේත් මූලික ගෙවීම් පවා කර නැහැ. ඒ මිනිසුන් ජීවත් වන දුක්ඛදායක තත්ත්වය ගැන කල්පනා කර වහාම සහනය ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා. ඒ ගැන ඊට වඩා කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ.

රත්ගම ගරු මන්ත්‍රීතුමා කථා කරද්දී කී කාරණයක් ගැන සඳහන් කරන්නට ඕනෑ. මේවා ස්වභාව ධර්මයෙන් සිදු වන දේවල් නිසා ඒ ගැන මෙනෙහි කර සැනසෙන්නට ඕනෑයයි එතුමා කියා සිටියා. ඒ අදහසට එකඟ වන්නට පුළුවන් කමක් ඇතැයි මා හිතන්නේ නැහැ. අනු ක්‍රමයෙන් දියුණු වන මිනිසා කරන්නේ ස්වභාව ධර්මය ජය ගැනීමයි. ඕනෑම රජයක් ස්වභාව ධර්මය ජය ගන්නටයි ක්‍රියා කරන්නේ. ස්වභාව ධර්මයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

ලැබෙන දේ පාවිච්චි කරන අතර ඒවා තමන්ගේ ප්‍රයෝජනයට හරවා ගැනීමයි දියුණු මිනිසා කරන්නේ. ස්වභාව ධර්මයට යටත් වන්නට නම්, ඊට අවනත වන්නට නම්, ඊට අනුකූලතාව දක්වන්නට නම්, මේ ඇඳුම් පැළඳුම්වත් මේ විධියට සකස් කර ගන්නට වුවමනාවක් නැහැ. ස්වභාව ධර්මය ජයගෙන ගංවතුර භීතියත් නැති කරගෙන රට සංවර්ධනය කරන්නැයි පරාක්‍රමබාහු අවතාරය හැටියට හඳුන්වනු ලබන තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

එක් කරුණක් මේ අවස්ථාවේදී විශෙෂයෙන් මතක් කළ යුතුව තිබෙනවා. මේ රටේ ගංවතුර ප්‍රශ්නය නිරාකරණය කරන ලෙස 1961 රාජාසන කථා විවාදයේදීත් මා මෙම ගරු සභාවෙහිදී ඉල්ලා සිටියා. එදාත් ඉඩම් ඇමතිව සිටියේ අද සිටින ඉඩම් ඇමතිතුමාමයි. දැන් අවුරුදු 12ක් පමණ කාලයක් තිස්සේ ඉඩම් ඇමති ධුරය දරන්නේ එතුමායි. ගිංගඟ යෝජනා ක්‍රමය ආදී වශයෙන් වූ යෝජනා ක්‍රමත් තිබෙනවා. පසුගිය ආණ්ඩුව කාලයේදීත් ඕනෑ තරම් යෝජනා ස්ථිර වී තිබෙනවා. එහෙත් අද වන තුරු ගිංගඟ යෝජනා ක්‍රමය වෙනුවෙන් එක පස් පිඩැල්ලක්වත් කපා නැහැ.

ගඟබඩ පත්තුවේ මහජනතාවත් ඒ වාගේම වළල්ලාවිටි කෝරළයේ මහජනතාවත් වෙනුවෙන් බෙන්තර ගඟ සම්බන්ධ යෝජනා ක්‍රමයක සැලැස්මක් තිබෙනවා. දැන් අවුරුදු 10 ක් 11 ක් තිස්සේ ඉඩම් මනිනවා. අවුරුදුපතා විශේෂඥයින් ඇවිත් බලනවා. එහෙත් කිසිවක් කෙරී නැහැ. මොන කරුණක් නිසා ගරු ඇමතිතුමා බෙන්තර ගඟ යෝජනා ක්‍රමයත් ගිංගඟ යෝජනා ක්‍රමයත් මේ විධියට අතපසු කරනවාදැයි මා දන්නේ නැහැ. මේ අතපසු කිරීම නිසා දැන් මිනිසුන් සිය ගණනක් මැරෙන්නට ඇති. කෝටි ගණනක අලාභයක් මේ ප්‍රදේශවල ජනතාවට සිදු වන්නට ඇති. ගඟබඩ පත්තුව අවුරුද්දකට දෙවරක් සම්පූර්ණයෙන්ම ගංවතුරෙන් විනාශ වෙනවා. බද්දේගම ආදී ප්‍රදේශ පමණක් නොව—හිනිදුම ගරු මන්ත්‍රීතුමා (එම්. එස්. අමරසිරි මයා.) අද මෙම ගරු සභාවෙහි නැහැ—හිනිදුම ප්‍රදේශයත් විනාශ වෙනවා. මේ වර ඇති වුණු ජලගැලීම නිසා ගරු අගමැතිතුමාගේ ගමන් පවා කල් දමා තිබෙනවා. ස්වභාව ධර්මය අනුව මේවා සිදු වන්නට ඉඩ හැර අප නිකම් සිටිනවා නම් අපගේ අනෙක් කටයුතුත් අතහැර දමන්නට ඕනෑ. ස්වභාව ධර්මය ජය ගෙන මේ ගංවතුර විපත නැති කර ගන්ට අපට පුළුවනි.

මීට වඩා විශාල වශයෙන් ගංවතුර විපත් සිදු වන රටක් චීනය. “චීනයේ විලාපය” නමින් හැඳින්වෙන හ්වැංහෝ ගඟේ පවා ජල ගැලීම් පාලනය කරන්නට ඒ රටට පුළුවන් වුණු බව චීනය පිළිබඳ විශෙෂ මතයක් දරන අපේ ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මයා.) ප්‍රකාශ කළා. ඉතින් චීනයට ඒ තරම් කටයුතු කරන්නට පුළුවන් නම් සිංහලයින් වන අපට ඊට වඩා හොඳට මේ රටේ ගංවතුර පාලනය කර ගන්ට බැරිද? ඊට වඩා හොඳට වැඩ කරන්නට අපේ ඉඩම් ඇමතිතුමාට බැරිද? අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා මැද පෙරදිග තිබෙන සියලුම ක්‍රම දැනගෙන දැන් ඇවිත් සිටිනවා. එම නිසා එතුමා කෙසේ හෝ ගරු අගමැතිතුමාටත් කියා—භේදයක් තිබෙන බව කියැවෙතත් එවැනි කිසිම දෙයක් ඇතැයි මා හිතන්නේ නැහැ—මේ රටේ ගංවතුර විපත වළක්වා ගන්නට කටයුතු යෙදුවොත් අන්න එදාට මා තමුන්නාන්සේලාට ස්තුතිවන්ත වෙනවා. මෙවර ගංවතුරෙන් අනාථ වුණු අසරණයින්ට පිහිට වීමට ඉක්මන් වැඩ පිළිවෙළවල් යෙදීම ගැන මා ගරු අගමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එම වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම සඳහා දිසාපතිතුමාත් වෙනත් නිලධාරීනුත් ගත් මහන්සිය ගැන මා ඒ අයටත් ස්තුතිවන්ත වෙනවා. බෝට්ටු ආදිය යොදා ආහාර ද්‍රව්‍ය බෙදා දීමේ කටයුතු හොඳින් කෙරුණා.

ගරු ඉඩම් ඇමතිතුමාගෙන් මා මේ අවස්ථාවේදී විශෙෂයෙන් ඉල්ලා සිටින්නේ ගිංගඟ යෝජනා ක්‍රමය වහාම ක්‍රියාත්මක කරන ලෙසයි. මා මේ ඉල්ලීම විසි වරක් පමණ කරන්නට ඇති. පසුගිය අතුරු මැතිවරණ කාලයේදී ඉඩම් ඇමතිතුමා ගොස් දිවිතුර වෙල්යාය මැන්නා. ගංවතුර නවත්වන බවට පොරොන්දුවක් එදා එතුමා ඒ ප්‍රදේශයේ ජනතාවට දුන්නා. ඒ පොරොන්දුව ඉෂ්ට කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලෙස මා දැන් එතුමාගෙන් ඉල්ලා සිටිනවා. මා සිනාසෙමින් මේ කරුණු කිව්වත් අන්ත දුක්ඛිත තත්ත්වයකට පත්ව සිටින ජනතාවගේ සංවේගය දනවන සුලු ශෝකාලාපයේ දුක් සුසුම් සමූහයයි මා දැන් මේ තමුන්නාන්සේලා ඉදිරියෙහි තබන්නේ. ගාලු දිස්ත්‍රික්කයේ ගංවතුර වැළැක්වීම පසුගිය ආණ්ඩුව කෙළේ නැතැයි කියමින් තමුන්නාන්සේලා එය පැහැර නොහරිනවා ඇතැයි මා විශ්වාස කරනවා. යම් විධියකින් තමුන්නාන්සේලා මේ ප්‍රශ්නය නොවිසඳුවොත් මිළඟට අප බලයට පමිණි විට අපේ ආණ්ඩුවක් විසින් මෙය විසඳන බව මතක් කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

අ. භා. 5.34

**විජයසුන්දර මයා.**

*(திரு. விஜயசுந்தர)*

(Mr. Wijesundera)

ගරු කථානායකතුමනි, නිල්වලා ගඟ ගැලීමෙන් වූ විපත සම්බන්ධයෙන් ප්‍රථම යෙන් අප ඇහුම්කන් දුන්නා. ඊළඟට ගම්පහ පළාතට ගංවතුරින් සිදු වූ විපත සම්බන්ධයෙන් ඇහුම්කන් දුන්නා. අනතුරුව බෙන්තර ගඟෙන් වූ විපත ගැන සාකච්ඡා කළා. හලාවත ප්‍රදේශයට හානි සිදු කළ දුදුරුඔය තරමටම විපතක් සිදු කළ කළුගඟ ගැන සාකච්ඡා කරන්නට අවශ්‍යව තිබෙනවා. කැළණිගඟ සම්බන්ධයෙන් දෙහිඕවිට ගරු මන්ත්‍රීතුමා මෙන්ම (වීරසේකර මයා.) කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාත් (ඉලංගරත්න මයා.), ඒ වාගේම හලාවත ප්‍රදේශයට විපත් පැමිණවූ දුදුරුඔය සම්බන්ධයෙන් නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමාත් (එම්. තෙන්නකෝන් මයා.) කථා කරන්නට බලාපොරොත්තුව සිටිනවා. මේ අවස්ථාවේදී ගරු කථානායකතුමාටත් කථා කරන්නට හැකියාවක් තිබෙනවා නම් ඔය කථානායක ආසනය වෙන කෙනකුට පවරා මෙම ගරු සභාවට පැමිණ පැය හතරක් පහක් තිස්සේ කථා කරන්නට තමුන්නාන්සේගේ හදවත තුළ ලොකු ආශාවක් තිබෙන බව අප දන්නවා.

ගංවතුර ප්‍රශ්නය ගැන අප සාකච්ඡා කළ යුත්තේ දේශපාලන වශයෙන් කල්පනා කර බැලීමෙන් නොවන බව මගේ හැඟීමයි. ඒ වාගේම ප්‍රශ්නවලට සහ පිළිතුරුවලට පමණක් අපේ සාකච්ඡාව සීමා කරන්නට හොඳ නැහැ. උත්තර බලාපොරොත්තුවෙන් පමණක් නොවෙයි කාරණා ඉදිරිපත් කළයුත්තේ. මේ රට මෙම වසංගතයෙන් මුදා ගන්නේ කෙසේ ද යන පරමාර්ථය හිතේ තබාගෙන අප මෙම ප්‍රශ්නය ගැන සාකච්ඡා කළ යුතුයි. ගංවතුරෙන් විපතට පත් වූවන්ට රජය මඟින් දෙන ලද ආධාර හරියාකාර බෙදී තිබෙනවාද, ආධාර නොලැබුණු පළාත්වලට මොන මොන ආධාර දිය යුතුද, මේ ගංවතුර විපත වැළැක්වීමට කුමක් කළ යුතුද යන මේ කාරණා මෙම සාකච්ඡාවේ දී වැදගත් වෙනවා. සමාජ සේවා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා මෙම අවස්ථාවේදී මෙහි නොසිටියත් එතුමා මේ කාරණා සම්බන්ධයෙන් කටයුතු කරනවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා. ඇත්තෙන්ම එතුමා තුළ තිබෙන උනන්දුව විශාලයි. එහෙත් එතුමාගේ උනන්දුව අනුව වැඩ සිදු වෙනවාද යන්න පිළිබඳවත් මේ අවස්ථාවේදී සාකච්ඡා කරන්නට සිදු වී තිබෙනවා. මෙම විවාදයට ගරු අගමැතිතුමාත්, ගරු ඉඩම් ඇමතිතුමාත්, සමාජ සේවා කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාත් සහභාගි වී සිටින හෙයින් විපතට පත් වූවන්ට ආධාර දීම සම්බන්ධයෙන් මෙන්ම ගං වතුර වැළැක්වීම සඳහා සැලකිල්ල යොමු කරවනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

ප්‍රධාන වශයෙන්ම ගංවතුර ඇති වන්නේ ගංගා උතුරා යෑම නිසා නොවෙයි. වායු ගෝළයේ ඇති වන චණ්ඩ මාරුත නිසා ප්‍රධාන වශයෙන්ම ගංවතුර ඇති වෙනවා. මෙම චණ්ඩ මාරුත ආදියෙන් ඇති වන ගංවතුර විපත හා සුළි සුළඟ, නාය යෑම් ආදී විපත් සම්බන්ධයෙන් මෙන්ම අපේ පළාත්වලට විපතක්ව තිබෙන ජල උල්පත් ගලා යෑම සම්බන්ධයෙන්ද කථා කළ යුතුව තිබෙනවා. ගංවතුර හා සුළි සුළං සම්බන්ධයෙන් ඉහළ මට්ටමෙහි කොතරම් උනන්දුවක් තිබුණත් පහළ මට්ටම දෙස පොදු වශයෙන් කල්පනා කර බලන විට ඒ උනන්දුව බොහෝ දුරට අඩු වී ගොස් තිබෙන බව පෙනී යනවා. පසුගිය වාරයේදී ගංවතුර ඇති වූ විට නිලධාරීන් තුළත් මහජනයා තුළත් විශාල උනන්දුවක් දක්නට



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයසුන්දර මයා.]

තිබුණා. එහෙත් විපතට පත් වූවන්ට ආධාර දීම සම්බන්ධයෙන් එදා තිබුණු උනන්දුව මෙදා දකින්නට තිබුණේ නැහැ. යම් යම් පළාත්වල යම් යම් නිලධාරීන් ඉතා දක්ෂ ලෙස වැඩ කරන්නට ඇති. එහෙත් බොහෝ පළාත්වල නිලධාරීන් සහ මහජනයා උදාසීනත්වයක් පෙන්නුවා. මහජනයා යන්නෙන් මා අදහස් කෙළේ මෙවැනි අවස්ථාවලදී ඉදිරිපත් වී ආධාර දෙන මහජනයායි. මේ විධියේ උදාසීනත්වයක් මේ වර ඇති වූයේ නිරතුරුවම මෙම විපත සිදු වන නිසයි. යම්කිසි විපතක් නිරතුරුවම සිදු වන විට ඒ පිළිබඳව උනන්දුවෙන් කටයුතු කිරීමට තරම් ධෛර්‍යයක්, ඕනෑකමක් හා උනන්දුවක් ඒ විපතට සහනය සලස්වන්නට ඉදිරිපත් වන මහජන සංවිධානවලටත් නිලධාරීන්ටත් ඇති වන්නේ නැහැ. ඒක ස්වභාව සිද්ධියක්. එසේ හෙයින් මේ විපත සදාකල්හි කොතරම් දුරට මැඩ පැවැත්විය හැකිද යන්න පිළිබඳව අප මේ අවස්ථාවේදී විශේෂයෙන් සාකච්ඡා කරන්නට වුවමනායි.

ගංවතුර නිසා නිතරම විපත් පැමිණෙන පළාත් තිබෙනවා. ඒ වාගේම ඉඳ හිට විපත් පැමිණෙන පළාත් තිබෙනවා. සුළි සුළං නිසා ගංවතුරෙන් සිදු වුණු විපතට වඩා විපතක් සමහර පළාත්වලට ඇති වුණා. එහෙත් එවැනි විපත් ඇති වන්නේ බොහෝ කාලයකට වරක් පමණයි.

ගරු කථානායකතුමනි, කළුගඟ හා කැලණි ගඟ ගැලීමෙන් සිදු වන විපත්තිය නම් අපට අවුරුද්දකට දෙවතාවක් තරම දකින්නට පුළුවන් වෙනව. ඒ නිසා මා මේ අවස්ථාවේදී කාරණා කීපයක් ගැන රජයේ අවධානය යොමු කරවන්ට කැමතියි. විශේෂයෙන් කළුගඟ අසබඩ ප්‍රදේශයේ ඇතිවන ගංවතුර නිසා බොහෝ විට ශ්‍රී පාදස්ථානයේ සිට රත්නපුරය දක්වා ඇති මාර්ගයේ තිබෙන ගිලීමලේ රත්නපුර මහා මාර්ගයත්, රත්නපුර-පානදුර මහා මාර්ගයේ රත්නපුරයේ සිට නම්බපාන දක්වා කොටසෙත් වාහන ගමනාගමනය ඇණහිටිනව. මේ විපත්තිය නිසා මේ රටේ සංවර්ධනයට ඇති වෙන්නෙ විශාල බාධාවක්. කුඹුරු හා හෙවල් විනාශ වීම පමණක් නොව වර්ෂයකට අඩු ගණනේ මාස දෙකක තරම් කාලයක් ඇතැම් මාර්ග අවහිර වී තිබීමත් රටේ සංවර්ධනයට විශාල බාධාවක්. ඒ නිසා ඊට ස්ථිර ප්‍රතිකර්මයක් කළයුතුව තිබෙනව. කළු ගඟ ගැලීම නිසා ඒ අසබඩ ප්‍රදේශයේ ගිලීමලේ, මල්වල, රත්නපුර නගරය, කහංගම, දොඩම්පෙ, කිරිඇල්ල සහ යටිපව්ව යන ගම් අවුරුද්දකට අඩු ගණනේ මාසයක් දෙකක්වත් ජලයෙන් යට වී තිබෙනව. රත්නපුර-පානදුර මාර්ගයත් අවුරුද්දකට අඩු ගණනේ මාසයක් දෙකක් ජලයෙන් යට වී තිබෙනව. නිරන්තරයෙන්ම වගේ ගංවතුර ආධාර ගෙවිය යුතු ගෙවල් අඩු ගණනේ 1,000 ක් පමණ තිබෙනව. වර්ෂයකට තුන්-හතර වරක් මේ ගෙවල් තැනීමට ආධාර ගෙවනව. 1920 තරම සිට මේ ගෙවල් තැනීමට දුන් ආධාර මුදල් ප්‍රමාණය කොතෙක්දැයි කල්පනා කර බලන්න. ගංවතුරින් හානි සිදු වන ප්‍රදේශවල වැසියන්ට ඒ අසබඩ තිබෙන රජයේ උස් බිම්වලින් හෝ රජයේ ඉඩම් නැති ස්ථානවල වතුවලින් හෝ ඉඩම් ලබා දුන්නොත් එය ඒ උදවියට කරන විශාල සෙතක්. ඒ වගේම රත්නපුර-පානදුර මහා මාර්ගයේ නම්බපාන සිට රත්නපුර දක්වා ඇති කොටසේ බිම ඊට වඩා උස් කරන්නට ක්‍රියා කළොත් අවුරුදු පතා ඒ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව මගින් කරන වියදමත් නතර කරගෙන ඒ මාර්ගයේ ගමනාගමනයත් ඇණ හිටින්නට ඉඩ නොදී තබාගන්ට පුළුවන් වෙනව.

රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර-පානදුර මහා මාර්ගයත්, තලාවිටිය-කුරුගම් මෝදර මාර්ගයත්, ඇහැලියගොඩ-නෑදුරණ මාර්ගයත් නිතරම වතුරෙන් යටවී විනාශයට පත් වෙනව. ඒ පාරවල් හැම අවුරුද්දේම විශාල මුදලක් වැය කර ප්‍රතිසංස්කරණය කරන්ට සිද්ධ වී තිබෙනව. මේ වතාවේදීත් ජලයෙන් යටවුණු ඒ මාර්ග ප්‍රතිසංස්කරණය කරන්ට තවම පටන්ගෙන නැති බව අපට පෙනී යනව. මේ නිසා ලංකා ගමනාගමන මණ්ඩලය ප්‍රකාශ කළොත් "මේ පාරවල බස් ධාවනය කරවන්ට බැරිය" කියා ලංකාවේ ප්‍රධාන මාර්ග දෙකක ගමනාගමනය ඇණහිට මහජනතාවට විශාල කරදරයක් වන බව අප හොඳාකාර දන්නව. එම නිසා කළු ගඟ සහ කුරුගඟ ප්‍රදේශයේ රජයේ උස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බිම්වලින් හෝ එවැනි ඉඩම් නැති ස්ථාන වල පුද්ගලික වතුවලින් හෝ අක්කර ගණනක් ලබාගෙන පහත් බිම්වල පදිංචිව සිටින වැසියන්ට බෙදාදී ඔවුන්ට වාසස්ථාන සාදා ගැනීමට පහසුකම් සලසන ලෙස සමාජ සේවා අමාත්‍යාංශයෙන් සහ ඉඩම් අමාත්‍යාංශයෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, ජල උල්පත් විපත නමැති තවත් විශේෂ විපතක් රත්නපුර දිස්ත්‍රික්කයේ පවතිනවා. කළුගඟේ වතුර වැඩි වීගෙන එන විට කළුගඟට හැතැප්ම 20 ක් 30 ක් ඈතින් පිහිටි ඇතැම් ගම්වලත් විශාල ජල උල්පත් මතු වී ස්වල්ප වේලාවකින් ඒ ප්‍රදේශ ජල යෙන් යට වෙනවා. මෙය භූගර්භ විද්‍යාඥයන් ලවා පරීක්ෂා කර බැලිය යුතු කරුණක්. මේ නිසා අපේ ප්‍රදේශයේ කුරුවිටි කෝරලයේ පුස්සැල්ල වසමේ මිල්ලවිටිය නමැති ගම ප්‍රධාන වශයෙන් විපත්තියට භාජන වෙනවා. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලෙස මම කීප වරක් අමාත්‍යාංශයෙන් ඉල්ලා තිබෙනවා. ඒ වගේම ඒ විපතින් විනාශයට පත්වන ගෙවල් සම්බන්ධයෙන් සහනාධාර දීමේ වැඩ පිළිවෙළක්වත් තවම ඇති වී නැහැ. මේ දිය උල්පත් සම්බන්ධයෙන් අවුරුදු 3 ක් තිස්සේ මා කරුණු ඉදිරිපත් කර තිබෙනවා. පසුගිය අවුරුදු 3 ඇතුළත මිල්ලවිටිය කියන ගමේ ගෙවල් තුන් වතාවක්ම විනාශ වී තිබෙනවා. එම නිසා පුස්සැල්ල මිල්ලවිටියේ දිය උල්පත්වලින් ඒ ප්‍රදේශයේ ගෙවල්වලට වන විනාශය ගැන විභාග කර බැලීම සමාජ සේවා අමාත්‍යාංශයේ යුතුකමක්. එසේම, විනාශ වුණු ඒ ගෙවල් හිමියන්ට සහනයක් සලසන හැටියටත් මා ඉල්ලා සිටිනවා. ඒ හානිය සිදු වන්නේ ගංවතුරෙන් නොවන නිසා ඊට ප්‍රතිකර්මයක් යෙදීමට නීතිරීතිවලින් ඉඩක් නැතැයි සමාජ සේවා අමාත්‍යාංශයෙන් දැනගන්නට ලැබී තිබෙනවා. ඒ නිසා ඒ ගැන විශේෂයෙන් සොයා බැලිය යුතුයි.

ඒ ප්‍රදේශයට ඇති තවත් විශාල විපතක් තමයි, නාය යෑම. ගංවතුර හා සුළි සුළං නිසා ඒ පළාත්වලට වන ලොකු විපත්තියක්, නාය යෑම. මගේ ඡන්දදායක කොට්ඨාශයේ ඇහැලියගොඩ කන්දන්ගමුවේ ආදාගල හා මාළිගාතැන්න කියන ගම් දෙක දැන් නාය යමින් පවතිනවා. එම නිසා දැනටමත් ගෙවල් 20 ක් පමණ අනතුරට භාජන වී තිබෙනවා. ඒ වාගේම තවත් ගෙවල් 50 කට පමණ වහාම පිළියම් යෙදිය යුතුව තිබෙනවා. එම නිසා දිසාපතිතුමා ඒ ප්‍රදේශ වාසීන්ට අවවාද කර තිබෙනවා, එම ස්ථානයෙන් සැතැපුම් 20 ක් පමණ ඈතින් පිහිටි රජයේ කැලෑ ඉඩම්වල පදිංචියට යන හැටියට. එහෙත් ඊට වඩා පදිංචියට පහසු ඉඩම් ඒ ගම් අසබඩ තිබෙන බව සමාජ සේවා අමාත්‍යාංශයට පෙන්වා දෙන්නට කැමැතියි. "අසීස්" හා "සන්ඩ ලැන්ඩ්" යනුවෙන් වතු දෙකක් ඒ ගම් අසබඩ තිබෙනවා. මා කලින් සඳහන් කළ ප්‍රදේශ වාසීන්ට එම වතුවල පරණ රබර් වගා කොටසෙන් ඉඩම් ලබා දුන්නොත් ඒ අයට ගෙවල් තනා ගැනීමට වඩාත් පහසු වන බව මතක් කරන්නට සතුටුයි. අපේ ප්‍රධාන යුතුකම එම වැසියන් උස් බිම්වල පදිංචි කරවීමයි. උස් බිම්වල පිහිටි රජයේ ඉඩම් ඉතුරු වී ඇත්තේ ඉතාමත් සවල්ප යයි. එම නිසා අනිවාර්යයෙන්ම පෞද්ගලික ඉඩම් රජයට පවරාගෙන මහජනතාව අතර බෙදා දෙන්නට සිදු වී තිබෙනවා.

ඒ වාගේම ගංවතුර ගැලූ අවස්ථාවල ඔරු-පාරු පිළිබඳ ප්‍රශ්නයටත් මුහුණ පාන්නට සිදු වෙනවා. ගංවතුර ගැලුවාම—ගුණ ධර්ම පිළිපදින පුද්ගලයන්ට නොවෙයි, සූරා කෑමට කැමති පුද්ගලයන්ට—ඔරු-පාරු හිමියන්ට අවස්ථාවක් ලැබෙනවා, එමඟින් තමන්ගේ මඩිය තර කර ගැනීමට. දිසාපතිතුමා යටතේත්, ගම් සභා යටතේත් ඔරු තිබෙනවා. එහෙත්, ග්‍රාම සංවර්ධන නිලධාරීන් වශයෙන් පෙනී සිටින යම් යම් කුට පුද්ගලයන්ට ඒ ඔරු පවරා තිබීම නිසා, ඔවුන් විසින් කරනු ලබන දූෂණ ක්‍රියා නිසා මහත් විපතක් සිදු වී තිබෙනවා.

කථානායකතුමා මෙන්ම අගමැතිතුමාත් දන්නවා ඇති, පැල්මඩුල්ලේ පසුගිය අතුරු මැතිවරණය පැවැත්වුණු අවස්ථාවේ ඇති වුණු තත්ත්වය ගැන. එම ඡන්දදායක කොට්ඨාශයෙන් 1/3 ක් පමණ වතුරෙන් යට වී තිබුණු දවසකයි, පැල්මඩුල්ලේ අතුරු මැතිවරණය පැවැත්වුණේ. ඒ අවස්ථාවේ හකමුණ, මාරපන, ඇත්ඔය ආදි ප්‍රදේශවල ඔරු සේවය භාර දී තිබුණේ රත්නපුර කච්චේරියේ ග්‍රාම සංවර්ධන නිලධාරි මහත්මයාටයි. දිසාපතිතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයසුන් දර මයා.]

අපට දැනුම් දුන්නා, ඒ ඔරු සේවය එම ග්‍රාම සේවක නිලධාරි මහතා භාරයේ තිබෙන බව. එහෙත් එදා උදය වරුවේ එක ඔරුවක්වත් හරියාකාරව යොදා තිබුණා අප දැක්කේ නැහැ. කොටින්ම කියනවා නම් ඔරුවක් පෙනෙන්නටවත් තිබුණේ නැහැ. තමන්ගේ ඡන්දය පාවිච්චි කිරීමට ඉතාමත් ආශාවෙන් සිටි පුද්ගලයකුට ඒ සඳහා පීනාගෙන එන්නට සිදු වුණේ, ඒ නිසයි. එසේ පීනාගෙන යැමේදී ඔහු ජීවිතක්ෂයට පත් වුණා. ඊට පසුව පොලීසිය මැදිහත් වී ඔරු සේවය හරියාකාරව ක්‍රියාත්මක කළා. එම නිසා එවැනි අවස්ථාවල රජය සතු ඔරු හරියාකාරව පවත්වා ගැනීම සඳහා කටයුතු කිරීමට සිදු වී තිබෙනවා.

ඔරු සේවය හරියාකාරව ක්‍රියාත්මක කිරීමට නම් එය භාර දිය යුත්තේ ඒ ඒ පුද්ගලයන්ට නොවෙයි. ග්‍රාම සේවකයන් රජයට වගකිව යුතු පිරිසක්. එම නිසා ඒ ඔරු සේවය ඔවුන් යටතට පත් කළොත් එය නියම විධියට ක්‍රියාත්මක වේ යැයි මා හිතනවා. එම නිසා ඒ ඔරු සම්බන්ධයෙන් විධිමත් ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අනාථ ආධාර ගැනත් වචනයක් දෙකක කිව යුතුව තිබෙනවා. මෙවැනි අවස්ථාවල අනාථ ආධාර බෙදීමේදී මෙන්ම එකතු කිරීමේදීත් නොයෙකුත් අක්‍රමිකතාවන් සිදු වෙනවා. සමහර උදවිය එවැනි අවස්ථාවල අවංකව ඉදිරිපත් වී ක්‍රියා කරනවා. එහෙත් සමහර උදවිය අනාථ ආධාර එකතු කිරීමේදීත්, ඒවා බෙදා හැරීමේදීත් වංචනික පිළිවෙළට වැඩ කරනවා. රජයෙන් දෙන ආධාර පවා තමන්ගේ පෞද්ගලික දෙයක් හැටියට සලකාගෙන බෙදා දෙනවා මා බොහෝ විට දැක තිබෙනවා. සමහර නිලධාරීන් ඒවාට ඉඩ දී ඇස් පියාගෙන ඉන්නවා. රජයේ සමහර නිලධාරීන් එසේ ඇස් පියාගෙන මෙන් කටයුතු කිරීම නිසායි වංචනික පුද්ගලයන්ට අයුතු පිළිවෙළට වැඩ කරන්නට පුළුවන්කම ලැබී තිබෙන්නේ. මෙවැනි ගංවතුර අවස්ථාවක් සෙල්ලම් කළයුතු අවස්ථාවක් නොව, වගකීමෙන් යුක්තව ක්‍රියා කළ යුතු අවස්ථාවක් බව නිලධාරි මහත්වරුන් කීප දෙනකුට මතක් කර දීමට අපට සිද්ධ වී තිබෙනවා.

අලාභහානි වූ ගෙවල් තක්සේරු කිරීම හා පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් බොහෝ විට ග්‍රාමසේවක මහත්වරුන්ට විරුද්ධව පැමිණිලි ගලාගෙන එනවා. එය ස්වාභාවික සිද්ධියක්. සමහර විට මෙම පැමිණිලි සත්‍යයෙන් තොර ඒවා වෙන්නත් පුළුවන්; සත්‍යයෙන් යුක්ත ඒවා වෙන්නත් පුළුවන්. කෙසේ හෝ වේවා, මෙම චෝදනාවලින් ආරක්ෂා වීම පිණිස අනුගමනය කළ හැකි යම් පිළිවෙළක් මා පෙන්වා දෙන්න කැමතියි. එවැනි තක්සේරු කිරීම් සහ පරීක්ෂා කිරීම් සඳහා යන විට ඒ කොට්ඨාශයේ ගම්කාර්ය සභාවේ සභිකවරයා හෝ ග්‍රාමසංවර්ධන සමිතියේ සභාපතිවරයා හෝ පළාතේ මන්ත්‍රීවරයාගේ නියෝජිතයකු හෝ ඇතුළු යම්කිසි කණ්ඩායමක් සමග ග්‍රාමසේවක මහතා යනවා නම්, මා හිතනවා ඉතාමත් පැහැදිලි ලෙස මේ වාර්තා ලබාගන්න පුළුවන් වේවිය කියා. මේ පිළිවෙළ සෑම විටම අනුගමනය කරන්න බැරි වෙන්න පුළුවන්. එහෙත් හැකි සෑම අවස්ථාවකම ඒ ක්‍රමය අනුගමනය කරන්නේ නම් පසුව එල්ල වන්නට ඉඩ තිබෙන චෝදනාවලින් ආරක්ෂා වන්න පුළුවන්.

ගංවතුර වැළැක්වීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කෙළින්ම වගකීමක් තිබෙන අමාත්‍යාංශයක් තමයි ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය. ප්‍රධාන වශයෙන් ගංගා පළල් කිරීමේ ප්‍රශ්නයට අපට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. දැනට කළු ගඟ තුන් වතාවක්ම පළල් කර ඇති නමුත්, ගංවතුර පිළිබඳ තත්ත්වය තවමත් එසේම තිබෙනවා. ජල මට්ටමත් එහෙමමයි. එම නිසා මේ ගංගාව හරස් කර හරවන යම්කිසි ක්‍රමයක් ඇති කිරීමේ වැඩ පිළිවෙළක් සලස්වනවා නම් රටටත් ප්‍රයෝජනයක් ලබාගන්න පුළුවන්. බෙන්තර-ඇල්පිටියෙ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළාක් මෙන් චීනයේ විලාපය නමින් තිබුණු හ්වැංහෝ ගංගාව අද චීනයේ භාග්‍යය හැටියට හරවාගෙන දැන් කටයුතු කරගෙන යන බව තමුන්නාන්සේලා දන්නවා ඇති. ගංගාවලින් ජලසම්පාදනය කරගෙන වාරිමාර්ග අවශ්‍ය ඉඩම්වලට එය හරවා වතුර බෙදා හැරීමෙන් පුළුල් වශයෙන් ක්‍රියා කළ යුතු අවස්ථාවකට දැන් අප පත් වී සිටිනවා. ඉඩම් අමාත්‍යාංශය මේ ගැන වහාම කල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පනා කර ක්‍රියා කළ යුතුයි. එසේ නො කළොත් සෑම වර්‍ෂයක් පාසාම ආධාර බෙද මින් සිටීමට අපට සිද්ධ වෙනවා. ආධාර බෙදීම හොඳ වැඩක්. එහෙත් නිරන්තර යෙන්ම එසේ කරමින් සිටිනවාට වඩා හොඳයි, ඒ සඳහා වැය වන මුදල අරගෙන ගංවතුර වැළැක්වීමේ ස්ථිර වැඩ පිළි වෙළක් සකස් කර අනාගත සංවර්ධනයට ඉවහල් වන සේ කටයුතු කිරීම.

අද කුඹුරු සම්බන්ධයෙන් ඇති වී තිබෙන විනාශය ගැන කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. කුඹුරු සහ හේන් ගොවිතැන්වලට සිදු වූ පාඩුව සඳහා යම් කිසි සහනයක් ඉතාමත් ඉක්මණින් සැලසිය යුතු අවස්ථාවක් අද එළඹ තිබෙ නවා. ඒ සම්බන්ධයෙන් ගොවිකම් අමාත්‍යාංශයෙන් චක්‍ර ලේඛයක් යවා තිබෙන නමුත්, අනික් නිලධාරීන් ඒ චක්‍ර ලේඛ අනුව කෙසේ ක්‍රියා කරන්නේද කියන එකත් වැඩ බලන ඇමතිතුමා ටිකක් සොයා බැලිය යුතු බව මා මතක් කරන්න කැමතියි.

අප විසින් ඉතාමත් සංක්ෂේපයෙන් ඉදිරිපත් කරන ලද මේ කරුණු ගැන සලකා බලා යම් සහනයක් සලසන ලෙස ඉල්ලන අතර, වර්‍ෂයක් පාසා සිදුවන ගං වතුර ගැලීම නතර කිරීම සඳහා හැකිතරම් දුරට යම්කිසි සංවර්ධන සැලැස්මක් ඇති කර මෙම විනාශයෙන් රට ගලවා ගැනීමට අධිෂ්ඨාන කර ගන්නවා ඇතැයි බලා පොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 5.53

**ෆේපස්ටස් පෙරේරා මයා.** (වෙන්නප්පුව)

*(திரு. பெஸ்ற்றஸ் பெரேரா—வென்னப்புவ)*

(Mr. Festus Perera—Wennappuwa)

ගරු කථානායකතුමනි, මට පෙර කථා කළ කිරිඇල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ කථා වෙදි එතුමා කිව්වා, ගංවතුරෙනුත් සුළි සුළි ඟෙනුත් ඇති වුණ මේ විපත ගැන දේශ පාලන පක්ෂ තත්ත්වයෙන් තොරව සාකච්ඡා කරන්න ඕනෑය කියා. එතුමාගේ ඒ ප්‍රකාශය ගැන අප බොහෝ සන්තෝෂ වෙනවා. එහෙත් ඊට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමන්ලා කීප දෙනකුම කළ කථා වලට ඇහුම්කන් දීගෙන සිටි අපට පෙනී ගියා, ගංවතුරෙන් සහ සුළි සුළඟෙන් මේ රටේ ජනතාව බේරුවේ නැත කියා රජයට චෝදනා කළ බව. ගංවතුර සම්බන්ධයෙන් කල්පනා කර බලන විට කථානායකතුමනි, එය ඊයේ පෙරේදා සිට ඇති වන්නට පටන් ගත් දෙයක් නොව, අප දන්න කියන කාලයටත් ඉතා ඈත අතීතයේ පටන්ම මෙම විනාශයට ලක් ජනතාව පත් වුණ බව අප පිළිගන්න ඕනෑ. එවැනි තත්ත්වයක් තිබෙද්දීත් ගරු ඉඩම් ඇමතිතුමාට චෝදනා එල්ල කළා, පසුගිය කාලයේදී ගං වතුර ගැලීම වැළැක්වීම සඳහා එතුමා කට යුතු කළේ නැතැයි කියා. එම ගරු මන්ත්‍රී තුමන්ලා, ගරු ඉඩම් ඇමතිතුමාට චෝදනා එල්ල කළාට වඩා පසුගිය රජයට චෝදනා එල්ල කළා නම් හොඳයයි මා කල්පනා කරනවා. ඒ මන්ද? ගරු ඉඩම් ඇමතිතුමා පමණක් නොවෙයි මේවාට වගකිව යුත්තේ. ඒ කාලයේදී තිබුණු රජය, අවුරුදු නවයක පමණ කාලයක් තිස්සේ මේ රට පාලනය කළා; ඒ කාලය තුළදී නියම සැලැස්මක් යටතේ ගංවතුර ගැලීම වැළැක් වීමට, පාලනය කිරීමට පියවර ගත්තා නම් අද ගංවතුරෙන් ඇති වී තිබෙන විශාල විපත බොහෝ දුරට මඟ හරවා ගන්න පුළුවන් කම තිබුණා. එමනිසා, ඇතැම් ගරු මන්ත්‍රී වරුන් විසින් මෙම ආණ්ඩුවට, විශෙෂ යෙන්ම ඉඩම් ඇමතිතුමාට, එල්ල කළ චෝදනාවන් සම්බන්ධයෙන් දීර්ඝ වශ යෙන් කථා කරන්න මා අදහස් කරන්නේ නැහැ.

එපමණක් නෙවෙයි, ගරු කථානායක තුමනි, ඇතැම් මන්ත්‍රීවරුන් ප්‍රකාශ කරන්න යෙදුණා, පසුගිය රජයත් වන්දි මුදල් වශයෙන් රුපියල් හාරසියයක මුද ලක් එක් පවුලකට ගෙව්වාය, මේ රජය ගන්නා ලද පියවර පසුගිය රජයත් ගත්තාය කියා. මේ පිළිබඳවත් කරුණු දෙකක් කියන්න කැමතියි. මේ රජය, පසු ගිය රජයට වඩා දුප්පත් ජනතාව වෙනු වෙන් මෙම විපතේදී කටයුතු කර තිබෙන බව පෙන්නා දෙන්න කැමතියි. ගරු කථා නායකතුමනි, ඔබතුමාගේ කොට්ඨාශයේත්, නාත්තන්ඩිය කොට්ඨාශයේත්, මගේ කොට්ඨාශයේත් ජනතාව විශාල විපතකට මුහුණ දී ඇති බව අප දන්නා කාරණයක්. එම විපතේදී, ගරු අගමැතිතුමා අපේ ප්‍රදේශයට ගොස්, පැල්පත්වලට පවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේපස්ටස් පෙරේරා මයා.]

ගොස්, විපතට පත් වූ උදවියගෙන් කරුණු විමසා ඒ අයට සහනයක් සැලසීම පිණිස වහාම ක්‍රියා කිරීම ගැන එතුමාට ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් මා ස්තුතිවන්ත වෙනවා. පසුගිය රජය මෙබඳු අන්දමේ විපත්වලදී ගත් ක්‍රියා මාර්ගයත් මේ රජය ගත් ක්‍රියා මාර්ගයත් අතරේ වෙනසක් තිබෙනවා. විපතට පත් වූවන්ට ආධාර මුදල් ගෙවීමට පසුගිය රජය තිබුණු කාල යේදී සති ගණනක් නැතිනම් මාස ගණනක් ගතවූ නමුත් මෙවර ආධාර මුදල් ගෙවීමේ නිරතව සිටි නිලධාරි මහතුන් දින ගණනකින්ම විපතට පත් උදවියට ආධාර මුදල් දුන්නා; වන්දි ගෙවීම් කළා; නොයෙකුත් නීතිරීති ගැන, "රෙඩ් ටේප්" ගැන සලකන්නේ නැතුව. ඒ අන්දමට නීතිරීති ගැන සලකන්නේ නැතුව දුප්පත් ජනතාවට හදිසියේම පැමුණුන මේ විපතේදී සහනය සැලසීම පිණිස ගත් පියවර ගැන ප්‍රදේශවාසීන් මේ ආණ්ඩුවට ස්තුතිවන්ත වන බව කියන්න සතුටුයි.

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවෙ මෙතෙක් සාකච්ඡා වුණේ ගංවතුරෙන් වූ විපත ගැනයි. සුළි සුළඟින් වූ විනාශය ගැන කිසිම මන්ත්‍රීවරයෙකු සඳහන් කළේ නැහැ. ඇත්ත වශයෙන්ම හලාවත ප්‍රදේශයට සුළි සුළඟින් විශාල හානියක්, විනාශයක් සිදු වී තිබෙනවා. මෙම සුළි සුළඟින් හලාවත දිස්ත්‍රික්කයේ ඇති කොට්ඨාශ තුනටම සිදු වී ඇති බරපතල හානිය ගැන තවමත් සෑහෙන අවබෝධයක් ඇති වී නැතැයි මා කල්පනා කරනවා. මා හිතන හැටියට අපේ ගරු අගමැතිතුමාට ඒ පිළිබඳව අවබෝධයක් ඇති වීමෙන් එම ප්‍රදේශයේ විපතට පත් ජනතාවට අවශ්‍ය කෑම්බීම් ආදිය වහාම යවන්නටයයි නියෝග කර තිබෙනවා. සුළි සුළඟින් ඒ ප්‍රදේශයට සිදු වී ඇති හානිය ගැනත් කරුණු හෙළිදරව් කිරීමට මේ අවස්ථාවේදී මා අදහස් කරනවා.

අද හලාවත ප්‍රදේශයේ මහා මාර්ගයෙන් මදක් ඈතට යන කෙනෙකුට සුළි සුළඟින් සිදු වී ඇති මහා විනාශය පෙනී යනවා ඇති. පොල් ගස් දහයක් දොළහක් ඇති දුප්පත් උදවියට අයත් කුඩා ඉඩම්වල ගස් සියල්ල ක්ම වාගේ ඉදිරී වැටී විනාශ වී ගොස් තිබෙනවා. එපමණක් නොවෙයි, ඇතැම් ස්ථානවල නිවාසයන් මත ගස් තුන හතර වැටී ඇති ආකාරය දකින්න ලැබෙනවා. ඒ අන්දමට මුළු හලාවත ප්‍රදේශයේම බරපතල විනාශයක් සිදු වී තිබෙනවා. ඉතිහාසයේ මින් පෙර නොවූ අන්දමේ බරපතල විනාශයකට මේ ප්‍රදේශ වාසීන් මුහුණ දී ඇති බව ගරු කථානායකතුමනි, තමුන්නාන්සේත් පිළිගන්නවා ඇති. පොල් වගාව දෙස බැලුවොත් පොල් ගස් ලක්ෂ ගණනක් සම්පූර්ණයෙන්ම ඉදිරී වැටී ගොස් තිබෙන බව පෙනී යනවා ඇති. එයින් ඒ ප්‍රදේශයට පමණක් නොවෙයි මුළු රටටම හානියක් සිදු වන බවත් ඒ සමගම පිළිගත යුතුව තිබෙනවා.

ඒ වාගේම ගෙවල් දස දහසක් පමණ සම්පූර්ණයෙන්ම විනාශ වී ගොස් තිබෙනවා. ගෙවල් දහස් ගණනකට මා ගියා. මා ගිය ඒ සෑම ගෙයකටම මොකක් හරි අලාභයක් නැත්නම් හානියක් සිද්ධ වී තිබෙන බව මට පෙනී ගියා. මේ සෑම කරුණකින්ම පෙනී යන්නේ සුළි සුළඟ කොයි තරම් මේ ප්‍රදේශයට බල පෑවා ද යන්නයි. ලක්ෂයකට වඩා මහජනතාව අනාථ වී තිබෙනවා. පවුල් දහස් ගණන් අනාථ වී තිබෙනවා. මේ සියලු දෙනාටම ආධාර අවශ්‍යයෙන්ම සැපයිය යුතු බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. නිසි පරිදි නියම අවස්ථාවේදී අනාථ වූවන්ට ආධාර ලබා දීම ගැන මා ඇත්ත වශයෙන්ම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට මේ අවස්ථාවේදී මුළු රටටම පෙනී යන විධියට ස්තුති පූර්වකව කථා කළ යුතුව තිබෙනවා. ඒ විනාශය ඇති වූ අවස්ථාවේදී හලාවත දිස්ත්‍රික්කය සම්පූර්ණයෙන්ම ජලයෙන් කොටු වී කොළඹට කිසිම සම්බන්ධයක් නැතිව දවස් ගණනක් තිබුණු බව තමුන්නාන්සේලා දන්නවා. ඒ දින කිපය තුළ ජනතාව විශාල දුකක් වින්ද. ඒ අවස්ථාවේදී ප්‍රදේශයේ සිටි රජයේ නිලධාරි මහත්වරුන් ඉතාම හොඳින් ක්‍රියා කළ බවත් මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. ප්‍රදේශයේ දිසාපති තුමාත් හලාවත හා නාත්තන්ඩිය ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරි මහත්වරුනුත්, පොලීසියත් සුරා බදු දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුනුත්, ග්‍රාම සේවක මහත්වරුනුත් ඉතාමත් හොඳින් ක්‍රියා කළා. සමහර ස්ථානවල සුළු සුළු අඩුපාඩුකම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබුණත්, සාමාන්‍යයෙන් ග්‍රාම සේවක වරුන් ඒ අවස්ථාවේදී සෑහෙන තරම් දුරට හොඳින් කටයුතු කළ බව මා සඳහන් කරන්නට ඕනෑ. යුද්ධ හමුදාවටත් මා ස්තුතිවන්ත වෙනවා. ගොවි හමුදාවටත් මා ස්තුති කරනවා. අද ඒ ප්‍රදේශයේ විනාශයට පත් වූ ගස් කොළන් ඉවත් කිරීමේ ලොකු ව්‍යාපාරයක් ගොවි හමුදාව ආරම්භ කර තිබෙනවා. එමෙන්ම සහනාධාර වැඩ කටයුතුවල යෙදුණු අනෙකුත් සියලු දෙනාටත් නොයෙකුත් සමිති සමාගම්වලටත් ස්තුති කළ යුතුව තිබෙනවා. විනාශයට පත්ව අනාථ වූ ඒ දුප්පත් ජනතාවට සහනය දුන් බෞද්ධ පූජ්‍ය පක්‍ෂයටත් කතෝලික පූජක පක්ෂයටත් අප විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්නට ඕනෑ.

තවත් කාරණයක් තිබෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ පුරන් වී තිබුණු කුඹුරු අක්කර දහස් ගණනක් දුප්පත් ජනතාව රුපියල් දහස් ගණන් වියදම් කර නැවතත් වැපිරුවා. ඒ කුඹුරුත් සියල්ලම අද විනාශ වී ගොස් තිබෙනවා. එම නිසා ඒ ගොවි ජනතාව අධෛර්යයට පත් නොවන සේ ඒ අයටත් සිදු වූ පාඩුව ගැන කල්පනා කර බලා යම් සහනයක් දිය හැකි නම් එය ලබා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා. ඒ ප්‍රශ්නය මා ගරු අග මැතිතුමාගේ අවධානයට යොමු කරවනවා.

පොල් වගාවට විශාල විනාශයක් සිදු වී තිබෙන බව මා මුලින් සඳහන් කළා. දුප්පත් පවුල්වලට අයත් සුළු ඉඩම්වල තිබුණු පොල් ගස් සියල්ලම වාගේ ඉදිරී වැටී විශාල විනාශයක් සිදු වී තිබෙනවා. එම නිසා ඒ දුප්පත් පවුල්වල එකම ආදායම් මාර්ගය නැතිව ගොස් තිබෙනවා. ඒ අය ගැනත් කල්පනා කර බලා සහනයක් දෙන්නට පුළුවන් නම් එය ලබා දිය යුතු බවත් මා ඉතා ඕනෑකමින් මතක් කරනවා.

විශාල ජනතාවක් අනාථ වූ මේ අවස්ථාවෙන් අයුතු ප්‍රයෝජන ලබන මිනී මෝරුන් ගැනත් මා සඳහන් කළ යුතුයි. මගේ කොට්ඨාශයේත් නාත්තන්ඩිය කොට්ඨාශයේත් ගම්වල මා නිතරම සංචාරය කරනවා. අනාථ වූවන්ට බඩු බාහිරාදිය බෙදා දෙන අවස්ථාවලදී සමහර විට සමුපකාර කඩ පවා ඒවායින් අයුතු ප්‍රයෝජන ලබන බව මට පෙනී ගියා. ඊයේ රාත්‍රී වෙන්නප්පුවේදී එවැනි අයථා ක්‍රියාවක් මට දකින්නට ලැබුණා. සමුපකාර කඩයක අනාථ වූවන්ට බඩු කිර කිරා බෙදා දුන්නා. විශාල ජනකායක් එතැන රොක් වී සිටියා. ඒ අවස්ථාවේදී මමත් ආදායම් පාලක නිලධාරිතුමාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ උප අධ්‍යක්ෂ රූපසිංහ මහත්මයාත් සමරකෝන් මහත්මයාත් යන අප එතැනට හදිසියෙන් පැන චෙක් කර බැලුවා. එතැනදී අපට තේරුම් ගියා පිටි රාත්තල් 10ක් පමණ දිය යුතු තැනැත්තාට රාත්තල් 7ක් පමණ දී තිබෙන බව; කරවල රාත්තල් 10ක් පමණ දිය යුතු තැනැත්තාට රාත්තල් 7ක් පමණ දී තිබෙන බව. මේ කටයුතුවලදී වගකිව යුතු පුද්ගලයන් පවා එවැනි වැරදි කරන බව පෙනී යනවා. ගරු අගමැතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, එවැනි අවස්ථාවලදී ඔවුනට සුදුසු දඬුවම් ලබා දෙන්නැයි නිලධාරීන්ට නියෝග කරන ලෙස. මෙසේ අනාථ වුණු උදවියට ලැබෙන්නට තිබුණු අනාථාධාර නැති කිරීමෙන් කරගෙන යනු ලබන මෙම කණගාටුදායක වැඩ පිළිවෙළවලක්වාලීම් වස් එවැනි වරද කරුවනට නිසි දඬුවම් පමුණුවන ලෙස මා නැවතත් මතක් කර සිටිනවා.

අවසාන වශයෙන් තව එක කාරණයක් මතක් කළ යුතුයි. අද අපේ ප්‍රදේශවල මෙම අනාථාධාර සලාක ක්‍රමයට බෙදාගෙන යනවා. මා සිතන හැටියට එම ආධාර අවශ්‍ය කරන උදවියගෙන් දෙකෙන් පංගුවකටත් වඩා දැන් ඒවා ලැබී තිබෙනවා. එහෙත් ඒ සඳහා අවශ්‍ය කරන බඩු බාහිරාදිය අඩු වන්නට ඉඩ තිබෙනවා. එවැනි තත්ත්වයක් උද්ගත වන්නට ඉඩ නොතබා නියමා කාරයෙන් එම අනාථාධාර බෙදා දීම පිණිස අවශ්‍ය බඩු බාහිරාදිය තව තවත් ලබා දීමට කල්පනා කරන මෙන් මා මතක් කර සිටිනවා.

මෙම ප්‍රශ්නය පිළිබඳව නිසි අවබෝධයක් ඇති කරලනු සඳහා මෙසේ අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව සලසා දීම ගැන ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 6.5

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

මෙවැනි ප්‍රශ්නයක් දේශපාලන ප්‍රයෝජනය සඳහා යොදාගත යුතු නැතැයි මාද කල්පනා කරනවා. එහා පැත්තෙන් මෙහා පැත්තටත් මෙහා පැත්තෙන් එහා පැත්තටත් දොස් කියන්නට නොවෙයි, අප මෙම විවාදය ඉල්ලා සිටියේ. ගරු අගමැතිතුමා ගරු කථානායකතුමාගේ කොට්ඨාශයට පවා ගොස් මෙම ප්‍රශ්නය ගැන පරීක්ෂා කළ බව පෙනී ගිය හෙයින් අප සිතුවා වැඩි වශයෙන් මෙවැනි විපත්වලට මුහුණ දෙන අපේ කොට්ඨාශවලටත් සහනයක් සලසා ගන්නට හැකි වේවිය කියා. තමුන්නාන්සේ මගින් රජයට නැතිනම් අගමැතිතුමාට මේ පිළිබඳ තත්ත්වය අවබෝධ කර දී අපේ අමාරුකම්වලටත් සෑහෙන අන්දමක සහනයක් සලසා ගන්නට පුළුවන් වේය යන බලවත් විශ්වාසය උඩයි, අප මෙම විවාදය පවත්වන්නට කල්පනා කළේ.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ කොට්ඨාශයේ විශාල විපතක් සිදු වී තිබෙන බව ඇත්තයි. මගේ කොට්ඨාශයේත් ඊට යාබද රුවන්වැල්ල ආසනයේත් ජනතාව අවුරුදු පතාම මෙම විපතට මුහුණ දෙනවා. මේ අවුරුද්දේ අප දෙගොල්ලන්—මා හිතනවා, යටියන්තොට කොට්ඨාශයේ ජනතාවත් මෙම තත්ත්වයට මුහුණ දුන්නාය කියා—ළඟ ළඟම දෙවතාවක් මෙම ප්‍රශ්නයට මුහුණ දුන්නා. මගේ කොට්ඨාශයේ ප්‍රශ්නය මා තනියම විසඳන්නට භාර ගත්තේ නැහැ. රුවන්වැල්ල කොට්ඨාශයත් මගේ කොට්ඨාශයත් මුහුණ දී තිබෙන තත්ත්වය අනුව ඒ කොට්ඨාශයේ මන්ත්‍රීතුමාත් මාත් යන අප දෙදෙනා මගේ කාර්යාලයේදීම සාකච්ඡා පවත්වා තීරණයකට බැස ගත්තා, මෙම ප්‍රශ්නය එක් ප්‍රශ්නයක් වශයෙන් සලකා සමාජසේවා ඇමතිතුමා වෙත ඉදිරිපත් කොට යම්කිසි සහනයක් ලබා ගන්නට. සමාජසේවා ඇමති අංශයට යාම පිණිස අපි එක්තරා දිනයක්ද ලබා ගත්තා. ඩී.ආර්.ඕ. මහතාගෙනුත් දිසාපතිතුමාගෙනුත් ග්‍රාම සේවක මහත්වරුන්ගෙනුත් සහාය ලබා ගෙන මගේ කොට්ඨාශය තුළ ජල ගැල්මෙන් යට වුණු සෑම ගෙයක්ම—311 ක් පමණ—ගණින් ගෙන ලැයිස්තුවක්ද සකස් කර ගත්තා. අන්තිමේදී සමාජසේවා ඇමති අංශයෙන් හදිසි විදුලි පුවතක් මගින් දැනුම් දුන්නා, එම දිනය කල් දැමූ බව. අපි එයින් නොනැවතී නැවතත් වරක් දිනයක් ඉල්ලා සිටියා. දිසාපතිතුමාත් සමග කථා කොට අප තීරණයට බැස ගත්තා, ඇමතිතුමාට වැඩ කටයුතු බහුල නිසා අපි කොළඹට ඇවිත් එතුමා සමග මේ ගැන සාකච්ඡා කරමු කියා. වැඩ බලන ආහාර ඇමතිතුමා මේ ගැන දන්නවා. හය මාසයක් ගත වුණා; එහෙත් එය කෙරුණේ නැහැ.

**ගරු ඉඹුලාන**
*(கௌரவ இம்புலான)*
(The Hon. Imbulana)

උඩපොල වත්තෙන් අක්කර 250 ක ඉඩමක් ලබාගෙන තිබෙනවා.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

දිගටම විපත් සිදු වී තිබෙන නිසයි, මෙම කරුණු කියන්නේ. දොස් කියනවා නොවෙයි.

එක් වතාවක් ජලගැල්මක් ආවායින් පසුව අනික් අවුරුද්දේ ඒ කාල සීමාවේදීම නැවතත් ජල ගැල්ම පැමිණේවියැයි සිතනවා හැරෙන්නට, හදිසියේ එකපිටම දෙවන වරටත් ජලගැලීමක් ඇති වේයයි කිසිවකු බලාපොරොත්තු වන්නේ නැහැ. මේවා පිළිබඳව දෙපාර්තමේන්තු මගින් ක්‍රියා කරන විට මාස ගණන් ගත වෙනවා. අහේතුවකට මෙන් දෙවරක් එක මණ්ඩියම යට වී ගියා. ඇතැම් ප්‍රදේශවලට අවශ්‍ය කරන අනාථාධාර තවම ලැබී ඇත්තේ නැහැ. පැල්පත් පවා ගසාගෙන ගොස් තිබෙනවා. 26 වනදා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාව පැවැත්තුවා. ගරු අගමැතිතුමා හලාවත ගොස් සිටි හෙයින් එතුමා ඊට සහභාගි වන්නට පැමිණියේ නැහැ. එහිදී යෝජනාවක් සම්මත වුණා, නිතරම යට වන ප්‍රදේශවල ජීවත්වන උදවියට අවුරුදු පතා ආධාර මුදල් දෙනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනුවට උස් බිම්වල ඉඩම් ලබා ගෙන ඔවුන් ඒවායේ පදිංචි කරවන්නට ඕනෑය යනුවෙන්. ගිය වර අප කළ යෝජනාව අනුව ඉඩම් සොයා ගෙන තිබෙනවා. ඒ කටයුතු සම්පූර්ණ කර තිබෙනවා.

**ගරු ඉඹුලාන**
*(கௌரவ இம்புலான)*
(The Hon. Imbulana)

උඩපොලවත්තෙන් අක්කර 250 ක් ගන්නට ගැසට් කර තිබෙනවා.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

උඩපොලවත්ත වෙනයි. කොට්ඨාශ කීප යක් තිබෙනවා. දැරණියගල කොට්ඨාශයේ 7 දෙනකු වළලන එක මළ ගෙයකට මා ගියා. එය කවදාවත් සිදු නොවන සිද්ධි යක්. එවැනි ප්‍රශ්න අපේ කොට්ඨාශවල තිබෙනවා. දැරිණියගල ඉඩම් දුන්නාට මානියම්ගම රබර් කපන මිනිහකුට එහි ගොස් පදිංචි වන්නට බැහැ. මානියම්ගම ප්‍රදේශයෙනුත් අක්කර විස්සක් තිහක් අරගෙන, පනාවල පැත්තෙනුත් අක්කර කීපයක් අරගෙන, දැරණියගල ඔය ඉඩම් කැබලි ටිකත් අරගෙන කිට්ටු පළාත්වල මිනිසුන් ඒවායේ පදිංචි කරවිය යුතුය කියා අප අදහස් කළේ ඒ නිසයි. එතකොට ඔවුන්ට හානියක් වන්නෙත් නැහැ; ප්‍රශ්නයත් විසඳෙනවා. දැනට තිබෙන රුපියල් දෙසියයේ හෝ තුන් සියයේ ආධාරය දහ පහළොස් වරක් එකම ගෙයෙහි පදිංචි අය ලබාගෙන තිබෙනවා. ඒ හැර ඒ රජයෙන් 400ක් දුන්නද මේ රජයෙන් 300ක් දුන්නද කියා නොවෙයි මා කියන්නේ. ඒ නිසා අගමැතිතුමාගෙන් මා විශෙෂයෙන්ම ඉල්ලා සිටින්නේ මෙයයි: සම්බන්ධතා කාරක සභාවේදීත් මේ යෝජනාව සම්මත වී තිබෙනවා. රුවන්වැල්ලේ ගරු මන්ත්‍රීතුමාටත් (පී. සී. ඉඹුලාන මයා.) මටත් මේ ප්‍රශ්නය බල පානවා. ගරු අගමැතිතුමාත් ඒ සම්බන්ධතා කාරක සභාවේ සිටිනවා. අපේ දිසාපති ස්ටැන්ලි මාරලන්ද මහත්මයාත් අතිරේක දිසාපති මනම්පේරි මහත්මයාත්, දෙහිඕවිට ඩී. ආර්. ඕ. මහත්මයාත් බොහොම උනන්දුවෙන් මේ ගැන ක්‍රියා කර සම්පූර්ණ වාර්තාව සොයා ගෙන තිබෙනවා. මේ සම්මත වූ යෝජනාව ක්‍රියාත්මක කර ස්ථිර පදනමක් මත මේ කටයුත්ත කළොත් අවුරුදුපතා මේ අන්දමට ආධාර මුදල් දෙන්නට සිදු වන්නේ නැහැ. එය රජයටත් වාසියක්. කොට්ඨාශයත් දියුණු වෙනවා. ඒ නිසා ඒ යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ අනුව මේ දෙහිඕවිට ප්‍රශ්නය ගැන ස්ථිර පදනමක් රජයෙන් ඇති කරන ලෙස ගරු අගමැතිතුමාගෙනුත් ගරු වැඩබලන කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාගෙනුත් මා ඉල්ලා සිටිනවා.

අ. භා. 6.12

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**
*(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*
(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

Mr. Speaker, I am glad that this House has been afforded an opportunity of discussing this very important matter, particularly because the recent floods and cyclone have caused considerable damage to certain areas of this country. In discussing this let us first realize that there has been the normal flood damage, and in addition there has been cyclone damage. The two are entirely different. You, Mr. Speaker, are well aware of the damage caused by cyclone in your constituency, Chilaw, in the constituency of the hon. Member for Wennappuwa (Mr. Festus Perera) who just spoke, and in the constituency which is not represented today but which was represented by your predecessor in office, Nattandiya. I myself had the occasion to visit these three constituencies. It is difficult to imagine the extent of the damage that has been caused in those areas.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

I should say that more than the floods, it is the cyclone that has caused damage to those areas.

ද සොයිසා සිරිවර්ධන මයා.
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

Damaged the coconut trees.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Not only the coconut trees; the coconut trees have fallen on houses. You have only to go and see how a number of huts and substantial buildings have been flattened to the ground by three or four coconut trees falling on them at a time. You, Mr. Speaker, are aware that all these areas were rendered inaccessible, due to various causes: firstly it was the flood; in addition to that, trees had fallen across the roads. Many of the roads in these areas were impassable because of the number of trees that had fallen across. I think, Sir, you yourself went through the gruelling experience of having to climb one tree, creep under another and so on. You took hours to get to Chilaw. I think you left Colombo in the afternoon and got to Chilaw at 1.30 the following morning.

I am now talking of the areas affected by cyclone. The first thing for us to do was to clear all the roads of obstruction. We put up an army unit on the joh. I am glad to say that the Army Engineers Unit did a magnificent job. As you yourself would testify, the whole place was rendered motorable in double quick time. Then various other measures had to be taken. People were rendered homeless. They had to be given rations. The floods had breached tanks, particularly in your area, Mr. Speaker. Tank spills were damaged. When I went I found the Agricultural Corps effecting temporary repairs to certain tanks in order to try and get a cultivation for this Maha season. They were placing sand bags and having temporary structures. Of course, now the Ministry is getting on to it to try and do some permanent work.

As regards cyclones, I must say that there is nothing that can be done to prevent them. However much we may shout there is nothing that can be done to prevent a cyclone.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Most cyclones are in China.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Yes. They call them cyclones or typhoons there. No government in the world has yet devised a method of stopping cyclones or typhoons. In fact we are lucky that such terrible and catastrophic experiences do not occur frequently. [*Interruption*]. When a cyclone hit Padaviya in 1964—I went to that area myself—it was the first time that anything of that nature happened to Ceylon.—[*Interruption*].

I do not think that anyone can blame this Government or any previous Government for the occurrence of a cyclone. It just happens.

I understand that there are countries like the Philippines—I met the Ambassador the other day—where cyclones are an annual occurrence and nothing has been devised, and I dare say can be devised, to prevent that.

We can only try and see what can be done for those who have suffered as a result, and I can assure the House—and Mr. Speaker, you are yourself aware of it—that everything possible is being done.

I did notice when I went to the area affected by the cyclone that some trees, although they had not fallen, were at an angle waiting to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

fall for the slightest blowing. Then we sent the army unit again, because some persons were trying to exploit the situation by demanding Rs. 75 to cut a tree when the people were suffering. We have such elements in our society. It is unfortunate. We had to send the army unit to cut down those trees. I suppose they are going on with the job.

So much for the cyclone and the cyclone damage.

In respect of the other areas, it is a question of floods. The hon. Member for Gampaha (Mr. S. D. Bandaranayake) spoke about the real cause of floods, that is, that our catchments have been denuded of forest cover. Well, there is a great deal of truth in that.

As a matter of fact, when I was Minister for Agriculture I did explain that to the House and I think it was then that I brought legislation before the House about soil erosion. Legislation was enacted.

The unfortunate fact is that our catchment areas, hilly areas, had been opened up in the last century or so. That is true. In ancient times our forefathers seem to have had a better knowledge of irrigation and scientific agriculture. They did not live in the salubrious atmosphere of the hill country; they maintained that for forest cover; they went to the plains.

With forest cover, when it rains you do not get the water rushing down taking with it the fertile soil; you get the sponge of the forest cover, the top soil, absorbing the water; and you have your perennial springs feeding the rivers; so that this forest cover acts as a reservoir; it holds the water and perennially feeds the rivers. You remove that cover and you get the water rushing headlong, taking all the soil, spilling over the rivers and rushing headlong into the sea.

This went on over a number of years. Vast extents of tea had been opened up, vast extents of rubber land had been opened up, in those catchment areas. We have also had extents opened up by the villagers, extents which should never have been opened up, under the instigation sometimes of the Members of Parliament too. Those things have happened—we have people clearing forest reserves—and all those have contributed towards this flood damage.

There are various measures that are being taken; but when hon. Members speak of the necessity for taking particular measures to prevent the frequent floods that occur, I only want to give a few figures about one scheme alone which will give hon. Members of this House an idea of the cost of it. This is a Russian scheme for the Kelani Ganga flood prevention. The measures are extremely costly. The flood control measures in respect of the Kelani River were investigated by a Russian team of engineers between 1950 and 1961, and the estimated cost of it was—we are well aware of costs; this is "was"; I am not saying "is"; the present cost must be double—Rs. 840 million, and even this scheme afforded only partial protection from floods.

Yes, it is true that if we can spend these vast sums we can have reservoir after reservoir to hold the water, but unfortunately, if these vast sums are expended now, it may prevent us from utilizing the necessary funds for more urgent development work. It is a question of priorities. Under the circumstances we must settle these people on higher land. I am glad that the hon. Member for Dehiowita (Mr. Weerasekera) states that at the D. A. C. meeting, or whatever it is, at Kegalla they passed such a resolution. That is what has to be done, and that is what is being done now.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

Mind you, the people who live on these lands are loath to forsake them for good. They are some of the most fertile lands in these areas and are very good for cultivation.

Hon. Members are well aware of the fact—when we talk of floods, we ought to take the biggest rice producing countries in the world today: Thailand and Burma—that it is nothing but floods that produce the rice.

ද සොයිසා සිරිවර්ධන මයා.
*(திரு. டி. சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

China.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

In China also it is floods that produce the rice. If you go to Thailand or to Burma, you will realize that it is the flooding of those rivers, the silting, that manures the fields, and they get their crop of rice. In Burma they hardly, if ever, use fertilizer. Fertilizer is supplied by the floods.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

What about Egypt, the Nile ?

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

So, in these areas, the people can be settled on higher land, and they themselves can cultivate these lands. They should not live on these lands but only cultivate them. These are some of the most fertile lands.

වීරසේකර මයා.
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

That is our proposal.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Yes, that is the proposal. That is what is being done.

An hon. Member spoke about the construction of huge reservoirs to prevent floods. That is not possible. We just cannot afford it.

I think it was the hon. Member for Kamburupitiya (Mr. Percy Wickremasinghe) who spoke about the supply of seed paddy. Where there is flood damage seed paddy will be supplied free. Mr. Speaker, I think free seed paddy is being supplied in your area. It is being done now. It is always done.

පර්සි වික්‍රමසිංහ මයා.
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

I inquired from the Government Agent, Matara. He told me that seed paddy would not be issued free. We discussed the matter.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

In normal circumstances seed paddy is not supplied free, but where damage has been caused by floods it is supplied free. It is not being supplied by the Agricultural Department but by the Social Services Department——

එම්. එම්. මුස්තාෆා මයා. (සමාජ සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
*(ஜனாப் எம். எம். முஸ்தபா—சமூகசேவை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. M. M. Mustapha—Parliamentary Secretary to the Minister of Social Services)

Through the Commissioner of Agrarian Services.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

——through the Commissioner of Agrarian Services, because we want these fields to come under cultivation. That is being done.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Sometimes, in certain areas, these things just do not happen. When I went round Chilaw District I found that most of the officers were very conscientious about their duties. I must commend the district revenue officers and the various other people who did tremendous work during that disaster. Most of the gramasevakas, I found, had gone round to give the rations. They were also busy taking stock of the damage caused by the floods so that the people affected could be paid money to build their houses. There have been just one or two places where the gramasevakas neglected their duty, and I have instructed the Government Agent to take action against those who had been negligent in their duty. I am happy to say that they are a negligible few.

One redeeming feature is the fact that, in spite of all the havoc, only a few deaths—I think four or five—had taken place.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Five at Wennappuwa, and one at Chilaw.

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்ளி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

Houses had been smashed to the ground, sometimes with people inside them, and nobody had died. That was the amazing thing. I do not know how it happened.

I believe the Hon. Minister who deals with the question of floods and Irrigation, and the hon. Parliamentary Secretary to the Minister of Social Services who are here, will be speaking. They will be able to give you more information. I thank you for giving me this opportunity to speak.

අ. භා. 6.30

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

ගරු කථානායකතුමනි, ජලගැල්ම පිළිබඳවත්, සුළි සුළං හැමීම පිළිබඳවත්, එය නවත්වන්නට බැරිකම ආදි නොයෙක් දේ ගැනත් කරුණු රාශියක් ඉදිරිපත් කිරීම ගැන මෙන්ම ආණ්ඩුවෙන් කරගෙන යන වැඩ ගැන විස්තරයක් ඉදිරිපත් කිරීම ගැනත් මා ගරු අගමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ආණ්ඩුව කරගෙන යන වැඩ ගැන අප එකඟ වෙනවා. කිසිම ආණ්ඩුවකට ස්වභාව ධර්මය ඒ තරම් දුරට සීමා කරන්නට බැරි බව අප පිළිගන්නවා. ඒ කෙසේ වෙතත් ආණ්ඩු දෙක තුනක් ඒ ඒ දේ ගැන අත්හදා බලා තිබෙන නමුත් සෑහෙන විධියේ වැඩ පිළිවෙළක් තවමත් ආරම්භ නොකිරීම කාටත් කනගාටුවට කාරණයක් බව කියන්නට ඕනෑ. රුසියානු පර්යේෂණ අනුව විශාල මුදලක් වැය වන බව අපට පෙනී යනවා. විශාල වශයෙන් ගංවතුර සීමා කිරීම, පාලනය කිරීම ගැන කටයුතු කිරීමට අපට වත්කමක් නැහැ. එසේ වුවත් ඇතැම්විට ඒ ඒ ප්‍රදේශවාසීන්ගේ අදහස් විමසා බලන විට භාර ගන්නට පුළුවන් ඉතා වැදගත් යෝජනා රාශියක් ලැබෙනවා. ඒ නිසා, ඒ විශාල යෝජනා සම්බන්ධව හිත යොමු කරන තුරු මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ පොඩි කාරක සභාවක්—කැබිනට් කාරක සභාවක්—පත් කර මේ සම්බන්ධව ජනතාවගේ අදහස් විමසා, සුළු වශයෙන් හෝ සීමා සහිත පියවරවල් රාශියක් යෝජනා කරන නිසා, ඒ සම්බන්ධයෙන් යුහුසුළු වන ලෙසයි.

කොලොන්නාව මැතිවරණ කොට්ඨාශය ගැන ඔබතුමා දන්නවා. කොලොන්නාව කොට්ඨාශයට ජලගැල්ම දන් වාර්ෂික අවමංගල්‍යයක් බවට පත් වී තිබෙනවා. වෙනත් නොයෙක් පළාත්වලත් ජලගැල්ම ඇති වෙනවා, ඒ වාගේම බරපතල හානිත් ඇති වෙනවා. මේ ගැන ගරු අගමැතිතුමාට මා ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. මේ වනාවේත් හතරෙන් තුන් පංගුවක් පමණ කොලොන්නාව මැතිවරණ කොට්ඨාශය යට වුණා. තොරතුරු දැන ගන්නට යන විට හමු වන නොයෙක් දෙනා නොයෙක් අදහස් ඉදිරිපත් කරනවා. මේ අන්දමට වැඩ පිළිවෙළක් ඇති කළොත් ගංවතුර හුඟක් දුරට වළක්වන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

පුළුවනැයි සමහර අය කියන අතර තවත් අන්දමකට වැඩ පිළිවෙළක් ඇති කළොත් ඉක්මණින් හොඳ ප්‍රතිඵල ගන්නට පුළුවනැයි තවත් සමහරුන් කියනවා. ඒ කොයි හැටි වෙතත් සංවත්සර අවමංගල්‍යයක් වශයෙන් ජලගැල්මක් පටන් ගත්තේ මෑතක සිටයි.

අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා හෙවත් ගරු කර්මාන්ත ඇමතිතුමා කොලොන්නාව මැතිවරණ කොට්ඨාශය ගැන තොරතුරු හොඳාකාර දන්නවා. මේ තරම් අන්තරාදායක අන්දමට කොලොන්නාව කොට්ඨාශයට ජලගැල්ම ඇති වුණේ හාවඩ් බැම්ම බැන්දට පස්සේ. ඒ බැම්ම බැන්දේ උතුරු කොළඹ ජලගැල්මෙන් රැක ගැනීමටයි. උතුරු කොළඹ රැක ගෙන කොලොන්නාව කොට්ටාව ආදී ප්‍රදේශ ඔස්සේ ජලය ගැලීමට සලසා තිබෙනවා. එම නිසයි මීට පෙර කවදාවත් නොවූ අන්දමට මෑතක සිට කොලොන්නාවට වාර්ෂික විපතක් හැටියට මේ ගංවතුර බිය ඇතිවේගෙන සන්නේ. හාවඩ් බැම්ම බැන්දා. එය කළේ විශේෂයෙන් උතුරු කොළඹ ආරක්ෂා කර ගැනීමටයි. උතුරු කොළඹ ආරක්ෂා කර ගැනීම ගැන කල්පනා කළා මිස අනෙක් කොට්ඨාශ ගැන සෑහෙන අන්දමට කල්පනා කර නැහැ. එම නිසා මා ඉල්ලා සිටිනවා මේ ගැන නැවතත් කල්පනා කරන ලෙස. හාවඩ් වාර්තාව කොහේ ඇද්දැයි කියන්නට මා දන්නේ නැහැ. ඒ ගැන මා සොයා බැලුවා. එහෙත් මට ඒ ගැන ආරංචියක්වත් ලැබුණේ නැහැ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අසා බැලුවා. වාරිමාර්ග අධ්‍යක්ෂතුමා පරීක්ෂා කර බලනවාය කිව්වා. ඒ නිසා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා හාවඩ් වාර්තාවේ මේ ගැන කුමක් කියා තිබෙනවාදැයි දන්වන ලෙස.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ලයිබ්‍රරියේ තිබෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
එය මුද්‍රණය කර තිබෙන්නක්ද?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayawardane)
ඔව්. එය වුවමනාද?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
දෙනවා නම් බොහොම ස්තුතිවන්ත වෙනවා.

සමහර මිනිසුන් කියන්නේ කැළණි ගංමෝය දැනට වඩා පළල් කළොත් ජලගැල්ම නවත්වන්නට පුළුවන් වෙතැයි ඒ අය කල්පනා කරන බවයි. මේවා ජනතාව ඉදිරිපත් කරන අදහස්. ඇළවල් හරහා බෝක්කු බැඳ තිබෙනවා. ඒවා පළල් කළොත් වඩා පහසුවෙන් ජලය ගලා යන නිසා ජලගැල්ම නතර කරන්නට පුළුවනැයි සමහර අය කියනවා. එතකොට එයින් සිදුවන හානිය නවත්වන්නට පුළුවන් බවයි ඒ අය කියන්නේ. ඒ වාගේම තැන්තැන්වල ගංඉවුරු වක් වී තිබෙනවා. ඒ වක් තැන් නැති කර කෙළින් සාදා ගත්තොත් වඩා වේගයෙන් ගලාගෙන යාමට ඉඩ ලැබෙන නිසා ගංවතුර ගැලීම නවත්වන්නට පුළුවනැයි ඇතැම් අය කියනවා. අඹතලෙන් පහළ පාර හයපොළක විතර අඩි හතරකින් පහකින් උස් කරතොත් සුළු ජලගැලීම් වළක්වන්නට පුළුවනැයි ජනතාව කියනවා.

අද දෙහිඹ්විට ගරු මන්ත්‍රීතුමාත් ගරු අගමැතිතුමාත් ඉදිරිපත් කළ එක් පිළියමක් නම් පහත් තැන්වල ඉන්න උදවියට උස් තැන්වල වාසස්ථාන තනාගෙන පදිංචියට යාමට සැලැස්සීමයි. එහෙත් කොලොන්නාව වැනි ප්‍රදේශවල එය කරන්නට අමාරුයි. කොලොන්නාවේ ඉන්නේ වැඩි වශයෙන්ම මධ්‍යම ප්‍රමාණයේ හා සුළු ප්‍රමාණයේ ආදායම් ලබන උදවියයි. ඔවුන් කොළඹ වැඩ කර එහි ගොස් පදිංචි වී සිටිනවා. එසේ සිටින උදවියට කොළඹින් ඈත ගොස් නිවාස ලබා ගැනීම අමාරුයි. ගමනාගමනය සඳහාත් විශාල වියදමක් දරන්නට වෙනවා. නිවාස සොයා ගන්නටත් බැරි වෙනවා. ඒ නිසා කොලොන්නාව වැනි කොළඹ අවට තිබෙන ආසනවල කළ යුත්තේ කෙසේ හෝ රජයෙන් නිවාස ක්‍රමයක් ඇති කර පදිංචි වන්නට සලස්වා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පහත් බිම්වල සිටින අයට වරින් වර ගංවතුරෙන් ඇති වන විපත් නැවැත්වීමට යම්කිසි ස්ථිර වැඩ පිළිවෙළක් යෙදීමයි. කොලොන්නාවට අවුරුදු පතාම මේ හානිය සිදු වුණත් තවම ඒ හානිය වැළැක්වීමට කිසිම සැලැස්මක් ඇති කර නැති බව තමුන්නාන්සේ දන්නවා. මා මේ කෙනකුට දොස් කියනවා නොවෙයි. මාත් කලක් සමාජ සේවා ඇමති වශයෙන් සිටියා. අඩියක් ගංවතුර ගලන විට මෙසේ කළ යුතුය, අඩි දෙකක් ගලන විට මෙසේ කළ යුතුය, අඩි තුනක් ගලන විට මෙසේ කළ යුතුය, කියා තවම කිසිම සැලැස්මක් ඇති කර නැහැ. මා සමාජ සේවා ඇමතිතුමාට සැලැස්මක් සාදා දුන්නා. එය ක්‍රියාත්මක කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

දැන් හදිසියෙම ගං වතුර ගලනවා. ග්‍රාම සේවක රපෝර්තුව එන තෙක් කිසිම දෙයක් කෙරෙන්නෙ නැහැ. ග්‍රාම සේවක රපෝර්තුව එන්නට දවසක් දෙකක් ගත වෙනවා. ඒ රපෝර්තුවත් සම්පූර්ණ එකක් නො වෙයි. මේ වර මගේ කොට්ඨාශයේ කඳවුරුවල පමණක් 29,000 ක් පදිංචි වී සිටිනවා. කොහේවත් යන්නට බැරිව කොටු වී ඉන්න උදවිය මෙතෙකැයි කියන්නට බැහැ. බෙන්තර-ඇල්පිටියේ මන්ත්‍රීතුමා විසින් කියන්නට යෙදුණා, ඒ ආසනයේ සුමාන දෙකක සලාකය දුන්නාය කියා. ඒ ගැන මා සන්තෝස වෙනවා. එහෙත් කොලොන්නාව ආසනයේ එහෙම වුණේ නැහැ. දුන්නේ පිසූ ආහාර පමණයි. ඒවත් හැම තැනටම ගිහින් නැහැ. සහල් සලාකය සතියකටවත් දුන්නෙ නැහැ. මේ සම්බන්ධව මා සාකච්ඡා කළා. ගරු උප ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, කරුණාකර මේ සම්බන්ධව විභාගයක් කරන ලෙස. ඒ කොට්ඨාශයේ ගං වතුරෙන් හානි සිදු වූ අයට දවස් 6 ක් පිසන ලද ආහාර දුන්නාය කියා එක සුමානයකටවත් සලාකය දුන්නෙ නැහැ. සමහර පළාත්වලට කිට්ටු වන්නටවත් බැරි වීම නිසා එක ආහාර වේලක්වත් නැතිව දවස් දෙක තුන බඩගින්නේ සිටලා තියෙනවා, ස්වේච්ඡා සේවකයන් ගොස් පාන් ගෙඩියක් දෙන තුරු, කිසිම ආහාරයක් නැතිව සිටි අය ඉන්නවා. මා ඒ සම්බන්ධව ගරු ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කර තිබෙනවා. සමාජ සේවා දෙපාර්තමේන්තුවත් දිසාපතිතුමාත් සෑහෙන වැඩ රාශියක් කිරීම ගැන මා සතුටු වෙනවා. පොලිසියත් එයට සහාය දුන්නා. එහෙත් නොයෙකුත් අඩුපාඩුකම් නිසා ඒ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්නට බැරි වුණා. රෑ කෑම එහාට යන විට රු. 3 යි. දවල් කෑම යන විට රු. 7 යි. ආණ්ඩුවෙන් විශාල වියදමක් කළත් ඒවා අනාථ වූවන්ට ගියේ නැහැ.

ගරු කථානායකතුමනි, කොලොන්නාව ආසනයේ ජනතාව මේ විධියට හැමදාම ගංවතුරෙන් අනාථ වන නිසා ඒ ප්‍රදේශයට අඟුල් සෑහෙන ගණනක් තියෙන්නට ඕනෑ. හැම ග්‍රාම සේවක කොට්ඨාශයකටම එක අඟුල බැගින් දුන්නොත් එය විශාල වශයෙන් ප්‍රයෝජනවත් වෙනවා. මීට කලින් අඟුල් දී තිබුණා. දැන් ඒවා දිරාපත් වී තිබෙනවා. කොටිකාවත්තේ සුළු නගර සභාව ඒ ඒ කොට්ඨාශවලට අඟුල් දීමට රුපියල් 5,000 ක් සම්මත කළාලු. මා ඒ ගැන සන්තෝස වෙනවා. ආණ්ඩුවෙන් හැම ග්‍රාම සේවක කොට්ඨාශයකටම අඟුලක් බැගින් ලබා දී ඒවා පොලීසියේ හෝ ඒ ඒ කොට්ඨාශවල තබන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ තැබුවොත් ගංවතුර ගැලුවාම ඒවා පාවිච්චි කරන්නට පුළුවන් වෙනවා.

කොලොන්නාව ආසනයට රජයෙන් හරියාකාර සහනාධාර නොලැබුණත් ස්වේච්ඡා සේවකයන් රාශියක් ඇවිත් තරමක් දුරට වැඩ කර තිබෙනවා. සමහර තැන්වලට කෙයාර් පිටි ලැබුණා. සමහර තැන්වලට සෞඛ්‍යදාන සමිතිවලින් ගොස් උදව් කළා. එහෙත් හුඟක් ප්‍රදේශවලට කිසිවක් ලැබී නැහැ. දවස් 6 ක් පිසන ලද ආහාර දුන්නාය කියා අනික් ප්‍රදේශවලට දුන් සති දෙකේ සලාකය මේ ප්‍රදේශයට නොදී සිටීම යුක්තිසහගත නැහැ. ඒ පළාත්වලටත් සුමාන දෙකකට සලාකය දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

අ. භා. 6.40

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු කථානායකතුමනි, ගංවතුර නිසා මේ රටේ ජනතාවට ඉතාමත් භයානක තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වී තිබෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]
නවා. මෙය මේ අවුරුද්දේ පමණක් සිදු වුණු දෙයක් නොවෙයි. මීට පෙර, 1957 දී 1947 දී 1937 දී අපට ආරංචි හැටියට 1927 දී 1917 දී මේ ගංවතුර උවදුර ඇති වී තිබෙනවා. අවුරුදු 10 න් 10ට මෙය සිදු වී තිබෙන බව මේ වර්ෂ දෙස බලන විට පෙනී යනවා. ගරු අගමැතිතුමා එතුමාගේ කථාවේදී කළ එක්තරා ප්‍රකාශයක් ගැන අපට මේ අවස්ථාවේදී සන්තෝෂ වන්නට පුළුවන් වී තිබෙනවා. උස්බිම්වල කැලෑ කැපීම නිසා ජලය කෙළින්ම පහළට ගලාගෙන ඒම ජල ගැලීම්වලට හේතු වන බව ගරු අගමැතිතුමා එතුමාගේ කථාවේ මුල් කොටසේදීම කියා සිටියා. මේ කාරණය විශෙෂයෙන්ම මා කියන්නට අදහස් කෙළේ මුලින්ම තිබුණු එක්සත් ජාතික පක්ෂය මේ ප්‍රකාශයට විරුද්ධව සිටි නිසයි. ගල්ඔය ආදී ප්‍රදේශවල සංවර්ධන වැඩ පටන් ගන්න අවස්ථාවේදී අකුරස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) දැන් ගරු අගමැතිතුමා කී විධියේ කථාවක් කිව්වා. එහෙත් එදා, අද සිටින අගමැතිතුමා කියා සිටියේ ඊට සම්පූර්ණයෙන්ම විරුද්ධ කථාවක්. අකුරස්සේ ගරු මන්ත්‍රීතුමා එදා කී දේ එදා තිබුණු ආණ්ඩුව—වර්තමාන අගමැතිතුමාම දැයි කියන්නට බැහැ—පිළිගත්තේ නැහැ. එහෙත් අද සිටින අගමැතිතුමා එය පිළිගැනීම එක්තරා විධියකින් අපගේ සන්තෝෂයට කාරණයක්.

1947 දී ගංවතුර ඇති වුණු අවස්ථාවේදී, උස්බිම්වල මිනිසුන් පදිංචි කරවීමේ ප්‍රතිපත්තිය එදා තිබුණු ආණ්ඩුව පිළිගත් බව තමුන්නාන්සේට මතක ඇති. දැන් සිටින ඉඩම් ඇමතිතුමාම මාඔය දැලේ වතුරෙන් යටවන ප්‍රදේශවල ජනතාවට උස්බිම් දීගෙන ඇවිත් එකපාරටම ඒ ප්‍රතිපත්තිය නතර කළා. එක් අවස්ථාවකදී ගරු ඉඩම් ඇමතිතුමාත් දිවංගත ගරු බණ්ඩාරනායක මහතාත් මගේ කොට්ඨාශයේ ඕතරවාඩිය නමැති ගමට ආවා. මුල්යාය, ඕතරවාඩිය, බෝලගල නමැති ගම් තුනම සෑම අවුරුද්දේම ගංවතුරෙන් යට වෙනවා. මේ ගම් තුනේ මිනිසුන්ට බෙදා දීම සඳහා ගැනීමට ඉඩමකුත් යෝජනා කර තිබුණා. එය ක්‍රියාත්මක කිරීමටත් කට යුතු කරගෙන ගියා. එහෙත් අන්තිමේ ආණ්ඩුව පෙරළුණු හැටියේම ඒ වැඩ පිළිවෙළ නතර වුණා. ගැනීමට යෝජනා කර තිබුණු ඉඩමේ නම ගොඩැල්ලවත්ත. ඉන් පසු ඒ ඉඩම හල්පේ, අම්බලයාය යන ගම්වලට බෙදා දීමට සූදානම් වුණු නමුත් ඒකත් එක පාරටම නතර වුණා. ඊට පසු අකරගම, ගොඩිගමුව ගම් සඳහා වැලිකැටිය නමැති වත්ත ගන්නට යෝජනා කළා. ඒ සඳහා 4 වැනි නොතීසියත් 5 වැනි නොතීසියත් ගැසුවාට පසු ආණ්ඩුව පෙරළීම නිසා ඒකත් නතර වුණා. ඊට පසු පිටවත්ත, ගලේවත්ත, කොටදෙනියාය ගමේ තම්බිවත්ත ආදී ඉඩම් ගන්නට යෝජනා කෙරුණු අවස්ථාවලදීත් වුණේ ඒකමයි. උස්බිම්වල මිනිසුන් පදිංචි කරවීමේ ප්‍රතිපත්තිය, ආණ්ඩු පෙරළීම් අනුව වෙනස් වන බව මේ අනුව අපට කියන්නට සිදු වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
එක යායටම රුපියල් ලක්ෂ 8 ක ඉඩම් ගෙන තිබෙනවා. ඊට වඩා ඉඩම් ගන්නට මුදල් නැති නිසයි එසේ ඒ වැඩ පිළිවෙළවල් නතර කරන්නට සිදු වුණේ.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
ඒක වෙනත් ප්‍රශ්නයක්. එහෙම නම්, දැන්වත් ඒවා නැවත වරක් සලකා බලා කටයුතු කරන්නට තමුන්නාන්සේලාට යුතුකමක් තිබෙනවා. ගෙවල් තුන් සිය ගණනක් මගේ කොට්ඨාශයේම කඩා වැටී තිබෙනවා. මෙකී ගම්වල පවුල් විශාල ගණනක් නැහැ. ගන්නට යෝජනා කරන ලද ඉඩම් එතරම් විශාල ඒවා නොවෙයි. එකක් අක්කර 5 යි; අනෙක් ඉඩම් 3 අක්කර 10 යේ ඒවායි. තවත් යෝජනාවක් තිබෙනවා. ගරු අගමැතිතුමාගේ නෑදැයින් පවා සිටින කෙහෙල්ඇල්ල නමැති ගමේ කුඩාඔය සම්බන්ධවයි, ඒ. මහඔයෙන් පිටාර ගලන වතුර පාර කුඩා ඔය දිගේ උඩහට එන විට ඒ අවට කුඹුරු සියල්ලම යට කරගෙන යනවා. මෙය වැළැක්වීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව රු. 75,000 ක ඇස්තමේන්තුවක් හැදුවා. වාරිමාර්ග දෙපාර්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේන්තුව මගින් මහඔයට වැටෙන සේ වෙනම ඇළක් කැපිය යුතු බව කියා ඒ සඳහා රුපියල් හැත්තෑ පන්දාහකට ඇස්තමේන්තුවක්ද සාදන්නට යෙදුණා. රුපියල් පහළොස් දාහකින් කැළය ශුද්ධ කළයුතු බව කීවත් රුපියල් හයදාහක් විය දම් කොට ශ්‍රමදානයේ ආධාරයෙන් අප ඒ වැඩේ කළා. එහෙත් කපන්නට යෝජනා කළ ඇළ කැපුවේ නැහැ. ඒ නිසා නැවතත් ගංවතුරින් හානි සිදු වුණා. ගංවතුර ගලනවා, උල්දිය ගලනවා. පහළ බිම්වල උල්දිය නිසා ගෙවල් කඩා වැටෙනවා. ඉතින් ඉහත කී යෝජනා තුන හතර ක්‍රියාත්මක කළහොත් මහඔයෙන් සිදු වන විපත නව තිනවා.

ගරු කථානායකතුමනි, භයානක සුළි සුළඟ අපේ ප්‍රදේශයට යන්තමින් වැදී ගෙන ගියා. එහි ප්‍රතිඵලයක් වශයෙන් කොස් ගස් ඉදිරුණා; දෙල් ගස් ඉදිරුණා; පොල් ගස් ඉදිරුණා ; කෙසෙල් ගස් ඉදිරුණා ; මයියොක්කා පඳුරු ඉදිරුණා. රට ස්වයංපෝෂිත කිරීමේ ව්‍යාපාරය සඳහා සිටුවන ලද මයියොක්කා පඳුරු ටික සහ දෙල් කෙසෙල් ගස් ටික විනාශ වී ගියා. මෙයින් පාඩු ලැබූ ගොවියන්ට කිසියම් ආධාරයක් දීමට කටයුතු කරනවාදැයි දැන ගන්නට කැමතියි.

කුඹුරු ගොවිතැන ගැන කථා කරන්නට යෙදුණා. බිත්තර වී නොමිළයේ දෙන බව ගරු අගමැතිතුමා ප්‍රකාශ කළා. කුඹුරු විනාශ වූ දා සිට මා වී බුසල් පන්සියයක් ඉල්ලුවා. ඇත්තෙන්ම වී බුසල් එක්දහස් පන්සියයක් පමණ අවශ්‍යයි. එහෙත් ඉක්මනින් ගොවිතැන් කරන්නට යන අයට අඩු වශයෙන් වී බුසල් තුන්සියයක් වත් වුවමනාම වෙනවා. ඒ වී බුසල් තුන් සියය පච්චපෙරුමාල්, වෙල්ලඉලන්කාල යන්, එච් 7 වැනි අඩු වයස් වී වර්ග විය යුතුයි. සති දෙකක් ඇතුළත මෙම වී නො දෙතොත් වැඩක් නැහැ. අද අපේ ප්‍රදේශයේ සාමාන්‍ය මිනිසුන් බිත්තර වී බුසලක් ගන්නේ රුපියල් තිහ ගණනේයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් වී නොසපයන නිසා ඒ තරම් වැඩි මිළකට වී ගන්නට සාමාන්‍ය මිනිසුන්ට සිදු වී තිබෙනවා. පච්චපෙරුමාල්, වෙල්ලඉලන්කාලයන්, එච් 7 වැනි වී වර්ග නොදුන්නොත් මේ කන්නය ඉවරයි. ඒ නිසා ගරු ඇමතිතුමා ඒ ගැන කල්පනා කර බලන්න. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) කී අන්දමට විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් නියෝජනය කරන කොට්ඨාශ වලට දක්වන්නේ කුඩම්මාගේ සැලකිල්ලක් බව මාත් කියනවා. මුළු කෙහෙල් ඇල්ලම වතුරෙන් යට වුණා. මීගමුවෙන් ඔරු ගෙනවුත් ඒ ගමට ගිය අවස්ථාවේදී අපට පෙනී ගියේ එහි වැසියන්ට ආණ්ඩුවෙන් දෙන ආධාරය ඉතාමත්ම අසතුටුදායක බවයි. පිටි රාත්තලක්, තේ කුඩු අරික්කාලක්, සීනි කාලක් වැනි ඉතා සුළු ප්‍රමාණයේ ආධාරයි ආණ්ඩුවෙන් ලැබුණේ. හාරසියයකට මේ ආධාරය දී තිබුණා. ඇත්තෙන්ම ඒ සියලු දෙනාටම ආධාර දීම සඳහා වියදම් වුණු මුළු මුදල රුපියල් අනූ දෙකකුත් ශත හැත්තෑපහයි. මේ ආධාරය දුන්නේ සුමානයක් ජීවත් වීම සඳහායි. මේ අනුව එක් තැනැත්තකුට ලැබුණු ආධාරයේ වටිනාකම ශත විස්සයි. ශත විස්සක මුදලකින් සුමානයක් රැකෙන්නට පුළුවන්ද ? මෙය මෙසේ වුවද ආණ්ඩු පැත්තේ සිටින ගරු මන්ත්‍රීවරුන් නියෝජනය කරන කොට්ඨාශවල විපතට පත් වූවන් සඳහා පාන් බෙදා දුන්නා. බත් පාර්සල් බෙදා දුන්නා.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Were not rice and bread brought by outsiders ?

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

No. I discussed this matter with the D. R. O., A. K. K. North. In some areas they distributed bread along with the flour. In my area they distributed only flour.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

They distributed bread and rice brought by private individuals.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
No.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
In Kolonnawa it was the Government that gave it.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
The Government gave it. We were so informed by the G. A. I am not saying anything against it. What I say is that there should not be a difference in treatment in two areas.

ඒ නිසා කරුණාකර එවැනි භේදයක් ඇතිව කටයුතු කරන්ට එපා යයි දනුම් දෙන්ට ඕනෑ.

ඊළඟට මා දනගන්ට කැමතියි, ගඩොල් කර්මාන්තකාරයින්ටත්, ගස් කඩා වැටී ගෙවල් විනාශ වුණු අයටත්, ජල ගැල්මෙන් ගෙවල් කඩා වැටුණු අයටත් කොයි ආකාරයට ආධාර දෙන්ට බලාපොරොත්තු වෙනවාද කියා. එවැනි උදවියට රජය මගින් ආධාර වශයෙන් ගෙවන රුපියල් 400 එක වර දෙන්නෙ නැහැ කියා අපට දන ගන්ට ලැබී තිබෙනවා. පළමුවෙන් රුපියල් 80 කුත්, ඊට පසු තවත් මුදල කුත්, තුන්වෙනි වරට රුපියල් 400 සම්පූර්ණ වන්ට ඉතුරු මුදලත් දෙන්ට යන බවයි, දන ගන්ට තිබෙන්නෙ. රුපියල් 80 ක් අරගෙන ගෙයක් හදා ගන්ට පුළුවන්කමක් නැහැ. අද නිකම් පොල් අතුවලින් පැලක් ගහ ගන්ට වුණත් කීයක් වියදම් වෙනවද ? පොල්අතු පැලක වහළයටත්, වටේටත් පොල් අතු 1,000ක් වත් වුවමනා වෙනවා. අපේ පැත්තෙ මිළ ගණන් අනුව, පොල් අතු සියයට රුපියල් 12 බැගින් පොල් අතු දාහක් මිළදී ගන්ට විතරක් අඩු ගණනේ රුපියල් 120ක් වත් වියදම් වෙනවා. අන්තිමේදී, මේ පළමුවෙන් රුපියල් 80 ක් දීමෙන් පසුව රුපියල් 400 සම්පූර්ණවන්ට ඉතුරු මුදල නොදෙන තත්ත්වයක් ඇතිවෙයිද කියා මගේ සැකයක් තිබෙනවා. එම නිසා රුපියල් 400 ක් දෙනව නම් ඒ මුදල එකවර දෙන්න. රුපියල් 400 ක් එකවර ලැබෙනව නම් බිමට සිමෙන්ති ටිකක් දමා ලීවලින්වත් පැල්පතක් හදා ගන්ට පුළුවනි. ඒ නිසා ඒ මුදල සම්පූර්ණයෙන් එකවර ලබා දෙන්ට ක්‍රියා කරන මෙන් මා ඉල්ලා සිටින්ට කැමතියි. මා වැඩි දුර කථා කරන්ට යන්නෙ නැහැ. මේ ජල ගැලීමෙන් ඇතැම් උදවියගේ මඤ්ඤොක්කා, කොස්, දෙල්, කෙසෙල් ආදි වගාවන්ට හානි පැමිණුනා. තවත් සමහ රුන්ගේ හරකුන්, එළුවන්, කුකුළන්, ඌරන් වැනි සතුන් විනාශ වී ගියා. ඒ අයටත් හැකි තරම් දුරට රජයෙන් සහනාධාර ලැබෙයි කියා මා විශ්වාස කරනවා.

අ. භා. 6.52

ඩබ්ලිව්. ඒ. ධර්මදාස මයා. (පැල්මඩුල්ල)
(திரு. டபிள்யு. ஏ. தர்மதாச—பெல்மதுல்ல)
(Mr. W. A. Dharmadasa—Pelmadulla)
ගරු කථානායකතුමනි, මගේ ආසනය තුළ ගංවතුරෙන් සිදු වී තිබෙන හානි ගැන කථා කරන්නට අවස්ථාවක් ලැබීම ගැන මා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනව. ඒ වගේම හලාවත වැනි ප්‍රදේශවල ක්‍රියාත්මක කළ ආධාර ක්‍රම ගැන ආණ්ඩුවටත් ස්තුතිවන්ත වෙනවා. මා නියෝජනය කරන පැල්මඩුල්ල ප්‍රදේශයේ ගම් 4 ක් සම්පූර්ණයෙන් ජලයෙන් යට වී තවත් ගම් දෙකක් කොටු වී විශාල හානි සිදු වුණා. එහෙත් ඒ ප්‍රදේශයට මෙතෙක් රජයෙන් කෙරී තිබෙන්නේ ආහාර පාර්සල් වගයක් බෙදා හැරීම විතරයි. ඒකත් සංවිධාන ක්‍රමයේ දුර්වලකම නිසා සතුටුදායක අන්දමින් කෙරී නැහැ. ආහාර සැපයීම හෝටල් වලට භාර දී තිබුණු නිසා බොහෝවිට ජනතාවට ලැබුණේ හෝටල්වල පිළුණු වූ බත් බව කනගාටුවෙන් මතක් කරන්ට සිදු වී තිබෙනවා.

දන් වතුර බැහැල ගිහින්. ගිය දේ කොහොම වුණත්, දැනට කෙරෙන්ට තිබෙන වැඩ ගැන ගරු සභාවේ අවධානය යොමු කරවන්ට මා බලාපොරොත්තු වෙනවා. ජලයෙන් යට වූ ගම් ප්‍රදේශවල සිය ගණනක් ඇවිදින් මා වට කර ගත්තාම මා ඒ උදවිය සමග කච්චේරියට ගොස් අතිරේක දිසපාතිතුමා සමග මේ ප්‍රශ්නය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැන සාකච්ඡා කළා. ආධාර ලබා දීම සම්බන්ධයෙන් මූලික වාර්තා සකස් කරන්නේ ග්‍රාම සේවක මහතුන් නිසා පරීක්ෂණ පවත්වන අවස්ථාවලදී, ගම්සභා නියෝජිතයින්, ග්‍රාමසංවර්ධන සමිතිවල නියෝජිතයින් වැනි උදවියගේ සහාය හැකි තරම් දුරට ලබාගෙන ඒ කටයුතු කරන ලෙස මා ඒ අතිරේක දිසාපතිතුමාගෙන් ඉල්ලා සිටියා. ඒ අන්දමට ක්‍රියා කරන්ට එතුමා කැමැත්ත ප්‍රකාශ කළා. එහෙත් තවම ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙන්නෙ බොහොම හෙමින්. මේ ජල ගැල්ම ඇති වුණේ පසුගිය මාසයේ 20 වැනිදායි. අර මුලින් දුන් ආහාර පාර්සලය හැර වෙන කිසිම ආධාරයක් ඒ පිරිසට මෙතෙක් ලැබී නැති නිසා මෙය අත්‍යවශ්‍ය සේවයක් හැටියට සලකා විපතට පත් අයට ඉක්මණින් ආධාර දෙන්ට කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දෙන ලෙස මා ඉල්ලා සිටිනව. දැන්ම ලැබෙන රුපියල් සියය පසුව ලැබෙන රුපියල් දාහට වඩා වටිනවා.

ග්‍රාම සේවකගේ මූලික වාර්තාව ලැබුණාට පසුව, සිදු වූ හානිය තක්සේරු කිරීමට නිලධාරියකු යන බව මට කච්චේරියෙන් දැනගන්නට ලැබී තිබෙනවා. එසේ තක්සේරු කිරීමට යන නිලධාරියා සමඟ පළාතේ මන්ත්‍රීවරයාට හෝ ඔහුගේ නියෝජිතයකුට හෝ යන්නට පුළුවන් විධියට වැඩ පිළිවෙළක් යොදනවා නම් හොඳයි. තක්සේරු කිරීමට යන දිනය අපට දන්වනවා නම් ඊට සහයෝගය දෙන්නට අප සූදානම්.

ගෙවල්වලට වාගේම කුඹුරු ගොවිතැන් හා ගොඩ ගොවිතැන්වලටත්, එළවුළු කොටු හා සත්ව ගොවිපොළවල් ආදියටත් ගංවතුරෙන් හානි පැමිණ තිබෙනවා. ඒවාටත් ආධාර සලසන ක්‍රමයක් ඇති කළ යුතුයි. ගංවතුරෙන් හානි පැමිනුණු ගම් හැරෙන විට, වර්ෂාව සමඟම ඇති වුණු කුණාටුවෙනුත් ගම් කීපයකටම හානි සිදු වී තිබෙනව. ඒ ගම්වල ගෙවල වහලවල් කඩාගෙන ගොස් තිබෙනවා පමණක් නොව වගාවන්ටත් හානි පැමිණ තිබෙනවා. ඒවාටත් සහනාධාර සලසන ක්‍රමයක් ඇති කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

මේ හානි සම්බන්ධයෙන් වාර්තා සපයන සමහර නිලධාරීන් තමන්ගේ හිතු මතයට කටයුතු කරන බවටත් මට පැමිණිලි ලැබී තිබෙනවා. "අපේ ගෙවල්-දොරවලට මේ තරම් හානි සිදු වී තිබෙනවා" යැයි කීවත්, "නෑ, එහෙම එකක් පෙනෙන්නට නෑ" කියමින් සමහර නිලධාරීන් හිතුවක්කාර විධියට කටයුතු කරනවාලු. එම නිසා ගංවතුරෙන් හෝ සුළි සුළඟින් හෝ තමන්ට සිදු වුණු හානි ගැන ඉදිරිපත් කරන හැම ඉල්ලීමක්ම ඉදිරිපත් කරන හැටියට ග්‍රාම සේවක මහතුන්ට නැත්නම් ඒ පිළිබඳ වාර්තා සපයන අනෙක් නිලධාරීන්ට අමාත්‍යාංශය මඟින් නියෝගයක් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ වාර්තා අනුව තක්සේරු කරන්නට ගිය විට, "හානි පැමිණ නැති බවට ඒත්තු ගියොත්" ඒ අයට සහනාධාර නොදෙන්නට එවිට පුළුවනි. එහෙත් තමන්ට හානි සිදු වුණා යැයි කියන හැම කෙනකුගේම ඉල්ලීම් ඉදිරිපත් කරන හැටියට නිලධාරීන්ට නියෝග කරන්නැයි මා ඉල්ලා සිටිනවා.

එසේ හානි පැමිනුණු, ජීවනාධාරත් සමඟ රුපියල් 150 ක් පමණ මාසික වැටුපක් ලබන රජයේ සේවකයන්ට, සහනාධාර වශයෙන් ආහාර නොසපයන බවට මට පැමිණිලි ලැබී තිබෙනවා. ඔවුන්ට ආහාර සපයන හැටියට මා ඉල්ලා සිටින්නේ නැහැ. එහෙත් හානි පැමිණි ගෙවල් හිමියන්ට දෙන රුපියල් 400 යේ සහන දීමනාව ඒ රජයේ සේවකයන්ටත් දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

මේ අවස්ථාවේදී ඉඩම් ඇමතිතුමා මේ ගරු සභාවේ නොසිටීම ගැන මා කණගාටු වෙනවා. රුපියල් 300 හෝ 400 බැගින් මේ අවුරුදු 10 ඇතුළත ඒ ඒ පුද්ගලයන්ට ගෙවා ඇති සහනාධාර මුදල් එකතු කර බැලුවොත්, ඒ මුදල් එක විටම ඔවුන්ට ලැබුණා නම් ඒ මුදලින් ඔවුන්ට බංගලා තනා ගන්නට පුළුවන්කමක් තිබුණ බව පෙනී යනවා ඇති. ඒ තරම් විශාල මුදලක් එසේ සහනාධාර වශයෙන් රජයෙන් වැය වී තිබෙනවා.

1965 ට ප්‍රථම ගංවතුරෙන් යට වුණු හකමුණ, මුද්දුව ආදි ප්‍රදේශවල වැසියන්ට උස් බිම්වල ඉඩම් කට්ටි ලබා දීමේ යෝජනා ක්‍රමයක් ඇති කර තිබුණා. ඒ සඳහා ගැසට් නිවේදන දෙකකුත් නිකුත් කළා. එහෙත් ආණ්ඩුව පෙරළුණාට පසුව ඒ ඇමතිතුමාම ඒ නියෝගය අවලංගු කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මදාස මයා.]

මගේ කොට්ඨාශයේ ගංවතුර ඇති වීමට ප්‍රධාන හේතුවක් වී තිබෙන්නේ කොම්පැනි වතුවල පස ආරක්ෂා කිරීමට ඒ පාලකයන් විසින් කිසිසේත්ම සතුටුදායක ක්‍රමයක් අනුගමනය නොකිරීමයි. මෙය ඉඩම් සංවර්ධන ඇමතිතුමාගේ විශෙෂ සැලකිල්ලට භාජන විය යුතු කාරණයක්. රබර් නැවත වගා කිරීමෙදි අද ක්‍රියාත්මක කෙරෙන ක්‍රමය නිසා සම්පූර්ණයෙන්ම පස සෝදාගෙන යන තත්වයක් ඇති වී තිබෙනවා. පැරණි රබර් වගාව උදුරා නැවත වගා කරන අවස්ථාවේදී පස ආරක්ෂා කිරීමේ ක්‍රමයක් වශයෙන් කරන්නේ වැල් වගයක් වැවීමයි. එහෙත් රබර් පැළ ලොකු වී අතු විහිදී වැවුණාට පසු අර වැල් ටික මැරී යනවා. එදා පටන්ම සිදු වන්නේ පස සෝදාගෙන ගොස් පහත ඇති ගංගා ගොඩ වීමයි. සාමාන්‍යයෙන් රබර් පැළයක මුල් පොළොව මට්ටමේ සිට අගල් තුනක් හතරක් යටින් තමයි විහිදී යන්නේ. එහෙත් අවුරුදු 10 කට කලින් සිටවූ පැළ ලොකු වී ගස් වශයෙන් වැඩී තිබෙන අද ඒවායේ මුල් අගල් 8ක් පමණ පොළොවෙන් උඩට මතු වී තිබෙනවා. අපට එයින්ම පෙනී යනවා, කොයි තරම් බරපතළ ලෙස පස සෝදාගෙන ගොස් තිබෙනවාද කියා. මා කුඩා කාලයේ අලියාට ගොඩ වී යන්න බැරි තරම් වළවල් තිබුණ ගංගාවල් අද දණක් පමණ වන තරමට ගොඩ වී තිබෙනවා. පස සෝදා යාමෙන් ඒ වළවල් සම්පූර්ණයෙන්ම වැලිවලින් ගොඩ වී තිබෙනවා. එම නිසා වතුවල පස සෝදා යාම සම්පූර්ණයෙන් වැළැක්වීමට යම් ප්‍රතිකර්මයක් යෙදිය යුතුයි. රබර් නැවත වගා කිරීමේදී දැනට කරන පරිදි වැල් වැවීම වැරදි ක්‍රමයක්. වැවිලිකරුවකු හැටියට මට කියන්න පුළුවන්, ඕනෑම වත්තක පස සෝදා යාම වැළැක්වීමට ඉතාමත් හොඳ පහසු ක්‍රම තිබෙන බව. ඕනෑම වැස්සකට ඔරොත්තු දී බොර පාට නැතිව හොඳ පිරිසිදු වතුර වත්තෙන් පිට වී යන සේ කානු දැමීමේ ක්‍රමයෙන් පස සෝදා යාම සම්පූර්ණයෙන්ම වළක්වන්න පුළුවන්. එසේ පුළුවන්කම තිබියදී අවුරුදු 10කට අඩියක් පමණ පස සෝදා ගොස් ගංගා ඇළ දොළ ගොඩ වී යනවා. කළුගඟ පිළිබඳව සිදු වී ඇත්තේ ඒකයි. මේ කාරණය ගරු ඇමතිතුමාගේ විශේෂ සැලකිල්ලට යොමු විය යුතුව තිබෙනවා.

මීට වඩා දීර්ඝ ලෙස මා කථා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. මා විශේෂයෙන් සඳහන් කර පෙන්වා දුන්නේ කොම්පැණි වතුවල පස සේදී ගොස් පහත තිබෙන ගංගා නිම්න ගොඩ වී එහි ප්‍රතිඵලයක් වශයෙන් වුණ බලවත් හානිය ගැනයි. එම නිසා ඒ කාරණය කෙරෙහි ගරු ඉඩම් ඇමතිතුමාගේ විශෙෂ සැලකිල්ල යොමු කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 7.5

**ජේ. එල්. සිරිසේන මයා.** (බිංගිරිය)
*(திரு. ஜே. எல். சிறிசேன—பிங்கிரிய)*
(Mr. J. L. Sirisena—Bingiriya)

ගරු කථානායකතුමනි, සුළි සුළං සහ ගංවතුර ගැන බොහොම කරුණු කියැවුණ නිසා ඒ ගැන කාලය ගත කිරීමට මා අදහස් කරන්නේ නැහැ. බිංගිරිය ඡන්ද කොට්ඨාශයට සිදු වී ඇති අලාභ හානි ගැන විශෙෂයෙන් වාරිමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමාට මතක් කරන්න තිබෙනවා. ඔයවල් කීපයක් එකතු වන ජලාශයක් මගේ කොට්ඨාශයේ තනා තිබෙනවා. එය ප්‍රසිද්ධ වී තිබෙන්නේ ගල්කිස්ස බැම්ම යනුවෙනුයි. මෙවර මෙම ගල්කිස්ස බැම්ම දෙපොළකින් කැඩී ගියා. මෙසේ කඩාගෙන යාමට හේතු වූයේ විශෙෂයෙන්ම එහි පැන්නුම—ඇනිකට්—ස්ථානයේ වතුර නැවැත්වීම සඳහා යොදා ඇති දොරටුවේ ඇති වරද නිසයි. එතැන යොදා තිබෙන්නේ ලී දොරටුවක්. මෙම ලී දොරටුව ඇද ගැසීම නිසා සාමාන්‍ය දිනකට වුණත් උස් පහත් කිරීමට ශක්තිමත් පුරුෂයින් හතර පස් දෙනකුට පැය දෙක තුනක කාලයක් ගත වෙනවා. මේ නිසා 1966 මුල් භාගයේදී මා කුරුණෑගල දිසාපතිතුමාත් වාරිමාර්ග ඉංජිනේරු මහතාත් මෙම ස්ථානයට කැඳවා ඉල්ලීමක් කළා, මෙම ලී දොරටුව ඉවත් කර ඒ වෙනුවට යකඩ දොරටුවක් සවි කර දෙන ලෙස. එදා කරන ලද මෙම ඉල්ලීමට කන් නොදීම නිසා මෙවර වතුර ගැලීමේදී එම බැම්ම කැඩී යාමෙන් ගම් ගණනාවක්, කුඹුරු අක්කර හත් අට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සියයක්, යට වූවා පමණක් නොව ගෙවල් ගණනාවක්ද විනාශයට පත් වී තිබෙනවා. මෙසේ යට වී ගිය සමහර කුඹුරුවල තව අවුරුදු ගණනාවකටවත් වගා කරන්න බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඇතැම් කුඹුරුවල වළවල් හැරීම නිසා පස් කියුබ් සිය ගණනක් දමා පිරවීමෙන්වත් යථා තත්ත්වයට පත් කර ගන්න බැහැ. මේ කාරණය ගැන ගරු ඇමතිතුමාට විශෙෂයෙන්ම මතක් කරන්නේ, ඉංජිනේරුවන් දක්‍ෂ පුද්ගලයන් වුණත්, සාමාන්‍ය ගම්බද උදවියට වඩා උගත්කමක් තිබුණත්, තේරෙන උදවිය වුණත්, ගම්බද උදවිය කියන යම් යම් දේවලට වුණත් පොඩ්ඩක් සැලකිල්ලක් දැක්වූවා නම් මෙවර ජලගැල්මෙන් සිදු වූ විනාශය බොහෝ දුරට මග හරවා ගන්නට ඉඩ තිබුණ නිසයි. 1966 මුල් භාගයේදී මා විසින් කරන ලද එම ඉල්ලීම අනුව යකඩ දොර වුවක් මෙම ස්ථානයට සවි කළා නම්, පැය භාගයක පමණ කාලයක් තුළදී වතුර බැස්සීමට හැකි වීමෙන් සිදු වුණු විශාල හානියෙන් ප්‍රදේශය බේරා ගන්න තිබුණා.

ගරු කථානායකතුමනි, දැදුරුඔය ගැලීම නිසා බිංගිරිය කොට්ඨාශයේ ගෙවල් දෙසිය පණහක් තුන් සියයක් පමණ කඩා වැටී තිබෙනවා. පැය 36 ක පමණ කාලයක් තුළ දී අගල් 19 ක 20 ක ප්‍රමාණයක වර්ෂාව පතිත වීම නිසා විශාල හානියක් සිදු වී ඇතත්, 1957 දී සිදු වුණු තරම් බරපතළ හානියක් මෙවර සිදු වී නැති බව කියන්න කැමතියි. මෙහිදී ගරු සමාජසේවා ඇමතිතුමාගේ අවධානය යොමු කරවීම පිණිස එක් කාරණයක් ගැන කියන්න ඕනෑ. දැදුරුඔය දෑලේ ගම්වල ග්‍රාම සේවක මහතුන්ට, ඔරු හෝ ගංවතුර ගැලීමකදී ප්‍රයෝජනයට ගත යුතු උපකරණ කිසිවක් දී නැහැ. මේ නිසා ඔරු ලබාගැනීම පිණිස සැතපුම් දහයක් පමණ දුර ලොරිවලින් යන්න සිද්ධ වෙනවා. ජලගැල්මකදී, ඔරු ලබාගැනීම පිණිස හලාවත, කාක්කපල්ලිය, තෝඩුවාව යන ප්‍රදේශවලට බොහෝ විට යන්න සිදු වෙනත්, මෙවර ඒ ප්‍රදේශයට වත් යන්න පුළුවන් තත්ත්වයක් ඇති වුණේ නැහැ. මේ නිසා දැදුරු ඔය දෑලේ ජීවත්වුන මහජනතාවට විශාල අමාරුවකට මුහුණ දෙන්න සිඬ වුණා. එම නිසා, මින් ඉදිරියට ඇති වන මෙබඳු විපත්වලදී ප්‍රයෝජනය ගැනීම පිණිස, ප්‍රදේශයේ ග්‍රාම සේවකයින් භාරයේ හෝ ප්‍රදේශයේ දිසාපතිතුමා භාරයේ හෝ ඔරු දෙකක් තුනක් සූදානම් කර තබා ගැනීමට ගරු සමාජ සේවා ඇමතිතුමා විධිවිධාන යොදනවා නම් ඉතාමත්ම කාලෝචිත බව මතක් කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, රජයෙන් දෙන ගංවතුර ආධාර ලැබෙන්නේ ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ට පමණයි. මේ අනුව බලහත්කාරයෙන් රජයේ ඉඩම්වල පදිංචිකරුවන්ට ආධාර ලැබෙන්නේ නැහැ. මේ උදවිය මොන විධියේ නිවාස සාදා ගෙන තිබුණත්, ඒ නිවාසවලට මොන අන්දමේ පාඩුවක් විනාශයක් වුණත්, ඔවුන්ගේ වගාවන් කොයි ලෙසින් විනාශ වී ගියත්, බලහත්කාරයෙන් රජයේ ඉඩම්වල පදිංචි වී ඇත්නම් ඔවුන්ට කිසිම අන්දමක ආධාර මුදලක් ලැබෙන්නේ නැහැ. මෙබඳු විපත්තිකර අවස්ථාවක මහජනතාවට භේදයක් ඇතුව සැලකීම කිසිසේත් යුක්ති සහගත යයි මා කල්පනා කරන්නේ නැහැ. එම නිසා රජයෙන්, විශෙෂයෙන්ම සමාජසේවා ඇමතිතුමාගෙන්, ඉල්ලා සිටින්න කැමතියි, බලහත්කාරයෙන් පදිංචිව සිටියත් ඒ උදවියටත් ආධාර සලසන ලෙස. ඒ උදවිය බලහත්කාරයෙන් රජයේ ඉඩම්වල පදිංචිව සිටින්නේ පදිංචි වීමට වෙනත් ස්ථාන නොමැති නිසයි. ඒ උදවියත් මනුෂ්‍යයෝ. අනිකුත් අයට තිබෙන අමාරුකම් ඔවුන්ටත් තිබෙනවා. එම නිසා මෙවැනි විපත්තිදායක අවස්ථාවකදී එක් කොටසක් වෙන් කර ආධාර දීම කිසිසේත් යුක්ති සහගත යයි මා කල්පනා කරන්නේ නැහැ.

ඒ අතරම ගංවතුරෙන් හානි වූ නිවාසයක් සඳහා රුපියල් හාරසියය බැගින් දීමට අදහස් කරනවා. සමහර උදවියට අලාභය වශයෙන් රුපියල් හාරසියයක්වත් ලැබෙන්නේ නැහැ. කෙසේ වුණත් රුපියල් හාර සියයක මුදලින් ගෙයක් තනාගැනීම තබා පියස්සක්වත් අද කාලයේ හැටියට සාදා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ වුණත් රුපියල් හාර පන්දහස බැගින් නැත්නම් රුපියල් හත් අටදහස බැගින් රජයෙන් නිකම් මුදල් දිය යුතුය කියා මා කියන්නේ නැහැ. මේ රටේ හැම දෙයක්ම නිකම් දෙන්නට යෑම නිසා තමයි බොහෝදුරට අපේ ජනතාව ධෛර්‍යය පැත්තකට දමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. එල්. සිරිසේන මයා.]

හැම දෙයක්ම නිකම් ගන්නට බලාගෙන ඉන්නෙ. එමනිසා රුපියල් 400 දෙන අතර ම නිවාස නැතිවූ අයට කැමති නම් තමන්ට වුවමනා විධියට ශක්තිමත් අන්දමින් ගෙවල් තනා ගැනීමට ණය දීමේ ක්‍රමයක් ඇති කරන්නට පුළුවනි. අවුරුදු දහයකින් පහළොවකින් ආපසු අය කර ගත හැකි වන අන්දමට ගේ පොඩ්ඩක් සාදා ගන්නට ප්‍රමාණවත් මුදලක් රුපියල් 400 ට අමතරව ණයක් වශයෙන් දීම ගැන මා රජයේ අවධානය යොමු කරවනවා. සාමාන්‍යයෙන් ගංවතුරට යට වන ප්‍රදේශ වල මේ ජනතාව ගෙවල් තනන්නෙ මැටි වලින්; ඒව වරිච්චි ගෙවල්. නමුත් රුපියල් හාර පන්දහසක ණය මුදලක් දෙන්නට පුළුවන් නම් සමහර විට ඒ අයට ගඩොලින් නැත්නම් ගල්වලින් අඩි තුන හතරක් තරම උසටවත් බිත්ති බැඳ තර මක් ශක්තිමත් ගෙයක් සාදා ගන්නට පුළුවන් වෙනවා. ඒ කාරණය ගැනත් මා රජයේ අවධානය යොමු කරවනවා.

අ. භා. 7.12

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)
(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)
(Mr. M. Tennakoon—Nikaweratiya)

ගරු කථානායකතුමනි, ගංවතුර අද රටේ සාමාන්‍යයෙන් ඇති වන දෙයක්. නමුත් අවාසනාවකට මෙන් මේ වාරයේ සුළි සුලඟකුත් ඇති වුණා. බොහෝ විට වයඹ පළාත මෙවැනි උවදුරුවලින් ආරක්ෂා වෙනවා. නමුත් මේ අවස්ථාවේදී එහෙම වුණේ නැහැ. මේ අවස්ථාවේදී වයඹ පළාත, විශෙෂයෙන්ම ඔබතුමාගේ ප්‍රදේශය මහා විනාශයකට ලක්වුණා. මේ ඛෙදජනක සිද්ධිය ගැන ඇත්ත වශයෙන්ම අප කණගාටු වෙනවා. කෙසේ වෙතත් රජයේ නිලධාරීන් ඇතුළු අනෙකුත් සියළුම කොටස් මේ අවස්ථාවේදී ඉතා ඕනෑකමින් කටයුතු කර තිබීම අපේ සැනසිල්ලට හේතුවක්. පුත්තලම දිසාපති තුමාත් ඒ කොට්ඨාශවල ආදායම් පාලක නිලධාරි මහත්වරුනුත්, ඒ වාගේම සමාජ සේවා අංශවලට සම්බන්ධ සියලුම නිලධාරී මහත්වරුනුත් අනෙකුත් හමුදාවලට අයත් නිලධාරි මහත්වරුනුත්—සියලු දෙනාම—තම තමන්ගේ යුතුකම් ඉෂ්ට කර තිබෙනවා. එය අපේ සතුටට කාරණයක්.

හදිසියෙන් ඇති වන තත්ත්වයක් වැළැක්වීමට මාර්ග නැහැ. නමුත් අවුරුදුපතා ඇති වන ගංවතුරෙන් ඒ ප්‍රදේශ බේරා ගැනීම ගැන අප ස්ථිර ක්‍රියා මාර්ගයක් ගත යුතුව තිබෙනවා. මේ ප්‍රශ්නයේදී අප හරියට වැද්දන් ගෙවල් සාදන ක්‍රමයටයි සෑම අවස්ථාවකදීම කටයුතු කර තිබෙන්නෙ. ගංවතුර ගැලුවාමයි අපට ගංවතුරෙන් ඇති වන උවදුරු, අලාභ හානි සියල්ලක්ම පෙනෙන්නෙ. නමුත් වර්ෂයක් පාසා අපට ගංවතුර උවදුරුවලට මුහුණපාන්නට සිද්ධ වෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රදේශ, කොළඹ ප්‍රදේශ රාශියක්—කැළණි ගඟ අවට ප්‍රදේශ, කොලොන්නාව අවට ප්‍රදේශ—නිතර නිතර ගංවතුරට යට වෙනවා. එම නිසා මේ ප්‍රදේශවල ජීවත් වන ජනතාව ස්ථිර වශයෙන්ම ගංවතුරෙන් බේරා ගැනීමට ක්‍රමයක් සකස් කරන්නට ඕනෑ. අග මැතිතුමා සඳහන් කළ කාරණය අප පිළිගන්නවා. එනම්, විශේෂඥයන්ගේ මත අනුව විශාල මුදලක් වැය කර මේ ප්‍රශ්නය විසඳන්නට අපට පුළුවන්කමක් නැහැ. නමුත් නිතර නිතර ගංවතුරට යට වන ප්‍රදේශවල වාසය කරන ජනතාව උස් බිම් වල පදිංචි කරවීමට අපට පුළුවන්කම තිබෙනවා. නමුත් ඒ ගැන මේ දක්වා කිසිම සැලැස්මක්, වැඩ පිළිවෙළක් කවුරුවත් ක්‍රියාත්මක කර නැහැ. ඒකයි මා මුලින්ම මේක හරියට වැද්දන් ගෙවල් සාදනවා වාගේය කියා කිව්වෙ. වැද්දන්ට ගෙවල් සාදන්නට මතක් වෙන්නෙ වර්ෂා කාලයටයි. නමුත් වර්ෂාව නැවතුණාම ඔවුන් ගෙවල් සෑදීම ගැන කිසිම වුවමනාවක් දක්වන්නේ නැහැ. ඒවාගේම තමයි මේකත්.

ගංවතුර උවදුර නිසා කොළඹ නගර සභාව අවුරුදුපතා කොයි තරම් මුදලක් සහනාධාර පිණිස වැය කරනවාද? කොළඹ නගර සභාව අපේ රටේ ප්‍රධානම පළාත් පාලන ආයතනයයි. නමුත් මේ දක්වා ගංවතුර උවදුර ගැන ස්ථිර සැලැස්මක් ඇති කර නැහැ. ඒවාගේම සමාජ සේවා දෙපාර්තමේන්තුවත් සහනාධාර වශයෙන්, වන්දි වශයෙන් කොයි තරම් විශාල මුදලක් වැය කරනවාද? එමනිසා කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) ප්‍රකාශ කළ අදහස මා සම්පූර්ණයෙන්ම අනුමත කරනවා. ගංවතුරෙන් නිතර නිතර යට වන ප්‍රදේශවල ජනතාවගේ තත්ත්වය ගැන පරීක්ෂා කර බලන්නට කාරක සභාවක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පත් කිරීම අවශ්‍යය කියා එතුමා කියන්නට යෙදුණා. තත්ත්වය පරීක්ෂා කර බලා මේ උදවිය ගංවතුර උවදුරින් ගලවා ගැනීම සඳහා යෙදිය යුතු සෑම වැඩ පිළිවෙළක්ම ඉතා ඉක්මනින් ක්‍රියාවට යොදවන හැටි යට මා මතක් කර සිටිනවා. අවුරුදු විස්සේ තිහේ සැලැස්මවල් අනුව කරන්නට ගියොත් කවදාවත් මේවා කෙරෙන්නේ නැහැ. එම නිසා මෙවැනි කාරක සභාවක් මගින් කරුණු විමසා බලා නිසි පරිදි යෝජනා සකස් කරගෙන ඒවා ඉතා ශීඝ්‍ර යෙන් හා අඩු වියදමකින් ක්‍රියාත්මක කරන හැටියට මා මතක් කර සිටිනවා. ගංවතුර උවදුරින් නිතර නිතර යට වන ප්‍රදේශවලට මෙවැනි සැලැස්මක් ඇති කිරීම ඉතාම අවශ්‍යයි.

මට තවත් කාරණයක් කියන්නට තිබෙනවා. ගංවතුරින් යට වන ප්‍රදේශවල වෙසෙන උදවියට ගෙවල් සාදා ගැනීමට දෙනු ලබන ආධාර පිළිබඳව යමක් කියන්නට කැමතියි. හැම අවස්ථාවකම ගංවතුරින් කඩාගෙන යන තැන්වල පිහිටි ගෙවල් සාදා ගැනීමට නිතර නිතර ආධාර දීමෙන් රජයටවත් එම මුදල් ලබා ගන්න උදවියටවත් ප්‍රයෝජනයක් සැලසෙන්නේ නැහැ. එම නිසා ගංවතුරින් යට නොවන ගොඩ බිම් ප්‍රදේශ අත්පත් කර ගෙන හෝ මෙම ආධාරවලින් නිසි පරිදි ප්‍රයෝජන ලබා ගැනීමට හැකි වන පරිදි කටයුතු සකස් කිරීම අවශ්‍යයි.

ගරු කථානායකතුමනි, මගේ කොට්ඨාශයේ ඇතැම් ප්‍රදේශ නිතර නිතර ජලයෙන් යට වෙනවා. තමුන්නාන්සේගේ ප්‍රදේශයේ පවා එම තත්ත්වය පවතිනවා. දැදුරු ඔයේ වතුරින් නිතර නිතර යට වන ප්‍රදේශ එම පළාත්වල තිබෙනවා. එම ප්‍රදේශවල ජීවත් වන උදවියට ස්ථිර ගෙවල් සාදා ගැනීම පිණිස ලබා දෙන්නට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම කළ යුතුයි. මේ සඳහා ඇතැම් ප්‍රදේශවල තිබෙන වගා නොකළ පුද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම ඉතා පහසුයි. වගා කළ ඉඩම් වුවත් කමක් නැහැ, මේ සඳහා අත්පත් කර ගත යුතු තත්ත්වයක් පැන නැගී තිබෙනවා. එවැනි ඉඩම් හෝ අත්පත් කර ගෙන ගෙයක් පමණක් සාදා ගැනීමට තරම් සෑහෙන කොටසක් බැගින්වත් ඒ උදවියට බෙදා දිය යුතුයි. සාමාන්‍ය නීතිය අනුව නොව දැනට තිබෙන හදිසි නීතිය යටතේ වුවත් ඒ සඳහා ක්‍රියා කරන්නට පුළුවන්කම තිබෙනවා. එසේ ක්‍රියා කොට ගෙවල් සාදා ගැනීමට දෙනු ලබන ආධාරය නිසි පරිදි ප්‍රයෝජන ලබා ගන්නට සලස්වන මෙන් මා ඉල්ලා සිටිනවා. ගරු ඉඩම් ඇමතිතුමා කොතෙක් දුරට එය ක්‍රියාවේ යොදවාවිදැයි කියන්නට බැහැ. හදිසි අවස්ථාව යටතේ හෝ ඒ සඳහා අවශ්‍ය නියෝග නිකුත් කර ගෙවල් සාදා ගැනීමට දෙන ආධාරවලින් මෙම අවස්ථාවේදීම නිසි පරිදි ප්‍රයෝජන ලබා ගන්නට ඉඩකඩ සලස්වා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා.

රජයේ ඉඩම් නොමැති නම් පුද්ගලික ඉඩම්වත් මේ සඳහා අත්පත් කර ගන්නට පුළුවනි. ගෙවල් සාදා ගැනීමටවත් සෑහෙන පමණ ඉඩම් ප්‍රමාණයක් අත්පත් කර ගැනීම සඳහා ඒ ඒ ප්‍රදේශ භාර දිසාපතිවරුන් ලවා අවශ්‍ය නිර්දේශ නිකුත් කරවනවා නම් හොඳයි. ගරු ඇමතිතුමා ඒ වෙනුවෙන් ක්‍රියා කරනවාදැයි මා ප්‍රශ්න කරනවා. මා විශ්වාස කරනවා, මෙවැනි නිර්දේශ නිකුත් කරන්නට දිසාපතිවරුන් නිතරම සූදානම්ය කියා. ඒවා ඉක්මනින් ක්‍රියාත්මක කරනවා නම් පමණයි, පලක් සිදු වන්නේ. දිසාපතිවරයකු වේවා, ආදායම් පාලක නිලධාරියකු වේවා, මෙවැනි නිර්දේශයක් නිකුත් කරන්නට බිය වන්නේ ඒවා කවදාවත් ක්‍රියාත්මක නොවන නිසයි. එවැනි නිර්දේශ අවුරුදු ගණනාවකින් පසු අහෝසි බවට පත් වෙනවා. දැන් එවැනි අවස්ථා කීපයක් ඇති වී තිබෙනවා. හදිසි අවස්ථාවෙන් නිසි ප්‍රයෝජන ලැබිය හැකි මෙවැනි අවස්ථාවන්ද පැමිණෙනවා. එම නිසා හදිසි අවස්ථාව යටතේ හෝ අවශ්‍ය ඉඩම් ඉක්මනින් අත්පත් කර ගන්නා හැටියට මා ඉල්ලා සිටිනවා. දිසාපතිවරුන්ගෙන් ඉල්ලීමක් කරන්න, එවැනි නිර්දේශ නිකුත් කරන ලෙස. එවැනි ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය කරන මිනින්දෝරුවන් යොදවා ගංවතුරට යට නොවන ප්‍රදේශවල ගෙවල් සාදා ගැනීම පිණිස ඉක්මනින් කටයුතු සකස් කර දෙන හැටියට මා මතක් කර සිටිනවා.

බිංගිරියේ ගරු මන්ත්‍රීතුමා (ජේ. එල්. සිරිසේන මයා.) විසින් ඉදිරිපත් කරන ලද එක් කාරණයක් මාද අනුමත කරනවා. බල පත්‍ර නොමැති ඉඩම් කොටස්වල පදිංචි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

වුවත්ට මෙම ආධාර ලැබෙන්නට ඉඩක් ඇත්තේ නැහැ. එම නිසා ඒ පිළිබඳ සුදුසු සංශෝධනයක් කරන්නට ඕනෑ. සමාජ සේවා කටයුතු භාර ගරු ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා මේ ගැන සිය අවධානය යොමු කරනවා ඇතැයි අප විශ්වාස කරනවා. අනවසරයෙන් යම් යම් ඉඩම් වල පදිංචි වී ඒවායේ වගා කටයුතු කර ගෙන ජීවත් වන උදවිය සිටිනවා. එවැනි ඉඩම් සුදුසු තත්ත්වයක තිබෙනවා නම් ඔවුන්ට අත් කර දෙන්නට ඕනෑ. නුසුදුසු තැන් වුවත් කමක් නැහැ, ඒ අයට අත් කර දුන්නාට. මා එසේ කියන්නේ, ඒවායේ පිහිටි ගෙවල් සඳහා ඔවුන් විශාල අත්දමින් සිය වත්කම් පවා යොදවා තිබෙන නිසයි. යම් හෙයකින් එවැනි ඉඩම් දෙන්නට බැරිකමක් තිබෙනවා නම් ඔවුන්ට වෙන සුදුසු තැන්වලින්වත් ගෙවල් සාදා ගැනීමට ඉඩම් ලබා දෙන ලෙසයි, මා කියා සිටින්නේ. මෙම අවස්ථාව, ඔවුන් ඉතා ලොකු අනාථ තත්ත්වයකට, උවදුරු සහගත තත්ත්වයකට, පත්ව සිටින අවස්ථාවක්. එම නිසා මෙය මානුෂික ප්‍රශ්නයක් වශයෙන් සලකන්නට ඕනෑ. මෙතැනට නීතිය අරගෙන බැහැ. අනාථ අයගේ සහනය පිණිස නීතිය උල්ලංඝනය වුණාට වරදක් නැහැ. ආධාර දුන්නත් ප්‍රමාණවත් ආධාරයක් දෙන්නට ලැබෙන්නේ නැහැ. එය කුමක් වුණත්, එසේ දෙන ආධාර ප්‍රයෝජන ගන්නට පුළුවන් අන්දමට, සාර්ථක ලෙස, දෙන්නට ක්‍රමයක් සකස් කරන ලෙස සමාජ සේවා ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟ ප්‍රශ්නය වැව් කැඩී යෑම ගැනයි. කැඩුණු වැව් ප්‍රතිසංස්කරණය නොකළොත් මාස් කන්නයට බලාපොරොත්තු වන වී වගාව කර ගන්නට ලැබෙන්නේ නැහැ. ගොවි හමුදාව වැනි කොටස් ඒ කාර්යය සඳහා යොදවන්නට ලැහැස්තියි කියා අපට ආරංචියි. ඒ කෙසේ වුවත්, කැඩී තිබෙන වැව් ඉක්මනින් සාදා ගැනීමේ වැඩ පිළිවෙළක් අවශ්‍ය වී තිබෙනවා. එමෙන්ම පාසැල් ගොඩනැගිලි රාශියකුත් කැඩී ගොස් තිබෙනවා. ඒවාත් ඉක්මනින් ප්‍රතිසංස්කරණය කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශයේ සැළකිල්ල යොමු විය යුතුව තිබෙනවා.

අනික් ප්‍රශ්නය පාරවල්. එය ඉතාමත්ම වැදගත් ප්‍රශ්නයක්. නරක තත්ත්වයේ තිබෙන අපේ ගම්බද පාරවල් ගංවතුර නිසා තවත් නරක තත්ත්වයට පත් වී තිබෙනවා. ඒ නිසා ඒ පාරවල් සෑදීමටත් රජයේ වැඩ දෙපාර්තමේන්තුව ශීඝ්‍රගාමී වැඩ පිළිවෙළක් යෙදිය යුතුව තිබෙනවා. කැඩුණු පාසැල් ගොඩනැගිලි සෑදීමටත්, අබලන් වූ පාරවල් සෑදීමටත් ගොළුබෙලි ප්‍රතිපත්තිය අනුව කටයුතු නොකර අධ්‍යාපන අමාත්‍යාංශය හා රජයේ වැඩ දෙපාර්තමේන්තුව ඉක්මන් ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

එමෙන්ම අපේ කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංගරත්න මයා.) සඳහන් කළ කරුණ මා නැවතත් මතක් කරන්න කැමතියි. එනම්, මේ සම්බන්ධව විශේෂ කාරක සභාවක් පත් කර ඒ ඒ ප්‍රදේශවල තත්ත්වය වෙන වෙනම විමසා බලා ගංවතුර හානි වැළැක්වීමට ඉක්මනින් ක්‍රියාත්මක කරන්නට පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කිරීමයි. කැලණි ගඟ යන්තම් ගලන විටම සෑමදාම යට වන ප්‍රදේශ තිබෙනවා. එවැනි කාරක සභාවක් මගින් කරුණු සොයා බලා එම හානි වළක්වා ගැනීමට කටයුතු කළ හැකි නිසා එවැනි වැඩ පිළිවෙළක් ඇති කර තත්ත්වය සතුටුදායක කර ගන්නා ලෙස මා විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

අ. භා. 7.23

**මුස්තාෆා මයා.**

*(ஜனாப் முஸ்தபா)*

(Mr. Mustapha)

Mr. Speaker, there is no doubt that the recent floods have caused numeruos loss and damage both to life and property over a large extent of land. The cyclone that followed contributed even more to the great havoc that had been caused in very many areas. In fact I myself feel very sorry that one of the areas affected is your own.

Soon after this incident took place we had a conference with the government agents of the affected areas. We have official reports sent to us from various officers including

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

those of the Social Services Department. But, in a situation like this it is very necessary that the Government must have the views of the people's representatives and that is why I feel very happy that an opportunity had been afforded to hon. Members of this House to make representations to Government on behalf of the people they represent.

I am very happy that hon. Members from both sides of the House have expressed appreciation of the promptness with which the Government went to the assistance of the numerous unfortunate people who have suffered as a result of the flood and the cyclone. I mysef should like to join hon. Members of this House who paid tribute to the many officers of the various departments—the Social Services Department, the gramasevakas, the D. R. Os the government agents and others—who had worked round the clock to help thousands of these unfortunate people.

It is very difficult, Mr. Speaker, particularly after a flood of this magnitude or after a cyclone or cyclonic condition to assess precisely the numerous ways in which the people have suffered. Already we have various views expressed. There are thousands of people who have been affected by the flood and the cyclone. There have been thousands of acres of paddy land completely ruined and some partially ruined. Vast acreages of coconut plantations have been damaged. Vegetable cultivation too has suffered damage. Public roads, V. C. roads and buildings have been damaged with consequential inconveniences caused to the people of the affected areas.

I can only give one assurance to hon. Members of the affected areas, and that is that the Government will spare no effort to see that within the shortest time possible normal conditions of life are restored. At the same time I must admit that no Government however willing it may be, can restore normal conditions of life immediately. This is something that the people will have to put up with for quite some time. I myself have had the trying experience of a situation like this way down in 1957 when there was a major flood in the Eastern Province. I was myself an eye witness to the enormous suffering that the people underwent during those difficult days.

Various suggestions have been put forward. As the Hon. Prime Minister mentioned it is very unfortunate that this situation came in at a time when the Government is concentrating all its efforts on food production. It is an irony that the worst affected have been paddy crops. In fact, in the Matara and Galle areas 15,000 to 20,000 acres of paddy land have been completely ruined. I have got the figures here relating to the various districts affected, the number of persons affected, the acres of paddy damaged and the amount the Government intends spending in these areas. It is not necessary for me to give details, but I admit that large extents of paddy crops have been damaged which would, I must say, have an impact on the effort the Government is making towards increased paddy production.

The hon. Member for Gampaha (Mr. S. D. Bandaranayake), I think, spoke of flood control measures that are being adopted in China. I must tell the hon. Member that there are instances where even in our own country floods have been effectively controlled. I remember when I was a schoolboy about 20 or 30 years ago practically every year we used to have terrible floods on the coastal belt of Amparai. Sometimes we kept away from school for two or even three weeks. The main road from Akkaraipattu used to get flooded. Today it is a thing of the past after the Gal-Oya Scheme came into being. Fortunately we have in the Prime Minister the architect of that scheme. Therefore we must not resign ourselves to fate. We must not consider a flood as an act of God and be satisfied with it. A flood is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුස්තෆා මයා.]

something that can be controlled—it has been controlled in certain areas—and I have no doubt that the Minister who is in charge of this subject, the Minister of Land, Irrigation and Power, when he speaks, will give an idea of what his Ministry proposes doing with regard to the control of floods in our country.

But with regard to our Ministry, we are interested in rehabilitating the people affected by this calamity, and I am very happy that hon. Members who spoke appreciated the work that the Social Services Ministry has already done. In fact, from the director downwards, the officers have been doing an excellent job of work and I think hon. Members have been satisfied with the work so far done.

I must specifically refer to one or two points made by hon. Members. I entirely agree with the hon. Member for Kolonnawa (Mr. Ilangaratne) when he said that in the Kolonnawa electorate floods have been a recurring feature. In fact, we had hardly completed paying compensation for the damage caused to houses in 1966 when the flood came in 1967, and one can better understand or imagine than describe the sufferings of those poor people who have to bear this miserable thing year in and year out. In fact, he complained that dry rations had not been given to the people of Kolonnawa. I checked up the facts from the Director of Social Services. He tells me that in the Kolonnawa electorate cooked food was given to the people, and it was done entirely in the interests of the affected people. Some of them have been de-housed. Their houses had collapsed and they were taking refuge in school buildings, in prefabricated buildings, in other neighbouring houses and so on. It was considered that when dry rations were given it would be rather difficult for these unfortunate people to cook the food; so the Department of Social Services had thought it necessary to supply these people with cooked meals which really cost about three times more than dry rations. That is the actual fact.

ඉලංගරත්න මයා.
(திரு. இலங்காரத்ன)
(Mr. Ilangaratne)

My complaint is that in certain areas dry rations were issued for two weeks. Just because six meals had been given to these areas, depriving them of the dry rations is unfair.

මුස්තෆා මයා.
(ஜனாப் முஸ்தபா)
(Mr. Mustapha)

I shall get the department to look into it and see whether anything can be done.

Then, there was a point made by several hon. Members with regard to settling the people who are regularly affected by floods—people living in low-lying areas—in safer areas. I think that is a suggestion which I myself would commend for the serious consideration of the Minister of Land, Irrigation and Power, because I think that is a subject that properly falls within his purview. The Government is compelled to spend large sums of money every year in repairing thousands of houses that have collapsed during floods. So, it would be better, once and for all, to make use of Crown land, and wherever Crown land is not available, even to acquire estates, and settle these people on high land. This would avoid this recurring expenditure for the Government.

The Social Services Department pays up to a maximum of Rs. 400 for a damaged house. As an immediate measure, the department pays Rs. 100 in the first instance; thereafter the actual damage caused to the house is assessed and the balance is paid in stages. If the damage is serious, Rs. 400 is paid in two or three instalments. If the amount of the damage is Rs. 200 or Rs. 250, the balance after paying the first instalment is paid

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

subsequently when the damage is assessed. To enable people to make some makeshift arrangement an initial payment of Rs. 100 is made immediately.

I do not wish to speak at length. The Hon. Prime Minister made a statement on this subject and answered a number of points raised by hon. Members.

Finally, I should like to say that the Ministry will do everything possible to restore normal conditions of life to all the people affected by the floods.

අ. භා. 7.35

**දයා ටී. පස්කුවල් මයා.** (මතුගම)
*(திரு. தயா ரீ. பஸ்குவல்—மத்துகம)*
(Mr. Daya T. Pasqual—Matugama)

ගරු කථානායකතුමනි, මිනිස් උපක්‍රමයකින් නොවැළැක්විය හැකි සුළි සුළඟකින් හා කුණාටුවකින් තමුන්නාන්සේගේ ප්‍රදේශයට සිදුවූ අලාභ හානි ගැන අසා, එසේම ඒ අවට ප්‍රදේශවලට සිදු වූ අලාභ හානි ගැන අසා, මේ ගරු සභාව ශෝක වෙමින් සිටින අවස්ථාවේ, රට පුරා ගංගා නිම්නවල නිතර නිතර ගංවතුරට අසු වන ප්‍රදේශ ඇති ඡන්ද කොට්ඨාශවල ගරු මන්ත්‍රීවරුන්ගේ දුක්මුසුපුවත් අසා මිනිස් උපක්‍රමවලින් වැළැක්විය හැකි ඒ දුක් කරදර නොවළක්වමින් අවුරුද්දක් අවුරුද්දක් පාසා ඒවා සිදුවන්නට ඉඩ හැරීම ගැන අපේ කණගාටුව ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා.

කළු ගඟ සහ බෙන්තර ගඟ මායිම්ව ඇති මතුගම ඡන්දදායක කොට්ඨාශයට, පසුගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ ගං වතුරෙන් පසු ගරු ඉඩම් ඇමතිතුමා ඇවිත් විශාල ආන්දෝලනයක් ඇති කර කළ දේ මට මතකයි. අවට ප්‍රදේශවල මන්ත්‍රීවරුන් කළුතර කච්චේරියට කැඳවා, දිසාපතිවරුන් සහ ආදායම් පාලක නිලධාරිවරුන් කැඳවා මොකද කළේ ? කළුතර සිට අඟුරුවාතොට තෙක් ගඟබඩ දිගේ ගොස් නැවතත් තෙබුවන තෙක් ඇවිත්, ඒ දෙපස මිනිසුන් තැනින් තැන රැස් කරවා, පිළිගැනීම් ආදිය පවත්වා, අත දික් කර ප්‍රකාශ කළා, අර පෙනෙන ඉඩම් අනික් ගං වතුරෙන් පෙර තමුන්නාන්සේලාට අයිති වෙනවාය කියා. ගංවතුරට යට වන ප්‍රදේශවල සිටින අය උස් බිම්වල පදිංචි කරවා මේ කරදරයෙන් නොවරදවාම ඔවුන් බේරනවාය කිව්වා. ගරු ඇමතිතුමාගේ ප්‍රකාශයෙන් පසු අඩු ගණනේ ගං වතුර වත් නවතීය කියා අපි බලාපොරොත්තු වුණා. ඒ තරම් විශ්වාසයක් මහජනයා තුළ තිබුණා. ඒ ගඟේ එක පැත්තක තෙබුවන, පැලපිටියාගොඩ, තුඩුගල, දෙඩම්ගොඩ, සේරුපිට, උක්වත්ත, කොහොලාන, ගමගොඩ, අදිකාරිගොඩ ආදි ප්‍රදේශවල ජනතාවත්, ගඟෙන් අනික් පැත්තේ උඩුවර, යටවර, පාතකඩ, ගල්පාත ආදි ප්‍රදේශවල ජනතාවත්, ඒ අවට ඇති නිව්චැටල් වත්තෙන්, නෑබොඩ වත්තෙන්, ලෝමන් වත්තට අයිති කෝන්ගොඩ වත්තෙන්, ආදි තැන්වලින් උස් බිම් අක්කර ස්වල්පය බැගින් හෝ අර ගෙන දී ඔවුන්ට ගෙවල් හදාගෙන පදිංචි වන්නට ඉඩ සලසාවිය කියා බලාපොරොත්තු වුණා. ඉදිරියට ගංවතුරක් ආවත්, ඒ ගං වතුරෙන් කුඹුරු වගා ආදිය යටවුණත්, ගං වතුරෙන් යට නොවන ප්‍රදේශයක තමන්ගේ ගෙවල් දොරවල් ආදිය හදා ගන්නට පුළුවන් වේය කියා ඒ අය බලාපොරොත්තු වුණා.

මා වඩාත් කණගාටු වන්නේ මේ කාරණය නිසයි. රෙමුනගොඩ, බොලොස්සෙගම අවට ගම් කොට ඇති, ලෝමන් වත්තට දීර්ඝ කාලීන ක්‍රමයට බදු දුන්, ගල්කැටියා වත්ත නමැති ඉඩමක් තිබෙනවා. කාසන් කම්බබැච් කොම්පැනියේ ලෝමන් වත්තට මේ ගල්කැටියා වත්ත නමැති ඉඩම දීර්ඝ කාලීන ක්‍රමයට බදු දී තිබෙනවා. මේ ඉඩමේ අළුත් වගාව දමන්නට පෙර, එය තහනම් කර මිනිසුන්ට බෙදා දෙන්නය කියා දන්වා තිබෙනවා. මේ දවස්වලත් අප විදුලි පුවතකින් දැන්වුවා, ගංවතුරෙන් අනාථ වීම නිසා යන්න එන්න තැන් නැති පවුල් 30 ක 40 ක මිනිසුන් ගෙවල්වල ඉතිරි වුණු දේත් ගෙන ගොස් හදිසියේ මේ ඉඩමේ ලැගුම් ගෙන සිටිනවාය, ඔවුන්ට හිරිහැර නොවන අන්දමට විධිවිධාන යොදන්නය, කියා. එහෙත් කොතෙක් කීවත් එයින් වැඩක් වුණේ නැහැ. ඒ සියල්ලන්ම අදත් රිමාන්ඩ් හිර භාරයේ සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පස්කුවල් මයා.]
දිසාපතිතුමාගේ මතක් කිරීමත් තිබියදීම පොලිසියෙන් කෙළේ කුමක්ද? ගංවතුරෙන් අනාථ වූ අය රජයට අයිති, දීර්ඝ කාලීන ක්‍රමයට බදු දී තිබෙන වත්තක සිටියය කියා අදත් හිර භාරයේ තබා තිබෙනවා. මා හිතන පිළිවෙළට ඔවුන්ට ඇප දෙන්නේ 7 වැනිදායි. ඒ සඳහා තමුන්නාන්සේට ලක්ෂ ගණනක් වියදම් කරන්නට සිදු වන්නෙ නැහැ, ගෙවතත් ගෙවන්නට සිදු වන්නේ ඉඩමේ වගාවට පමණයි. දැන් වගාව ගළවා තිබෙන වේලාවේ එහි පදිංචි වී සිටින ඒ අසරණ ජනතාව ඒ විධියට ඇදගෙන ගොස් රිමාන්ඩ් හිර භාරයේ තබා ගැනීම ලොකු අපරාධයක්. ගඟෙන් අනික් පැත්තේ ගල්පාතත් යන්නට එන්නට තැනක් නැති අය පෞද්ගලික ඉඩමක පදිංචි වී සිටිනවා. ඔවුනුත් 7 වැනිදා තෙක් හිර භාරයේ තබා තිබෙනවා.

ගල්කැටිවත්ත ගැන කලින් කිව්වා. එය රජයේ ඉඩමක්. බදු දී තිබෙනවා, ලෝමන් වත්තට. වතු හිමියන්ගෙන් ඇහුවාම ඒ අය කියනවා රජයට ගන්නට කමක් නැහැ කියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ගල්කැටිය වත්තෙ අක්කර කීයක් තිබෙනවාද?

**පස්කුවල් මයා.**
*(திரு. பஸ்குவல்)*
(Mr. Pasqual)
අක්කර 13ක් තිබෙනවා. ඒ ගැන වැඩි විස්තර දන්නේ නැහැ. දීර්ඝ කාලීන බදු ක්‍රමයට දුන් ඒවා තවත් තිබිය හැකියි. අරක්වල කන්ද, නැබඩ ගෘෂ් යන වත්තේ තේ වගා කර තිබෙන නමුත් එය නිකම්ම නාස්තිවෙලා තිබෙනවා. දුටුවාම කනගාටු හිතෙනවා. දැන් එය තණකොළ පිට්ටනියක් වශයෙන්වත් සුදුසු නැහැ. එය මහජනයාට දීම අයිතිකාරයාට පින් සිද්ධ වන වැඩක්.

පැලපිටියාගොඩ ඉඩම් ටිකක්වත් නැති විශාල පිරිසක් ඉන්නවා. ඒ අයට කුඹුරුත් නැහැ. කිසිම රක්ෂාවක් කර ගන්නට මාර්ගයක් එහි නැහැ. මුලදී ඒ උදවිය බට කූඩා කර්මාන්තය කළා. දැන් ඒ අයට ඒකත් නැහැ. හැඩිගල්ල උස්බිම් ජනපදය ඇති කළත් එයට පදිංචියට යාමට මිනිසුන් කැමති නැහැ. තමන්ගේ ගම් අත්හැර දමා යන්නට ඒ අය කැමති නැහැ. එහෙත් ගල්කැටියාවත්ත, නැබඩවත්ත ආදි වතුවලින් ඉඩම් දුන්නොත් ඒවා තමන්ගේ පරම්පරාගත ඉඩම්වලට යාබදව පිහිටා තිබෙන නිසා ඒවායේ පදිංචියට යාමට මිනිසුන් කැමති වේවි. ගංවතුරින් යට වන ප්‍රදේශවල ගෙවල් හැදීම තහනම් කළොත් හොඳයි. නැත්නම් වරින්වර ආධාර දෙන්නට සිදු වෙනවා පමණයි. ඒවායේ වගාවල් කරන්නට පුළුවනි. සමහර තැන්වල තණකොළ වවන්නට පුළුවනි. උළු කර්මාන්තය වැනි මැටි කර්මාන්ත කරන්නට සමහර තැන් පාවිච්චි කළ හැකියි. උස්බිම්වල ඉඩම් බෙදා දෙන්නට තෝරා ගැනීම ඉක්මන් කරන්නට ඕනෑ. නිරන්තරයෙන්ම යට වන ප්‍රදේශවල උදවියට වන්දි වශයෙන් සෑහෙන මුදලක් ගෙවා, උස් බිම්වල පදිංචි කරවන්නට ඕනෑ.

කැලණිය කතරගම ආදි පැරණි නගර—නටබුන් නගර—වැඩි දියුණු කිරීමට කෝටි ගණන් මුදල් වැය කරතත් ජීවත් වන ජනයා වෙනුවෙන් ඒ තරම් මුදලක් තබා ඊට අඩු ප්‍රමාණයක්වත් වැය නොකිරීම කනගාටුදායකයි. ජීවත් වන අය වෙනුවෙන් වැය කරන්නට මැලි වන්නේ මන්දැයි අහන්නට කැමතියි. නටබුන් නගර වෙනුවෙන් වැය කරන කෝටි සංඛ්‍යාත මුදලින් සියයට එකක්වත් වියදම් කරනවා නම් ඒත් ඇති. මළවුන්ට ආධාර කරන්නට පෙර දැනට ජීවත්ව ඉන්න උදවියට ආධාර කරන්නට ඕනෑ. ඉඩම් කොටසක්—පර්චස් විස්සක්, තිහක් නැත්නම් හතළිහක්—දී ගෙයක් හදා ගන්නැයි කීවාට ඒ අයට එය කර ගන්නට බැහැ. රුපියල් සියයක දෙසියයක ආධාරයකින්ද වැඩක් නැහැ.

ගංවතුර නිසා පළාත් පාලන ආයතනවලට විශාල අමාරුකම්වලට මුහුණ පාන්නට වෙලා තිබෙනවා. පාලම්, බෝක්කු රාශියක් කඩා ගිය පළාත් පාලන ආයතන ගණනාවක් තිබෙනවා. මතුගම නගර සභාව තුළ රුපියල් පණස් දාහක් පමණ වැය කර සෑදූ පාළම අලුත්වැඩියා කිරීමට ආධාර ලැබී නැහැ. ඒ නිසා පළාත් පාලන ආයතනවලට අවංකව ආධාර නොකොළොත් මහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජනයට ලැබිය යුතු අත්‍යවශ්‍ය පහසුකම් නැති වී යනවා. විශාල ධන පරිත්‍යාගය කිනුයි එය කරන්නට සිදු වන්නේ.

නිතර යට වන ප්‍රදේශවල ඉන්න අයට උස් බිම්වල උස් මණ්ඩිවල, පදිංචියට යාමට උදව් කළ යුතුයයි කවුරුත් පාහේ කියා සිටියා. ආධාර දෙන විට එය ස්ථිර වශයෙන්ම ප්‍රයෝජනයක් වන අන්දමට දෙන්නට ඕනෑ. අවුරුද්ද කට වරක් දෙකක් ගංවතුර ඇති වන ප්‍රදේශ තිබෙනවා. ඒ කාලයේදී බත් පාර්සලයක්, සීනි රාත්තලක් බාග යක්, තේ කොළ සවල්පයක් වැනි ආහාර ද්‍රව්‍ය බෙදා දීම හැමදාම කරන්නට යාම විහිලුවක් වෙනවා. ඒ සඳහා සථිර වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. මේ වැඩේ හැමදාම කරන්නට පුළුවන්දැයි ඔවුන් අහනවා. මහජනාධාර එකතු කිරීමත් බෙදා හැරීමත් අද ඉතාමත් අමාරු වී තිබෙනවා. ගංවතුරට යට වුණු අයත් නොවුණු අයත් ඒවාට පොර කනවා.

ගංවතුර නිසා විපතට පත්වන අය සම්බන්ධයෙන් ආරක්ෂා සංවිධාන හරියාකාර සලසා ඇත්තෙත් නැහැ. ඔරු අගුල් ආදිය නැති නිසා ඔවුන් ඉතාම අමාරු අවස්ථාවලට මුහුණ පානවා. උක්වත්ත ප්‍රදේශයේ එක් ගෙදරක සිදු වුණු දෙයක් මා දන්නවා. ඒ ගෙදර ගැහිණිය දරුවකු ලැබීම සඳහා ඉස්පිරිතාලයට ගොස් සිටියා. ඒ අතර ගෙය ගංවතුරෙන් යට වුණා. එහි තිබුණු මහන මැසිමත් ගුවන් විදුලි යන්ත්‍රයත් බයිසිකලයත් ඔරුවලින් එහා මෙහා යන අය විසින් හොරකම් කරගෙන තිබෙනවා. පසු ගිය අවුරුද්දේ මෙන් මේ අවුරුද්දේ කළුතර ප්‍රදේශයේ නොමිළයේ යාම් ඊම් පහසුකම් සලසා තිබුණෙත් නැහැ. ඇතැම් පළාත්වලට නම් සෑහෙන අනුමට ආධාර ලැබුණත් කළුතර පැත්තේ ගම්වලට එසේ නොලැබුණු බව ගම්වාසීන් විසින් කියන්නට යෙදුණා. එම නිසා ගරු ඉඩම් ඇමති තුමා මේ වනාවේවත් ස්ථිර වශයෙන්ම, නිරන්තරයෙන්ම ගංවතුරෙන් විපතට පත්වන අය සිටින ප්‍රදේශ සොයා බලා ඒවායේත් තදසන්න පළාත්වලත් සිටින ජනතාව උස් බිම්වල පදිංචි කරවීමට කට යුතු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන සවල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 7.47

**ද සොයිසා සිරිවර්ධන මයා.**

*(திரு. டி. சொய்சா சிறிவர்தன)*

(Mr. de Zoysa Siriwardena)

ගරු කථානායකතුමනි, මටත් මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව සලසා දීම ගැනත් ඒවාගේම, තම කොට්ඨාශවලට ගංවතුරෙන් හානි පැමිණි, විරුද්ධ පාර්ශ්වයේ සෑම ගරු මන්ත්‍රීවරයකුටම වාගේ කථා කිරීමේ අවස්ථාව ලබා දීම ගැනත් මා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. තමුන්නාන්සේගේ කොට්ඨාශය ගැන කථා කරන්නට තමුන්නාන්සේට අවස්ථාව නොලැබුණු නමුත් ගරු අගමැතිතුමා හලාවත කොට්ඨාශය ගැන කථා කළ නිසා එය පිරිමැසුණා. නාත්තණ්ඩිය ගැන කවුරුවත් කථා නොකළ නිසා මා මගේ කොට්ඨාශය ගැන කථා කරන ගමන්ම, ගංවතුර සහනාධාර වෙනත් පළාත්වලට දෙන අන්දමින්ම ඒ කොට්ඨාශයටත් ලබා දෙන ලෙස මතක් කරනවා.

මේ වාරයේ ගංවතුරෙන් මිණුවන්ගොඩ කොට්ඨාශයටත් සෑහෙන අලාභයක් සිදු වුණා. වැඩි වශයෙන් හානි පැමිණියේ ඔපාත නමැති ගමටයි. මේ ගමට වතුරෙන් හානි සිදු වන්නේ විශෙෂ හේතුවක් නිසායි. කොටුගොඩ සිට එන ඇළපාරෙන් හැතැප්ම කාලක් පමණ එහායින් පුරාණ ඇළක් තිබුණා. දැන් මේ ඇළ ගොඩ වී තිබෙනවා. මා ප්‍රසිද්ධ වැඩ ඇමති වශයෙන් සිටි කාලයේදී මේ ඇළ පාර හදන්නට සූදානම් වුණු අවස්ථාවේදී අඩි 8 ක් පමණ යටින් අත්තිවාරම් දමන ලෙස ඉල්ලීමක් තිබුණු බව මට මතකයි. එසේ කළොත්, කොටුගොඩ සිට එන වතුර පාර ඔපාත ගමට තදින් බල නොපාන බව ඒ අවස්ථාවේදී පනේවා දී තිබුණා. පුරාණයේ තිබුණු ඒ ඇළ පාරේ දැන්, කටානේ ගරු මන්ත්‍රීතුමාගේ මස්සිනා කෙනකු විසින් කොහු මෝලක් සවි කර තිබෙන බවත් ඊට අලාභ හානි වන නිසා මේ ඇළ සුද්ධ නොකරන බවත් මට දැනගන්නට ලැබී තිබෙනවා. එම නිසා, මේ කොහු මෝල එතැනින් ඉවත් කර හෝ මේ ඇළ සුද්ධ කොට ඔපාත නමැති ගම ගංවතුරෙන් බේරා ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම :

[ද සොයිසා සිරිවර්ධන මයා.]

අනෙක් කාරණය මෙයයි: ගංවතුර සහනාධාර දෙන්නේ මාසයකට රු. 150 ට අඩු ආදායමක් ලැබෙන අයට පමණක් බව සමාජ සේවා කටයුතු පිළිබඳ ගරු උප ඇමතිතුමා පෙන්වා දුන්නා. ඊට වැඩි ආදායම් ලබන අයට ගංවතුරෙන් කොපමණ අලාභ සිදු වුණත් සහනාධාර දෙන්නේ නැහැ. අඩු ගණනේ මසකට රු. 300 ක් ලබන අය දක්වාවත් ගංවතුර සහනාධාර දීමට කටයුතු සලස්වන ලෙස ඉල්ලා සිටිමින්, දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාට (බර්නාඩ් සොයිසා මයා.) කථා කිරීමට අවස්ථාව දිය යුතු නිසා මගේ කථාව මෙයින් අවසාන කරනවා.

අ. භා. 7.50

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

Mr. Speaker, I only want three minutes of your time. There being seven Members representing Colombo in this House, of whom three are Ministers, one is a Parliamentary Secretary, one is a private Member on that side, and just two Members are on this side and since nobody happens to be here except one Minister and myself representing the same constituency in Colombo, I should like to say a few words about some of the troubles in Colombo.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Speak on my behalf also.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

Yes, I am speaking on your behalf also. The troubles in Colombo do not come within the category of troubles referred to by Members who spoke about river valley development schemes, the flooding of rivers and so on, and therefore the replies given by the hon. Parliamentary Secretary to the Minister of Social Services do not cover them. We have our troubles from three sources. There are, as the Hon. Prime Minister pointed out, calamities preventible and calamities not preventible—natural calamities over which we have no control and preventible calamities which we fail to prevent. In the first category we have the cyclones and typhoons and depressions over the Bay of Bengal, and the like, and in the second category, the floods and fires and bad governments.

Now in regard to floods and the like in Colombo, the Colombo Municipal Council spends several lakhs on relief every year, irrespective of whether there is a cyclone or not, after every heavy monsoon. Some of the money finds its way into the pockets of racketeers and some into the pockets of mudalalis who choose the occasion to quote very high rates for the supply of vehicles and the like; and the Municipal Council is generally powerless to prevent this expenditure. It arises partly out of the low-lying land being used for housing by dehoused persons and the influx of people from outside—those who put up shanties in Wanathamulla, Narahenpitiya and the eastern side of the City—and partly out of the low-lying areas abutting the canals. These canals overflow partially during the monsoon, and in any event they are insufficient for carrying away the surface water from the City of Colombo.

There is one grouse I have against the Minister of Irrigation. The irrigation channels that run through Colombo—there are two or three channels—are under the control of the Irrigation Department.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Those channels were in the charge of the P. W. D. The Irrigation Department took them over in 1964 and we have cleaned them since.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

In whatever way you get the devolution of authority, these channels are not cleaned. They are allowed to silt up, and proper arrangements are not

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

made for the outflow of the rain water into these canals. That is one difficulty. The other, of course, is that despite the harbour dam which protected Colombo South from the effects of the Kelani floods, there is no effective drainage system for the rain water that accummulates in the City of Colombo after the heavy monsoonal showers. The natural drainage system in Colombo westward towards the sea and eastwards towards the marshy land abutting Diyawanna-ela has been completely disturbed as a result of buildings that have come up. Every single middle class person buys a bit of land in Colombo—maybe on a housing loan or otherwise—fills up the land, raises the elevation and builds a house. The poor man needs a place to live in. But this has completely destroyed the natural outflow of water, and you find areas like Jawatte, Dematagoda, Baseline Road, Narahenpitiya, and portions of Pamankade going under water. Even the top middle class residential areas like Kollupitiya and the areas abutting Cinnamon Gardens go under water after the monsoonal showers.

There are three solutions that are required. One is that the Irrigation Department that has taken over these channels should maintain them in proper order. The second is that we must move by providing alternate housing—not by driving them away—those people who live in shanties in the low-lying land.

The third is something for which no money will be voted by the Colombo Municipal Council because it does not bring votes to any individual member. That is, that we get a proper expert to report on the surface draining of the City of Colombo ; and I want to ask the Government to use its project aid in the form of assistance in order to obtain the services of an expert who will be able to plan out an effective surface draining of the City of Colombo. That has been long overdue. The last report available on the subject was somewhere in 1931. It is over 35 years old and completely out-moded and out-dated.

I would ask the Hon. Minister to use his influence to get at least two of those problems attended to. The Hon. Minister who spoke is not in charge of housing, and the Hon. Acting Minister for Housing is also not here. Anyway, I should like this question of massive aid to the Colombo Municipal Council to solve the housing problem also to be taken up for consideration.

අ. භා. 7.56

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගරු කථානායකතුමනි, මා මගේ කථාව හොඳටම කෙටි කරන්නටයි, අදහස් කරන්නේ. මෙම ආණ්ඩුව දැනට අවුරුද් දකට පමණ පෙර ගංගා මිටියාවත්වල ගංවතුරෙන් යට වන පවුල් පිළිබඳ ලැයිස්තුවක් දිසාපතිවරුන්ගේ මාර්ගයෙන් ලබා ගත්තා. විශේෂයෙන්ම කළු ගඟ ගැන කල්පනා කර බලමු. මේ ගඟේ මිටියාවත බොහොම පටුයි. මෙම මිටියාවතේ පදිංචිව සිටින ගංවතුරෙන් හානි සිදු වන්නවුන්ගෙ ලැයිස්තු කළුතර සහ රත්නපුර දිසාපතිවරුන්ගෙන් ලබාගෙන තිබෙනවා. ගංවතුරෙන් යට වන ස්ථානවල ගෙවල් සාදා ඇති අයට ගංවතුරෙන් යට නොවන තැන්වල ගෙවල් සාදා ගැනීමට ඉඩම් දීමට ආණ්ඩුව අදහස් කරනවා. දැනටමත් ඒ සඳහා ඉඩම් තක්සේරු කර ගෙන යනවා. ගංවතුරෙන් යට නොවන ස්ථානවල ඒ අයට ගෙවල් සාදා ගැනීමට කටයුතු සැලැස්විය යුතු බව ආණ්ඩුවේ ප්‍රතිපත්තියයි. කෙසේ වෙතත් ගංවතුරෙන් යට වන මෙම ඉඩම් ඉතාමත්ම සාරවත්. කන්න හතරක් පහක් ප්‍රයෝජන ගත්තායින් පසුව එක කන්නයක් ගංවතුරෙන් විනාශ වුණත් ඒ ඉඩම් වටිනවා. වුවමනා වී ඇත්තේ ගංවතුරෙන් යට නොවන ස්ථානවල ගෙවල් සාදා ගැනීමට ඒ මිටියාවත්වල පදිංචිව සිටින්නන්ට කටයුතු සලස්වා දීමයි. හැබැයි, සියල්ලටම එක වරම උස් බිම්වල ගෙවල් සාදා ගැනීමට කටයුතු සලස්වන්නට පුළුවන්කමක් නැහැ. මුලින් ඒ සඳහා ඉඩකඩ සලස්වන්නේ වැඩියෙන්ම ඒ සඳහා අවශ්‍යතාවක් ඇති අයටයි. මේ අවුරුද්දේ මේ වැඩ පිළිවෙළ පටන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම:

ගංවතුරින් වූ හානිය

[ගරු සී. පී. ද සිල්වා]

ගන්නවා. කළු, කැලණි, ගිං යන මිටියාවත් තුනේම මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම ඒ උදවිය ඉල්ලන තැන්වලින්ම ඉඩම් දෙන්නට පුළුවන් වන්නේ නැහැ. කළුගඟ මිටියාවතේ හකමුව ගමේ රජයේ ඉඩමක් තිබෙනවා. එම ඉඩම දෙන්නට පුළුවනි.

ගංවතුර වළක්වන්නට නම් අමාරුයි. කැලණි ගඟේ ගංවතුර වැළැක්වීමේ කට යුතු සඳහා රුපියල් දශලක්ෂ 84 ක් අවශ්‍ය වන බව ගරු අගමැතිතුමා කීවා. කළුගඟ මිටියාවතේ සහ නිල්වලා ගඟ මිටියාවතේ ගංවතුර වැළැක්වීම සඳහා සැලැස්මක් සකස් කිරීමට ඇමෙරිකන් කොම්පැනියකට භාර දී තිබෙනවා. ඒ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කොතරම් මුදලක් වියදම් වේදැයි කියන්නට බැහැ. අප ලබාගෙන ඇති පළපුරුද්ද අනුව ගංගා මෝයවල "ග්‍රෝයින්"—groin—සෑදුවහොත් පහසුවෙන් ජලය මුහුදට ගලාගෙන යනවා ඇති. අම්බලන්ගොඩ ගඟේ එවැනි "ග්‍රෝයින්" එකක් සෑදුවායින් පසුව දැන් වගා කරන්නට බැරිව තිබුණු කුඹුරු අක්කර දහසක් පමණ වගා කරන්නට පුළුවන් වී තිබෙනවා. වැලි සහ මඩ ගං මෝයේ නොරැඳෙන ලෙස ඒ "ග්‍රෝයින්" බැඳීමෙන් ඉක්මනින් වතුර මුහුදට ගලාගෙන යනවා. විශේෂයෙන්ම ප්‍රධාන ගංගාවල "ග්‍රෝයින්" බැඳීම හොඳයි. කැලණි ගං මෝයේ "ග්‍රෝයින්" එකක් බැඳ ගඟ කෙළින්ම මුහුදට යැව්වොත් විශාල ප්‍රයෝජනයක් සැලසෙනවා ඇති. ඒ වාගේම එතකොට ගඟේ එහා පැත්තේ ඇති ඉඩම් පුරවා ගෙවල් සාදන්නට ගත්තොත් කොතරම් වටිනාකමක් ඇති වේද?

**එකල්හි වේලාව අ. භා. 8 වූයෙන්, ප්‍රශ්නය නොවිමසන ලදුව මන්ත්‍රී මණ්ඩලය කල් තැබීමේ යෝජනාව අහෝසි විය.**

**යෝජනාව යළිත් ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි:**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය."—[ගරු සී. පී. ද සිල්වා]

அப்போது பி. ப. 8 மணியாகிவிடவே, சபையின் ஒத்திவைப்பிற்கான பிரேரணை, வினா விடுக்கப்படாமலே காலாவதியாயிற்று.

பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப் பெற்றது.

"சபை இப்பொழுது ஒத்திவைக்கப் பெறுமாக".—[கௌரவ சீ. பீ. டி சில்வா.]

*And it being 8 P.M., the Motion for the Adjournment of the House lapsed without Question put.*

*Motion made and Question proposed,*

"That this House do now adjourn."—[*The Hon. C. P. de Silva.*]

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
The Hon. C. P. de Silva)

පානදුරෙන් මුහුදට වැටෙන බොල්ගොඩ ගඟ සඳහාත් "ග්‍රෝයින්" එකක් සාදන්නට අදහස් කරනවා. මේ අවුරුද්දේ අයවැය ඇස්තමේන්තුවල ඒ ගැන සඳහන් වෙනවා. බණ්ඩාරගම ඡන්ද කොට්ඨාශයේ දියවන්නා ඇළේ වතුර ඔක්කොම මුහුදට බැස්සවීමේ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනව. ඒක රුපියල් ලක්ෂ 30 ක් ඇස්තමේන්තු කර තිබෙන වැඩක්. අපි අමාරුවෙන් හරි ඒක කරනව. මොකද, ඒක ආහාර නිෂ්පාදනයට ඉතාම අවශ්‍යයි.

අනික් කාරණය: සුළි සුළං කොහොම නවත්වන්නදැයි මා දන්නෙ නැහැ. ඒක කාටවත් නවත්වන්න බැහැ. ටෙක්සාස් ප්‍රදේශයේ ගල්ෆ් ඔෆ් මෙක්සිකෝවල මාසයකට "ටයිෆූන්" සුළි සුළං එකක් දෙකක් ඇති වෙනව. මා වැඩිදුර කථා කරන්ට යන්නෙ නැහැ. ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කළ කාරණා සියල්ලම ගැන අපි පරීක්ෂා කර බලනව.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.05 ට 1967 නොවැම්බර් 5 වන ඉරිදා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

அதன்படி சபை பி. ப. 8.05 மணிக்கு, 1967 நவம்பர் 5 ஆம் தேதி ஞாயிற்றுக் கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

*Adjourned accordingly at 8.05 P.M. until 2 P.M. on Sunday, 5th November 1967.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org